# විෂය සමගාමී
# මාර්ගෝපදේශ සංග්‍රහය

ISBN : 978-624-5826-31-5

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**උපදේශනය හා මගපෙන්වීම**
පී.ශ්‍රීලාල් නෝනිස් මහතා - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කේ.පී.එන්.ප්‍රේමසිරි මහතා - අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්)
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය හා නියාමනය**
එල්.එච්.ඩබ්.ආර්.සිල්වා මිය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන I)
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ශාස්ත්‍රීය දායකත්වය**
ආචාර්ය සුජීව වාකිෂ්ඨ මහතා
කලාප අධ්‍යාපන කාර්යාලය - ගාල්ල

**සම්පත් දායකත්වය**
**ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකාය**
කර්නල් ඒ.ඒ.ජී අබේසිංහ, බ්‍රිගේඩියර් පුහුණු ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය
කර්නල් චන්ද්‍රිකා රූපසිංහ, බාලිකා ශිෂ්‍යභට සම්බන්ධීකරණ, ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය
ලුතිනන් කර්නල් කේ.එස්.සමන්ප්‍රිය - ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය

**ශ්‍රී ලංකා සාන්ත ජෝන් ගිලන් සේවය**
විශේෂඥ වෛද්‍ය ජේ.එම්.නිලාම් මහතා - ප්‍රධාන කොමසාරිස්
එම්.ඩී.පී.ඩී. සේනානායක මහතා - දිස්ත්‍රික් කොමසාරිස්, කොළඹ

**ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**
නීතිඥ ජනප්‍රිත් ප්‍රනාන්දු මහතා - ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්
එස්.කේ.පී. මාතරආරච්චි මහතා - ජාතික වැඩසටහන් කොමසාරිස්

**ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය**
සුලාරි ජයවර්ධන මිය- ප්‍රධාන බාලදක්ෂිකා කොමසාරිස්
එල්.එච්.ඩබ්.ආර්.සිල්වා මිය - සැලසුම් හා ප්‍රගති සමාලෝචනය කොමසාරිස්
සිරිනි සී.වෙන්ගප්පුලි මිය - බාලදක්ෂිකා කොමසාරිස්

**ශ්‍රී ලංකා රතු කුරුස සමාජය**
ආයතන සංවර්ධන අංශය

**ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය**
ප්‍රදීපා ද සිල්වා මිය - අධ්‍යක්ෂ ජනරාල්
සුනිල් ගාමිණි පෙරේරා මහතා ජ්‍යේෂ්ඨ පුහුණුකරු
නිරෝෂිනී පෙරේරා මිය - පරිපාලන නිලධාරිනී

**යෞවන තිලිණ ප්‍රදානය**
සංගීත හා වාද්‍ය විශාරද අනෝමා චන්ද්‍රමාල් කුරුවිට ආරච්චි මිය - පුහුණු මණ්ඩල සාමාජිකා
අයි.පී.සාගර බණ්ඩාර මයා - පුහුණු මණ්ඩල සාමාජික - බප/ජය/ආනන්ද ශාස්ත්‍රාලය කෝට්ටේ
අයි.චාන්දනී ගුණතිලක මිය - පුහුණු මණ්ඩල සාමාජිකා - බප/කො/අසෝක විද්‍යාලය, කොළඹ 10

**පරිසර නියමු වැඩසටහන**
ඩී.එම්.ටී.කේ. දිසානායක මිය - සහකාර අධ්‍යක්ෂ, පරිසර අධ්‍යාපන අංශය, මධ්‍යම පරිසර අධිකාරිය
එල්.පී.එච්.ලියනගේ මිය - පරිසර නිලධාරී, මධ්‍යම පරිසර අධිකාරිය

**මුල් කවරය සැකසීම**
විරාජ් කොඩිතුවක්කු මහතා - බප /ගම් / එළුවපිටිය කනිෂ්ඨ විද්‍යාලය, වේයන්ගොඩ

**විවිධ සහාය**
ලියෝනි ගුණවර්ධන මිය
කළමනාකරණ සහකාර

**මූල්‍ය දායකත්වය**
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය

## බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



දැනුම පමණක් නොව කායික, මානසික හා සමාජයීය වශයෙන් සමබර පූර්ණ පෞරුෂයකින් යුත් පුද්ගලයෙක් බිහි කිරීමට වර්තමානයේ පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය මාලාව ප්‍රමාණවත් නොවන බව අධ්‍යාපන විද්වතුන්ගේ අදහසයි.

පුද්ගලයෙක් සමාජානුයෝජනය කිරීමට විෂය සමගාමී ක්‍රියාකාරකම් බෙහෙවින් ඉවහල් වේ. සිසුන්ට සමාජ සම්බන්ධතා ගොඩනැගීමට හා වින්දනයක් ලබා ගැනීමට හැකි ක්‍රියාකාරකම් විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළ ඇතුළත් ය. විෂය සමගාමී ක්‍රියාකාරකම්වල ප්‍රධාන පරමාර්ථය වන්නේ ශිෂ්‍යයා සමාජයට හා පරිසරයට යෝග්‍ය වන පරිදි හැඩ ගැස්වීම ය.

පුළුල් විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශයක් අධ්‍යාපන පද්ධතිය තුළ නොමැති යුගයක මෙවැනි කටයුත්තක් සම්පාදනය කිරීමට කටයුතු කිරීම අගය කරමි. ඒ සඳහා කටයුතු කළ බස්නාහිර පළාත් විෂය සමගාමී නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ එල්.එච්.ඩබ්.ආර්.සිල්වා මහත්මියට මාගේ කෘතඥතාව පිරිනමමි.

මෙම මාර්ගෝපදේශය පරිශීලනය කොට විෂය සමගාමී ක්‍රියාකාරකම් ඉතා ඵලදායී සහ විශිෂ්ට ලෙස පද්ධතිය තුළ ක්‍රියාත්මක කර මනා පෞරුෂයකින් හෙබි අනාගත පරපුරක් බිහි කිරීමට පියවර ගනු ඇතැයි අපේක්ෂා කරමි.

**පී. ශ්‍රීලාල් නෝනිස්**
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
බස්නාහිර පළාත.

## අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



දූයේ අනාගත උරුමකරුවන් වන දරු පරපුර පූර්ණ පෞරුෂයකින් හෙබි පූර්ණ මිනිසුන් කිරීම අධ්‍යාපනයේ මූලික පරමාර්ථයයි. කායික, බුද්ධිමය, විචක්ෂණශීලී හා සදාචාරාත්මක වශයෙන් පූර්ණ මිනිසකු බිහි කිරීමට වර්තමාන පාසල් විෂය මාලාවට විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධ කළ යුතු බව අධ්‍යාපනඥයින්ගේ විශේෂ අවධානයට යොමු වූ කරුණකි.

පුද්ගලයා තුළ පූර්ණ පෞරුෂ වර්ධනයක් ඇති කිරීමට විෂය සමගාමී ක්‍රියාකාරකම් ඉවහල් වේ. එමෙන්ම සමාජානුයෝගී පුද්ගලයෙකු බිහි කිරීමට සමත්, මනා සමාජ සබඳතා පවත්වා ගැනීමට විෂය සමගාමී කටයුතු බොහෝ දුරට ඉවහල් වේ.

වර්තමාන විභාග කේන්ද්‍රීය තරගකාරී අධ්‍යාපනය තුළ ජීවිතයට මුහුණ දීමේ දී අපහොසත් වන දරුවන් සංඛ්‍යාව ඉතා ඉහළ ය. එහෙත් පූර්ණ පෞරුෂ වර්ධනයක් ඇති සිසු පරපුරක් බිහි කිරීමට පාසල් පද්ධතිය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුව ඇත. එම භාරදූර කර්තව්‍යය අධ්‍යාපන පද්ධතියේ සිටින විදුහල්පති, ගුරු භවතුන් වෙත සක්‍රියව පැවරෙන කාර්යයකි. එයට මනා මගපෙන්වීමක් ලබා දෙන අත්පොතක් ලෙස මෙම විෂය සමගාමී මාර්ගෝපදේශය සැකසීමට දරන ලද ඉමහත් වෙහෙස අගය කරමි. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සිසුන්ගේ පූර්ණ පෞරුෂ වර්ධනය සඳහා විවිධ වැඩසටහන්වලට දායක වන ඔබ සැමට ඉමහත් පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**කේ.පී.එන්.ප්‍රේමසිරි**
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන හා සැලසුම්)
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය (අධ්‍යාපන සංවර්ධන)



21 වන සියවසට ඔබින පුරවැසියෙකු බිහි කිරීම පාසල් අධ්‍යාපනයෙන් සිදු කළ යුතුය. මෙහිදී දැනුම පමණක් නොව ඕනෑම පරිසරයක ජීවත් වීමට හැකි පුද්ගලයෙකුට අවශ්‍ය කුසලතා සහිත ගෝලීය පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමට හැකි විය යුතුය. පාසල්වල විෂය සමෝධානිත ශිෂ්‍ය සංගම්, විෂයානුබද්ධ සංගම් මෙන්ම බාහිර ආයතන සම්බන්ධව ක්‍රියාත්මක වන සංගම් ආශ්‍රිත ක්‍රියාකාරකම් ලෙස වර්ග කිහිපයකින් යුත් විෂය සමගාමී ක්‍රියාකාරකම් අපට හඳුනාගත හැකිය. පාසල තුළ ක්‍රියාත්මක වන ශාස්ත්‍රීය විෂය මාලාව මෙන්ම විෂය සමගාමී ක්‍රියාකාරකම් ද එක ලෙස වැදගත් ය. විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් දැනුම පමණක් ලබා ගන්නා දරුවන්ට විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින් ලබා ගත් අත්දැකීම් තුළින් පෞරුෂ වර්ධනය, සන්නිවේදන කුසලතා වර්ධනය, ප්‍රායෝගික ජීවිතයට හුරුවීම, නිර්මාණ ශක්තිය ඇති කිරීම, විවේක කාලය අර්ථවත්ව ගත කිරීම මෙන්ම ස්වයං විනය හා සහකම්පනයෙන් යුතු පුද්ගලයෙකු බවට පත්වීමට අවශ්‍ය කුසලතා ප්‍රගුණ කරයි.

වර්තමානයේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබන ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ විශ්ව විද්‍යාල ප්‍රවේශය හා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයට ඇතුළත් වීම සිදු කරන සම්මුඛ පරීක්ෂණවලදී ඇගයීමට ලක් කරනු ලැබේ. නමුත් පාසල් පද්ධතියේ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන්නේ ඉතා සීමිත ලෙස ය. ඇතැම් පාසල්වල ගුරුවරුන් මේ සඳහා ඉදිරිපත් නොවීම මීට ප්‍රධාන හේතුවක් වී ඇත. මේ නිසා මෙම ග්‍රන්ථය තුළින් පාසල්වල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් සංක්ෂිප්තව හඳුන්වා දීමටත් බාහිර ආයතන මගින් ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව ද කරුණු ඇතුළත් කිරීමටත් උත්සාහ කරන ලදී. මෙහිදී බාහිර ආයතනවල සම්පත්දායකයින් ලබා දුන් දායකත්වය ඇගයීමට ලක් කරමි.

මේ අනුව බස්නාහිර පළාතේ දරුවන් සැම දෙනාම අවම වශයෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකක් සඳහා සහභාගී කරවීම අපේක්ෂා කරනු ලබයි. මෙහිදී පාසල තුළ ක්‍රියාත්මක කරන සමිති සමාගම් මෙන්ම බාහිර ආයතන හා සම්බන්ධ වී ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ගුරුවරු යොමු කිරීම හා ඒ ඒ විෂය මාලාවට අදාළ අඛණ්ඩ පුහුණුවීම් සඳහා සහභාගී කරවීමේ වගකීම ද පාසලේ ඉහළ කළමනාකාරීත්වයට පැවරේ. තවද සියලුම විෂය සමගාමී ක්‍රියාකාරකම් අඛණ්ඩව නියාමනය කිරීම හා ඒවා සඳහා සහභාගී වන දරුවන් සඳහා මෙන් ම ගුරුභවතුන්ද වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සව, වර්ණ ප්‍රදාන වලදී ඇගයීමට ලක් කිරීමට යෝජනා කරමි.

පාසල තුළ විධිමත්ව විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සැලසුමක් වාර්ෂිකව සංවිධානය කිරීමත් වර්ෂ අවසානයේ විෂය සමගාමී දිනයක් පැවැත්වීමට පාසලට ඇති හැකියාව ද සැලකිල්ලට ගන්නා ලෙස සඳහන් කරමි.

මෙම ග්‍රන්ථය සකස් කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දුන් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පී.ශ්‍රීලාල් නෝනිස් මහතා හා අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්) කේ.පී.එන්.ප්‍රේමසිරි මහතාත් සම්පත් දායකත්වය ලබා දුන් සියලුම ආයතනවල නිලධාරීන්වත් විශේෂයෙන් ශාස්ත්‍රීය දායකත්වය ලබා දුන් ආචාර්ය සුජීව වාකිෂ්ඨ මහතා ද (ගුරු උපදේශක - ගාල්ල කලාපය) කෘතවේදීව සිහිපත් කරමි. මෙම ග්‍රන්ථය පරිශීලනය කරමින් පාසල්වල විෂය සමගාමී කටයුතු වඩාත් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම තුළින් දරුවන්ට ඵලදායී අත්දැකීම් ලබා ගනිමින් ස්වයං අභිප්‍රේරණයෙන් යුක්තව කටයුතු කිරීමට සියලු දෙනා ම දායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

**එල්.එච්.ඩබ්.ආර්.සිල්වා**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන I)
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පෙරවදන

රටක අධ්‍යාපනයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ එම රටේ සංවර්ධනයට ඍජු දායකත්වයක් සපයන ක්‍රියාශීලී පුරවැසියන් බිහි කිරීමයි. එම ප්‍රධාන පරමාර්ථය ඉටු කර ගනු වස් ජාතික අධ්‍යාපන අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත. රටක අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පාසල් අධ්‍යාපනයට ඉතා වැඩි වැදගත්කමක් ලබා දීම සිදු කරයි. පාසල් අධ්‍යාපනයේ අරමුණු ගොනු කරනු ලබන්නේ පෙර සඳහන් කරන ලද අධ්‍යාපන අරමුණු හා මූලික නිපුණතා සාක්ෂාත්කරණය පාසල් තුළ දී ඉටුවන ආකාරයටයි. මේ සඳහා විධිමත් පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන මෙවලම වන්නේ විෂය මාලාවයි. පාසල තුළ ක්‍රියාත්මක වන විධිමත් විෂය මාලාව තව දුරටත් ශක්තිමත් කර පෝෂණය කිරීමෙහිලා සහාය දක්වන්නේ විෂය සමගාමී විෂය මාලාවයි. විධිමත් විෂය මාලාව පෝෂණය කිරීමෙහිලා පාසල විසින් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙල වන්නේ විෂය සමගාමී ක්‍රියාකාරකම් වේ. මෙමගින් ශිෂ්‍යයන්ගේ දැනුම පමණක් නොව යහපත් ආකල්ප ගති සිරිත් උසස් කුසලතා, ජීවන නිපුණතා, පෞරුෂ ලක්ෂණ ආදී වැදගත් ගුණාංග වර්ධනය කිරීමට දායකත්වය සපයයි.

විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් ඔස්සේ ශිෂ්‍යයාට වැදගත් වන බව පර්යේෂණ අනාවරණ පෙන්වා දෙයි. ලොව බොහෝ රටවල සිදු කරනු ලැබූ පර්යේෂණ අනාවරණ ආශ්‍රයෙන් හඳුනාගනු ලැබූ මෙම පොදු ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රබල දායකත්වයක් සපයන බව පර්යේෂණ සාහිත්‍ය තුළ හඳුනා ගත හැක. එම ප්‍රධාන ක්ෂේත්‍ර 4 වනුයේ,

- සිසුන්ගේ ස්වදිශානතිය සංවර්ධනය කිරීම.
- සිසුන්ගේ ආත්ම ප්‍රකාශනය සංවර්ධනය කිරීම.
- සිසුන් ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක ජීවත් වීමේ ගුණාංග සංවර්ධනය
- ශිෂ්‍ය ප්‍රජා සම්බන්ධතා සංවර්ධනය

මේ අනුව ශිෂ්‍ය පූර්ණ පෞරුෂ සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රබල දායකත්වයක් සපුරන බව පැහැදිලි වේ.

පූර්ණ විෂය මාලාවක් සාර්ථක ලෙස ක්‍රියාත්මක වන පාසලක විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ඉහළ වැදගත්කමක් ලබා දී ඇත. එමෙන් ම පාසලේ ජනප්‍රිය භාවය හා කීර්තිනාමය තීරණය කිරීමේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා එම පාසල දක්වන දායකත්වය හා ඒවායේ ක්‍රියාකාරී මට්ටම පිළිබඳව අවධානය යොමු කිරීමක් දක්නට ලැබේ. වර්තමානය වන විට මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ පැහැදිලිව හඳුනාගත හැකිය. එබැවින් පාසලක කීර්තිනාමය තීරණය කිරීමේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දායකත්වය පිළිබඳ දැඩි අවධානයක් ප්‍රජාව තුළින් යොමු වී ඇත.

සමෝධානික පෞරුෂයකින් හෙබි ශිෂ්‍ය පරපුරක් බිහි කිරීමේ දී පන්ති කාමරය තුළ ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික ශාස්ත්‍රීය විෂය මාලාව පමණක් ප්‍රමාණවත් නොව බව අධ්‍යාපනඥයින්ගේ අදහසයි. එබැවින් ශිෂ්‍ය පූර්ණ පෞරුෂ සංවර්ධනය සඳහා පන්ති කාමරයෙන් පිටත දී සිදුවන ක්‍රියාකාරකම් ද එක සේ වැදගත් වේ. විෂය මාලාවේ පූර්ණ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා පන්ති කාමරයෙන් පිටත අත්දැකීම් ලබා දීමට ප්‍රමුඛ වන්නේ විෂය සමගාමී ක්‍රියාකාරකම් වේ.

ක්‍රමවේද සැලසුම් කිරීම සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ඇතුළු ප්‍රමුඛ කාර්යයන් රැසක් විදුහල්පතිවරයා විසින් සිදු කළ යුතු වේ. විෂය සමගාමී ක්‍රියාකාරකම සම්බන්ධව විදුහල්පතිවරයා සතු විය යුතු නිපුණතා 4 ක් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය කරුණු පැහැදිලි කරයි.

ඒ අනුව,

- සංකල්පමය නිපුණතා
- ආකල්පමය නිපුණතා
- මානව නිපුණතා
- තාක්ෂණික නිපුණතා

මෙම නිපුණතාවලින් විදුහල්පතිවරයා සන්නද්ධ විය යුතු බව පෙන්වා දේ. පාසලක ක්‍රියාත්මක කළ හැකි විවිධ ආකාරයේ විෂය සමගාමී ක්‍රියාකාරකම් රාශියක් අධ්‍යාපන අමාත්‍යාංශය හඳුන්වා දී ඇත. ඒ අනුව,

- ශිෂ්‍ය කායික සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍ය බුද්ධිමය සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍ය පෞරුෂ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍යයන්ගේ සෞන්දර්යාත්මක කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍යයන්ගේ සමාජ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍ය හැකියා හා විභව්‍යතා සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍යයන්ගේ සංස්කෘතික ආචාර විද්‍යාත්මක සාරධර්ම හැකියා සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්
- ශිෂ්‍යයන්ගේ පුරවැසි දියුණුවට අදාළ ක්‍රියාකාරකම්

මෙම ක්‍රියාකාරකම් ඔස්සේ ශිෂ්‍ය පූර්ණ පෞර්ෂ සංවර්ධනයට අදාළ වන පරිදි ක්‍රියාකාරකම් සංවිධානය කිරීම විදුහල්පතිවරුන්ගේ ප්‍රමුඛ වගකීමක් බව අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කරයි.

විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම හා අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යාපන පර්යේෂණ සාහිත්‍ය විමසීමේ දී බොහෝ කරුණු අනාවරණය කරගත හැකිය. එ මෙන්ම ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතිය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධාරණය කර ඇති ස්ථානද සුලබ වේ. එසේ නමුත් පෙර සඳහන් කරන ලද ශිෂ්‍ය විභව්‍යතා සංවර්ධනය වන පරිදි විවිධ ආකාරයේ විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් සංග්‍රහයක් අධ්‍යාපන පද්ධතිය තුළ හඳුනාගත නොහැකි වීම කණගාටුවට කරුණකි. එම තත්ත්වය ශ්‍රී ලංකාව තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා ඉන් උපරිම ප්‍රයෝජන අත්පත් කර ගැනීමේ අඩුපාඩු ඇති වීමට හේතු වී ඇති බව පර්යේෂණ අනාවරණය පැහැදිලි කරයි.එබැවින් එම අඩුව සම්පූර්ණ කිරීම උදෙසා මෙම උපදෙස් සංග්‍රහය මහඟු පිටුවහලක් සපයන බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ පාසල් වල බහුල වශයෙන් ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක් පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙම ග්‍රන්ථයෙහි අඩංගු වේ. එමගින් තම පාසලේ ක්‍රියාත්මක කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට හා ඒවායේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික උපදෙස් මෙම උපදෙස් සංග්‍රහය තුළින් ලබා ගත හැකිය. ශ්‍රී ලංකාවේ දනට ක්‍රියාත්මක වන ප්‍රධාන විෂය සමගාමී ක්‍රියාකාරකම් 08 ක් සම්බන්ධයෙන් ඒවායේ ක්‍රියාකාරීත්වය පාලනය කරනු ලබන පාලන අධිකාරියේ උපදෙස් හා රෙගුලාසි වලට අනුගතව මෙම උපදෙස් සංග්‍රහය සකස් කර ඇත. අදාළ විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට ඍජුව වග කියනු ලබන ආයතනවල පූර්ණ එකඟතාවය යටතේ එම ආයතනවල නිලධාරින් මෙම උපදෙස් සංග්‍රහය සකස් කිරීමේ දී ප්‍රමුඛතාවය ගෙන කටයුතු කරන ලදී. ඒ අනුව වර්තමානය වන විට ඉතාමත් යාවත්කාලීන වූ තොරතුරු වලින් මෙම උපදෙස් සංග්‍රහය සමන්විත ය.

ඒ අනුව පාසල්වල විදුහල්පතිවරුන්ට විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ගුරු භවතුන්ට ශිෂ්‍යයන්ට මෙන්ම දෙමව්පියන්ට ද මෙම උපදෙස් සංග්‍රහය වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අභිමතාර්ථ සාධනය කිරීමේ ලා වර්තමානය වන විට සාකච්ඡාවට බඳුන් වී ඇති 21 වන සියවසට අදාළ කුසලතා වලින් සපිරි ගෝලීය පුරවැසියෙක් දැයට දායාද කිරීම සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් මහඟු මෙහෙවරක් සිදු කරන බව අවධාරණය කරන අතර ඒ සඳහා ප්‍රමුඛ මඟපෙන්වීමක් මෙම උපදෙස් සංග්‍රහය තුළින් ලැබේ.

**ආචාර්ය එස්.පී.ඩබ්ලිව්.වාකිෂ්ඨ**
කලාප අධ්‍යාපන කාර්යාලය
ගාල්ල

# පටුන


1. පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම්

1.1 පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම

1.2 විෂය සමගාමී ක්‍රියාකාරකම් අරමුණු

1.3 විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

1.4 විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී කොට්ඨාස, කලාප. පළාත් අධ්‍යාපන නිලධාරීන්ගේ කාර්යභාරය

1.5 විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් සිසුන්ට ලැබෙන ප්‍රයෝජන

1.6 විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් ගුරුවරුන්ට ලැබෙන ප්‍රයෝජන

1.7 විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් පාසලට ලැබෙන ප්‍රතිලාභ

2. විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක වන ආකාරය

2.1 පාසල් ආශ්‍රිත විෂය සමගාමී ක්‍රියාකාරකම්

2.2 විෂය සමගාමී ක්‍රියාකාරකම් හා සම්බන්ධ වෙනත් ආයතන

22. I ජාතික ශිෂ්‍යභට බලකාය

2.2. II ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය

2.2. III ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

2.2. IV ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය

2.2. V ශ්‍රී ලංකා රතු කුරුස සංගමය

2.2. VI ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය

2.2. VII එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන

2.2. VIII පරිසර නියමු කණ්ඩායම්

3. උත්සව හා වැඩසටහන්

3.1 උත්සව හා වැඩසටහන් සංවිධානයේ දී සැලකිය යුතු කරුණු

3.2 වැඩසටහන් සැලසුම්කරණය

3.3 වැඩසටහන් ප්‍රගතිය

3.4 විෂය සමගාමී ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම් පෝරමය

## 1. පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම්

### 1.1 පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම

පාසල් විෂය සමගාමී කටයුතුවලින් අපේක්ෂිත අරමුණ වන්නේ යහපත් සදාචාර ගති පැවතුම් සහිත සමාජානුයෝජනය වූ සිසු පරපුරක් බිහි කිරීමයි. මෙහිදී විෂය සමගාමී කටයුතු තුළින් අන්‍ය අදහස් ගරු කිරීම, වගකීම් සහගතව කටයුතු කිරීම, ඉවසීම, මිත්‍රශීලී වීම, කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නියැලීමට අවස්ථාව උදා කර ගනියි. මේ නිසා සමාජ විරෝධී ක්‍රියාවලින් දරුවන් ඈත් වේ. එම නිසා සමාජය අපේක්ෂිත සමාජ ක්‍රියාවන්හි යෙදීමට මෙන්ම යහපත් මානසික තත්ත්වයක් තුළ අධ්‍යාපන කටයුතු ද සාර්ථක කර ගැනීමට හැකියාව ලබා ගනියි.

එබැවින් පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී කටයුතු මගින් ශාස්ත්‍රීය විෂයන් ඉගැනීමට නොදෙවෙනි කාර්ය භාරයක් ඉටු කරයි. වර්තමානයේ එක් එක් පාසල තුළ පවතින භෞතික හා මානනව සම්පත් ප්‍රමාණය මත විවිධත්වයෙන් යුතුව විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක වනු දැකගත හැක. බහුතරයක් පාසල්වල විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක වීම ඉතාමත් අවම වශයෙන් සිදු වේ. නමුත් වර්තමානයේ සෑම පාසලක ම විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් තීරණය කිරීමත් ඒ අනුව ගුරුවරුන් සඳහා විශේෂ පුහුණුවීමක් සිදුකරන බැවින් සෑම ගුරුවරයෙකුම මේ කෙරේ සුවිශේෂී අවධානයක් යොමු කරනු ඇත. මෙහිදී සෑම සිසුවෙකු ම අවම වශයෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකක නියුක්ත කරවීමට බස්නාහිර පළාතේ අවශ්‍ය ගුරුභවතුන් දැනුවත් කිරීමට අපේක්ෂිත ය.

1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ දී වෙනම ශීර්ෂයක් යටතේ සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ දක්වා ඇත.

"සෑම පාසලකම පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය කොටසක් විය යුතුය. නායකත්වය, කණ්ඩායම් වැඩ, සාමූහික ක්‍රියාකාරකම්, විධානාත්මක හා ප්‍රායෝගික කුසලතා සාධාරණ නීතිගරුක බව, අනුන් ගැන සැලකිලිමත් වීම යන ගුණාංග සංවර්ධනයට මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම් උපකාරී වනු ඇත."

සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය (1997 - 21)

මේ අනුව විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා පාසැල් පද්ධතියේ සුවිශේෂ ස්ථානයක් හිමි වී ඇත. ශිෂ්‍ය හැකියා වර්ධනය කිරීමට හැකි වන ආකාරයෙන් පාසල් තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවකාශය ලබා දී ඇත. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් මුල් වකවානුවේ දී මේ සඳහා ගුරුවරුන්ගේ විශේෂ නැඹුරුවක් දක්නට ලැබුණි. මෙම ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දුන් ශිෂ්‍ය කාර්ය දර්ශකයේ සටහන් කිරීම නිසා සිසුන් උනන්දු වීමත් ගුරු කාර්ය දර්ශකයට ඇතුල් කිරීම, සේවාස්ථ පැය ආවරණය, උසස් වීම් සඳහා අදාළ කර ගැනීම විවිධ කරුණු හේතු කොටගෙන ගුරුවරුන් විශේෂ කැමැත්තකින් හා උනන්දුවකින් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය. එහෙත් එම සියලු කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිසා විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට ඇති වූ සුභවාදී තත්ත්වය කාලය සමග නැති වී ඇත. මේ නිසා පාසල් තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් නැවත බලගැන්වීමේ අවශ්‍යතාවය ප්‍රභලව මතු වී ඇත. විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් අධ්‍යාපනයේ පුළුල් අරමුණ කරා ළඟා වීමට අවකාශය ලැබේ. එසේම සාමූහිකත්වය හා සහෝදරත්වය වර්ධනය කර ගැනීමටත්, අන්‍යෝන්‍ය ගරුත්වය හා මිත්‍රත්වය ගොඩනැගීමටත්, නායකත්වය, පෞරුෂත්වය වර්ධනය කර ගැනීමටත්, පුද්ගල හැකියාව හඳුනාගනිමින් ජීවිතයට විවිධ අත්දැකීම් ලබා ගැනීමටත් සිසුන්ට අවස්ථාව ලැබේ.

මේ අනුව සෑම විට ම අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීමට පුද්ගලයෙකු තමා සමග මෙන්ම සමස්ත සමාජය සමඟද කටයුතු කිරීමට අවස්ථාව ලබා ගත යුතු ය. මෙම කාර්ය ඉටු කිරීමට සෑම විට ම සාමූහිකව ක්‍රියාත්මක විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රීඩා පිළිබඳ අඛණ්ඩ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ ජාත්‍යන්තර හා සුපිරි ගණයේ පාසල්වල පමණි. අනෙකුත් පාසල්වල කෙටි කලක දී අධ්‍යාපන කටයුතු ද අඩපණ කරමින් ක්‍රීඩා තරග සඳහා සිසුන් පුහුණු කිරීම සිදු කරයි. මෙවැනි තත්ත්වයක් යටතේ පාසලේ විෂය සමගාමී කටයුතු මගින් ඉටුවිය යුතු කාර්යය හා බලාපොරොත්තු වූ අරමුණු ඉටු නොවීමත් අඛණ්ඩ පුහුණුවීම්වලට දරුවන් සහභාගී නොවීම නිසා නිශ්චිත ජයග්‍රහණ කරා යාම මෙන්ම කුසලතා වර්ධනයට බාධා පැමිණේ.

පාසලක විෂය සමගාමී කටයුතු සාර්ථක වන්නේ ඒවා නිශ්චිත සැලැස්මකට අනුව ක්‍රියාත්මක වීමෙනි. මෙම සැලසුම වාර්ෂිකව සකස් කිරීමට පාසල් උනන්දු කළ යුතු ය.

වර්තමාන විභාග කේන්ද්‍රීය අධ්‍යාපන තුළ ජීවිතයට මුහුණ දීමට අපොහොසත් වන දරුවන් සංඛ්‍යාව ඉතා ඉහළ ය. එහෙත් විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් සමස්ත පෞරුෂ සංවර්ධනයක් සිදු වේ. එතුළින් දරුවන් ට යහපත් ක්‍රියාවක නියැලීමට අනාගතයේ දී රටේ සංවර්ධනයට උරදීමට හැකියාව ලැබේ.

අර්බුදයට ලක් නොවූ පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ පහත ලෙස අතුකෝරාල අදහස් දක්වා ඇත.

"පාසල් අධ්‍යාපනය විෂය මාලාව හා සිසු ගුරු නොගැලපීම ගැන කොතරම් ප්‍රශ්නකාරීව කථා කළ ද පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් ගැන කථා කළ හැක්කේ ඉතා ධනාත්මකව ය. පසුගිය දශක දෙක තුළ "විෂය සමගාමී" ක්‍රියාකාරකම් ලෙස නම් කළ මෙම අංශය කලින් හැඳින්වූයේ විෂය බාහිර ක්‍රියාකාරකම්, සෘජුවම බලපාන නිසා මේවා විෂය සමගාමී ක්‍රියා ලෙස හැඳින්වීම සාධාරණ වේ."

(අතුකෝරාල, 1996, 177)

පාසල් අධ්‍යාපනය ලබන කාල සීමාව තුළ දරුවා කායික, මානසික චිත්තවේගික ශාරීරික යන සෑම අතින් ම වර්ධනය කරා ළඟා වේ. එනිසා පාසල් කාලයේ දී බුද්ධි වර්ධනය කිරීම පමණක් නොකළ යුතුය. එබැවින් පූර්ණ පෞරුෂ වර්ධනයක් ඇති කිරීම සඳහා පාසල් පද්ධතිය තුළ හැකි තරම් විෂය සමගාමී කටයුතු වර්ධනය කළ යුතු ය. ළමා පෞරුෂ වර්ධනය තුළ අත්‍යාවශ්‍ය පුද්ගලික හා සමාජ කුසලතා වර්ධනය කිරීමේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම ඉතා ඉහළ ය.

විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් වේගාත්මක සමාජයේ සාමාජිකයෙකු වීමට අවශ්‍ය පුහුණුව ලබා දීම කළ යුතු බවත් පන්ති කාමරය නිශ්ශබ්දව තබා විභාග සඳහා සූදානම් කිරීමට වඩා සුවිශේෂී කාර්යයක් කළ යුතු බව ගිනිගේ පෙන්වා දෙයි.

"සෑම විෂයකට ම අනුබද්ධව ක්‍රියාත්මක විය යුතු මෙම ක්‍රියාකාරකම් ළමා පෞරුෂයේ විවිධ පැති සංවර්ධනය වන පරිදි ක්‍රමවත් ව සැලසුම් කළ යුතු ය. සෑම සිසුවෙක් ම අඩු තරමින් විෂය සමගාමී කටයුතු කිහිපයකට සහභාගී කර ගැනීමට ගුරුවරු උනන්දු විය යුතුයි."

(ගිනිගේ, 2006, 46)

මේ අනුව සමාජ ජීවිතයට හැඩ ගැසීමට ප්‍රයෝජනවත් වන්නා වූ සමිති සමාගම්, සමූපකාර ශ්‍රමදාන ව්‍යාපාර, බාල දක්ෂ, බාල දක්ෂිකා ව්‍යාපාර, නාට්‍ය, කලා උත්සව, අධ්‍යාපන චාරිකා යෑම ආදී ක්‍රියාකාරකම් පාසල් අධ්‍යාපනය තුළින් ලබා දීමට වර්තමාන පාසල් සමත් විය යුතුයි.

සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රවෘත්ති රාමුවක් සඳහා යෝජනා (2003) ට අනුව අධ්‍යාපනයේ පොදු ජාතික අරමුණු අතරින් සුසමාහිත සමබර පෞරුෂයක් සඳහා වූ අංග ලක්ෂණ සංවර්ධනය කිරීමේ කාර්යයේ විෂය සමගාමී අත්දැකීම් ලබා දීම මගින් ඊට අදාළ සංවර්ධනය කරා සිසුන් මෙහෙයවීමට උත්සාහ කළ යුතු ය. මේ අනුව ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේ දී විෂය සංවර්ධනය ඇති කිරීමට සුවිශේෂී කාර්ය භාරයක් ඉටුවන බව පෙන්වා දිය හැක.

## 1.2 විෂය සමගාමී ක්‍රියාකාරකම්වල අරමුණු

- 21 වන සියවසට ඔබින ගෝලීය පුරවැසියෙකු බිහි කිරීම.
- විවේකය ඵලදායී ලෙස ගත කිරීමට අවස්ථාව ලබා දීම.
- යහජීවන පුරුදු තුළින් යහපත් සෞඛ්‍ය සම්පත් හා ජීවන රටාවක් ගොඩනැගීම.
- සමස්ත ප්‍රජාව තුළ මානසික සතුට හා යහපත් ආකල්ප ඇති කිරීම.
- පරිසරය සුරකින මානව හා පරිසර හිතකාමී අනාගත පරපුරක් බිහි කිරීම.
- ගැටලු විසඳා ගැනීමට හා අභියෝග ජය ගැනීමට හැකියාව ඇති කිරීම.
- ප්‍රායෝගික ජීවිතයට තමා ලබන අත්දැකීම, කුසලතාව භාවිත කිරීමෙන් යහපත් පුරවැසි පුහුණුව.
- අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නැගීම හා සහජීවනයෙන් පිළිබඳ ආකල්ප ලබා දීම.
- වගකීම් දැරීමට හා නායකත්ව කුසලතා වර්ධනය කිරීම.
- අන්තර් පුද්ගල සම්බන්ධතා තුළින් ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ කුසලතාව ලබා දීම.
- කණ්ඩායමක් ලෙස සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ලබා දීම.
- ජය පරාජය විඳ දරා ගැනීමේ හැකියාව ලබා දීම.
- කාල කළමනාකරණය කර ගැනීමේ කුසලතාව ලබා දීම.
- ස්වයං ඇගයීම තුළින් ආත්ම තෘප්තියෙන් විවිධ ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථාව උදා කරදීම.
- වගකීම් සහිත පුරවැසියන් බිහි කිරීමෙන් සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රමිතිය ඉහළ තත්ත්වයට නංවාලීම.

## 1.3 විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

1. වාර්ෂික සැලැස්ම පිළියෙල කිරීම.
2. පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධ වගකීම නියෝජ්‍ය විදුහල්පති හෝ එසේ නොමැති අවස්ථාවක දී විෂය සමගාමී ක්‍රියාකාරකම් භාරකාරීත්වය ගුරුවරයෙකු වෙත පැවරීම.
3. අවම වශයෙන් සෑම ශිෂ්‍යයෙකුටම විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකකටවත් සහභාගීවීමට හැකිවන ලෙස විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
4. එක් එක් ක්‍රියාකාරකම් සඳහා සුදුසු ගුරුභවතුන් පත් කිරීම හා ඔවුන්ට නිසි හා අඛණ්ඩ පුහුණු අවස්ථා ලබා දීම.
5. පාසලේ ඉඩ පහසුකම් ඇත්නම් එක් එක් ක්‍රියාකාරකම් සඳහා ඒකකයක් පිහිටුවීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම.
6. පිහිටුවන ලද ඒකක සඳහා අවශ්‍ය සම්පත් ලබා දීම.
7. පාසල් නිළ ඇඳුමට අමතරව නිළ ඇඳුම් සහිත විෂය සමගාමී ක්‍රියාකාරකම්වල යෙදෙන අවස්ථාවේ දී කණ්ඩායම් පුහුණුවීම් සඳහා නිළ ඇඳුම් ඇඳීමට අවස්ථාව ලබා දීම. උදා :- බාලදක්ෂ, බාලදක්ෂිකා
8. අඛණ්ඩව සිදුවන විවිධ තරග පුහුණුවීම් කඳවුරු සඳහා සිසුන් හා කණ්ඩායම් භාර ගුරුවරු සහභාගි කරවීම.
9. එක් එක් කණ්ඩායම්වල ලිපිලේඛන තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂා කළ හැකි ආකාරයෙන් පාසලේ ස්ථානගත කර තිබීම.
10. විවිධ ආයතන හා පාසල් සංවිධානය කරන වැඩසටහන් සඳහා සිසුන් යොමු කිරීම.
11. බඳවා ගැනීම්, සිසු ජයග්‍රහණ හා එක් එක් විෂය සමගාමී කටයුතු පිළිබඳ තොරතුරු පාසලේ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කිරීම.
12. අඛණ්ඩ නියාමනය හා ඇගයීම - මේ සඳහා විෂය සමගාමී නියෝජ්‍ය විදුහල්පති මූලිකත්වයෙන් කමිටුවක් එක් කිරීම.
13. වාර්ෂිකව විෂය සමගාමී දිනයක් සංවිධානය කිරීම.
14. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩසටහන් සඳහා සිසුන්ට හා කණ්ඩායම් භාර ගුරුවරුන් හා නිලධාරීන්ට සහභාගිවීමට අවස්ථාව ලබා දීම.
15. විෂය සමගාමී ක්‍රියාකාරකම්වල යෙදෙන ගුරුවරුන් නිලධාරීන්ගේ කැපවීම ඇගයීමට ලක්කිරීම.

### 1.4 විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී කොට්ඨාස, කලාප පළාත් අධ්‍යාපන නිලධාරීන්ගේ කාර්ය භාරය

1. කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමෙන් විෂය සමගාමී කටයුතු පවත්වාගෙන යාමට සුදුසු නිලධාරියෙකු පත් කිරීම.
2. වාර්ෂික සැලසුම සියලුම පාර්ශවයන් සමඟ එක්ව සකස් කිරීම හා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.
3. විවිධ ආයතන සම්බන්ධීකරණය කරමින් සිසුනට නව ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
4. විවිධ වැඩසටහන් අධීක්ෂණය හා නියාමනය.
5. කොට්ඨාස කලාප හා පළාත් අධීක්ෂණ ක්‍රියාවලියේ දී වැඩසටහන් හා කණ්ඩායම් ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම.
6. වාර්ෂික විෂය සමගාමී දිනයක් පැවැත්වීම.
7. සිසු හා ගුරු භවතුන්ගේ ජයග්‍රහණ ඇගයීමට ලක් කිරීම.
8. වාර්ෂික ස්ථාන මාරු ගුරු හා විදුහල්පති ඇගයීම් හා උසස් වීම් සඳහා නිර්දේශ කිරීමේ දී සලකා බැලීම.

### 1.5 විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් සිසුන්ට ලැබෙන ප්‍රයෝජන

1. ආත්ම විශ්වාසය හා නායකත්ව ගුණාංග ප්‍රගුණ කිරීම.
2. කණ්ඩායමක් ලෙස සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ලබා ගනී.
3. ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කිරීමේ හැකියාව ලබා ගනී.
4. අභියෝගවලට මුහුණ දීමේ අවස්ථාව උදා කර ගනී.
5. ගැටලු නිරාකරණය කිරීමේ කුසලතාව ඇති කර ගනී.
6. කායිකව හා මානසිකව නිරෝගීමත් ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස ගත කිරීම.
7. යහපත් විනය ගරුක පුරවැසියෙකු කටයුතු කළ හැකි වීම.
8. කාල කළමනාකරණය කර ගැනීමේ හැකියාව ලබාගනී.
9. ඉලක්ක සපුරා ගැනීම සඳහා අන්‍යයන් මෙහෙයවීමේ අවස්ථාව උදාකර ගනී.
10. එක් එක් ක්ෂේත්‍රයන්හි අදාල ප්‍රවණතාවයට පත් වීමෙන් පසු පාසල හැරගිය ද ඒ ඒ කටයුතු කිරීමේ හැකියාව ලැබේ.
11. ස්වයං දැනුවත් භාවය, ස්වයං නියාමනය, අභිප්‍රේරණය, සන්නිවේදන කුසලතා ප්‍රගුණ කරගනිමින් ඵලදායී පුරවැසියෙකු ලෙස තිරසර සංවර්ධනයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීමේ හැකියාව ලබා ගනී.
12. ජාතික හා අන්තර්ජාතික නියෝජනය සඳහා අවස්ථාව ලැබීම.

### 1.6 විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් ගුරුභවතුන්ට ලැබෙන ප්‍රයෝජන

1. තම අභිමතය පරිදි විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා යොමු වීම තුළින් ප්‍රීතිමත් හා කැපී පෙනෙන සාමාජිකයෙකු වීම.
2. ප්‍රායෝගික ජීවිතයට හුරුවීම හා ඒ සඳහා සිසුන් සූදානම් කිරීමේ හැකියාව ලබා ගනී.
3. සිසුන්, පාසල් ප්‍රජාව හා වෙනත් ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට හැකි වීම.
4. විවේක කාලය ඵලදායි ලෙස ගත කිරීම.
5. කාල කළමනාකරණය කර ගැනීම.
6. සමස්ත සමාජයේ වගකීම සහිත පුද්ගලයෙකු ලෙස දරුවන් සූදානම් කිරීම.
7. අන්තර් පුද්ගල සම්බන්ධතා තුළින් ඵලදායී සන්නිවේදකයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබා ගැනීම.
8. ජාතික හා අන්තර් ජාතික මට්ටමේ වැඩසටහන් සඳහා සහභාගී වීමේ අවස්ථාව උදා කර ගැනීම.
9. සිසුන් ජයග්‍රහණ සඳහා මෙහෙයවීමෙන් පාසලට ද ගුරුභවතුන්ට ද ස්වයං තෘප්තිය හා බාහිර පාර්ශවයන්ගේ ඇගයීමට ලක්වීම.

10. ස්වයං ඇගයීම හා ආත්ම තෘප්තිය.
11. මනා සැලසුම්කරුවෙකු ලෙස කටයුතු කළ හැකි වීම.
12. තමා සතු දැනුම අන්‍යයන්ට ලබා දීමේ හැකියාව ලබා ගැනීම.
13. එක් එක් ක්ෂේත්‍රය සම්බන්ධව පුළුල් අවබෝධයක් ළඟා වීම තුළින් යාවත්කාලීන වූ පුද්ගලයෙකු බවට හැකියාව ලැබීම.
14. තිරසර සංවර්ධන කරා දායක විය හැකි සිසුන් නිර්මාණය කිරීමේ හැකියාව ලබා ගනිමින් සමස්ත අධ්‍යාපනයේ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබා දිය හැකි පුද්ගලයෙකු බවට පත් වීම.

**1.7 විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් පාසලට ලැබෙන ප්‍රතිලාභ**

1. නායකත්වය, සංවිධාන ශක්තියෙන් හෙබි සිසු හා ගුරු පිරිසක් බිහි වීම.
2. පාසලේ අභිමානය හා සුවිශේෂී කීර්තියක් ලැබීම.
3. පාසල තුළ විනය ආරක්ෂා කර ගත හැකි වීම.
4. නිරෝගී මනසක් සහිත යහපත් හුරු පුරුදු වලින් හෙබි පුරවැසියෙකු බිහි වීම.
5. ජාතික හා ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ සඳහා අවස්ථාව ලැබීම.

විශේෂ සටහන්

කිසිදු අවස්ථාවක දී බාහිර ආයතනවලට ගුරුවරුන්, විදුහල්පතිවරුන්, නිලධාරීන් ඍජුවම ඇමතීමට හැකියාවක් නොමැත. කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර විවිධ වැඩසටහන් සඳහා කැඳවීම් කළ හැකි ය.

බාලිකාවන් සඳබාලදක්ෂිකා කටයුතු බාලිකාව

## විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක වන ආකාරය

පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් පහත ලෙස හඳුනාගත හැකිය.

**විෂය සමගාමී**

| විෂයානුබද්ධ සංගම් | විෂය සමෝධානත සංගම් | බාහිර සංවිධාන හා සම්බන්ධ ක්‍රියාකාරකම් |
|---|---|---|
| • සිංහල සාහිත්‍ය සංගමය<br>• විද්‍යා සංගමය<br>• ගණිත සංගමය<br>• ඉංග්‍රීසි සංගමය<br>• වාණිජ සංගමය<br>• තොරතුරු තාක්ෂණ සංගමය<br>• සමාජ විද්‍යා සංගමය<br>• ආගමික සංගම් (බෞද්ධ/කතෝලික/ඉස්ලාම්/හින්දු) | • සංහිඳියා සංගමය (බෞද්ධ/කතෝලික/ඉස්ලාම්/හින්දු සියලුම අයගේ සහභාගීත්වය<br>• නව නිපැයුම් සංගමය<br>• මාධ්‍ය සංගමය<br>• තාරකා විද්‍යා සංගමය<br>• ඡායාරූප සංගමය<br>• ව්‍යවසායකත්ව සංගමය | • බාලදක්ෂ සංගමය<br>• බාලදක්ෂිකා සංගමය<br>• ජාතික ශිෂ්‍යභට බලකාය<br>• සෞඛ්‍යදාන ව්‍යාපාරය<br>• රතුකුරුස සංවිධානය<br>• ශාන්ත ජෝන් ගිලන් රථ සේවය<br>• යෞවන තිලිණ වැඩසටහන<br>• පරිසර නියමු වැඩසටහන |

**<u>විෂයානුබද්ධ සංගම්</u>**

පාසල තුළ ක්‍රියාත්මක වන විවිධ විෂයයන්ට අදාළ වන කටයුතු සඳහා ක්‍රියාත්මක වන සංගම් මෙම ගණයට අයත් වේ. පාසලක සෑම සිසුවෙකුට ම අවම වශයෙන් එක් සංගමයකටවත් සහභාගී වීමට අවස්ථාව තිබිය යුතු ය. එසේ ම ඊට අවශ්‍ය ගුරුභවතුන් යොමු කිරීමට හා අවශ්‍ය පුහුණුව ලබා දීමට පාසල කටයුතු කළ යුතු ය.

**<u>විෂය සමෝධානිත සංගම්</u>**

පාසලේ විවිධ විෂයයන් එක්ව ක්‍රියාත්මක වන සංගම් මීට අයත් වේ. මෙහිදී එම සියලුම විෂයයන් අයත් ගුරුවරුන්ගේ සාමූහික එකතුවකින් වැඩසටහන් ක්‍රියාත්මක කරයි.
උදා :- තාරකා විද්‍යාවේදීන්ගේ සංගමය සඳහා භෞතික විද්‍යාව, භූගෝල විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මාධ්‍යය අධ්‍යයනය වැනි විෂය කිහිපයක ගුරුවරුන්ට සම්බන්ධ වීමට හැකියාව ලැබේ.

**<u>බාහිර ආයතන සම්බන්ධ ක්‍රියාකාරකම්</u>**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන ජාතික හා අන්තර් ජාතික විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත් කටයුතු මීට අයත් වේ. මෙහිදී එක් එක් ආයතන මගින් ඒ ඒ ක්ෂේත්‍රයට අවශ්‍යවන විෂය නිර්දේශය සකස් කර ඇති අතර ඊට අදාළ පුහුණුවීම් ගුරු, සිසු දෙපිරිසට ම ලබා දේ. ඒ තුළින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර පාසල හා බාහිර ආයතන මගින් මෙම කටයුතු නියාමනයට හා ඇගයීමට ලක් කරයි.

මෙම සෑම අංශයකම ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් සිසු - ගුරු හා ඉහළ කළමනාකරිත්වය විවිධ කුසලතා ප්‍රගුණ කරමින් තිරසර සංවර්ධනයට දායක විය හැකි ඵලදායී පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබා ගනී.

## 2.1 පාසල් ආශ්‍රිත විෂය සමගාමී ක්‍රියාකාරකම්

- Exploration Club (ගවේෂණ සංගමය)
- ඡායාරූප සංගමය
- කෘෂිකාර්මික සංගමය
- දේශපාලන විද්‍යා සංගමය
- කලා සංගමය
- පුරා විද්‍යා සංගමය
- තාරකා විද්‍යා සංගමය
- ගුවන් සේවා සංගමය
- ජීව විද්‍යා සංගමය
- බෞද්ධ සංගමය
- කතෝලික ශිෂ්‍ය සංගමය
- රසායනික විද්‍යා සංගමය
- වාණිජ සංගමය
- විවාද සංගමය
- Adventure club
- පරිසර සංගමය
- මුද්දර සංගමය
- Gavel Club
- Mother Sri Lanka Club
- සාමාන්‍ය දැනුම සමාජය
- හින්දු ශිෂ්‍ය එකමුතුව
- ඉතිහාසය සමාජය
- තොරතුරු තාක්ෂණ සංගමය
- රක්ෂණ සමාජය
- අන්තර් ක්‍රියාකාරී සමාජය
- නව නිපැයුම්කරුවන්ගේ සමාජය
- ඉස්ලාම් ශිෂ්‍ය සංසදය
- ගුවන් විදුලි සංගමය
- නර්තන සංගමය
- නාට්‍ය සංගමය
- ඉංග්‍රිසි සාහිත්‍ය සංගමය
- චිත්‍රපට සමාජය
- පුස්තකාල පාඨක සංගමය
- ගණිත සමාජය
- මාධ්‍ය ඒකකය
- සංගීත සංගමය
- දමිළ සාහිත්‍ය සංගමය
- UNESCO සමාජය
- සත්ව විද්‍යා සංගමය
- ජපන් සංගමය
- විද්‍යා සංගමය
- Scrabble Club
- සමාජ විද්‍යා සංගමය
- කිතුණු සිසු එකමුතුව
- ශිෂ්‍ය පාර්ලිමේන්තුව
- අධ්‍යාපන චාරිකා
- මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය

**Exploration Club** (ගවේෂණ සංගමය)

ගවේෂණ ක්‍රියාකාරකම් බොහෝ විට විවෘත එළිමහනේ සොබාදහම සමග ක්‍රියාකරන අතර අළුත් දෙයක් කිරීමට අභියෝග කරයි. ගවේෂණ හා සම්බන්ධ ක්‍රියාකාරකම් වලට උදාහරණ කිහිපයක් පහත දැක්වේ,

- කඳු නැගීම
- බෝට්ටු පැදීම

ගවේෂණ සංගමයේ අරමුණ වනුයේ එළිමහන් ක්‍රියාකාරකම් වලට කැමැත්තක් දක්වන සම වයස් සිසුන් එකට එකතු කිරීමයි. එමගින් ලැබෙන ප්‍රතිලාභය නම් සිසුන්ට එළිමහන් වටපිටාව ගවේෂණය කිරීමට අවස්ථාව ලැබීමයි.

**කෘෂිකාර්මික සංගමය**

කෘෂිකර්මය යනු දියුණු වෙමින් පවතින රටවල ජාතික ආදායමක් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රයකි. මෙම සමාජය මගින් සිසුන් හට කෘෂිකර්මාන්තය පිළිබඳ ගොවි පවුල්වල දරුවන්ට ඔවුන්ගේ භූමිකාව තේරුම් කරදීම පාසල දීම පාසල් කළමනාකරණ තරුණ නායකයන් හා ඔවුන්ගේ කාර්යයන් තේරුම්කර දීම ව්‍යාපෘති දියත් කිරීම පිටිසර තරුණයන්ට අභියෝග වලට මුහුණ දීමට හා ඒවා ජය ගැනීමට හුරු කිරීම වැනි දෑ පුරුදු කිරීම් සිදු කරයි.

**පුරාවිද්‍යා සංගමය**

තරුණ පුරාවිද්‍යා සංගමය මගින් පුරාවිද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන සිසුන් හට විවිධ පුරාවිද්‍යා ශිල්පීය ක්‍රම විධිමත් අධ්‍යාපනය වැඩමුළු හරහා ඉගෙනීමට හැකි වීම හා සමවයස් කණ්ඩායම් සමඟ එක්ව සංගමයේ අරමුණු සාර්ථක කර ගැනීමට හැකිවේ.

**ගුවන් සේවා සංගමය**

ගුවන් සේවයේ අරමුණු යන්නේ මගීන්ට, කාර්ය මණ්ඩලයට, පුහුණු සේවකයන්ට, මහජනතාවට ගුවන් යානා හා ගුවන්තොටුපල සේවා කරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවාවන්ට පියාසර කිරීමේ දී හෝ පොළොවේ සිදුවන නීති විරෝධී ක්‍රියා කරුවන්ට එරෙහි වීමයි මෙම සමාජයේ අරමුණ වූයේ තරුණ ගුවන් සේවා ලෝලීන්ට අධ්‍යාපනය දීම, දිරි ගැන්වීම, පෙළඹවීම හා උපකාර කර ගුවන් සේවා ක්ෂේත්‍රයේ සිය වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට උපකාර කිරීමයි.

**ජීව විද්‍යා සංගමය**

ජීව විද්‍යා සංගමයේ පරමාර්ථය වනුයේ ජීව විද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන සිසුන්ට අදහස එක්රැස් කර අදහස් හුවමාරු කර ගැනීම සඳහා ප්‍රජාවක් ලබා දීමයි.එපමණක් නොව ජීව විද්‍යාව කෙරෙහි උනන්දුවක් දක්වන සිසුන්ට විනෝදජනක අධ්‍යාපනික සහ උපකාරී වන විවිධ ක්‍රියාකාරකම් හා රැස්වීම් වාරය පුරාම පැවැත්වීම මෙම සමාජයේ අරමුණයි.

**කලා සංගමය**

කලා සංගමය යනු කලාකරුවන්ට ඔවුන්ගේ කුසලතා ඔප් නංවා ගැනීමට, ශිල්ප ක්‍රම දියුණු කිරීමට, තමන් වැනි අනෙකුත් කලාකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට, කලාව තුළින් සමාජය සමඟ බැඳීම් ඇති කර ගැනීමට සහ අලංකාර වන සමූහ ව්‍යාපෘති තුළින් එකට වැඩ කිරීමට ඉගෙන ගැනීමට හැකි ස්ථානයකි.

කලා සමාජයක ක්‍රියාකාරකම් පහත ලෙස දැක්විය හැකි ය.

- ඉදිරියට පැවැත්වෙන ක්‍රීඩා ඉසව් සඳහා බැනර් නිර්මාණය කිරීම.
- ක්‍රීඩා කණ්ඩායම් වල නාට්‍ය නිෂ්පාදන සහ වෙනත් විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා අත්හදා බැලීම්
- පොත් ප්‍රදර්ශන හෝ විද්‍යාල ප්‍රදර්ශන සඳහා පෝස්ටර් නිර්මාණය කිරීම.
- සැරසිලි තරග පැවැත්වීම.
- නැටුම් සැරසිලි සැකසීම.

**තාරකා විද්‍යා සංගමය**

පාසල් තාරකා විද්‍යා සමාජය යනු සිසුන්ගේ එම ආශාව සහ උනන්දුව රැකගැනීම සඳහා ගොඩනැගෙන සංගමයකි. කුතුහලය දනවන මනසට නිසි සම්පත් හා තොරතුරු ලබා දීම අනාගත තාරකා විද්‍යාඥයින් හා විද්‍යාඥයින් බිහිකිරීමේ පියවරයි.

තාරකා විද්‍යා සමාජයක ක්‍රියාකාරකම් පහතින් දක්වා ඇත.

- කෞතුකාගාරයකරට හෝ නිරීක්ෂණාගාරයකට ක්ෂේත්‍ර අධ්‍යයනයක යෙදීම.
- තාරකා මණ්ඩලය සටහන ගැන අධ්‍යයනය කිරීම.
- තාරකාවක් සඳහා නැගීම සහ වේලාව නියම කිරීම.
- චන්ද්‍රයාගේ සිතියමක් ඇඳීම.
- පැහැදිලි රාත්‍රියක නවාතැන් ගෙන නිරීක්ෂණය කිරීම හෝ එය ඡායාරූප වැඩමුළුවක් පැවැත්වීම.
- තාරකා විද්‍යාව සහ උපාංග අධ්‍යයනයේ ඉතිහාසය ගැන ඉගෙන ගැනීම.

**කතෝලික ශිෂ්‍ය එකමුතුව**

මෙම සමාජයේ මූලික පරමාර්ථය නම් පාසලේ සියලුම කතෝලික සිසුන්ට දේව වචනය පතුරුවා හැරීම සහ ආගම කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය තහවුරු කර ගැනීමයි. කතෝලික ශිෂ්‍ය සංගමය අරමුණු වනුයේ කතෝලික සම්ප්‍රදානුකූලව සාමාජිකයින් හමුවීම්ට වැඩ කිරීමට සහ සැමරීමට ඉඩ සැලසීමයි.

**බෞද්ධ සංගමය**

පාසල් වල බෞද්ධ සමිති හා සාමාජිකයන්ගේ යහපත් පුරවැසියන් බවට පත් කිරීම සඳහා ඔවුන්ගේ විනය හා සාමාන්‍ය හැසිරීම වැඩිදියුණු කළ යුතු ය. විනය සම්බන්ධයෙන් තම චරිතය සකස් කරවීමේදී ශිෂ්‍යයාගේ අධ්‍යාත්මික වටිනාකම් විශාල කාර්යභාරයක් ඉටුකරන බව ද ඔවුහු විශ්වාස කරති.

බෞද්ධ සමාජයක ක්‍රියාකාරකම් පහත ලෙස දැක්විය හැකි ය.

වෙසක් තැපැල්පත් සැලසුම් කර වෙසක් තරඟ පැවතීම,පහන් කූඩු තරග,පන්ති සැරසිලි තරඟ ආදිය පැවැත්වීම සිදු කරයි. ඊට අමතරව

- පිරිත් උත්සව සංවිධානය කිරීම
- සිල් වැඩසටහන්
- පොහොය ධර්ම දේශනා
- භාවනා වැඩ වැඩසටහන්
- භක්ති ගීත වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

**වාණිජ සංගමය**
වාණිජ සංගමය යනු පාසල් වාණිජ අංශයේ ශිෂ්‍ය සංගමයයි. වාණිජ සංගමයක් පවත්වාගෙන යාමෙන් වර්තමාන ව්‍යාපාරික තත්ත්වයේ ඇති ප්‍රායෝගික අභියෝගයන්ට මුහුණ දීමට පාසල්ට සිසුන්ට ඉඩ සැලසිය හැකි ය. කර්මාන්තයේ ව්‍යාපාර විශේෂඥයන් සමඟ සිසුන්ට අන්තර් ක්‍රියා කිරීමට ඉඩ දීම, සිදුවීම් කළමණාකරුවන් වීමට සිසුන් ඉදිරිපත් කිරීම, ආත්ම විශ්වාසය සහ ක්‍රියාකාරී ප්‍රවේශය ගොඩනැගීම සඳහා අවස්ථාව ලබා දිය යුතු ය.

**රසායන විද්‍යා සංගමය**
මෙම සමාජය විසින් පාඨමාලා විෂය මාලාවෙන් ඔබ්බට රසායන විද්‍යාව අන්තර්ගතය සහ ප්‍රජාව සමග අනුබද්ධ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට අවස්ථාව ලබාදෙන අතර රසායන විද්‍යාව හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා විෂය බාහිර ක්‍රියා ක්‍රියාකාරකම් සපයයි.

**විවාද සංගමය**
විවාද සංගමයේ මූලික පරමාර්ථය නම් ලබා දී ඇති මාතෘකාවේ මූලික කරුණු පිළිබඳව එලදායි විවේචනාත්මක චින්තනය ජනිත කර ගැනීමයි. සියලු නිපුණතා මට්ටම් වල සිසුන්ට විවාදය වටිනා ක්‍රියාවලියකි. විවාදය වෙනත් අධ්‍යයන කටයුතු සඳහා සහ සාමාන්‍යයෙන් ජීවිතය සඳහා ප්‍රයෝජනවත් කුසලතා උගන්වයි. බොහෝ දුරට පැහැදිලිවම වාදවිවාද කරන්නන් ප්‍රසිද්ධියේ කතා කිරීමට සහ තම අදහස් චතුර ලෙස ප්‍රකාශ කිරීමට විශ්වාසය ගොඩනගා ගනී.

**මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය**
මත්ද්‍රව්‍ය සහ මධ්‍යසාර භාවිතය තුළින් ඇතිවිය හැකි අනතුරු පිළිබඳව තරුණ සිසුන් දැනුවත් කිරීම පාසල් පදනම් කරගත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වල අරමුණ වේ. මත්ද්‍රව්‍ය අධ්‍යාපනය තුළින් ළමයින්ට තරුණයන්ට සහ වැඩිහිටියන්ට සෞඛ්‍යය සම්පන්නව ජීවත් වීමේ ප්‍රතිලාභ අගය කිරීමට දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කර ගැනීමට අවස්ථාව උදා වේ. මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර වීම පිළිබඳ වගකීම ප්‍රවර්ධනය කිරීමටත් එම වැඩසටහන් සඳහා ඔවුන් සම්බන්ධ කර ගැනීමටත් හැකි වේ.

**නර්තන සමාජය, නාට්‍ය සමාජය, සංගීත සමාජය**
මෙම සංගම් පාසලේ සෞන්දර්යාත්මක අංශයට සම්බන්ධය. සෞන්දර්යාත්මක ගුණය සියලුම ක්‍රියාකාරකම් සංජානනය සහ බුද්ධිමත් චින්තනයේ අංගයක් වන හෙයින් සෞන්දර්යාත්මක අධ්‍යාපනය සිසුන්ට තම එදිනෙදා අත්දැකීම් දෙස බැලීමට සවන් දීමට චලනය වීමට සහ කතා කිරීමට නව ක්‍රම සොයා ගැනීමට උපකාරී වේ. ආත්ම ගෞරවය සහ අන්‍යෝන්‍ය ගෞරවය උගන්වන අත්දැකීම් තුළින් ආත්ම ගෞරවය ලබා ඇත.

**ඉංග්‍රිසි සාහිත්‍ය සංගමය**
ඉංග්‍රිසි සාහිත්‍යය සංගමයක් මගින් සාහිත්‍යයට ඇති ඇල්ම ධනාත්මක පෝෂණය වන පරිසරයක් තුළ ප්‍රවර්ධනයය කළ හැකි ය. මෙම සංගමයේ පරමාර්ථය වන්නේ යම් ප්‍රජාවක් තමන්ට වැදගත් වන යමක් ගැන ඉගෙන ගැනීමට හා සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දීමයි. එමගින් සිසුන්ට ඉංග්‍රිසි සාහිත්‍යය කෙරෙහි ඇති උනන්දුව සොයා ගැනීමට අවස්ථාව ලැබේ.

**නව නිපැයුම්කරුවන්ගේ සමාජය** (Young Investors Club)
නව නිපැයුම්කරුවන්ගේ සමාජය යනු තරුණ සිසුන්ගේ සිත් තුළ සැඟවුණු නව්‍ය නිපුණතා හා අදහස් මතු කිරීමේ මූලික අරමුණ ඇතිව පිහිටුවන ලද සමාජයකි. මෙම සමාජය විසින් සිදු කරන ලද කාර්යයන් තුළින් සෑම දෙයක්ම ජීවිතය වඩාත් පහසු කරවන විවිධ අයිතමයන් සොයා ගැනීමට සාමාජිකයින්ට හැකි වේ. නවෝත්පාදන ක්ෂේත්‍රයේ නව නිපුණතා සමග ඔවුන්ට අත්‍යවශ්‍ය මූලික තාක්ෂණික දැනුම් සහ අවශ්‍ය දැනුම් ලබා දීම සිදු වේ.

**තොරතුරු තාක්ෂණ සංගමය**

මෙම සමාජය සැලසුම් කර ඇත්තේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ඕනෑම දෙයක් ගැන උනන්දුවක් දක්වන සිසුන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමඟ වැඩ කිරීම සහ පසුව මෙම දැනුම අන් අය සමඟ හුවමාරු කර ගැනීම ගැන ඉගෙන ගැනීමට අවස්ථාව ලබා දීම සඳහා ය. පාඩම් වලට අනුකලනය වීමත් සමග සිසුන් වැඩිපුර වැඩ කටයුතුවල නිරත වේ. එයට හේතුව නම් එකම දේ විවිධ ආකාර වලින් ඉගැන්වීමේදී එය වඩාත් විනෝදජනක හා ප්‍රිය උපදවන තාක්ෂණය විවිධ අවස්ථාවන් ලබා දෙන බැවිනි.

**පුස්තකාල පාඨක සංගමය**

මෙම සංගමයේ දැක්ම නම් ශ්‍රී ලංකාව සහ එහි ප්‍රජාවන් දැනුවත් කිරීම් සහ දිරිගැන්වීම තුළින් සියලු දෙනා 21 වැනි සියවසට ඔබින දැනුමැති පුද්ගලයින් බවට පත් කිරීමයි. පාසල් පුස්තකාලය වඩාත් සක්‍රීය ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා මෙන්ම සිසුන්ට ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීමට හැකියාව තිබිය යුතු ය.

**ගණිත සමාජය**

ගණිත සමාජය යනු ගණිත සිසුන්ට යමක් හමු වී සාකච්ඡා කිරීමට හෝ යම් දෙයක් හැදෑරීමට හමුවන ස්ථානයයි. ගණිතය හා සම්බන්ධ ගැටලු, එය සිසුන් අතර හුරුපුරුදු හා ගැටලු විසඳීමේ ආකල්පය වර්ධනය කිරීමට උපකාරී වේ.

- ගණිත සමාජයක ක්‍රියාකාරකම්
- ගණිත ක්‍රීඩා
- ප්‍රහේලිකා
- පැන විසඳුම්
- ක්ෂේත්‍ර කඩ කිරීම ගණිත පරීක්ෂණ
- ගණිත මංපෙත්
- සාමාන්‍ය ගැටලු විසඳීම
- ප්‍රචාරණය කිරීම සහ වීඩියෝ සම්මන්ත්‍රනය

**මාධ්‍ය ඒකකය**

මාධ්‍ය ඒකකය සිසුන්ට කදිම වේදිකාවකි. සෑම පාසලකම පාහේ මාධ්‍ය ඒකකයක් ඇත. මාධ්‍ය ඒකකය සිසුන්ට මාධ්‍ය ලෝකය ගවේෂණය කිරීමට උපකාරී වේ. මාධ්‍ය ඒකකයක් සමග සම්බන්ධ වීමෙන් ඔබට බොහෝ කුසලතා වැඩි දියුණු කළ හැකිය. නිවේදනය, හඬ කැවීම, සංස්කරණය කිරීම, නිෂ්පාදනය කිරීම, ක්‍රීඩා විවරණය කිරීම, ග්‍රැෆික් කාටූන් ඇඳීම යනාදිය ඒවාට නිදසුන් ය.

**මුද්දර සංගමය**

මුද්‍රිත ලෙස ජාත්‍යන්තර විනෝදාංශය වඩාත් කැපී පෙනේ. මුද්දර සමාජය යනු තැපැල් මුද්දර සහ තැපැල් ඉතිහාසය අධ්‍යයනය කිරීමයි. මුද්දර එකතු කිරීම ගැන ද එය සඳහන් කරයි. මෙම සමාජයේ අරමුණ වන්නේ පාසල් මට්ටමින් විනෝදාංශය පවත්වා ගැනීම සහ තරුණ මුද්දරකරුවන්ට මඟපෙන්වීමයි.

**පරිසර සංගමය**

මෙම සමාජය පරිසරය සංරක්ෂණය පිළිබඳව සිසුන් හා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, අභිප්‍රේරණය කිරීම සහ දැනුම්වත් කිරීම සඳහා ය. පරිසරය හා ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳව සමාජය දැනුවත් කිරීම, දිස්ත්‍රික්කයේ දූෂණය අවම කිරීම් සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, අවට ඇති ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සහ සංරක්ෂණය කිරීමට දරණ උත්සාහයන් දිරිමත් කිරීම සිදු කරයි.

**පරිසර සමාජයක ක්‍රියා ක්‍රියාකාරකම්**

- පැල සිටුවීම පරිසර පද්ධතිය පිළිබඳ හැදෑරීම.
- ක්ෂේත්‍ර සංචාර ක්‍රියාකාරකම් පැවැත්වීම.
- පරිසරය පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම.
- පාරිසරික පිරිසිදුකම ආරක්ෂා කිරීම.
- වික්‍රමාන්විත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- පරිසර අධ්‍යයන කඳවුරු පැවැත්වීම.

**ඡායාරූප සංගමය**

ඡායාරූප සංගමයක් යනු මුදල් ඉපයීමේ අදහස් නොව ඡායාරූප කලාව පිළිබඳ හදාරන කණ්ඩායමකි. ඡායාරූප සමාජ මගින් සිදු කෙරෙන පොදු ක්‍රියාකාරකම් අතර නිතිපතා (මාසික, ත්‍රෛමාසික) රැස්වීම්, ප්‍රදර්ශන, රාත්‍රී වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ක්ෂේත්‍ර චාරිකා ඇතුළත් වේ .

**සත්ව විද්‍යා සංගමය**

සත්ව විද්‍යාඥයින් යනු රසායනාගාරයේ දී සහ ඒවායේ ස්වභාවික වාසස්ථාන තුළ නිරීක්ෂණය කරමින් සතුන් පිළිබඳ අධ්‍යයනය කරන විද්‍යාඥයින් කණ්ඩායමකි. ඔවුන් විශේෂයෙන් සතුන්ගේ ආරම්භය හා වර්ධනය මෙන්ම ඔවුන්ගේ පුරුදු හැසිරීම් හා අන්තර් ක්‍රියා අධ්‍යයනය කරති.

**සමාජ විද්‍යා සංගමය**

සමාජ විද්‍යාව විෂය ක්ෂේත්‍රය යටතේ එකිනෙකාගේ අන්තර් ක්‍රියාකාරිත්වය, ඔවුන්ගේ සමාජ තත්ත්වය සහ පරිසර අධ්‍යයනය කිරීම් ඇතුළත් වේ. සමාජ විද්‍යා විෂයන් තුළ සිසුන්ගේ දැනුම සහ අවබෝධයේ ගැඹුරු යන දෙකම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ.
සමාජ විද්‍යා සංගමයේ ක්‍රියාකාරකම් පහත ලෙස දැක්විය හැකි ය.

- සමාජ විද්‍යා ප්‍රදර්ශන පැවැත්වීම.
- විවිධ මාතෘකා යටතේ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.
- සංස්කෘතික උරුම ඉතිහාසය සහ සාමාන්‍ය දැනුම ඇතුළත් ප්‍රශ්න විචාරාත්මක තරග පැවැත්වීම.
- වර්තමාන ගැටලු සහ අනෙකුත් මාතෘකා පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම.
- ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.

**ශිෂ්‍ය පාර්ලිමේන්තුව**

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පිළිබඳව ද ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු ක්‍රමය හා සම්ප්‍රදාය පිළිබඳව ද අවබෝධය ලබා දීමට කටයුතු කරනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදය, එහි අගයන්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, එහි වගකීම් හා වගවීම්, ඡන්ද ප්‍රකාශ කිරීම් හා ඡන්ද ප්‍රකාශ කිරීමේ වැදගත්කම, නීතිය හා නිතියේ ආධිපත්‍යය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් පාසල් සිසුන්ට ලබා දීම සඳහා ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන ඉවහල් වේ.

**අධ්‍යාපන චාරිකා**

ඉගෙනුම් ශිල්ප ක්‍රම ගුරු කේන්ද්‍රිය හා ශිෂ්‍ය කේන්ද්‍රිය නැඹුරුවක් ඇති ඒවා ලෙස වර්ග කළ හැක. ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ක්‍රමයක් ලෙස ක්ෂේත්‍ර චාරිකා මගින් සැබෑ අත්දැකීම් ලබා ගැනීමට හැකියාව ලැබේ. එසේම ක්ෂේත්‍ර චාරිකා ක්‍රමයේ වාසි ලෙස ද පහත සඳහන් කරුණු දැක්විය හැකි ය.

1. අධ්‍යාපනික අරමුණු වන සංජානගත මනෝචාලක හා චර්යාමය අරමුණු ඉටු වීම.
2. සද්භාවය පිළිබඳ අවබෝධය - භෞතික සංස්කෘතික තත්ත්වය පිළිබඳ අවබෝධය
3. මිනිස් පරිසරය සම්බන්ධව තේරුම් ගැනීම.
4. නිවැරදි සංකල්ප සාධනය.
5. මානුෂ හැඟුම් වර්ධනය හා සහයෝගී ආකල්ප වර්ධනය.
6. සැලසුම්කරණය, වගකීම් දැරීම වැනි විවිධ කුසලතා වර්ධනයට අවස්ථාව ලැබීම.
7. පරිසර සම්පත් උපරිම ලෙස අධ්‍යයනයට යෙදීම.
8. සාමූහික ක්‍රියාකාරකම්වලට හුරු වීම.
9. ගුරු ශිෂ්‍ය සම්බන්ධය වර්ධනය වීම.
10. ගුරු කාර්යභාරය පහසු වීම.
11. පොත්පතින් ලත් ඓතිහාසික, ආර්ථික, පරිපාලනමය දැනුම සාක්ෂාත් වීම.
12. ආකල්ප හා ඇගයුම් වර්ධනය.
13. විමර්ශන ශක්තිය වර්ධනය.

බොහෝ විට ක්ෂේත්‍ර චාරිකා,අධ්‍යාපන චාරිකා පාසල්වල වාර්ෂික ලිතට ඇතුළත් කරමින් අනිවාර්ය අංගයක් ලෙස ක්‍රියාත්මක කිරීම දැකිය හැකිය. මහාචාර්ය අශෝකා ජයසේන ඇයගේ කෘතියක මෙසේ සඳහන් කර ඇත. "වර්තමානයේ ක්ෂේත්‍ර චාරිකා බහුල වශයෙන් විනෝදය සඳහා යොදා ගැනීම නිසා ඒවායේ අධ්‍යාපනික වටිනාකම පිළිබඳ අවබෝධය අඩු ය. ක්ෂේත්‍ර චාරිකා එළිමහනේ පවත්වන පාඩමක් වශයෙන් හැඳින්විය හැකිය. දැනට පන්ති කාමරයේ උගන්වන බොහෝ පාඩම් වල ක්ෂේත්‍ර චාරිකා යොදාගත හැකි වුවද ගුරු අවධානය ගැනීම පාසලේ සීමා පුළුල් කිරීමකට සමාන කළ හැකිය. සාමාන්‍යයෙන් පන්ති කාමරය තුළ ගුරුවරයාට දිය හැක්කේ සීමිත දැනුම් කොටසකි." මේ අනුව වඩා පුළුල් දැනුමක් මෙන්ම විෂය කරුණු වලට වඩා සැලසුම්කරණය, අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කිරීම, සංවිධාන ශක්තිය, කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක වීම වැනි කුසලතා ප්‍රගුණ කිරීමට ක්ෂේත්‍ර චාරිකා මෙන්ම අධ්‍යාපන චාරිකා සංවිධානයේ දී ගුරු සිසු දෙපාර්ශවයට ප්‍රගුණ කිරීමට අවකාශය ලැබේ.

## 2.2 විෂය සමගාමී ක්‍රියාකාරකම් හා සම්බන්ධ වෙනත් ආයතන

- ජාතික ශිෂ්‍යභට බලකාය
- ශාන්ත ජෝන් ගිලන්රථ සේවය
- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
- ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය
- ශ්‍රී ලංකා රතු කුරුස සමාජය
- ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය
- එඩින්බරෝ ආදිපාදවරයාගේ ජාත්‍යන්තර තිළිණ වැඩසටහන
- පරිසර නියමු කණ්ඩායම්

## 2.2 I ජාතික ශිෂ්‍යභට බලකාය

## National Cadet Corps
## (1881)

**හැඳින්වීම**

ජාතික ශිෂ්‍යභට බලකාය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් 1881 වර්ෂයේ දී ආරම්භ කර වසර 142 ක අඛණ්ඩ ඉතිහාසයකට උරුමකම් කියන සංවිධානයකි. ජාත්‍යන්තර සමාජයේ විශිෂ්ඨ පාර්ශවකරුවකු ලෙස එළඹෙන අභියෝග වලට සාර්ථකව මුහුණ දිය හැකි දැනුමින් පරිපූර්ණ වූ ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් නිරෝගිමත්, විනයගරුක අනාගත පරපුරක් බිහි කිරීම සඳහා පාසල් අධ්‍යාපනය සමග අත්වැල් බැඳගනිමින් අඛණ්ඩව අද දක්වාම ක්‍රියාත්මක වේ.

ජාතික ශිෂ්‍යභට බලකාය වසර 142 ක් තුලදී හෙට දින ජාතික නායකත්වය වෙනුවෙන් අද දින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විනයගරුක හා දක්ෂ තරුණ පරපුරක් ලෙස ගොඩනැංවීම සඳහා ඉටු කරන ලද මෙහෙවර වෙනුවෙන් සහ පළමු, දෙවන ලෝක මහා සංග්‍රාමයන්වලදී ඉටුකරන ලද සේවය සහ සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත ඉටු කළ සහ ඉටුකරනු ලබන සේවය අගය කරමින් ගරු ජනාධිපතිතුමන් විසින් ජනාධිපති වර්ණ සහ බලකා වර්ණ ජාතික ශිෂ්‍යභට බලකාය වෙත පිරිනැමීමට නියමිතය.

ජාතික ශිෂ්‍යභට බලකායේ ශිෂ්‍යභට පුහුණුව දිවයිනේ පාසල් පද්ධතියේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් වයස අවුරුදු 12 සිට අවුරුදු 20 දක්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අංශ දෙකක් යටතේ විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස ක්‍රියාත්මක වේ.

**ආදර්ශ පාඨය**

**"සුදානම් නොවී නොසිටිනු"**

**"නකදවිද් අසං විහිතඃ" – සංස්කෘත භාෂාවෙන්**

"NEVER BE UNPREPARED" – **ඉංග්‍රීසි භාෂාවෙන්**

"NONQUAM NON PARATUS" – **ලතින් භාෂාවෙන්**

**ජාතික ශිෂ්‍යභට බලකායේ දැක්ම**

හෙට දින ජාතික නායකත්වය වෙනුවෙන් අද දින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විනයගරුක හා දක්ෂ තරුණ පරපුරක් ලෙස ගොඩනැංවීම.

**ජාතික ශිෂ්‍යභට බලකායේ මෙහෙවර**

සැලසුම් කරන ලද පුහුණු පාඨමාලාවන් තුළින් ශිෂ්‍යභටයින් තුළ චරිතවත්බව, චිත්ත ධෛර්ය, ක්‍රීඩාශීලිබව, ආත්ම විශ්වාසය, ස්වයං විනය, ප්‍රජා හැඟීම්, වික්‍රමාන්විත හැඟීම්, වගකීම් දැරීම, සුහදශීලීබව යන ගුණාංග වර්ධනය කර ජාතියේ සේවය සඳහා යෙදවිය හැකි ඕනෑම ජීවන පැවැත්මකට නායකත්වය දිය හැකි පිරිපුන් තරුණ පරපුරක් බිහිකිරීම.

## බලකා ගීතය

සැම කල් සැදී සිටින්නෙ සූදානමින්
මාතෘ භූමියේ උදාර වූ නාමයෙන්
පාලයේ නැඟී තෙදින් - ජාතිකාභිමානයෙන්
ජීවිතේ වුවත් පුදා - රටත් දැයත් රකිමි.

මේ අපේ දේශයයි - ධීර වීරයන් උපන්
වීරයන් තැනූ මගේ - පෙරට පා තබමි
දේශ භක්තියෙන් වෙලී - දැනු රාගයෙන්
ජීවිතේ වුවත් පුදා - රටත් දැයත් රකිමි

සැම කල් ...................................


පදරචනය - රංජිත් වීරසිංහ මහතා
සංගීතය - කමාන්ඩර් ප්‍රේමලාල් දන්වත්ත LRAM, ARCM, LTCL, p.s.m

- 1988 අප්‍රේල් මස 29 වන දින ජාතික ශිෂ්‍යභට බලකාය සමාරම්භක දිනයේදී ප්‍රථම වරට බලකා ගීතය ගායනය කරන ලදී.

## ජාතික ශිෂ්‍යභට බලකායේ විකාශය

1881 අගොස්තු මස කොළඹ රාජකීය විද්‍යාලයේ එවකට විදුහල්පති ජෝන් බී කල් මහතා විසින් පා සරඹ මගින් ශිෂ්‍යයන්ගේ විනය ඇති කිරීම අරමුණු කරගෙන ලංකා පාබල රෙජිමේන්තුවට (Ceylon Light Infantry) සම්බන්ධ ස්වේච්ඡා බණ්ඩයක් ලෙස ශිෂ්‍යභට ව්‍යාපාරයේ ආරම්භය සටහන්ව ඇත.

ලංකා ශිෂ්‍යභට ව්‍යාපාරයේ නිර්මාතෘ ජෝන් බී කල් මහතා




- 1917 - ශූරතාවය ලබාගන්නා දක්ෂතම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බාලක බණ්ඩය සඳහා "හර්මන්ලෝස් කුසලානය" පිරිනැමීම ආරම්භ කිරීම.

- 1918 වර්ෂය වන විට ශිෂ්‍යභට බණ්ඩ පාසල් 17ක ව්‍යාප්ත විය. පාබල රෙජිමේන්තුවෙන් (Ceylon Light Infantry) ඉවත් වී ලංකා ශිෂ්‍යභට බලකාය Ceylon Cadet Battalion (CCB) නගා සිටුවන ලදී.

- 1950 ලංකා ශිෂ්‍යභට බලඇණිය (CCB) ලංකා ශිෂ්‍යභට බලකාය Ceylon Cadet Corps (CCC) ලෙස ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව යටතට පත්විය.

- 1953 වර්ෂයේ සිට පළමුවන බලඇණිය කළුතර සහ දෙවන බලඇණිය මහනුවර ආදි ලෙස ප්‍රධාන නගර කේන්ද්‍ර කර ගනිමින් බලඇණි ආරම්භ විය.

- 1972 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පරිවර්තනය වීමත් සමගම ලංකා ශිෂ්‍යභට බලකාය (CCC) ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකාය Sri Lanka Cadet Corps (SLCC) ලෙස නම් කරන ලදී.


- 1985 අංක 40 දරණ මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතට අනුව 1988 අප්‍රේල් මස 29 වන දින ජාතික ශිෂ්‍යභට බලකාය ලෙස නම් කර ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සමාරම්භක උත්සවය කොළඹ රාජකීය විද්‍යාලයේ දී පවත්වන ලදී.

- ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකාය ජාතික ශිෂ්‍යභට බලකාය බවට පත්වීමේදී ලංකා පොලිස් ශිෂ්‍යභට ඒකකයද ඒකාබද්ධ කරන ලදී.

- 1985 - පාසල් 10 ක බාලිකා ශිෂ්‍යභට බණ්ඩ ආරම්භ කිරීම සහ බාලිකා ශුරතාවය සඳහා "ද සොයිසා කුසලානය" පිරිනැමීම ආරම්භ කරන ලදී.

- 1990 දෙසැම්බර් මස 05 දින ජාතික ශිෂ්‍යභට බලකායේ පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ ප්‍රදේශයේදී ස්ථාපනය කරන ලදී.

- මේ වන විට ජාතික ශිෂ්‍යභට බලකාය පළාත් මූලස්ථාන 9 ක් යටතේ සමස්ත දිවයින ආවරණය කරමින් බලඇණි 30 කින් සංවිධානාත්මකව ක්‍රියාත්මක වේ.




1985 අංක 40 දරණ මිනිස් බල උපයෝගීතා සහ පරිපූරක හමුදා පනත මගින් සහ 1996 අංක 19 දරණ මිනිස්බල උපයෝගීතා හා පරිපූරක හමුදා (සංශෝධන) පනත මගින් බලය ගෙන ශිෂ්‍යභට බලකා රෙගුලාසි ස්ථාවර නියෝග වශයෙන් පනවා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂගේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ ශිෂ්‍යභටයන් බඳවා ගැනීම, ශිෂ්‍යභටයින්ගේ අන්තර් පාසල් හා අන්තර් බලඇණි මාරුවීම්, උසස් කිරීම්, පත්කිරීම්, විදේශ සංචාර, ශිෂ්‍යභට ඇගයීම්, හොඳම ශිෂ්‍යභටයා තේරීම, ශිෂ්‍යභට ප්‍රවීණතා බලපත්‍රය, ශිෂ්‍යභට සේවා ඇගයීම් සහතිකය, ශිෂ්‍යභට අවසන් සහතිකය සම්බන්ධ විධිවිධාන ස්ථාවර නියෝග පරිදි විධිමත්ව පවත්වාගෙන යනු ලබයි.

## ජාතික ශිෂ්‍යභට බලකායේ සංවිධානය

**පරිපාලන ව්‍යුහය**

මූලස්ථානය (ජාශිබ) → ජාශිබ පුහුණු මධ්‍යස්ථානය

↓

පළාත් මූලස්ථාන 09

↓

බලඇණි මූලස්ථාන 30

↓

කණ්ඩායම්

↓

ශිෂ්‍යභට ඛණ්ඩ

## ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය - පාමංකඩ - දෙහිවල



ශිෂ්‍යභට ස්මාරකය



මූලස්ථාන ගොඩනැගිල්ල

## ජාතික ශිෂ්‍යභට බලකා පුහුණු මධ්‍යස්ථානය - රංටැඹේ




ආචාර පීඨිකාව සහ නොහඳුනන
ශිෂ්‍යභටයාගේ ස්මාරකය



මකර තොරණ




ප්‍රධාන ප්‍රවේශය, ශිෂ්‍යභට භෝජනාගාරය
සහ නිලධාරි නිවස්නය





සරඹ භූමිය

ජාතික ශිෂ්‍යභට බලකායේ එකම පුහුණු කඳවුර මෙය වේ. වාර්ෂික පුහුණු සැලැස්මට අනුව නිලධාරී, නිලධාරිනීන් සහ ශිෂ්‍යභට/භටවියන්ගේ පුහුණු කටයුතු හා ඇගයීම් මෙහිදී සිදුකරනු ලබයි.

<u>**ශිෂ්‍යභට බල ඇණි මූලස්ථානයක සංවිධානය**</u>



## ශිෂ්‍යභට බණ්ඩයක සංවිධානය




## ජාතික ශිෂ්‍යභට බලකායේ පුහුණු අරමුණු

ජාතික පොදු අරමුණු ජයගැනීම සඳහා අධ්‍යාපනය මගින් වර්ධනය කළ යුතු මූලික නිපුණතා අතරින් ශිෂ්‍යභට විෂය මාලාව හරහා ශිෂ්‍යභටයින් තුළ

- පෞරුෂත්ව වර්ධනයට අදාල නිපුණතා
- පරිසරයට අදාල නිපුණතා
- ක්‍රීඩා හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

වර්ධනය කිරීම සුවිශේෂීව හඳුනාගත හැක. ඒ අනුව ජාතික ශිෂ්‍යභට බලකායේ පුහුණු අරමුණු පහත පරිදි ය.

අ. ස්වයංවිනය සහිත සුසමාහිත චර්යාවන් ශිෂ්‍යභටයා තුළ සංවර්ධනය කිරීම.

ආ. දේශයේ අනාගත නායකත්වය සඳහා අවශ්‍ය ජීවගුණය සහිත ඕනෑම අභියෝගයක් ජයගැනීමට ශක්තිමත් නායකත්ව හැකියාවන් ශිෂ්‍යභටයා තුළ සංවර්ධනය කිරීම.

ඇ. ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු කරමින් බහුවිධ සමාජ සංස්කෘතික විවිධත්වය ගරුකරමින් ජාතික ඒකාබද්ධතාව හා ජාතික සමගිය වර්ධනය කරමින් දේශාභිමානයෙන් කටයුතු කිරීමට ස්වයං පෙළඹවීමක් ඇතිකිරීම.

ඈ. ශිෂ්‍යභටයෙකු ලෙස සමාජ හා ප්‍රජා සංවර්ධනයට දායකවෙමින් සමාජ හිතකාමීත්වයෙන් යුතුව වගකීම් දරමින් සමාජ හා ප්‍රජා සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනයට උරදීමේ ශක්තිය ගොඩනැගීම.

ඉ. ශ්‍රී ලංකාව පිළිබඳ අභිමානයෙන් යුතුව අන්තර්ජාතික ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට අවශ්‍ය ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම.

## ශිෂ්‍යභටයකු ලෙස සංවර්ධනය කළයුතු නිපුණතා

ශිෂ්‍යභට බණ්ඩයට බැඳෙන ශිෂ්‍යයෙකු තුළ සංවර්ධනය කළ යුතු නිපුණතා 6 ක් හඳුනාගෙන ඇති අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

### ස්වයංවිනයට අදාළ නිපුණතා

- පිළිගත් සමාජ සත්චාරිත්‍ර ධර්මයන්ට ගරු කිරීම, පිළිගැනීම හා පිළිපැදීම.
- ශිෂ්‍යභටයෙකු ලෙස බලකායේ සම්ප්‍රදායන්ට, නීතීන්ට හා රීතීන්ට ගරු කිරීම/පිළිපැදීම.
- සෑමවිටකම ශිෂ්‍යභටයෙකු තුළ තිබිය යුතු යහගුණ වර්ධනය කරගනිමින් ඇඳුම පැළඳුම, ගමන බිමන, කථාබහ, හැසිරීම, වැඩකිරීම, ක්‍රමානුකූලව හා රෙගුලාසීන්ට අනුව ඉටුකිරීම.
- නිවැරදි, යහපත් චරිත ලක්ෂණ හඳුනාගනිමින් තම පෞද්ගලික චරිතය ආදර්ශමත්ව ගොඩනගා ගැනීමට කටයුතු කිරීම.
- ස්වයංවිනය විචාරශීලීව හඳුනාගනිමින් ජීවත්වන සමාජයට ගැලපෙන පරිදි සමාජානුයෝජනය වීම.

**පෞරුෂත්වයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා ගවේෂණය වැනි වර්ගීය කුසලතා ජීවිතයට අනුහුරු කරගැනීම සඳහා ස්වයං පුහුණුව.
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය හා මානව අභිමානය ගරු කිරීම වැනි අගයන් පිළිබඳ අවබෝධය හා ඒ අනුව කටයුතු කිරීම.
- පෞද්ගලික ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන සියලු ප්‍රශ්න, ගැටලු, අභියෝග හා දුෂ්කරතාවන්ට මුහුණදීමේ දී චිත්තවේගී බුද්ධියෙන් කටයුතු කිරීම.

**නායකත්වයට අදාල නිපුණතා**

- අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණදීම, ඕනෑම අභියෝගයක් ජයගැනීමට හැකි කායික මානසික ශක්තිය.
- ඇහුම්කන්දීමේ ශක්තිය, පැහැදිලි සන්නිවේදනය හා ඵලදායී ලෙස අදහස් හුවමාරු කර ගැනීම.
- දුෂ්කර අවස්ථාවන්හි පෙරමුණ ගනිමින් කණ්ඩායම් මෙහෙයවීම හා සියලුදෙනාගේ සහයෝගය ලබා ගැනීමට හැකියාව.
- අවස්ථා කළමනාකරණය, අවදානම් කළමනාකරණය හා ඒ හා සබැඳි සියලු තීරණ ගැනීමේ ශක්තිය.
- සමාජ ප්‍රගමනය උදෙසා නායකත්වය ගැනීම.

**දේශාභිමානය සඳහා වූ නිපුණතා**

- බහු වාර්ගික, බහු සංස්කෘතික, බහු ආගමික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදී කුසලතා වර්ධනය හා ශ්‍රී ලාංකිකත්වය ප්‍රවර්ධනය කිරීම.
- දේශාභිමානය, දේශ වාත්සල්‍යය හැඟීම් දනවමින් "තමාට පෙර රට" සංකල්පිතව දැඩි හැඟීමෙන් හා කැපවීමෙන් කටයුතු කිරීම.
- ජාතික උරුමයන් සුරැකීම සහ අනාගත පරපුරට දායාද කිරීම.
- ශ්‍රී ලංකාව හා ශ්‍රී ලාංකිකයන්ගේ සුරක්ෂිතතාව උදෙසා දිවි හිමියෙන් කැපවීම.

**සමාජ ප්‍රජා සංවර්ධන නිපුණතා**

- සමාජ හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ යහපත් ආකල්ප වර්ධනය.
- සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගැනීම, සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- සමාජ සංවර්ධන ව්‍යාපෘති තුළින් නායකත්ව පන්නරය ලබා ගැනීම.
- ජන ප්‍රජාව පිළිබඳ මානව දායාවකින් කටයුතු කිරීම.

**ලෝකය ජයගැනීම සඳහා වූ නිපුණතා**

- නිර්මාණශීලි චින්තනය, බහුවිධ කුසලතා තුළින් නව නිර්මාණ හා නව සංකල්ප බිහිකිරීම.
- ජාත්‍යන්තර ප්‍රජාව සමග සහසම්බන්ධතා පැවැත්වීම සඳහා වූ භාෂා ඥානය වර්ධනය කර ගැනීම.
- තම හැකියා දක්ෂතා මනාව අවබෝධ කරගනිමින් අනාගත ජීවිතය ඵලදායිව සැලසුම් කිරීම සඳහා වූ කුසලතා

**<u>පුහුණු දර්ශනය</u>**

බලකායේ පුහුණු දර්ශනය පහත සඳහන් පරිදිය.

අ. ශිෂ්‍යභටයින් වෙත මූලික යුධ පුහුණුව හා ප්‍රජා පුහුණුව සමබරව හා සමෝධානිතව ලබාදීම තුළින් ශිෂ්‍යභටයින් තුළ අපේක්ෂිත නිපුනතා සංවර්ධනය කිරීම.

ආ. සංවිධිත පුහුණු මාර්ගෝපදේශය මගින් අත්දැකීම් වර්ධනය වන ප්‍රායෝගික හා ක්‍රියාකාරකම් පාදක සාමූහික කඳවුරුගත පුහුණුවට ප්‍රමුඛත්වය ලබා දීම.

ඇ. පුහුණු කටයුතු සඳහා අවශ්‍ය වන භෞතික හා මානව සම්පත්/යෙදවුම් පැහැදිලි සංවිධාන ව්‍යුහයක් තුළ කළමනාකරණය කොට සම්පාදනය කිරීම හා ඒ මගින් උද්යෝගිමත් පුහුණු ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම.

ඈ නිලධාරී/සෙසු නිළ පුහුණු උපදේශකයින් අඛණ්ඩව පුහුණු කිරීම, අධීක්ෂණය කිරීම සංස්කරණ/විශේෂ පාඨමාලා මගින් ඔවුන්ගේ දැනුම, ආකල්ප සංවර්ධනය කිරීම හා උපදේශක හැකියාව සංවර්ධනය කිරිම.

ඉ	විධිමත් ප්‍රායෝගික/ලිඛිත/වාචික පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා ශිෂ්‍යභට නිපුණතාවන් සාමූහිකව හා පෞද්ගලිකව ඇගයීම හා තක්සේරුකරණය.

ශිෂ්‍යභටයින්ට අවස්ථා 5 ක් යටතේ පුහුණුවට අවස්ථාව සැලසේ.

අ.	පාසල් මට්ටම	ආ. කණ්ඩායම් මට්ටම	ඇ බලඇණි මට්ටම

ඈ	පළාත් මට්ටම	ඉ ජාතික මට්ටම

**පුහුණු වැඩසටහන**

ශිෂ්‍යභට පුහුණුව වාර්ෂික සක්‍රීය වැඩසටහනකි. බණ්ඩ/කණ්ඩායම්/බලඇණි/පළාත් හා ජාතික මට්ටමේ කඳවුරු සියල්ල සඳහා ඒ ඒ බලඇණි වල ශිෂ්‍යභට බණ්ඩයන්ට සහභාගී විය හැක. එක් තලයකින් ඊලඟ තලයට ප්‍රවේශවීම/ප්‍රවේශ නොවීම, ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියේ දී පෙන්නුම් කරනු ලබන දක්ෂතාව ගණනය කිරීම මත තීරණය වේ.

මෙම සක්‍රීය පුහුණුව තුළින් ඕනෑම ශිෂ්‍යභට බණ්ඩයකට ජාතික ශූරතාව ජයග්‍රහණය කිරීමටත් ශිෂ්‍යභටයාගේ ගුණාත්මක වර්ධනය තුළින් බලකායේ පුහුණු අරමුණු ජයගැනීම හා පොදු ජාතික අධ්‍යාපන අරමුණු ජයගැනීමට අවශ්‍ය දායකත්වය සැපයීමට හැකිවනු ඇත.

**<u>ශිෂ්‍යභටයා</u>**

අ. ශිෂ්‍යභටයා සැමවිටම පාසල් ශිෂ්‍යයෙකි. රජයේ පිළිගත් පාසලක හෝ ජාත්‍යන්තර පාසලක ශිෂ්‍යයෙකුට මූලික සුදුසුකම් සපුරා ඇතිනම් සහ තම පාසලේ ලියාපදිංචි ශිෂ්‍යභට බණ්ඩ තිබේනම් එහි ශිෂ්‍යභටයෙකු ලෙස බැඳී ජාතික ශිෂ්‍යභට බලකායට/රටට සේවය කිරීමේ හැකියාව ඇත.

ආ. ශිෂ්‍යභටයා පාසල් අධ්‍යාපනය අවසානයේ උසස් අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය, රැකියා වෙළඳපොළ යන අවස්ථාවලට ශක්තිමත්ව ප්‍රවේශවීම සඳහාත් රටේ යහපත් විනයගරුක පුරවැසියෙකු ලෙස කටයුතු කිරීම සඳහාත්, සමාජශීලී, මනා පෞරුෂයකින් යුතු අනාගත නායකයෙකු වීම සඳහාත් තම ශක්තීන් හඳුනාගනිමින් බහුවිධ කුසලතාවයන් ප්‍රගුණ කරමින් කටයුතු කරන දිරිමත් තරුණයෙකි / තරුණියකි.

ඇ. සැම ශිෂ්‍යභටයෙකුම තම පුහුණුව තුළින්,

- මම අණගරුක වෙමි.
- මම නීතිගරුක වෙමි.
- මම හොඳ ශාරීරික හා මානසික සෞඛ්‍ය සම්පන්න බවකින් යුක්ත වෙමි.
- මම මගේ රටට ආදරය කරමි.
- මම මගේ රට සංවර්ධනය කිරීමටත්, රට ආරක්ෂාකර ගැනීමටත් සියලු ජාතින් ශ්‍රී ලාංකිකයන් ලෙස ජීවත්වන සාමකාමී රටක් ගොඩනැගීමටත් දිවිහිමියෙන් කැපවෙමි.

යන පංචවිධ ප්‍රතිපත්තින් සඳහා අවශ්‍ය ප්‍රවීණතාව ලබාගත යුතුය.

ඇ. ශිෂ්‍යභටයා තමන්ගේ ඇඳුම හා පෙනුම පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරන්නෙකි. ඔහු තමන්ගේ නිළ ඇඳුම් ආයිත්තම් නියමිත රෙගුලාසිවලට අනුව අඳියි, පළඳියි.

**<u>බලකාය තුළ ශිෂ්‍යභටයින් වර්ග 04 කි.</u>**

- ජ්‍යෙෂ්ඨ ආරක්ෂක ශිෂ්‍යභටයින් (බාලක/බාලිකා)
- තූර්ය වාදන ශිෂ්‍යභටයින් (බාලක/බාලිකා)
- ජ්‍යෙෂ්ඨ පොලිස් ශිෂ්‍යභටයින් (බාලක/බාලිකා)
- කණිෂ්ඨ ශිෂ්‍යභටයින් (බාලක/බාලිකා)

වයස අවුරුදු 12-14 අතර ශිෂ්‍ය/ශිෂ්‍යාවන් කණිෂ්ඨ ශිෂ්‍යභටයන් වශයෙන් ද
අවුරුදු 14-20 අතර ශිෂ්‍ය/ශිෂ්‍යාවන් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභටයින් ලෙස ද හඳුන්වනු ලබයි.

### <u>ආරක්ෂක / පොලිස් / තූර්යවාදන ශිෂ්‍යභට බාලක/බාලිකා</u>

**<u>ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභටයෙකු වශයෙන් බැඳීමට අවශ්‍ය මූලික සුදුසුකම්</u>**

- අදාළ වර්ෂයේ දී වයස අවුරුදු 14ට වැඩි සහ එම වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට වයස අවුරුදු 20ට අඩු විය යුතුයි.
- යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට රජයේ පිලිගත් වෛද්‍යවරයෙකු විසින් විධිමත් වෛද්‍ය පරීක්ෂණයකින් පසු නිර්දේශ කිරීම.
- පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් යහපත් කල්ක්‍රියාවකින් යුත්ත වීම.

**<u>තූර්යවාදන ශිෂ්‍යභටයෙකු වශයෙන් බැඳීමට අවශ්‍ය මූලික සුදුසුකම්</u>**

- අදාළ වර්ෂයේ දී වයස අවුරුදු 14ට වැඩි සහ එම වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට වයස අවුරුදු 20ට අඩු විය යුතුයි.
- යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට රජයේ පිලිගත් වෛද්‍යවරයෙකු විසින් විධිමත් වෛද්‍ය පරීක්ෂණයකින් පසු නිර්දේශ කිරීම.
- පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් යහපත් කල්ක්‍රියාවකින් යුක්ත වීම.
- සංගීතය පිළිබඳ නිපුණතාවය හා දැනුම.

**<u>ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බඳවා ගැනීම හා නිළ උසස් කිරීම</u>**

ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභටයින්ගේ හා තූර්යවාදන ශිෂ්‍යභටයින්ගේ නිල ධූරාවලිය ශිෂ්‍යභට, ලාන්ස් කෝප්‍රල්, කෝප්‍රල්, සැරයන්, මාණ්ඩලික සැරයන්, බලලත් නිලධාරී (දෙවන පන්තිය), බලලත් නිලධාරී (පළමුවන පන්තිය). ලෙස පහත සඳහන් පරිදි වේ.

**<u>ජ්‍යෙෂ්ඨ ආරක්ෂක / පොලිස් / තූර්යවාදන ශිෂ්‍යභට නිළ ධූරාවලිය</u>**



ලාන්ස් කෝප්‍රල්



කෝප්‍රල්



සැරයන්



මාණ්ඩලික සැරයන්



බලලත් නිලධාරි II



බලලත් නිලධාරි I


1. ශිෂ්‍යභටයෙකු වශයෙන් බැඳෙන අයෙකුට තමන්ගේ සේවාකාලය හා දක්‍ෂතාවය අනුව උසස්වීම් ලැබිය හැක.
   - ශිෂ්‍යභට සිට ලා/කෝප්‍රල් දක්වා - ශිෂ්‍යභටයෙකු ලෙස මාස 06ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අවම වශයෙන් කණ්ඩායම් මට්ටමේ කඳවුරු 03කට සහභාගී වීම.
   - ලා/කෝප්‍රල් සිට කෝප්‍රල් දක්වා - ලා/කෝප්‍රල් නිලයේ මාස 06ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අවම වශයෙන් කණ්ඩායම් මට්ටමේ කඳවුරු 05කට සහභාගී වීම.
   - කෝප්‍රල් සිට සැරයන් දක්වා - කෝප්‍රල් නිලයේ මාස 06ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අවම වශයෙන් කණ්ඩායම් මට්ටමේ කඳවුරු 08 කට සහභාගී වීම.
   - සැරයන් සිට මාණ්ඩලික සැරයන් දක්වා - සැරයන් නිලයේ මාස 06ක සේවා කාලය සම්පූර්ණ කිරීම සහ බණ්ඩභාර සැරයන්වරයකු ලෙස කණ්ඩායම් මට්ටමේ කඳවුරකට සහභාගී වීම. මෙහිදී බලඇණි ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සලකා බැලේ.
   - මාණ්ඩලික සැරයන් සිට බනි II දක්වා - මාණ්ඩලික සැරයන් නිලයේ මාස 06 ක කාර්යක්ෂම සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම මා/සැරයන් වරයෙකු ලෙස ඉටුකරන ලද සේවය, ජ්‍යෙෂ්ඨතාවය, දක්ෂතාවය, කුසලතාවය හා රෙජිමේන්තු රාජකාරී පිළිබඳ ප්‍රමාණවත් දැනුමකින් යුක්ත විය යුතුය.
   - බනි II සිට බනි I දක්වා - බනි II නිලයේ මාස 06 ක කාර්යක්ෂම සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. බලඇණිය තුළ ජ්‍යෙෂ්ඨතාවය, දක්ෂතාවය, කුසලතාවය හා රෙජිමේන්තු රාජකාරී පිළිබඳ ප්‍රමාණවත් දැනුමකින් යුක්ත විය යුතුය.

**<u>ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට නිළ ඇඳුම්</u>**

අ. ශිෂ්‍යභට නිළ ඇඳුම් පහත සඳහන් පරිදි අංක කර ඇති අතර ඒවා පරිහරණය කරන අවස්ථා ඊට ඉදිරියෙන් දක්වා ඇත.
   - අංක 01 නිළ ඇඳුම - සම්මාන ඇඳුම (උත්සව අවස්ථාවන් හා සම්මාන පෙළපාළි, විසිර යාමේ පෙළපාළි සඳහා භාවිත කරයි.)
   - අංක 02 නිළ ඇඳුම - සරඹ ඇඳුම (පුහුණුවීම් හා සරඹ කටයුතු සඳහා භාවිත කරයි.)
   - අංක 03 නිළ ඇඳුම - වැඩ ඇඳුම (ජීව වෙඩි තැබීම, ආත්ම විශ්වාස වර්ධන ක්‍රියාකාරකම් හා වෙනත් ක්ෂේත්‍ර පුහුණුවීම් හා අවි පුහුණුව සඳහා භාවිත කරයි.)
   - ශාරීරික අභ්‍යාස ඇඳුම - ශරීර සුවතා (ශාරීරික අභ්‍යාස චක්‍ර හා යෝග්‍යතා පරීක්‍ෂණ ආදිය සඳහා භාවිත කරයි.)



අංක 01 නිල ඇඳුම - සම්මාන ඇඳුම



අංක 02 නිල ඇඳුම - සරඹ ඇඳුම



අංක 03 නිල ඇඳුම - වැඩ ඇඳුම



ශාරීරික අභ්‍යාස ඇඳුම

**කණිෂ්ඨ ශිෂ්‍යභට බාලක/බාලිකා**

**<u>කණිෂ්ඨ ශිෂ්‍යභටයෙකු වශයෙන් බැඳීමට අවශ්‍ය මූලික සුදුසුකම්</u>**

- බඳවාගනු ලබන වසරේදී වයස අවුරුදු 12 සම්පූර්ණ වූද එම වසරේ දෙසැම්බර් 31 වන දිනට වයස අවුරුදු 14 නොඉක්ම වූ ද ශිෂ්‍යභට ඛණ්ඩයක් පවත්වාගෙන යාමට බලයලත් පාසලක ඉගෙනුම ලබන පාසල් ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට බලකායේ කණිෂ්ඨ ශිෂ්‍යභටයෙකු /භටවියක ලෙස ඔහුගේ/ඇයගේ සහ දෙමාපියන්ගේ කැමැත්ත පරිදි බලකායට බඳවාගනු ලැබේ.
- සුදුසු හා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත බවට රජයේ රෝහලක ක්‍රීඩා වෛද්‍යවරයෙකු/රජයේ පිළිගත් වෛද්‍යවරයෙකු විසින් විධිමත් වෛද්‍ය පරීක්ෂණයක් අවසානයේ නිගමනය කොට සහතික කර තිබිය යුතුය.

**<u>කණිෂ්ඨ ශිෂ්‍යභට නිළ ධුරාවලිය හා ලාංඡන</u>**




ලාන්ස් කෝප්‍රල්




කෝප්‍රල්




සැරයන්

**<u>කණිෂ්ඨ ශිෂ්‍යභට නිළ උසස්වීම්</u>**

ඒ ඒ නිලයන් සඳහා උසස් කිරීම් පහත සඳහන් පරිදි ය. කණිෂ්ඨ ශිෂ්‍යභටයෙකු ලෙස ක්‍රියා කළ හැකි උපරිම වසර ගණන 03කි.

- ශිෂ්‍යභට සිට ලා/කෝප්‍රල් දක්වා - ශිෂ්‍යභටයෙකු ලෙස මාස 06ක සේවා කාලය
- ලා/කෝප්‍රල් සිට කෝප්‍රල් දක්වා - ලා/කෝප්‍රල් නිලයේ මාස 06ක සේවා කාලය
- කෝප්‍රල් සිට සැරයන් දක්වා - කෝප්‍රල් නිලයේ මාස 06ක සේවා කාලය (දක්ෂතාවය හා කුසලතාවය පරීක්ෂා කොට තෝරා ගැනීමේ පදනමක් මත උසස්වීම් ලබා දෙනු ඇත.)
- නමුත් සේවා අවශ්‍යතාවය මත ඛණ්ඩභාර නිලධාරි, බලඇණි අණදෙන නිලධාරි නිර්දේශය මත විධිමත් පරීක්ෂණයකින් පසු ඊළඟ නිලයට උසස් කිරීමට හැකියාව ඇත.

**කණිෂ්ඨ ශිෂ්‍යභට නිල ඇඳුම්**



අංක 01 නිළ ඇඳුම
සම්මාන ඇඳුම



අංක 02 නිළ ඇඳුම
සරඹ ඇඳුම



ශාරීරික අභ්‍යාස ඇඳුම

අ. ශිෂ්‍යභටයෙකුගේ ඇඳුම හා පෙනුම සකස්කර ගැනීමේදී බාලකයින් කොණ්ඩය කොටට කපා සිටිය යුතු අතර පැති කොණ්ඩය තමන්ගේ කනේ ඉහළ කොටසට සමාන්තරව සිටින සේ කැපිය යුතු ය. රැවුල නිසි පරිදි කපා තිබිය යුතු ය. බාලිකාවන් කොණ්ඩය ගොතා එල්ලා නොවැටෙන ආකාරයට බැඳ තිබිය යුතු අතර කොණ්ඩය කපා ඇත්නම් කොණ්ඩ කටු ගසා මනා ලෙස හිරකර තිබිය යුතු ය. කොණ්ඩය මුහුණට හෝ පිටට නොවැටෙන ආකාරයට සකස්කර තිබිය යුතු ය.

ආ. තම නිළ ඇඳුම් කමිසයේ අත් නිවැරදිව නැමීම බඳ පටිය අවශ්‍ය ප්‍රමාණයට ගැළපෙන පරිදි සකස්කර ගැනීම හා ලාංඡන ඔපමට්ටම් කර පැළඳීම, බූට් සපත්තු මනාව ඔපමට්ටම් කර පැළඳීම, බෙරෙස් (හිස් පළඳනාව) නිවැරදිව සකස්කර පැළඳීම ශිෂ්‍යභට පෙනුමට ඉතාමත් වැදගත් ය.

ඇ. ශිෂ්‍යභට නිළ ඇඳුමට අනුමත පදක්කම්/ලාංඡන බලකා නියෝග මගින් ප්‍රකාශයට පත් කරයි.

**<u>ශිෂ්‍යභට ප්‍රවීණතා බලපත්‍රය</u>**

පාසල් ශිෂ්‍යයෙකු ශිෂ්‍යභටයෙකු ලෙස බැඳුණු වහාම ඔහුවෙත නිකුත් කරන ප්‍රවීණතා බලපත්‍රය නිතර යාවත්කාලීන කරගනිමින් පවත්වාගෙන යාම ශිෂ්‍යභටයාගේ ද වගකීම වන්නේ ය.



**<u>ශිෂ්‍යභට විෂය අන්තර්ගතය</u>**

ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ, තූර්යවාදන හා පොලිස් ශිෂ්‍යභටයින් සඳහා වෙන් වෙන්ව සැලසුම් කළ විෂය නිර්දේශ පාඩම් මාලා බලකාය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන අතර ශිෂ්‍යභට මාර්ගෝපදේශයන්ගේ ඇතුළත් අන්තර්ගතය පහත පරිදි වේ.

**විෂය අන්තර්ගතය - ආරක්ෂක ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට හමුදා විෂයයන්**

- ජාශිබ දනුම හා රෙජිමේන්තු රාජකාරි



- ශාරීරික අභ්‍යාස
- සණ සරඹ
- භට නිවාස පිලිවෙත
- ආත්ම විශ්වාස වර්ධන ක්‍රියාකාරකම්
- සිතියම් කියවීම
- භූමි උපක්‍රම
- අවි පුහුණුව හා ජීව වෙඩිතැබීම
- ත්‍රිවිධ හමුදා පොලිස් දනුම සහ ජාත්‍යන්තර ශිෂ්‍යභට දැනුම

**පූර්ව හමුදා විෂයයන්**

- පෞරුෂ සංවර්ධනය, සාරධර්ම හා නායකත්වය
- ප්‍රථමාධාර



**ප්‍රජා විෂයයන්**

- මූලික රටේ නීතිය හා මත්ද්‍රව්‍ය නිවාරණය
- ආපදා කළමනාකරණය හා ගිනි නිවීම

**විවිධ ප්‍රසංගය සහ බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම**

**විෂය අන්තර්ගතය - පොලිස් ශිෂ්‍යභට**

**හමුදා විෂයයන්**



- ජාශිබ දැනුම හා රෙජිමේන්තු රාජකාරී
- ශ්‍රී ලංකා පොලිසියේ ඉතිහාසය
- පොලිස් ශිෂ්‍යභට ඉතිහාසය
- ශාරීරික අභ්‍යාස
- සන සරඹ
- භට නිවාස පිලිවෙත
- ආත්ම විශ්වාස වර්ධන ක්‍රියාකාරකම්
- සිතියම් කියවීම
- භූමි උපක්‍රම
- අවි පුහුණුව හා ජීවවෙඩි තැබීම
- ත්‍රිවිධ හමුදා හා ජාත්‍යන්තර ශිෂ්‍යභට දැනුම

**පූර්ව හමුදා විෂයයන්**



- පෞරුෂ සංවර්ධනය, සාරධර්ම හා නායකත්වය
- ප්‍රථමාධාර

**ප්‍රජා විෂයයන්**

- රටේ නීතිය
- මත්ද්‍රව්‍ය නිවාරණය
- ළමා අපයෝජනය
- ආපදා කළමනාකරණය හා ගිනි නිවීම
- විවිධ ප්‍රසංගය සහ බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම

**විෂය අන්තර්ගතය - තූර්යවාදන ශිෂ්‍යභට**




- පෙරදිග/අපරදිග තූර්යවාදන විෂය අන්තර්ගතය
- ජාශිබ දැනුම හා රෙජිමේන්තු රාජකාරි
- ශාරීරික අභ්‍යාස
- සණ සරඹ
- භට නිවාස පිළිවෙත
- ආත්ම විශ්වාස වර්ධන ක්‍රියාකාරකම්
- සිතියම් කියවීම
- භූමි උපක්‍රම
- ත්‍රිවිධ හමුදා,පොලිස් හා ජාත්‍යන්තර ශිෂ්‍යභට දැනුම
- අවි පුහුණුව හා ජීව වෙඩිතැබීම
- පෞරුෂ සංවර්ධනය, සාරධර්ම හා නායකත්වය
- ප්‍රථමාධාර
- ආපදා කළමනාකරණය හා කාලීන තොරතුරු
- විවිධ ප්‍රසංගය
- තූර්යවාදන පුහුණුව (පෙරදිග/අපරදිග)
    - තූර්යවාදන පිළිවෙත
    - අනිවාර්ය හැඩතල සංදර්ශනය
    - ස්වීය සංදර්ශනය
    - ස්ථානගත වාදනය
    - බියුගල් වාදනය



**විෂය අන්තර්ගතය - කණිෂ්ඨ ශිෂ්‍යභට**





1. අපේ බලකායේ ඉතිහාසය
2. අපේ බලකායේ සංවිධානය
3. නිරෝගීතාවය අගය කරමු
4. සරඹ තුළින් විනය ගොඩනගමු
5. සිතියමක් කියවමු
6. රණබිම් ක්‍රම උගනිමු
7. හදිසි අනතුරකදි උදව් වෙමු
8. මම යහපත් නායකයෙක්මි
9. මම ගුණදහමින් පිරි ශිෂ්‍යභටයෙක්මි
10. ධීර අභ්‍යාස තුළින් අත්දැකීම් ලබමු

## <u>ජාතික මට්ටමේ කඳවුරු</u>

ජාතික ශිෂ්‍යභට බලකාය මගින් වාර්ෂිකව පහත සඳහන් ජාතික කඳවුරු පවත්වනු ලබයි.

- "හර්මන්ලෝස්" ශූරතා කඳවුර - දිවයිනේ දක්‍ෂතම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බාලක ඛණ්ඩය තෝරා ගැනීම.
- "ද සොයිසා" ශූරතා කඳවුර - දිවයිනේ දක්‍ෂතම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බාලිකා ඛණ්ඩය තෝරා ගැනීම.
- පෙරදිග තූර්යවාදන ශූරතා කඳවුර - පෙරදිග තූර්යවාදන ඛණ්ඩවල දක්‍ෂතා ඇගයීම
- අපරදිග තූර්යවාදන ශූරතා කඳවුර - අපරදිග තූර්යවාදන ඛණ්ඩවල දක්‍ෂතා ඇගයීම
- පොලිස් ශිෂ්‍යභට ශූරතා කඳවුර - දිවයිනේ දක්‍ෂතම ජ්‍යෙෂ්ඨ පොලිස් ශිෂ්‍යභට බාලක/බාලිකා ඛණ්ඩය තෝරා ගැනීම
- කණිෂ්ඨ ශිෂ්‍යභට ශූරතා කඳවුර - කණිෂ්ඨ ශිෂ්‍යභට බාලක/බාලිකා ඛණ්ඩවල දක්‍ෂතා ඇගයීම



Hermann Loos Challenge Trophy



De Soysa Challenge Trophy

**ශිෂ්‍යභටයින් සඳහා වූ පාඨමාලා**

ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ හා තූර්යවාදන ශිෂ්‍යභටයින් සඳහා ඒ ඒ මාර්ගෝපදේශයන්ගේ දැක්වෙන විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඛණ්ඩ, කණ්ඩායම්, බලඇණි, පලාත් හා ජාතික මට්ටමේ සංවිධානය වන කඳවුරු වලට අතිරේකව ශිෂ්‍යභටයින්ගේ විශේෂ දක්ෂතා, කුසලතා සංවර්ධනය සඳහා වාර්ෂිකව පහත සඳහන් පුහුණු පාඨමාලා සංවිධානය වේ.

## ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභටයින් සඳහා

- ශිෂ්‍යභට උසස් පාඨමාලාව - මාණ්ඩලික සැරයන් හා ඉන් ඉහළ නිලයන් සඳහා උසස්වීම් ලැබීමට මූලික සුදුසුකම් සපුරා ඇති ජ්‍යෙකොනීන් සඳහා
- ශිෂ්‍යභට සැරයන් පාඨමාලාව - සැරයන් ලෙස පත්වීමට මූලික සුදුසුකම් හා නිර්දේශ ලබා ඇති ජ්‍යෙෂ්ඨතම කෝප්‍රල්වරුන් සඳහා
- විදේශ සංචාර සංචිත පාඨමාලාව - විදේශ සංචාර සංචිතය සඳහා තෝරාගත් ශිෂ්‍යභටයින් සඳහා
- විශේෂ පාඨමාලා - ගිණිනිවීම/ප්‍රථමාධාර/මත්ද්‍රව්‍ය නිවාරණය/මාර්ග සංඥා ළමා ආරක්‍ෂණය / රථවාහන පාලනය/ජීවිතාරක්ෂක පාඨමාලා
- ශිෂ්‍යභට කණිෂ්ඨ නායකත්ව පාඨමාලාව - කෝප්‍රල්වරුන් සඳහා
- තූර්යවාදන මෙහෙයවන්නා සහ බියුගල් නලාකරු පුහුණු පාඨමාලාව- තූර්යවාදන ඛණ්ඩවල සැරයන්වරුන් සහ බියුගල් නලාකරුවන් සඳහා




කණිෂ්ඨ ශිෂ්‍යභටයින් සඳහා

- නායකත්ව පාඨමාලාව - සැරයන්වරුන් හා කෝප්‍රල්වරුන් සඳහා නායකත්ව පාඨමාලා අදියර කිහිපයක් යටතේ බලඇණි මට්ටමින් සංවිධානය කරයි.

## ශිෂ්‍යභටයාගේ කාර්ය භාරය

ශිෂ්‍යභටයෙකු ලෙස

- පාසල තුළ විනයගරුකව කටයුතු කිරීම.
- පාසලේ සහ ශිෂ්‍යභට බලකායේ කීර්තිනාමය හා ගෞරවය ඉහල නැංවීම සඳහා දායක වීම.
- සෑමවිටම නිවැරදි කාර්යශූර නායකත්වයක් පවත්වාගෙන යාම.
- තම පාසලේ අනෙකුත් ශිෂ්‍යයන්ට ආදර්ශවත් වන අයුරින් කටයුතු කිරීම.
- තම දක්‍ෂතා හා අරමුණු සාර්ථක කර ගැනීම.
- බලකායේ විෂය මාර්ගෝපදේශයට අනුව හොඳින් පුහුණු වීම.
- තමන්ගේ චරිතය තුළ ශිෂ්‍යභටභාවය වර්ධනය කර ගැනීම.
- සමාජ හිතකාමී, දෑ හිතකාමී පුද්ගලයෙකු වීම.
- සමාජ විරෝධි ක්‍රියා පිටුදකිමින් ඒවායින් තම සහෝදර පාසල් ශිෂ්‍යයින් මුදවා ගැනීමට කටයුතු කිරීම.
- "සුදානම් නොවී නොසිටිනු" යන බලකායේ ආදර්ශ පාඨයට අනුව කටයුතු කිරීම.

පුරවැසියෙකු ලෙස

- මව්බිමට ආදරය කරන, මව්බිම සුරකින, මව්බිමට ප්‍රයෝජනවත්, මව්බිම ගොඩනගන පුරවැසියෙකු ලෙස කටයුතු කිරීම.
- විනයගරුක, නීතිගරුක හා සමාජ හිතකාමී පුරවැසියෙකු වීම.
- ජාතියේ සේවය සඳහා යෙදවිය හැකි පුරවැසියෙකු වීම.
- ඕනෑම ජීවන පැවැත්මකට නායකත්වය දිය හැකි පිරිපුන් තරුණ, තරුණියන් වීම.
- සමාජ විරෝධී ආකල්ප දරන්නන්, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් නිවැරදි මඟට ගනිමින් පරමාදර්ශී ලෙස කටයුතු කිරීම.
- පෞද්ගලිකව හා කණ්ඩායමක් වශයෙන් මහජන සේවයට කැපවීම.
- කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම, තම අරමුණු කරා ළඟාවීම හා රටේ සංවර්ධනයට දායකවීම සඳහා ඉදිරිපත් වීම.

## ශිෂ්‍යභට කටයුතු තුළින් ලැබෙන ප්‍රතිලාභ

**ශිෂ්‍යභට බාලක/බාලිකාවන් සඳහා ලැබෙන ප්‍රතිලාභ**

- අත්දැකීම් තුළින් නායකත්වය ගෙන කටයුතු කිරීමේ හැකියාව ලබා ගැනීම.
- කාල කළමනාකරණයෙන් යුතුව සාර්ථකව කාර්යයක් නිම කිරීමේ හැකියාව ලබා ගැනීම.
- වාර්ෂිකව ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, පකිස්ථානය යන රටවල සංචාර සඳහා ශිෂ්‍යභට බාලක/බාලිකාවන්ට ලැබෙන අවස්ථාව මගින් අත්දැකීම් ලබා ගැනීම.
- සම්මුඛ පරීක්ෂණ සඳහා සාර්ථකව මුහුණ දීමට හැකියාව ලබා ගැනීම.
- විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී විශේෂ දක්ෂතා වලට අදාල ලකුණු උපයාගත හැකිවීම.
- අධ්‍යාපන විද්‍යාපීඨ සම්මුඛ පරීක්ෂණ සඳහා අමතර ලකුණු උපයාගත හැකිවීම.
- පාසල් තූර්යවාදන තරගාවලිය සඳහා ජාතික තලයේ පැවැත්වෙන එකම තරගාවලියට සහභාගිවී දක්ෂතා දැක්වීමට අවස්ථාව උදාවීම.
- ත්‍රිවිධ හමුදාවන්ට සහ ශ්‍රී ලංකා පොලිසියට බැඳී සේවය කිරීමට අවස්ථාව ලබා ගත හැකිවීම.
- අභියෝගාත්මක ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව සහභාගිවීමට අවස්ථාව ලැබීම.
- විනයගරුක බව, නිවැරදි දැක්ම, කාර්යක්ෂම බව හා ක්‍රමවත්ව කටයුතු කිරීමේ හැකියාව ලබා ගැනීම.
- අභියෝග වලට මුහුණදෙමින් තම ජීවන අරමුණු ජයග්‍රහණ ලබා ගත හැකිවීම.
- ලිපි ලිවීම, ලේඛන පවත්වා ගැනීම, තම බඩුබාහිරාදිය රැක ගැනීම, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව නිවැරදි භෝජන පිළිවෙත් සහ සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වීමේ හැකියාව ලබා ගැනීම.
- නායකත්වය හුරුවෙමින් තම අනුගාමිකයින් නිසි මග රැගෙන යාමේ හැකියාව ලබා ගැනීම.
- ජාතික නිදහස් දින පෙළපාලියට සහභාගිවීමට අවස්ථාව ලැබීම.

⋆ බලකාය වෙත ජනාධිපති වර්ණ හා බලකා වර්ණ හිමිගැන්වීමත් සමග කාර්මික විද්‍යාල, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, අධ්‍යාපන විද්‍යාපීඨ, ඇතුලු උසස් අධ්‍යාපන ආයතන සඳහා නියමිත සිසුන් සංඛ්‍යාවක් ජාතික ශිෂ්‍යභට බලකාය වෙතින් බඳවා ගැනීමට අවස්ථාව හිමිව ඇත.

**ශිෂ්‍යභට සැරයන් වරයෙකුට ලැබෙන ප්‍රතිලාභ**

- ශිෂ්‍යභට, ලාන්ස් කෝප්‍රල්, කෝප්‍රල් නිළ දරමින් ක්‍රමානුකූලව නායකත්වයට අවශ්‍ය ගුණාංග පුහුණුවීමෙන් සැරයන්වරයෙකු බවට පත්ව තම නායකත්වය යටතේ කණිෂ්ඨයින් මෙහෙයවීම.
- පාසල තුළ පිළිගැනීමක් ඇති නායකයකු බවට පත් වීම.
- ලබා ගත් නායකත්ව පුහුණුව තුළින් අනාගත අභියෝගයන්ට මුහුණදීමේ හැකියාව ලබා ගැනීම.

**පාසල තුළ ශිෂ්‍යභට කටයුතු පවත්වාගෙන යාමේ දී පාසලට ලැබෙන ප්‍රතිලාභ**

- පාසලේ අභිමානයට රුකුලක් වීම.
- සාමාන්‍ය පාසල් සිසුවකු ඉදිරිපත් නොවන ක්‍රියාකාරකම් සඳහා පුහුණු ශිෂ්‍යභටයින් ඉදිරිපත් වීම.
- සම්මාන පෙළපාලි පවත්වමින් ක්‍රීඩා උත්සවය අලංකාර කිරීම සඳහා, වෙනත් උත්සව අවස්ථාවන් අලංකාරවත් කිරීම සඳහා ප්‍රමුඛ දායකත්වය ලබා දීම.
- නායකත්වය නිවැරදිව හසුරුවන සිසුන් පිරිසක් බිහිවීම.

**ශිෂ්‍යභට සේවා ඇගයීම් සහතිකය**

වසර තුනකට නොඅඩු සේවා කාලයක් හා නොකැළැල් චරිතයක් ඇති ශිෂ්‍යභට/ භටවියකට තමන්ගේ උසස් අධ්‍යාපනය හෝ වෙනත් අවශ්‍යතාවයන් සඳහා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂතුමා විසින් සහතික කරන ලද සේවා ඇගයීම් සහතිකයක් ප්‍රදානය කරනු ලබයි

**ශිෂ්‍යභට අවසන් සහතිකය**

සෑම ජ්‍යෙෂ්ඨ ආරක්ෂක, පොලිස්, තූර්යවාදන ශිෂ්‍යභට / භටවියකටම තම පාසල් අධ්‍යාපන කටයුතු අවසන් කලපසු ශිෂ්‍යභට අවසන් සහතිකය ලබාගත හැක. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට අවසන් සහතිකය පහත සඳහන් පරිදි ශ්‍රේණිගත කෙරේ.

A ශ්‍රේණියේ සහතිකය - අති විශිෂ්ඨ මට්ටම (රන් පැහැති දිය සලකුණ)
B ශ්‍රේණියේ සහතිකය - විශිෂ්ඨ මට්ටම (රිදී පැහැති දිය සලකුණ)
C ශ්‍රේණියේ සහතිකය - කුසලතා මට්ටම (ලෝකඩ පැහැති දිය සලකුණ)
D ශ්‍රේණියේ සහතිකය - සහභාගීත්ව මට්ටම

## <u>ජාතික ශිෂ්‍යභට බලකායේ නිලධාරීන්</u>


ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු සේවය, ගුරු උපදේශක සේවය, ගුරු අධ්‍යාපන සේවය, විදුහල්පති සේවය, අධ්‍යාපන පරිපාලන සේවයන්හි නියුතු නිලධාරින් ජාතික ශිෂ්‍යභට බලකායේ නිලධාරි/ නිලධාරිනින් ලෙස කටයුතු කරයි.

### <u>නිලධාරි / නිලධාරිනීන් බඳවා ගැනීම</u>

අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 35 ට නොවැඩි, යහපත් සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වන ගුරුසේවය, ගුරු උපදේශක සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, විදුහල්පති සේවය, අධ්‍යාපන පරිපාලන සේවයන්හි නියුතු නිලධාරි/ නිලධාරිනින් ජාතික ශිෂ්‍යභට බලකායට බැඳීමට සුදුසුකම් ලබයි. ජාතික ශිෂ්‍යභට බලකාය වෙත බඳවාගනු ලබන අයවලුන් ආධුනික නිලධාරි පුහුණු පාඨමාලාවකට සහභාගිවී ආධුනික නිලධාරියෙකු ලෙස බලකායට එක්විය හැක. ඉන් අනතුරුව පවත්වන ලද පරීක්ෂණයකින් සමත්වන අයවලුන් ආධුනික නිලධාරීන් ලෙස බඳවා ගෙන වසරක කාර්යක්ෂම සේවා කාලසීමාවකින් අනතුරුව දෙවන ලුතිනන් වරයකු ලෙස ජනාධිපතිතුමා විසින් අධිකාරියට පත් කර ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කරයි.
තම නිලයේ නියමිත කාලවකවානු සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා අවසානයේදී නිල උසස්වීම් පරීක්ෂණ වලින් සමත්ව තමාට හිමි ඊලඟ නිලයට උසස්වීම් ලබාගත හැක.

### <u>නිලධාරී නිල ධුරාවලිය</u>

පාසල් තුළ ශිෂ්‍යභට කටයුතු සිදුකිරීම සහ සක්‍රීය සේවා රාජකාරිවල නියුක්ත වෙමින් නිසි කාලවකවානු වලදී නිල උසස් කිරීමේ පරීක්ෂණ වලින් සමත්ව පහත සඳහන් නිල උසස්වීම් ලබා ගත හැක.



## නිලධාරීන් සඳහා වූ පාඨමාලා

ශිෂ්‍යභටයින්ගේ ආසන්නතම පුහුණුකරුවා වන්නේ බලකායේ නිලධාරීන් ය. ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා පහත දැක්වෙන පාඨමාලාවන් සංවිධානය කෙරේ.

- තරුණ නිලධාරි පාඨමාලාව - 2/ලුතිනන්, ලුතිනන් නිලයේ නිලධාරීන් සඳහා.
- කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - කපිතන්, මේජර් නිලයේ නිලධාරීන් සඳහා.
- විධායක අධිකාරි/පුහුණුවීම්භාර නිලධාරි සංස්කරණ පාඨමාලාව - සියළුම විධායක අධිකාරි/පුහුණුවීම් භාර නිලධාරි සඳහා
- ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ සංස්කරණ පාඨමාලාව- අණදෙන නිලධාරීන් සඳහා
- මාණ්ඩලික නිලධාරි සංස්කරණ පාඨමාලාව - සියළුම මාණ්ඩලික නිලධාරීන් සඳහා




### ඛණ්ඩ භාර නිලධාරියෙකුගෙන් පාසලට ඇති ප්‍රයෝජන

- පාසලක විනය හා පරිපාලනයට යොදාගත හැකි සම්පත් දායකයකු වීම.
- තම පාසලේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා මනා දැක්මක් සහිතව වෘත්තිය මාර්ගෝපදේශකයකු ලෙස කටයුතු කිරීම.
- වගකීමක් සහිතව කිසියම් කාර්යයක් භාරදීමට හැකි පුද්ගලයෙකු වීම.
- තරඟකාරිත්වය සඳහා නිසි මගපෙන්වීමක් සහිතව සිසුන් පුහුණු කරවීමට අවශ්‍ය පාලනමය කටයුතු සිදු කිරීම.
- පාසලට ජයග්‍රහණ ගෙන ඒමට කටයුතු කිරීම තුළින් අභිමානයක් ඇති කිරීම.
- ක්‍රීඩා උත්සව හා ආචාර පෙළපාලි ඇතුළු සියළු උත්සව අවස්ථාවන් වලදී පැවරෙන රාජකාරීන් නිසි ලෙස ඉටු කිරීම.

### ශිෂ්‍යභට කටයුතු පවත්වාගෙන යාමේ දී යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ලේඛණ

- ශිෂ්‍යභට ඛණ්ඩ භාර නිලධාරීගේ ලොග් පොත
- ඛණ්ඩ නාම ලේඛණය
- ලියාපදිංචි නාම ලේඛණය
- පුහුණුවීම් සඳහා පැමිණීමේ ලේඛණය
- ඒ ඒ නිලයන් සඳහා රාජකාරී පැවරුම
- අධීක්ෂණ සටහන් පොත
- වාර්ෂික, මාසික සැලසුම
- සමුහ ඡායාරූප හා විශේෂ අවස්ථා ඡායාරූප එකතුව

### ශිෂ්‍යභට ඛණ්ඩ ලියාපදිංචි කිරීම

ශිෂ්‍යභට බලකායේ ලියාපදිංචි විය හැකි ශිෂ්‍යභට ඛණ්ඩ වර්ග 4 කි.

අ. ආරක්ෂක ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට (බාලක / බාලිකා)
ආ. තූර්යවාදන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට (බාලක / බාලිකා)
ඇ. පොලිස් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට (බාලක / බාලිකා)
ඈ. කණිෂ්ඨ ශිෂ්‍යභට (බාලක / බාලිකා)

**ලියාපදිංචිය සඳහා සැපිරිය යුතු අවශ්‍යතා**

ඕනෑම පාසලක ශිෂ්‍යභට බණ්ඩයක් පිහිටුවීම හා ලියාපදිංචි කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලීමට හැකි විය යුතුය.

අ. විදුහල්පති අධීක්ෂණය යටතේ විධිමත් පරිදි බණ්ඩභාර ගුරුභවතෙකු/බණ්ඩභාර නිලධාරියෙකු වගකීම් දැරිය යුතුය.

ආ. පාසල තුළ ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරිලත් නිලධාරියෙකු වූ ගුරුභවතෙකු සේවය කරන්නේ නම් ඔහු/ඇය බණ්ඩභාර නිලධාරියා ලෙස අනිවාර්යෙන් පත්කළ යුතුය.

ඇ. පුහුණු කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ක්‍රීඩා පිටියක් හෝ එවැනි භූමියක් තිබිය යුතු ය.

ඇ. ශිෂ්‍යභට බණ්ඩය සහ බණ්ඩභාර නිළධාරී සඳහා පාසලතුල ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතු ය.

ඇ. තූර්යවාදන බණ්ඩ සඳහා නියමිත සංයුතියට අනුව සංගීත භාණ්ඩ ප්‍රමාණවත් පරිදි සපයා දීමට හා නිසි පරිදි නඩත්තු කිරීමට හැකි විය යුතු ය.

ඉ. තූර්යවාදන බණ්ඩ පුහුණුවීම සඳහා සංගීතය පිළිබඳ දැනුම ඇති ගුරුභවතෙකු හෝ උපදේශකයෙකු යොදවා ගැනීමට හැකි විය යුතු ය.

**ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය**

ශිෂ්‍යභට බණ්ඩ එකක් හෝ කිහිපයක් ස්ථාපිත කිරීමට අදහස් කරන පාසලක විදුහල්පති විසින් පාසල අයත් බල ප්‍රදේශයේ අණදෙන නිලධාරී වෙතින් ඒ සඳහා වූ අයදුම්පත්‍රයක් ලබාගෙන නිසි පරිදි සම්පූර්ණ කොට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නිර්දේශය ද සහිතව අණදෙන නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත්‍රය ලැබීමෙන් පසු දක්වා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව හා පවතින සම්පත් පිළිබඳ සනාථ කර ගැනීමෙන් අනතුරුව ලියාපදිංචි කිරීම සඳහා මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම සිදු වේ.

බණ්ඩයක් ලියාපදිංචිය සඳහා ජාතික ශිෂ්‍යභට බලකා අධ්‍යක්ෂගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එම බණ්ඩය සඳහා ලියාපදිංචි අංකයක් ලබාදී ශිෂ්‍යභට බණ්ඩය පවත්වාගෙන යාම සඳහා පාසල වෙත බලපත්‍රයක් නිකුත් කරයි.

එලෙස ලියාපදිංචි කරන ලද ශිෂ්‍යභට බණ්ඩයකට ලියාපදිංචි කළ දිනයේ සිට බණ්ඩය සඳහා ශිෂ්‍යභටයින් බඳවා ගැනීමට හා පුහුණු කිරීමට හැකිවන්නේ ය.

<u>විමසීම්</u>

ලිපිනය :- මූලස්ථානය, ජාතික ශිෂ්‍යභට බලකාය, අංක 15, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල.
දුරකථන අංකය :- 0112815346 - පුහුණු අංශය

විද්‍යුත් ලිපිනය :- nccbtbranch@gmail.com
ncchq.lk@gmail.com
වෙබ් අඩවිය :- cadet.gov.lk

සංස්කරණය :-

Colonel A A G Abeysinghe ( Brigadier Training - NCC HQ )
Colonel Chandrika Rupasinghe ( Girls Cadet Coordinator - Training Branch - NCC HQ )
Lt Col K S Samanpriya ( SO I - Training Branch - NCC HQ )

## 2.2 II. ST' JOHN AMBULANCE - ශාන්ත ජෝන් ගිලන් රථ සේවය (1906)

**අපගේ ප්‍රධාන තේමාව**

"For the service of mankind"- "මානව සංහතියේ සේවය උදෙසා "

**අපගේ ප්‍රධාන ක්ෂේත්‍රයන්**

- ප්‍රථමාධාර සහ සෞඛ්‍යය ආශ්‍රිත පුහුණුව සහ සේවා සැපයීම.
- කිරි සහ කැඩෙට් වැඩසටහන් තුළින් ළමාවියට නිසි මග පෙන්වීම.
- වැඩිහිටි වැඩසටහන් තුළින් පරාර්ථකාමිත්වය සහ මනුෂිකත්වය අවධි කරවීම.
- ශාන්ත ජෝන් ප්‍රවීණයන්ගේ වැඩසටහන මගින් කළ සේවාවන් ඇගයීම.

**අපගේ වටිනාකම්**

- සමානාත්මතාවය, සාධාරණත්වය, සහජීවනය හා විනිවිදභාවය පවත්වා ගැනීම.
- ළමා අපචාර, දූෂණ ක්‍රියා, සමාජ අපචාර සහ ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීම.
- හරිත ලොවක් සංකල්පය පිළිගැනීම සහ අනුගත වීම.

St John Sri Lanka - Values ශාන්ත ජෝන් ශ්‍රී ලංකා - පිළිගැනීම්

Humanity - මානුෂිකත්වය Co existence - සහජීවනය

Equality - සමානාත්මතාවය Transparency - විනිවිදභාවය

Green World - හරිත ලොවක් Excellence - විශිෂ්ඨත්වය

St John Sri Lanka - Rejects ශාන්ත ජෝන් ශ්‍රී ලංකා - ප්‍රතික්ෂේප

Child Abuse - ළමා අපචාර Corruption - දූෂණය Violence - ප්‍රචණ්ඩත්වය

Antisocial - සමාජ විරෝධී බව Racism - ජාතික අසමගිය Selfishness - ආත්මාර්ථකාමීත්වය

(St John Child friendly) Child safe policy - ශාන්ත ජෝන් ළමා හිතකාමි සහ ළමා ආරක්ෂාකාරි ප්‍රතිපත්තියක් යටතේ අප ක්‍රියා කරන්නෙමු. ඒ අනුව අප ආයතනය ළමා හිංසනය තරයේම ප්‍රතික්ෂේප කරන අතර අපගේ සෑම වැඩසටහනක් ම සැලසුම් කර ඇත්තේ ළමා පරපුරට මානසික හෝ කායික වශයෙන් අනිසි පීඩාවන් ඇති නොවන ආකාරයට ය.සියල්ල දරුවන්ගේ යහපත උදෙසා ය.

**අපගේ දැක්ම**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ප්‍රථමාධාර පුහුණු සංවිධානය වීමත්, අපදා තත්වයන්හිදී හදිසි සහන සහ පූර්ව ප්‍රතිකාර සේවා සැපයීමේ ප්‍රමුඛයා වීමත්, විශිෂ්ට වූ වැඩසටහන් තුලින් ළමා පරපුර යහපත් පුරවැසියන් බවට පත් කිරීමේ ප්‍රමුඛයා වීමත් අපගේ දැක්ම වේ.

**අපගේ මෙහෙවර**

මානව සංහතියේ සේවය උදෙසා යන්න ආදර්ශ පාඨය වූ අපගේ මෙහෙවර වන්නේ ප්‍රථමාධාර පුහුණුව හා ප්‍රජා සේවය ලබාදෙමින් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, ජාතිය ආගම හෝ වෙනත් භේද නොසලකා ප්‍රජාවගේ සෞඛ්‍ය හා ආරක්ෂාව නංවාලීමත්, කාලෝචිත වැඩසටහන් ළමා පරපුරට ලබා දෙමින්, ඔවුන්ගේ ජීවිත අති සාර්ථක තත්වයකට පත් කිරීමත් වේ.

ශාන්ත ජෝන් ගිලන් සේවයේ මුලික ප්‍රථමාධාර පුහුණු කිරීමේ කටයුතු ආරම්භ කල අප සංවිධානය වර්තමානය වන විට විවිධ සමාජ ගැටළු හදුනාගනිමින් ඒවා වලක්වා ගැනීමට ගත හැකි පියවර වශයෙන් කාලෝචිත වූ සාර්ථක වැඩසටහන් හඳුන්වා දී ඇත්තෙමු. අපගේ ප්‍රධාන ඉලක්කය වන්නේ ළමා පරපුරයි. ඔවුන් වෙනුවෙන් වැඩසටහන් හදුන්වාදීමට අප අධ්‍යාපන අමාත්‍යාංශය සමග අත්වැල් බැදගෙන ඉතා සමීපව කටයුතු කරන්නෙමු. අපගේ වැඩසටහන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල අනුමැතියද ලබා දී ඇත.

## ST' JOHN HISTORY - ශාන්ත ජෝන් ඉතිහාසය

Humanity Based Beginning - මානුෂිකත්වය පෙරදැරි කර ගත් ආරම්භයක්

St John Ambulance Brigade (Definitions)

Ambulance - The Term ambulance comes from the Latin word "ambulare" as meaning "to walk or move about' which is a reference to early medical care where patients were moved by lifting or wheeling'

ගිලන් රථය - ගිලන් රථය යන්නෙන් වාහනයක් අර්ථ වුවද එය වාහන වලින් සපයන සේවය නොව රෝගියෙකු වෙනුවෙන් කණ්ඩායමක් වශයෙන් කරනු ලබන මූලික සත්කාරයයි.

Brigade - a group of people who have something in common" especially an enthusiasm for a particular subject'

ස්ව කැමැත්තෙන් ශාන්ත ජෝන් ආයතනයේ නීතිරීති වලට අනුකූලව කටයුතු කරන බවට ලිඛිතව හෝ වාචිකව පොරොන්දු වෙමින් ආයතනයේ නිළ ඇඳුම පැළඳ මානව සංහතියේ සේවය උදෙසා ස්වේච්චාවෙන් කැප වී කටයුතු කරන පුද්ගලයන්.

වයස 06-11 කිට් සාමාජික, 12 - 18 කැඩෙට් සාමාජික, 19 - 65 වැඩිහිටි සාමාජික, 65 පසු ප්‍රවීණ සාමාජික

Volunteer - a person who does something" especially helping other people" willingly and without being forced or paid to do it'

ස්වේච්චා සේවය - අනුන්ගේ යහපත වෙනුවෙන් වැටුපක් හෝ බලපෑමක් නිසා නොව ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වී කටයුතු කරන පුද්ගලයන් ස්වේච්චා සේවකයන් ලෙස හැඳින්වේ.

**හැඳින්වීම**

ශාන්ත ජෝන් ගිලන් සේවය සෑම විටම උත්සාහ කරනුයේ ප්‍රථමාධාර පිළිබඳව ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක සේවාවක් සහ ගුණාත්මක පුහුණුවක් ලබාදීමටයි. අපගේ සංවිධානය ශ්‍රී ලංකාව තුළ වසර 115 වඩා වැඩි ඉතිහාසයකට උරුමකම් කියන ස්වේච්ඡා ආයතනයකි. දීර්ඝ කාලයක් තිස්සේ ලද අත්දැකීම් තුලින් පරිණත වූ අපගේ සාමාජික සාමාජිකාවන් සහ නිලධාරීන් තම වටිනා කාලය, ශ්‍රමය ස්වේච්ඡාවෙන් ළමා පරපුර සහ සමස්ථ සාමාජයම වෙනුවෙන් කැප කරමින් සිටිති. අප ආයතනයේ පවතින සුවිශේෂිභාවය එයයි.

ශ්‍රී ලංකාව තුළ මුල්ම අඩිතාලම දැමුවේ වර්ෂ 1906 දීය. එය කොළඹ, ගාල්ල, යාපනයට සීමා විය. මෙහි විශේෂත්වය වන්නේ මුලින් එය සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, ගිනි නිවන හමුදාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල යන ආයතන තුළ පමණක් ආරම්භ වීමයි. මුලින් වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක වුවත් පසුව කිටී, ශිෂ්‍ය භට, වැඩිහිටි වශයෙන් පුළුල් පරාසයකත් දීප ව්‍යාප්ත වී ඇත. පසුව එය රජයේ හා පුද්ගලික ආයතන වලත් පාසල් පද්ධති තුළත් ක්‍රියාත්මක විය. දැනට ශ්‍රී ලංකාවේ ශාන්ත ජෝන් ගිලන් සේවයේ කටයුතු ස්වාධීනව පවත්වා ගෙන යන අතර අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන ද ශ්‍රී ලංකාව තුළින්ම සොයා ගත යුතුව ඇත.

## ජාත්‍යන්තර සංවිධානයේ ඉතිහාසය

වසර 900 කට ඉහත දී  ජෙරුසලමේ ශාන්ත මරියා කන්‍යාරාමයේ අසනීප වූ බැතිමතුන් රැක බලා ගැනීමට කුඩා රෝහලක් ලෙස ආරම්භ විය. එය ජෝන් ශාන්තුවරයා වෙනුවෙන් කැප කරන ලද පල්ලියකට අනුබද්ධව පිහිටා තිබුනි. පසුව එය ශාන්ත ජෝන් පූජකවරුන් විසින් හමුදාමය කාර්යභාරයක් සඳහා පවත්වාගෙන යන ලදී. 12 වන ශත වර්ෂයේ මැද භාගයේ දී ශාන්ත ජෝන් පර්ෂදය ලෙස මූලාරම්භයක් ගන්නා ලදී.

පසුව එය යුරෝපය පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. 1140 පමණ වන විට එය බ්‍රිතාන්‍ය නයිට්වරුන්  විසින් ඔවුන්ගේ මූලස්ථානය ලන්ඩනයේ ක්ලැ(ර්)කල්වෙල් හි පිහිටුවා ගන්නා ලදී. VIII (8 වන) හෙන්රි රජුගේ කාලය දක්වා ශාන්ත ජෝන් පර්ෂදය සාර්ථක ලෙස ක්‍රියාත්මක විය.

1978 දී මෝල්ටාවේ පිහිටි සිය මූලස්ථානය අහිමි වීමෙන් දුෂ්කර කාල පරිච්ඡේදයක් පසු කිරීමට සිදුවිය. දීර්ඝ කාලීන පසුබෑමකින් පසුව එහි සාමාජිකයන් පිරිසක් විසින් ගනු ලැබූ තීරණයකට අනුව බ්‍රිතාන්‍ය ශාඛාව යළි ගොඩනැගීමට තීන්දු විය.

එය 1877 දී ඔවුන් විසින් ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව ලෙස ආරම්භ කරන ලදී. මේ වකවානුව වන විට බ්‍රිතාන්‍ය කාර්මික විප්ලවය උච්ඡ ස්ථානයක පැවතුණි. වැඩ පොළෙහි කම්හලේ කටයුතු කිරීම අම්හිරි හා අනතුරුදායක වූ අතර, සේවකයන් නිතරම අනතුරු වලට ගොදුරු විය. එහෙත් ඔවුන්ට ප්‍රතිකාර කිරීමට පුහුණු වූ කිසිවෙක් නොසිටියේ ය.

මෙයට පිළිමයක් ලෙස ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව මඟින් ප්‍රථමාධාර පංති පැවැත්වීම සිදුවිය. ඒ හා සම්බන්ධ පොතපත මුද්‍රණය කිරීමත් සිදු කරන ලදී. ප්‍රථමාධාර සහතික සඳහා වූ විභාග ද පවත්වන ලදී. මේ සඳහා අවශ්‍ය උපකරණ සපයා ගන්නා ලද්දේ පර්ෂද මූලස්ථානය ලෙස ක්‍රියාත්මක වූ ශාන්ත ජෝන් දොරටුව (St John Gate) ලෙස හැඳින්වූ ස්ථානයකි.

මේ ආකාරයට වැඩි කලක් ඉක්ම යාමට පෙර රට පුරා දහස් ගණන් ජනතාව සිය ප්‍රථමාධාර පුහුණුව ලබාගත් අතර, ඉන් බොහෝ දෙනෙකුට අවශ්‍ය වූයේ සිය පුහුණුව මහජනයාගේ ප්‍රයෝජනය පිණිස යොදා ගැනීමටයි. මුලින් ගිලන් රථ සේනාංකය නම් වූ කණ්ඩායමක් ලෙස ක්‍රියා කළේ ය.

දෙවන ලෝක යුද්ධ සමය අවසානයත් සමඟම ස්කොට්ලන්තය, වේල්සය, දකුණු අප්‍රිකාව, නවසීලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව යන රටවල්වල ශාන්ත ජෝන් වෙනම පූජාරාමයක් ලෙස පිළිගෙන ඇත. පසුව 1996 දී එයට ඇමෙරිකා එක්සත් ජනපදයද එක්විය.

1920 දී ශාන්ත ජෝන් ගිලන් රථ සේවයේ වයස අවුරුදු 11-18 අතර දරුවන් සඳහා කැඩෙට් වැඩසටහන අරඹන ලදී. 1958 දී ආයතන තුනක එකතුවෙන් පළමුවන ප්‍රථමාධාර අත්පොත නිකුත් කරන ලදී. ශාන්ත ජෝන් බැජර් (කිටි) ජාත්‍යන්තර වැඩසටහන ආරම්භ වූයේ 1987 දීය.

1999 ඔක්තෝබර් මස පර්ෂද ව්‍යවස්ථාවේ ප්‍රධාන සංශෝධනයේ කොටසක් ලෙස අනෙක් රටවල් හතේ පූජාරාම හත සමඟ එක්ව සහයෝගයෙන් කටයුතු කිරීමට එංගලන්ත පූජාරාමය පිහිටුවා ගන්නා ලදි. පූජාරාම හතේ ප්‍රධාන නිලධාරීන් එක්ව පර්ෂදයේ උත්තරීතර සභාව ලෙස ක්‍රියා කරයි. පොදු රාජ්‍ය මණ්ඩල රටවල් 30 ක පමණ ජාතික ශාන්ත ජෝන් සභාව (National St John Council) මඟින් ක්‍රියා කරන සභා පිහිටුවා ඇත.

මුලින් මව් සංගමයෙන් සෘජු ආධාර උපයා ලබමින් ක්‍රියාත්මක වූ ශාන්ත ජෝන් ගිලන් සේවයේ කටයුතු රටවල් නිදහස ලැබීමත් සමඟ ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථා ලබා දෙන ලදී.

වර්තමානයේ ශාන්ත ජෝන් ගිලන් සේවය ස්වාධීනව කටයුතු කරන අතර අවශ්‍ය සියළුම මූල්‍ය ප්‍රතිපාදන සොයා ගනු ලබන්නේ අපගේ පුහුණු කිරීම් කටයුතු වලිනි. එසේම අප ජාත්‍යන්තර මව් සංගමයේ නීතිරීති වලට අනුකූලව කටයුතු කරන බැවින් අපගේ සහතිකය සහ සාමාජිකත්වය එංගලන්තය ඇතුළු රටවල් 40ක පමණ සෘජුවම පිළි ගනිති.

**සංවිධාන ව්‍යුහය**

1. අධ්‍යක්ෂක මණ්ඩලය Board of Directors
2. ප්‍රධාන අණදෙන නිලධාරීතුමා
3. ප්‍රධාන කොමසාරිස්තුමා
4. ප්‍රධාන ශල්‍ය වෛද්‍ය/ හෙද ප්‍රධාන අධිකාරි
5. සහකාර කොමසාරිස්වරුන්
6. පළමු ශ්‍රේණිය ජාතික මූලස්ථාන මාණ්ඩලික නිලධාරීන්
7. පළාත් කොමසාරිස් /පළාත් ප්‍රධාන සැරයන් (ඝන සරඹ පෙලපාලි සඳහා)/ දෙවන ශ්‍රේණිය මාණ්ඩලික නිලධාරී - පළාත් ලේකම්/ පළාත් භාණ්ඩාගාරික/ පළාත් ගබඩා පාලක /පළාත් ප්‍රවාහන නිලධාරී/ පළාත් ශල්‍ය වෛද්‍ය /හෙද පළාත් නිලධාරීන්
8. දිස්ත්‍රික් කොමසාරිස්/ අතිරේක දිස්ත්‍රික් කොමසාරිස් / දිස්ත්‍රික් සභාපති/ දිස්ත්‍රික් ප්‍රධාන සැරයන් (ඝන සරඹ පෙලපාලි සඳහා) / මාණ්ඩලික නිලධාරි තුන්වන ශ්‍රේණිය - දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් භාණ්ඩාගාරික / දිස්ත්‍රික් ගබඩා පාලක/ දිස්ත්‍රික් ප්‍රවාහන නිලධාරී/ දිස්ත්‍රික් ශල්‍ය වෛද්‍ය /හෙද දිස්ත්‍රික් නිලධාරී
9. සහකාර කොමසාරිස්/ මාණ්ඩලික නිලධාරී 4 වන ශ්‍රේණිය - ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය භාණ්ඩාගාරික/ ප්‍රාදේශීය ගබඩා පාලක/ ප්‍රාදේශීය ප්‍රවාහන නිලධාරී
10. සේනාංක අධිකාරි - 100 (සියයකට) අධික වැඩිහිටි සාමාජිකයන් සිටිය යුතුය)/ සේනාංක ප්‍රධාන සැරයන්( ඝන සරඹ පෙලපාලි සඳහා)/ සේනාංක ශල්‍ය වෛද්‍ය /හෙද සේනාංක නිලධාරීන්
11. කොට්ඨාස අධිකාරි - ශිෂ්‍ය සහ වැඩිහිටි( කොට්ඨාස 03 කට වැඩියෙන් ලියාපදිංචි වී සිටිය යුතු අතර සාමාජික සංඛ්‍යාව 48 කට වඩා වැඩි විය යුතුය)/ මාණ්ඩලික නිලධාරී පස්වන ශ්‍රේණිය - කොට්ඨාස ලේකම්/ කොට්ඨාස භාණ්ඩාගාරික /කොට්ඨාස ගබඩා පාලක/ ප්‍රවාහන නිලධාරී
12. කොට්ඨාස ශල්‍ය වෛද්‍ය/ වෛද්‍ය නිලධාරී/ හෙද කොට්ඨාස නිළධාරීන් /කිට් නායක /කොට්ඨාස නිළධාරීන් - ශිෂ්‍ය සහ වැඩිහිටි (එක් පාසලක කාර්ය මණ්ඩලය තුළ පත් කරනු ලබයි )/ ශිෂ්‍ය ශල්‍ය වෛද්‍ය
13. මාණ්ඩලික සැරයන් (නායකයා ලෙස පත් කරනු ලබයි - ශිෂ්‍ය සහ වැඩිහිටි)
14. සැරයන් (ශිෂ්‍ය නම් සාමාජික සංඛ්‍යාව 8 -24 ක් සහ වැඩිහිටි නම් සාමාජික සංඛ්‍යාව 12 - 24 ක්)
15. කෝප්‍රල් (ශිෂ්‍ය සාමාජික සංඛ්‍යාව 6ක් සහ එලෙසම වැඩිහිටි සාමාජික සංඛ්‍යාව)
16. සාමාජික

වලංගු නවතමම තොරතුරු සඳහා මූලස්ථානය හෝ දිස්ත්‍රික් කොමසාරිස් අමතන්න.
www.stjohsl.org වෙබ් අඩවියට පිවිසෙන්න.

**අප සංවිධානය ක්‍රියාත්මක කරන වැඩසටහන්**

1. උසස් ප්‍රථමාධාර පුහුණුව
2. සාත්තු සේවය - මූලික හා උසස් පාඨමාලාව.
3. නායකත්ව පුහුණුව
4. ජීවන කුසලතා ඔප් නැංවීමේ නේවාසික කඳවුරු.
5. ජීවිතාරක්ෂක පුහුණුව (ගිනි,වතුර)
6. පුද්ගල සංවර්ධනය හා වික්‍රමාන්විත ක්‍රියාකාරකම් පුහුණුව.
7. ගිලන් රථ ශිල්පීය පුහුණුව.
8. වාර්ෂික ජාතික කඳවුර.
9. රෝගී ප්‍රවාහන සේවය සහ ස්ථානීය පොරොත්තු සේවය

මෙයට අමතරව පාසල් මට්ටමින් එක් දින පුහුණු කඳවුරු, වාර්ෂික චාරිකා, ප්‍රථමාධාර පුනරීක්ෂණ කටයුතු ද සිදු කෙරේ. මේ සඳහා වෙනත් වාර්ෂික වැඩසටහන් ද ඇතුළත් වේ.

**<u>අප සංවිධානය මගින් ධනය හා ශ්‍රමය වැය කරමින් ඉටුකරන ජාතික රාජකාරි</u>**

1. කැලනිය ඇසළ පෙරහැර
2. ශ්‍රීපාද ප්‍රථමාධාර රාජකාරි
3. අනුරාධපුර පොසොන් උත්සවය
4. කතරගම ඇසළ උත්සවය සහ පාද යාත්‍රා
5. යාපනය නල්ලූර් කෝවිලේ වාර්ෂික උත්සවය
6. මන්නාරම මඩු මාතා මංගල්‍යය
7. මහනුවර දළදා පෙරහැර
8. කෝට්ටේ දළදා පෙරහැර
9. බෙල්ලන්විල ඇසළ පෙරහැර
10. ගංගාරාම නවම් මහා පෙරහැර

## St John Ambulance - Financial Regulation

### මූල්‍ය විනය - ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය

ශාන්ත ජෝන් ගිලන් සේවය දැඩි මූල්‍ය විනයක් පවත්වා ගනිමින් කටයුතු කරන ආයතනයකි. ප්‍රධාන වශයෙන් මූල්‍යමය කටයුතු සිදුවන්නේ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් පරිපාලනය කරනු ලබන ශ්‍රී ලංකා ශාන්ත ජෝන් සංගමය (ප්‍රධාන මූලස්ථානය) මගිනි. විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා සෑම වසරකදීම ඉදිරිපත් කිරීම අනිවාර්ය අංගයකි.

**දිස්ත්‍රික් කටයුතු** - සෑම දිස්ත්‍රික්කයක්ම අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් හරහා සියළුම මුදල් ගනුදෙනු සිදු කල යුතුය.
සෑම ලැබීමක් සඳහාම මූලස්ථානයෙන් ලබා දී ඇති කුවිතාන්සයක් නිකුත් කිරීම අනිවාර්ය වේ.
වෙනත් ආකාරයක රිසිට්පත් නිකුත් කිරීමට අවසර නොමැත.
දිස්ත්‍රික්ක මගින් විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා සෑම වසරකම නියම කරන දිනට පෙර මූලස්ථානයට යොමු කළ යුතුය.

**අය කිරීම්** - සියළුම පුහුණු කිරීම් සහ සේවාවන් සඳහා අයකළ හැකි මුදල් ප්‍රමාණයන් මූලස්ථානය මගින් ප්‍රසිද්ධියට පත් කර ඇති අතර සෑම වසරකම ජනවාරි 01 දාට සංශෝධිත අයකිරීම් ප්‍රසිද්ධ කරනු ලැබේ. අන්තර්ජාලය මගින් ලබා ගත හැකිය.


**මුදල් රැස්කිරීම්** - දිස්ත්‍රික් මට්ටමෙන් කොඩි දින හෝ වෙනත් එවැනි මුදල් රැස්කිරීම් සිදු කිරීමට අවසර නොමැති අතර යම් විශේෂිත කරුණක් මත මුදල් රැස්කිරීමක් කරන්නේ නම් ඒ සඳහා ප්‍රධාන කොමසාරිස්ගේ පූර්ණ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය. එසේම එම කටයුත්ත අවසන් වී සති 02ක් ඇතුලත අයවැය වාර්තාවක් මූලස්ථානයට ඉදිරිපත් කල යුතුය.

**මුදල් ගෙවීම්** - සියළුම ගෙවීම් නිර්දේශිත වවුචර් යොදා චෙක්පත් වලින් පමණක් සිදුකළ යුතුය.

**ලිපි ලේඛන** - මූල්‍යමය කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය පෝරම සහ වෙනත් ලේඛන දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇති අතර එම කටයුතු නිසි පරිදි ඉටු කිරීමට අදාළ දිස්ත්‍රික් කොමසාරිස් වග බලා ගත යුතුය. හැකිතාක් දුරට මෙම කටයුතු පරිගණක භාවිතයෙන් සිදු කළ යුතුය. රිසිට්පත් භාවිතා කළ ආකාරයේ සාරාංශයක් ඇතුළත් අදාළ ලේඛනය NHQ/DC/AC/RS/21/01 මාස 04 කට වරක් මූලස්ථානය වෙත යොමු කළ යුතුය. (District Common Receipt Usage Summary Sheet)

**විදේශ ආධාර** - විදේශ රටවල් සමඟ ගනුදෙනු කිරීමට කිසිම දිස්ත්‍රික්කයට හෝ නිලධාරියෙකුට අවසර නොමැති අතර සියළුම විදෙස් රටවල් සමඟ සන්නිවේදන කටයුතු සිදුවිය යුත්තේ ප්‍රධාන අණදෙන නිලධාරි මගිනි.

**දිස්ත්‍රික් කමිටුව** - මූල්‍ය කටයුතු පිළිබඳව මූලික වගකීම දිස්ත්‍රික් භාණ්ඩාගාරික වෙත පැවරිය යුතු අතර සියළුම අයවැය පිළිබඳව තීන්දු තීරණ දිස්ත්‍රික් කමිටු මගින් ගත යුතුය. එසේම දිස්ත්‍රික්ය සතු සියළුම උපකරණ සහ වෙනත් භාණ්ඩ වල ලැයිස්තුවක් (Inventory) පවත්වා ගෙන යා යුතු අතර වාර්ෂික වාර්තා සමඟ Inventory පිටපතක් මූලස්ථානය වෙත යොමු කළ යුතුය. දිස්ත්‍රික් කොමසාරිස් තනතුරු වෙනස් වන අවස්ථාවලදී නිසි පරිදි උපකරණ භාර දීම සහ භාර ගැනීම සිදු කර ඒ බව මූලස්ථානය වෙත වාර්තා කළ යුතුය.




## ST JOHN KITTY - ශාන්ත ජෝන් කිටි

Discipline) Humanity from the beginning - ආරම්භයේ සිටම විනය සහ මානුෂිකත්වය







**හැඳින්වීම**

ජාත්‍යන්තර ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාවේ බැජර් වැඩසටහන නමින් කුඩා දරුවන් වෙනුවෙන් පවත්වා ගෙන ගිය වැඩසටහන ආදර්ශයට ගනිමින්, 1990 දශකයේදී එවකට අණදෙන නිලධාරී ජී.ඒ. මහතාගේත්, කොළඹ සී.ඩබලිව්.ඩබලිව්. කන්නන්ගර විදුහලේ ආචාර්ණි අශෝක කුලසිංහ මහත්මියගේත්, මූලස්ථානයේ පුහුණු කිරීම් නිලධාරියෙකුව සිටි එස්.ඒ.පී. බෙනඩික්ට් මහතා ඇතුළු කණ්ඩායමකගේ මූලික උත්සාහයේ ප්‍රතිපලයක් ලෙස ශාන්ත ජෝන් කිටී වැඩසටහන ශ්‍රී ලංකාවේ ආරම්භ විය.

එලෙස ආරම්භ කළ වැඩසටහන මහනුවර, කුරුණෑගල, බදුල්ල, ගාල්ල වැනි ප්‍රදේශවලට ව්‍යාප්ත කරන ලද අතර පසුව එය ලංකාව පුරා ප්‍රචලිත වැඩසටහනක් බවට පත්විය. පසු කලකදී කිටී සහකාර කොමසාරිස් වශයෙන් කටයුතු කළ එම්. බී. ගොඩමුණේ මහතා විසින් කිටී වැඩසටහන දියුණු තත්වයකට ගෙන එන ලදී.

අරමුණ

- ජීවත්වීමට අවශ්‍ය මුදු කුසලතා ගොඩනැංවීම
- දරුවන් හට ප්‍රථමාධාර දැනුම ලබාදීම
- නායකත්ව හා සන්නිවේදන හැකියාව වර්ධනය
- මූලික යහපත් සෞඛ්‍ය පුරුදු පුහුණු කිරීම
- ස්වයං විනය සහ නීති ගරුක බව ගොඩනැංවීම
- මා හා අන් අයගේ ආරක්ෂාව තහවුරු කිරීම
- සාමුහිකත්වය හා ස්වයං පාලනය හුරුකරවීම
- සමතුලිත සහ නිරෝගී මනසක් ගොඩ නැංවීම
- සාම්ප්‍රදායික සිතුම් පැතුම්, ජීවන රටාව හුරු කිරීම හා අගය කිරීම
- පෞද්ගලික හැකියාවන්, දක්ෂතාවයන් වර්ධනය කිරීම හා අගය කිරීම
- පරිසර හිතකාමීත්වය සහ පරිසර රැක ගැනීමට හුරුකරවීම
- නිවැරදි ළමාවියකට මග පෙන්වීම තුළින් හරවත් නිරෝගි වැඩිහිටියන් නිර්මාණය කිරීම

**යහපත් සංකල්ප තුළින් යහපත් පුරවැසියන්**

යහපත් දේ ඇසෙන්නට, දකින්නට සහ අත්විඳින්නට අවශ්‍ය ක්‍රියාකාරකම් සහ පරිසර,ය කිටී වැඩසටහන තුළින් ලබාදීම මගින්, යහපත් ළමා මානසික සංකල්ප ගොඩ නැංවීම සහ එමගින් යහපත් පුරවැසියන් ශ්‍රීලාංකීය සමාජයට දායාද කිරීම.

මුළු ලොවම අද උත්සාහ ගන්නේ කුඩා දරුවන්ගේ මානසික සංකල්ප යහපත් ලෙස ගොඩනැංවීම තුළින් අනාගතයේ ඔවුන්ගේ ආකල්ප සහ ක්‍රියාකලාපයන් යහපත් කර ගැනීමටයි.

මෙම වැඩසටහන තවත් දැනුම ලබාදෙන තරඟ බිමක් නොකර, මානසික සහනය සහ විනයානුකූල ආශ්වාදයන් ලබමින්, ජීවත් වීමට අවශ්‍ය මෘදු කුසලතා ගොඩනගමින්, ස්ථාවරවූත් සාර්ථකවූත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පන්නරය ලබා දීමේ අත්තිවාරම නිර්මාණය කිරීම අපගේ බලාපොරොත්තුවයි.

අධ්‍යාපනයට තරමක් හෝ අකමැති විෂය පාදක වූ අධ්‍යාපනයට දුර්වලතා පෙන්වන දරුවන් හට මෙම වැඩසටහන වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. තරගකාරී අධ්‍යාපනය තුළින් ගොඩනැගෙන මානසික ආතතිය තරමක් හෝ අඩුකර ගැනීමට ද කිටී වැඩසටහන උපකාරී වනු ඇත.

දරුවන් හට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අතරතුර ළමාවියට නිවැරදි මඟ පෙන්වීමක් ලබා දිය යුතු ආකාරය පිළිබඳව දෙමව්පියන් දැනුවත් කර පෙළඹවීමට මෙම වැඩසටහන තුළින් අප උත්සහ කරන්නෙමු.

KITTY BADGES - **කිටී පදක්කම්**

විස්තර ඇතුළත් අත්පොතක් ලබාගත හැකි ය. www.stjohnsl.org මගින් ද ලබාගත හැකි ය.

1. First Aid Kitty ප්‍රථමාධාර කිටී
   - -හුස්ම ගැනීම
   - -ලේ ගැනීම හා පිළිස්සීම
   - -අස්ථි හා භග්න
   - -හදිසි අපදා

2. Sporty Kitty ක්‍රීඩාශීලී කිටී
   - නවීන සහ පැරණි ක්‍රීඩා
   - ක්‍රියාශීලී ක්‍රීඩා
   - කණ්ඩායම් කුසලතා
   - ජවන හා මලල ක්‍රීඩා

3. Hobbies Kitty විනෝදාංශ
   - නිර්මාණාත්මකව
   - ඉදිරිපත් කිරීම
   - පිටද දී කළ හැකි විනෝදාංශ

4. St John Kitty ශාන්ත ජෝන් ගිලන් රථ සේවය
   - මුල් යුගයේ තොරතුරු
   - එතෙර තොරතුරු
   - ගෘහස්ථ විනෝදාංශ

5. Safety Kitty ආරක්ෂක කිටී
   - නිවසේදී ආරක්ෂාව
   - මාර්ගයේදී ආරක්ෂාව
   - ජලයේදී ආරක්ෂාව
   - ආරක්ෂිත එළිමහන

6. Healthy Kitty සෞඛ්‍යය කිටී
   - ආහාර හා පෝෂණය
   - ඇඳුම් පැළඳුම් පවිත්‍රතාවය
   - පොදු පිරිසිදුකම
   - සෞඛ්‍ය සම්පන්නව සිටීම

7. Communication Kitty සන්නිවේදන කිටී
   - වාචික සන්නිවේදනය
   - ශ්‍රව්‍ය දෘශ්‍ය උපයෝගීතාවය
   - ලිඛිත සන්නිවේදනය
   - තාක්ෂණය සන්නිවේදනය

8. Resourceful Kitty සම්පත් පිරි කිටී
   - ගෙවතු වගාව
   - ස්වභාවධර්මය
   - පරිසරය
   - සාමාජීය සම්පත්

9. Caring Kitty රැකවරණය කිටී
   - වැඩිහිටියන් රැකබලාගැනීම
   - ළමයින් රැකබලාගැනීම
   - රෝගීන් රැකබලා ගැනීම
   - සුරතල් සතුන් රැක බලා ගැනීම

මෙම පදක්කම් වල ආවරණය කළ යුතු විෂය කරුණු හැකිතාක් දුරට ක්‍රියාකාරකම් මගින් සම්පූර්ණ කළ යුතුය අතර දරුවන් හට කිසිසේත්ම පීඩාකාරී වැඩසටහනක් නොවිය යුතුය. නිර්දේශිත සහභාගිත්වය සනාථ කිරීමේ ලේඛනය නඩත්තු කිරීමත්, කිටීයන්ට හැකියාවට උචිත පරිදි ලොග් සටහන් පොතක් පවත්වා ගෙන යාමත් ප්‍රමාණවත් වන අතර පදක්කම් සඳහා කිසිදු ආකාරයක විභාගයක් පැවැත්වීම නිර්දේශ කළ නොහැක.

ලිවීමේ කියවීමේ හැකියාව දුර්වල දරුවන්ට පවා කිටි වැඩසටහන සාර්ථකව කරගත හැකි වන පරිදි වැඩසටහන පවත්වාගෙන යාමට ගුරුවරයා දක්ෂ විය යුතුය. සෑම විෂයක් සඳහාම පදක්කමක් සහ විෂයන් 03 ක් සඳහා එක් සහතිකයක් බැගින් සහතික 03 ක් වසර 03 ක් තුළ දී ලබාගත හැකිය. කිටී පදක්කම් වල විෂය මාලාව අන්තර්ජාලයෙන් ලබාගත හැකිය. www.stjohnsl.org ST JOHN KITTY page - Syllabus

Super Kitty Award - සුපිරි කිටී සම්මානය

සුදුසුකම් (2021 ජනවාරි 01 සිට වලංගුය)

1. වසර තුනක සාමාජිකත්වය සම්පූර්ණ කර තිබීම
2. පදක්කම් නමය සාර්ථකව නිම කර තිබීම
3. එක්දින කඳවුරු දෙකකට සහභාගි වී තිබීම
4. නේවාසික කඳවුරු එකකට සහභාගි වී තිබීම
5. නියමිත පරිදි ලිපි ලේඛන මූලස්ථානයට යොමු කර තිබීම

පදක්කම් 09 නිම කිරීමෙන් පමණක් සුපිරි කිටී ලබාගත නොහැක. අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබිය යුතුය වසරක් තුළ දෙවතාවක් සුපිරි කිටී අයදුම්පත් කැඳවනු ලැබේ. මැයි (මැයි 15 ට පෙර) සහ නොවැම්බර් (නොවැම්බර් 15 ට පෙර) මාස වල දී අයදුම්පත් භාර ගෙන ජූලි සහ දෙසැම්බර් මාසවලදී සහතික නිකුත් කරනු ලැබේ.

**කිටී වැඩසටහනක් ආරම්භ කිරීම**

1. විදුහල්පති දැනුවත් කර අනුමැතිය මත සුදුසු ප්‍රාථමික අංශයේ ගුරුවරයෙකු හෝ වැඩි සංඛ්‍යාවක් තෝරා ගැනීම.
2. දරුවන් තෝරා ගැනීමට අපේක්ෂිත වසර වල (1 වසර සිට) දෙමව්පියන් රැස්වීමක් පවත්වා මෙම වැඩසටහනේ අරමුණ ක්‍රියාත්මක වන ආකාරයෙන් දැනුවත් කිරීම.

**දරුවන්ට ලැබෙන ප්‍රධාන ප්‍රයෝජන**

1. නිරෝගී මනසක් සහිත යහපත් හුරුපුරුදු වලින් පිරිපුන් පුරවැසියන් වීමට අවශ්‍ය මඟ පෙන්වීම සහ පුහුණුව ලැබීම.
2. ජීවත්වීමට අවශ්‍ය මෘදු කුසලතා ගොඩනගා ගත හැකි වීම සහ එමගින් යථාර්ථවාදී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පන්නරය ලැබීම.
3. ස්වයං මානසික විනයක් ගොඩනැගීම සහ එමගින් විනයානුකුල වැඩිහිටියන් බවට පත් වීම.
4. මෙම වැඩසටහනෙන් ආවරණය වන විෂය කරුණු ශිෂ්‍යත්ව සහ වෙනත් විභාග වල දී ප්‍රයෝජනවත් වීම.
5. යහපත් මානසික සංකල්ප ගොඩනඟාගත හැකි ක්‍රියාකාරකම් සහ මග පෙන්වීමක් ලැබීම.
6. නිරෝගී දිවිපෙවෙතක් සඳහා වන හුරු පුරුදු සංවර්ධනය වන බැවින් අනාගතයේ බෝනොවන රෝග හට ගැනීමේ අවදානම අවම වීමයි.
7. අනාගතයේ විනය සහ මානුෂිකත්වයෙන් සපිරි සමාජයේ නායකත්වය ගත හැකි පිරිසක් බවට පත්වීම.
8. රැකියාවක් සොයා ගැනීමට යාමේදී අමතර සුදුසුකමක් වීම.

**සුදුසු දරුවන් කණ්ඩායමක් තෝරා ගැනීම.**

1. එක් ගුරුවරයෙකු සඳහා උපරිම සංඛ්‍යාව කිටි සාමාජිකයන් 20 කි.
2 අදාළ අයදුම්පත්‍ර සම්පූර්ණ කර ලියාපදිංචිය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
3. ලියාපදිංචි ගාස්තුව එක් සාමාජිකයෙකු සඳහා රුපියල් 100/- කි.
4. ප්‍රගති වාර්තා පොත සඳහා රුපියල් 50/- කි.

## ST JOHN CADET - ශාන්ත ජෝන් කැඩෙට්

"Better citizens through right attitudes"

"නිරෝගී චර්යාධර්ම තුළින් යහපත් පුරවැසියන්"

**ශාන්ත ජෝන් කැඩෙට් - පොදු උපදෙස්**

1. කැඩෙට් සාමාජිකයන් සියලු දෙනා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් දෙමව්පියන් මත රඳා පවතින පිරිසක් බව නිතරම සිහි තබාගත යුතු ය.
2. අප ආයතනයේ නීතිරීති වලට වඩා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නීති රීති සහ අදාළ පාසල්වල යොදා ඇති නීතිරීති පාසල් දරුවන්හට වලංගුවේ. නීති රීතිවල පරස්පරයක් ඇති වුවහොත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නීති රීති වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතු ය.
3. පුහුණුකරුවන් තෝරාගැනීම - අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති චක්‍රලේඛණ සහ මාර්ගෝපදේශයන් ට අනුකූලව පමණක් බාහිර පුහුණුකරුවන් තෝරා ගත යුතු ය. විශේෂ සම්පත් දායකයින් යොදා ගන්නේ නම් ඔවුන්ගේ අදාල විස්තර සුදුසුකම් ද සහිතව පාසලේ විදුහල්පති වෙත සහ අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යාපන අප දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.
4. දෙමව්පිය අවසරය - සෑම පුහුණු කරුවෙකුට සහ වෙනත් සේවාවන් වලට කැඩෙට් දරුවන් යොදා ගැනීමේදී වැඩසටහන ස්වරූපයත් සහ පවත්වන කාලය දැනුවත් කර දෙමාපිය අවසරය අනිවාර්යෙන්ම ලිඛිතව ලබා ගත යුතුය. දෙමව්පිය සන්නිවේදන සටහන් පොත.
5. වෛද්‍ය නිර්දේශය - සැලකිය යුතු කායික ක්‍රියාකාරකම් සහිත වැඩසටහන් සඳහා තෝරා ගැනීමේදී සුදුසුකම් ලත් වෛද්‍යවරයකුගෙන් නිර්දේශයක් ලබා ගත යුතු ය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් හා අනෙකුත් වැඩසටහන් සඳහා දෙමව්පියන්ගෙන් දැනුවත්ව රෝගී තත්වයක් නොමැති බවට ප්‍රකාශයක් ලබා ගැනීම සෑහේ.
6. සියලුම වැඩසටහන් වල දී අදාළ පාසලේ ගුරුවරයෙකු සහ / හෝ දෙමාපියන්ගෙන් කෙනෙකු සිටීම අනිවාර්යය වේ. ගැහැණු දරුවන් සහභාගී වන අවස්ථාවලදී ගුරුවරියක් හෝ මවක් සහභාගි කරගැනීම ද අනිවාර්ය වේ. මේ පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිර්දේශ පිළිපැදිය යුතු ය.
7. සියලුම අවස්ථාවලදී කිසිම ළමා අපචාරයක් කායිකව සහ මානසිකව සිදුනොවීමට වගබලා ගත යුතු ය. එසේම එවැනි අපචාර වලට චෝදනා ලැබ සිටින හෝ වරදකරුවන් වී සිටින කිසිවෙකුත් අපගේ වැඩසටහන් සඳහා සම්බන්ධ කර නොගත යුතු ය.
8. සියලුම පුහුණු කටයුතු සිදු කිරීමේදී අප ආයතනයේ මූලික සිද්ධාන්ත අනුව ජාතියකට, ආගමකට, සංස්කෘතියකට හෝ පරිසරයට අගතියක් හෝ අගෞරවයක් වන පරිදි කටයුතු නොකළ යුතු ය.
9. කිසිම පුහුණුවකදී ආයුධ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය වන ප්‍රකාශ වූ ක්‍රියාකාරකම් නොකළ යුතු ය.
10. හැකි සෑම විටම දෙමව්පිය කමිටුවක් මගින් ආරක්ෂක සහ මූල්‍යමය කටයුතු මෙහෙය විය යුතු ය.

A ප්‍රථමාධාර ආශ්‍රිත පුහුණු වැඩසටහන්

A1 මූලික ප්‍රථමාධාර පුහුණුව යාවත්කාලීන කිරීම.
ප්‍රායෝගික පුහුණුව ප්‍රමුඛතාවයක් ලබා දෙමින් වැදගත් මාතෘකා නැවත මතක් කර දීම.
Average Training Time( 08 Hours (02 days)

A2 Advanced First Aid training උසස් ප්‍රථමාධාර පුහුණුව
පුහුණුව අවසානයේ ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.
සුදුසුකම් ලබන අය සඳහා පමණක් ප්‍රවීණතා සහතිකයක් පිරිනමනු ලැබේ.

A3 First Aid service competency certificate ප්‍රථමාධාර සේවා සැපයීම පිළිබඳව ප්‍රවීණතාවය
පුහුණු කිරීම - රිතික් නිලධාරීන් සඳහා මූලස්ථානය මගින් පුහුණුවක් ලබාදෙන අතර ඉන්පසුව දිස්ත්‍රික් පුහුණු නිලධාරීන් සකස් කරගත යුතුය දිස්ත්‍රික් සාමාජිකයන් පුහුණු කළ යුත්තේ දිස්ත්‍රික් නිලධාරීන් විසිනි එක්දින කඳවුරක එක් කොටසක් ලෙස පැවැත්වීම වඩාත් සුදුසුය පුහුණු කාලය අවම පැය හතරයි.
Average Training Time : 04 Hrs (02 days) Cadet Records Book Page 17 - 20

Average Training Time (04 Hours (02 days) Cadet Records Book Page 17 - 20

සුදුසුකම 1. අවම වශයෙන් මාස 12 ක සාමාජිකත්වය.

2. පරීක්ෂණයෙන් සමත් වීම.

3. ප්‍රථමාධාර සේවා පැය තිහක් සම්පූර්ණ කර තිබීම.

සුදුසුකම් ලබන අය සඳහා පමණක් ප්‍රවීණතා සහතිකයක් සහ පදක්කම් පිරිනමනු ලැබේ. ප්‍රථමාධාර සේවාවන් සඳහා අවස්ථාව ලබා දෙනු ලබන්නේ මෙම පුහුණුව ලැබූ සාමාජිකයන් හට පමණි. සහතිකය සහ පදක්කම ලබා ගැනීමට නම් සේවා පැය තිහක් සම්පූර්ණ කළ යුතු ය.

**A4 Caring for the Sick - Basic Module රෝගී රැකවරණය පිළිබඳව මූලික ප්‍රවීණතාවය පුහුණු කිරීම**

1. මූලස්ථානය මගින් විෂයමාලාව PowerPoint presentation සහ අනෙකුත් මග පෙන්වීම් ලබා දෙනු ලැබේ.
2. දිස්ත්‍රික් කොමසාරිස් විසින් වෛද්‍ය නිලධාරීන් හෙද නිලධාරීන් සම්පත්දායකයින් ලෙස තෝරාගෙන අනුමැතිය සඳහා ප්‍රධාන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු ය.
3. වැඩසටහන පැවැත්විය යුත්තේ මූලස්ථානය අනුමැතිය ලබා ගත් පසුවය අවශ්‍ය අවස්ථාවලදී මූලස්ථානයෙන් නියෝජිතයකු යොමු කරනු ඇත.
4. පරීක්ෂණය සඳහා අවශ්‍ය ප්‍රශ්න පත්තර සහ අනෙකුත් ලිපි ලේඛන සියල්ල මූලස්ථානය මගින් සපයනු ලැබේ පුහුණු කාලය දින 03 අවම පැය 18 පරීක්ෂණය දින 1කි නේවාසික කඳුරක් ලෙස ද පැවැත්විය හැකි ය.

   Average Training Time( 18 Hours (03 days) Cadet Records Book Page 12

පුහුණුව අවසානයේ ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්විය යුතු ය. සුදුසුකම් ලබන අය සඳහා පමණක් ප්‍රවීණතා සහතිකයක් සහ පදක්කමක් පිරිනමනු ලැබේ.

**සුදුසුකම**

1. අවම වශයෙන් මාස 18ක සාමාජිකත්වය.
2. පරීක්ෂණය සමත් වීම.
3. ප්‍රථමාධාර සේවා පැය හතලියක සම්පූර්ණ කර තිබීම.
4. උසස් ප්‍රථමාධාර පුහුණුව නිම කර තිබීම.

B Life Skills Training ජීවන කුසලතා ආශ්‍රිත හුම් වරසටහන්

B1 Leadership Communication Skills - 06H නායකත්වය සන්නිවේදනය.

- එක්දින කඳවුරක් ලෙස පැවැත්වීම වඩා සුදුසු ය.
- සුදුසු සම්පත්දායකයන් තම දිස්ත්‍රික්කයෙන් සොයා ගත යුතු ය.
- හැසිරවීමට පහසු සංඛ්‍යාවක් පමණක් එක් වරකට සම්බන්ධ කරගත යුතු ය.
- Average Training Time : 06 Hours (01 days) Cadet Records Book Page 12

B2 Home Economy - 02H ගෘහ හා සමාජ ආර්ථික කළමනාකරණය.

- පාසැලේ ගෘහ විද්‍යා ගුරුවරයාගේ සම්පත් දායකත්වය ලබාගත හැකි ය.
- Average Training Time : 02 Hours Cadet Records Book - Page 17 20

B3 Minor Repairs - 06H ගෘහස්ථ සුළු අලුත්වැඩියාවන් පුහුණුව.

- එක්දින කඳවුරක් ලෙස පැවැත්වීම වඩා සුදුසු ය.
- සුදුසු සම්පත් දායකත්වයක් තම දිස්ත්‍රික්කයෙන් සොයා ගත යුතු ය.
- Average Training Time: 06 Hours (01 days) Cadet Records Book Page 17 - 20

B4 High Tech Usage - 03H තාක්ෂණික උපකරණ භාවිතය කළමනාකරණය.

- එක්දින කඳවුරු එක් කොටසක් ලෙස පැවැත්වීම සුදුසු ය.
- සුදුසු සම්පත්දායකයින් තම දිස්ත්‍රික්කයෙන් සොයා ගත යුතු ය.
- Average Training Time : 03 Hours Cadet Records Book Page 17 - 20

B5 Healthy life style from the childhood - 04H ළමා වියේ පටන් නිරෝගී දිවි පෙවතක්.

- එක් දින කඳවුරක එක් කොටසක් ලෙස පැවැත්වීම වඩාත් සුදුසු ය.
- සුදුසු සම්පත්දායකයින් තව දිස්ත්‍රික්කයෙන් සොයා ගත යුතු ය.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වලින් සහය ලබාගන්න.
- Average Training Time:04 Hours (01 days) Cadet Records Book Page 17 - 20

B6 Solid Waste Management - 04H කසළ කළමනාකරණය සහ පරිසර සුරැකුම

- එක්දින එක් කොටසක් ලෙස පැවැත්වීම වඩාත් සුදුසු ය.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සහ පරිසරවේදී සංගම්වලින් සහ සහාය ලබාගන්න.
- කසල කලමනාකරණය මධ්‍යස්ථානයක් පෙන්වීමට හැකි නම් වඩාත් සුදුසු ය.
- Average Training Time: 04 Hours (01 days) Cadet Records Book Page 17 - 20

C Safety Training ආරක්ෂාව සහ ප්‍රවේසම ආශ්‍රිත පුහුණු වැඩසටහන්

C1 Water Safety - 04H ජලය ආශ්‍රිතව ආරක්ෂාව

- ජීවිතාරක්ෂක සංගමයේ පුහුණු නිලධාරීන්ගේ සහාය ලබා ගන්න.
- ප්‍රයෝගික පුහුණු කිරීම් කළ යුත්තේ නිලවශයෙන් අවසර ලත් ආයතන වලින් පමණයි.
- සැම විටම අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ඇති පුහුණුකරුවන් පමණක් යොදාගන්න.
- හැසිරවීමට පහසු සංඛ්‍යාවක් පමණක් එක් වරකට සම්බන්ධ කරගත යුතු ය.
- Average Training Time( 04 Hours (01 days) Cadet Records Book Page 17 - 20

C2 Fire Safety - 02H ගින්දර ආශ්‍රිතව ආරක්ෂාව

- ගිනි නිවන හමුදාවේ පුහුණු නිලධාරීන්ගේ සහාය ලබා ගන්න.
- ප්‍රායෝගිකව පුහුණු කිරීම් කළ යුත්තේ නිලවශයෙන් අවසර ලත් ආයතන වලින් පමණි.
- සැමවිටම අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ඇති පුහුණුකරුවන් පමණක් යොදාගන්න.
- එක්දින කඳවුරක එක් කොටසක් ලෙස පැවැත්වීම වඩාත් සුදුසු ය.
- හැසිරවීමට පහසු සංඛ්‍යාවක් පමණක් එක් වරකට සම්බන්ධ කරගත යුතු ය.
- Average Training Time: 02 Hours Cadet Records Book Page 17 - 20

C3 Road safety 03H වාහන සහ මහා මාර්ග ආශ්‍රිත ආරක්ෂාව

- ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පුහුණු නිලධාරීන්ගේ සහයෝගය ලබා ගන්න.
- ප්‍රායෝගික පුහුණු කිරීම් කළ යුත්තේ නිල වශයෙන් අවසර ලත් ආයතන වලින් පමණි.
- සැමවිටම අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ඇති පුහුණුකරුවන් පමණක් යොදා ගන්න.
- Average Training Time( 03 Hours Cadet Records Book Page 17 - 20

D සන සරඹ /ආචාර කිරීම සහ කායික ව්‍යායාම පුහුණුව

D1 Basic Drill Training - 14H මූලික සන සරඹ සහ ආචාර කිරීම් පුහුණුව

- සැහීමකට පත්විය හැකි මට්ටමකට ප්‍රායෝගික පුහුණුවක් ලබාදිය යුතු ය.
- පුහුණුවට පෙර මහන්සි වීමට සුදුසු තත්ත්වයෙන් සිටී දැයි සොයා බැලිය යුතු ය.
- කඳවුරක් ලෙස පැවැත්වීම වඩාත් සුදුසු ය.
- සැම විටම අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතිය ලබා ඇති පුහුණු කරුවන් පමණක් යොදා ගන්න.
- පාසල් වල සිටින කැඩෙට් ගුරුවරුන්ගේ සහාය ලබාගත හැකි ය.
- හැසිරවීමට පහසු සංඛයාවක් පමණක් එක් වරකට සම්බන්ධ කරගත යුතු ය.
- Average Training Time( 14 Hours (03 Days) Cadet Records Book Page 17 - 20

D2 Dress Regulation - 02H නිළ ඇඳුමට පිළිබඳ මූලික දැනුම

- ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාවේ නිලධාරීන්ගේ සහාය ලබාගත හැකි ය.
- අවශ්‍ය තොරතුරු මූලස්ථානය ලබාගත හැකි ය.

D3 Ergonomics - 03H නිවැරදි ඉරියව් සහ ක්‍රියා කලාපය

- කඳවුරක එක් කොටසක් ලෙස පැවැත්වීම වඩාත් සුදුසු ය.
- සැමවිටම අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ඇති පුහුණු කරුවන් පමණක් යොදා ගන්න.
- රෝහල්වල සිටින භෞත චිකිත්සක යන්ගේ (Physiotherapist) සහාය ලබාගත හැකි ය.
- Average Training Time : 03 Hours  Cadet Records Book Page 17 - 20

SUPER CADET AWARD සුපිරි කෙනෙක් සම්භානය - සුදුසුකම

- ශාන්ත ජෝන් ගිලන් හමුදාවේ සක්‍රීය සාමාජිකත්වයක් දරමින් සමාජයටත් ශාන්ත ජෝන් ගිලන්රථ හමුදාවටත් සේවාවක් සපයමින් යහපත් චර්යාවක් පවත්වා ගනිමින් පුහුණුව ලබාගත් කැඩෙට් සාමාජිකයන් සඳහා පිරිනමන සම්මානයකි.

**සුදුසුකම**

1. අවම වසර තුනක සක්‍රීය සාමාජිකත්වය.
2. A සහ D සියලුම අංශ සම්පූර්ණ කර තිබීම.
3. ප්‍රථමාධාර සේවා පැය අවම හැටක් ඉටු කර තිබීම.
4. දිනක තුනක නේවාසික කඳවුර කට සහභාගි වී තිබීම.
5. අවම ජාතික රාජකාරියකට සහභාගි වී තිබීම.
6. කිසිදු විනය විරෝධී ක්‍රියාවකට සම්බන්ධ නොවීම.
7. කැඩෙට් වාර්තා පොත සහ අනෙකුත් ලිපිනයක නිවැරදිව නඩත්තු කර තිබීම.
8. අදාළ පාසලෙන් මාස තුනක් ඇතුළත ලබා ගත් චරිත සහතිකයක් ඉදිරිපත් කිරීම.

**තෝරාගැනීම**

- සුදුස්සන් තෝරනු ලබන්නේ ප්‍රධාන කොමසාරිස් විසින් පත් කරනු ලබන කමිටුවක් මගිනි. දිස්ත්‍රික් මගින් නියමිත අයදුම්පත් මූලස්ථානය වෙත යොමු කළ යුතුය. වසරකට එක්වරක් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. සෑම වසරකම පෙබරවාරි 15 වන දිනට පෙර අයදුම්පත් යොමු කළ යුතු ය.
- සුදුසුකම් ලබන කැඩෙට් සාමාජිකයන් සඳහා මූලස්ථානය මගින් පදක්කමක් සහ සහතිකයක් පිරිනමනු ලැබේ.
- 2022 වසරේ සිට ක්‍රියාත්මකයා Cadet Record Book Page 31

**SPECIAL CADET AWARD - විශේෂ කැඩෙට් සම්මානය**

මෙම සම්මානය සුවිශේෂී අවස්ථාවලදී පමණක් පිරිනමනු ලැබේ. අපහසුතා මධ්‍යයේ ප්‍රථමාධාර ලබා දී ජීවිත බේරා ගැනීම් වැනි අවස්ථා සඳහා පමණක් ලබා දෙනු ලැබේ. සිදුවීමෙන් පසු මාසයක් ඇතුලත සාක්ෂි ලෙස අවශ්‍ය ලිපි ලේඛන ද සමග මූලස්ථානය වෙත යොමු කළ යුතුය. අවශ්‍ය අවස්ථාවලදී සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සුදුස්සන් තෝරනු ලබන්නේ ප්‍රධාන කොමසාරිස් විසින් පත් කරනු ලබන කමිටුවක් මගිනි.

**2022 සිට ක්‍රියාත්මකයා - Cadet Record Book Page 31**

සේවා සම්මාන උළෙලක් වසර දෙකකට වරක් මූලස්ථානය මගින් සංවිධානය කිරීමට අපේක්ෂිතය.

**කාණ්ඩ භාර ගුරුවරුන් ඇගයීම**

පාසල් තුළ අපගේ කටයුතු බොහොමයක් සාර්ථකව ක්‍රියාත්මක වීමට නම් කොට්ඨාශය භාර ව කටයුතු කරන ගුරුවරයා (Divisional Officer) කැපවීමෙන් කටයුතු කළ යුතු ය. මෙලෙස කැපවී කටයුතු කරන කිට් සහ කැඩෙට් ගුරුවරුන් සඳහා කාර්ය සාධන ඇගයීමක් වසර දෙකකට වරක් සිදුකිරීමට අපේක්ෂිත ය.

**SERVICE APPRECIATION CERTIFICATE - කාර්ය සාධන ඇගයීම් සහතිකය**

එක් එක් ගුරුවරයා ලබාදුන් දායකත්වයට කලින් යොදාගත් නිර්ණායක අනුව ඇගයීමට ලක්කර ශ්‍රේණිගත කිරීමක් කර අදාළ ශ්‍රේණියට සුදුසු සහතිකයක් පිරිනමනු ලැබේ. එසේම එම කාර්ය සාධන ඇගයීම් සහතිකයේ පිටපතක් අදාල අධ්‍යාපන කාර්යාලයටද යොමු කරන අතර විශේෂ උත්සවයකදී මෙම සහතික පිරිනමනු ලැබේ.

**Best Divisional Officer Award - විශිෂ්ට සේවා ඇගයීම් සම්මානය**

කලින් යොදාගත් නිර්ණායක යොදා ගනිමින් ලංකාව පුරාම සිටින කාණ්ඩ භාර නිලධාරීන්ගෙන් විශිෂ්ට සේවාවක් ඉටු කළ නිලධාරීන් (ගුරුවරුන් සඳහා පමණි) සඳහා පිරිනමන සම්මානයකි. නිර්දේශිත මට්ටමකට වඩා ඉහළ ලකුණු ලබන නිලධාරීන් සඳහා සහතික පිරිනමනු ලැබේ. ඉහළම ලකුණු ලබන තිදෙනාට (නිර්දේශිත ලකුණු සංඛ්‍යාව ලබා තිබිය යුතු ය.) රන් රිදී සහ ලෝකඩ පදක්කම් පිරිනැමේ.

**Best School Division Award - විශිෂ්ට කණ්ඩායම් සම්මානය පාසල් සඳහා**

කලින් යොදාගත් නිර්ණායක සපුරා ඇති පාසල් වලින් උපරිම පාසල් තුනක් සඳහා පිරිනමනු ලැබේ. එක් දිස්ත්‍රික්කයකින් පාසල් දෙක බැගින් සම්මානය සඳහා ඉදිරිපත් කළ හැකි ය. එම පාසල් අවම ලකුණු මට්ටමක් ලබා නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන කොමසාරිස් ගේ ප්‍රධානත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් තෝරනු ලැබේ. වසර දෙකකට වරක් පවත්වන ශාන්ත ජෝන් ගිලන්රථ හමුදා ජාතික සේවා සම්මාන උළෙලක දී මෙම සම්මාන පිරිනමනු ලැබේ.

## <u>St John Adults - ශාන්ත ජෝන් වැඩිහිටි</u>

"Service for the happiness" - "**ආත්ම තෘප්තිය උදෙසා සමාජ සේවය**"

වයස අවුරුදු 18ට වැඩි අය සඳහා

පාසල් මට්ටමේ සිට අප සංවිධානය හා සම්බන්ධ වූ අය විවෘත සේනාංකවලට බැඳිය හැකි ය. එහිදී ඔවුන් සඳහා උසස් ප්‍රථමාධාර පාඨමාලාව හැදෑරීමටත් ආධාර පුහුණුකරුවෙකු ලෙස පත්වීම සඳහා තරග විභාගවලට මුහුණ දීමෙන් හා ප්‍රායෝගික පුහුණුව සම්පූර්ණ කිරීමෙන් ඒ සඳහා සුදුසු පුද්ගලයකු ලෙස පත්විය හැකිය.

පාසලෙන් ඉවත්ව යන සිසුන්ට අපගේ වැඩිහිටි සාමාජිකත්වය ලබාගත හැකි ය. මෙම වැඩිහිටි සාමාජිකයන් ශාන්ත ජෝන් ගිලන් සේවයේ යහපත හා පැවැත්ම, දියුණුව උදෙසා තම කාලය, ශ්‍රමය ස්වෙච්ඡාවෙන් කැප කරති. වර්තමානයේ ආත්මාර්ථකාමීත්වය රජයන අවධියක මෙම පිරිස ලබාදෙන ආදර්ශය ඉතා අගය කොට සැලකිය යුතු ය. ශාන්ත ජෝන් සේවයේ සමාජ සේවා කටයුතුවලදී හැකි අයුරින් සහයෝගය ලබාදෙමින් ආත්ම තෘප්තිය ලබා ගත හැකිවනු ඇත.

**අපෙන් ඔබට**

1. ඉතාම වටිනා ගෞරවනීය නිළ ඇඳුමක් ලබාදීම.
2. අන්තර්ජාතික වශයෙන් පිළිගත් සහතිකයක් පිරිනැමීම.
3. රෝහල් පුහුණුව.
4. සේවා කාලය හා දක්ෂතා අනුව උසස්වීම්.
5. ප්‍රථමාධාර පුහුණුකරුවෙකු ලෙස පත් වීමේ අවස්ථාව.
6. ජාතික මට්ටමේ ප්‍රථමාධාර තරඟ වලට ඉදිරිපත් වීමේ හැකියාව.
7. ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමේ හැකියාව.
8. ජාත්‍යන්තර කඳවුරු සඳහා සහභාගි වීමට අවස්ථාව.

**FIRST AID can save a LIFE ප්‍රථමාධාර මගින් ජීවිත බේරා ගත හැකි ය.**

## First Aid & Sick Room Management ප්‍රථමාධාර සහ හදිසි රෝගී රැකවරණ ඒකකය

වර්තමානයේ ලොව පුරා ස්වාභාවික විපත් සේම අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වෙමින් පවතී. මෙම ආපදා තත්වවලදී විවිධාකාර වූ අනතුරුවලට ලක්වූ රෝගීන් සංඛ්‍යාවක් බිහි වේ. හදිසි රෝගී තත්ත්වවලදී පුද්ගලයකුගේ ජීවිතය රඳා පවතින්නේ එම අවස්ථාවේ එම ස්ථානයේ සිටින පුද්ගලයන්ගේ ක්‍රියාකලාපයන් මත ය.

හුස්ම ගැනීම නතර වූ රෝගියකු ගේ ජීවිතය ආරක්ෂා කරදීමට අප සතුව ඇත්තේ විනාඩි 6-10 ත් අතර කාලයකි. එසේම හුස්ම ගන්නා මාර්ගයේ යමක් සිර වූ විට එය එසැනින් ඉවත් නොකළහොත් එම ඔබ ඉදිරියේදීම මෙලොවින් සමු ගන්නවා ඇත. මෙවැනිම අවස්ථාවල දී නිවැරදි ප්‍රථමාධාර ලබාදීම මගින් ජීවිත බේරාගත හැකි වනු ඇත.

## Maintaining First Aid Boxes & Equipment ප්‍රථමාධාර කට්ටල පවත්වා ගැනීම

ප්‍රථමාධාර ඒකක වලට අවශ්‍ය ප්‍රථමාධාර උපකරණ කට්ටල පිළිබඳව දැනුවත් කිරීම සහ ගිලන් මැසි භාවිතය පිළිබඳව දැනුවත් කිරීම.

## Training Equipment & Quality පුහුණු උපකරණ සහ ගුණාත්මකභාවය

වර්තමානයේ භාවිතා වන නවීන පුහුණු උපකරණ සියල්ලක්ම අප ආයතනය සතුව පවතින අතර ඉල්ලුම සහ අවශ්‍යතාවයන් අනුව භාවිතයට ගනු ලැබේ.
Training Dummies, AMBU bags, Defibrillators (AED), Stretchers, spinal Board, Splints & etc

**ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය - අපගේ උත්සාහය**

1. කැපවීමෙන් සහ විනයානුකූලව අභිමානවත් ස්වෙච්ඡා සේවාවක නිරත විය හැකි සුදුසු පසුබිමක්, මානුෂිකත්වය පෙරදැරි කරගත් පුරවැසියන් හට නිර්මාණය කර දීමටයි.
2. එදිනෙදා ජීවිතයේ මුහුණ දීමට සිදුවන හදිසි අනතුරු සහ අසනීප තත්වයන් වල දී ක්‍රියා කළ යුතු නිවැරදි ක්‍රමවේදයන් සමාජගත කිරීම මගින් ආපදාවට ලක් වූ ජීවිත වලට විද්‍යාත්මක රැකවරණයක් ලබාදීම.
3. දිනෙන් දින පිරිහෙමින් පවතින පරාර්ථකාමීත්වය සහ මානුෂිකත්වය සමාජය තුළ නැවත ගොඩනැගීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට උත්සාහ ගැනීම.
4. ශාන්ත ජෝන් ගිලන් සේවය මෙම කටයුතු පවත්වාගෙන යන්නේ ඉමහත් පරිශ්‍රමයක් දරමින් සමාජ සේවයට ලැදි මානවහිතවාදී පිරිසකගේ උදව් උපකාර ලබා ගනිමිනි.

**ඔබ හට අපගේ ආයතනය වෙනුවෙන් කළ හැකි දේ**

1. ශාන්ත ජෝන් ගිලන් සේවය ප්‍රථමාධාර පුහුණුව ලබා ගැනීම සහ ඔබ හඳුනන ආයතන සඳහා ශාන්ත ජෝන් ගිලන් සේවය හඳුන්වාදීම.
2. ශාන්ත ජෝන් ගිලන් සේවයේ සාමාජිකයෙකු වී සැබෑ ස්වෙච්ඡා සේවකයෙකු ලෙස මානුෂීය සේවාවන් වල නිරත වීම.
3. ශාන්ත ජෝන් ගිලන් සේවයේ වැඩසටහන් සහ සේවා සැපයීම් වලට අවශ්‍ය අනුග්‍රහකත්වයන් ලබාදීම හෝ හඳුනන ආයතන ඒ සඳහා පෙළඹවීම.

අපගේ ආයතනයේ යාවත්කාලීන කළ විස්තර සඳහා : www.stjohnsl.org/
www.stjohnsrilanka.lk/

**ප්‍රථමාධාර පාඨමාලාවක් ආරම්භ කිරීම**

යම් ප්‍රාථමික හෝ ද්විතීය පාසැලකට කිටී හෝ ශිෂ්‍ය භට කණ්ඩායමක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය නම් පාසල් ලිපි ශීර්ෂයක් මගින් අප මූලස්ථානයට ඉල්ලුම් කළ යුතුය. එවිට එය අදාල දිස්ත්‍රික් කොමසාරිස්වරුන් දැනුවත් කර ඒ මාර්ගයෙන් ඉදිරි කටයුතු සංවිධානය කර ගත හැකිය.

| | | |
|---|---|---|
| මූලස්ථාන ලිපිනය | : | ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය, ජාතික මූලස්ථානය<br>නො: 65 /11 විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. |
| දුරකථන අංකය | : | 0112 437744, 0112 437745, 0112 341736 |
| විද්‍යුත් ලිපිනය | : | nhqcommisioner@gmail.com/ |
| වෙබ් පිටුව | : | www.stjohnsl.org/ |

ශාන්ත ජෝන් ගිලන් සේවයේ කිටී හා ශිෂ්‍ය භට කඳවුරු, විසිරයාමේ උළෙල වලට අදාළ ඡායාරූප සහ අදාළ විස්තර පහතින් දැක්වේ.








St John Ambulance official Logos - **අපගේ නිළ ලාංඡන**

මෙය ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවයේ වැඩසටහන් පිළිබඳව නිවැරදි සංෂිප්ත වාර්තාව බවට සහතික කරමි.

book designed by Dr. J.M.Nilam Chief Commissioner MBBS, DCH, MD - 2021 November
issued 22.04.2022
076 137 8494 nhqcommisioner@gmail.com, www.stjohnsl.org

## 2.2 III ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
## (1912)

### හැඳින්වීම

වර්තමාන ලෝකයේ ළමා හා  තරුණයන් සඳහා ක්‍රියාත්මක වන විශාල තම, ප්‍රබල තම හා ජනප්‍රිය තම ස්වෙච්ඡා සංවිධානය වන බාලදක්ෂ ව්‍යාපාරය තුලින් ලබා දෙන නොවිධිමත් අධ්‍යාපන වැඩ පිළිවෙළ පාසල් තුළ ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මග පෙන්වීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. මේ අනුව පාසල් පද්ධතිය තුළ නව බාලදක්ෂ ඒකක ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවේදයන් හා ප්‍රතිලාභ මෙහි අන්තර්ගත ව ඇත.

### ආරම්භය හා ව්‍යාප්තිය

### බේඩන් පවල් සාමිතුමා හා බාලදක්ෂ ව්‍යාපාරය

බාලදක්ෂ ව්‍යාපාරයේ නිර්මාතෘ




**රොබට් ස්ටීවන්සන් ස්මිත්**
**බේඩන් පවල් සාමිතුමා**

1857 පෙබරවාරි මස 22 වන දින එංගලන්තයේ උපත ලබා සිය පාසල් දිවිය සම්පූර්ණ කර මහා බ්‍රිතාන්‍යයේ යුධ හමුදා සේවයට එක් වී ලුතිනන් ජනරාල්වරයකු දක්වා උසස් වීම ලබමින් බ්‍රිතාන්‍යයේ යුධ හමුදාවට විශිෂ්ඨ සේවයක් ඉටු කරමින් "ශ්‍රීමත්" යන ගෞරව නාමයකට ද පාත්‍ර වූ රොබට් ස්ටීවන්සන් ස්මිත් බේඩන් පවල් සාමිතුමා වර්ෂ 1907 අගෝස්තු මස එංගලන්තයේ බ්‍රවුන්සි නම් දූපතෙහි බාලදක්ෂයන් විසි දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සමග පවත්වන ලද මූලික කඳවුරෙන් ලෝක බාලදක්ෂ සංවිධානය ආරම්භ විය.

### ලෝක බාලදක්ෂ ව්‍යාපාරය

2022 සංගණන වාර්තා අනුව වර්තමාන ලෝකයේ රටවල් 172 ක මිලියන 57 ක් අභිබවා බාලදක්ෂයන් ව්‍යාප්ත වී ඇති අතර පරිපාලන පහසුව සඳහා කලාප 6 කට බෙදා ඇත. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය අයත් වන්නේ ඒ අතුරින් විශාලත ම කලාපය වන ආසියා ශාන්තිකර කාලපයටයි. ලෝක බාලදක්ෂ කාර්යාංශය මැලේසියාවේ ක්වලාලම්පූර් නුවරත් ලෝක බාලදක්ෂ මූලස්ථානය ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරත් පිහිටා ඇත.



## ශ්‍රී ලංකාවේ බාලදක්ෂ කටයුතු

**ශ්‍රී ලංකාවේ බාලදක්ෂ නිර්මාතෘ**



**ප්‍රැන්සිස් ජෝර්ජ් ස්ටීවන්ස් මැතිතුමා**

වර්ෂ 1912 මාතලේ දිස්ත්‍රික්කයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරුවරයකු ලෙස සේවය කළ බ්‍රිතාන්‍ය ජාතික ප්‍රැන්සිස් ජෝර්ජ් ස්ටීවන්ස් මැතිතුමා විසින් මාතලේ ක්‍රිස්තුදේව විද්‍යාලයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම බාලදක්ෂ කණ්ඩායම ආරම්භ කරන ලදී. එසේ ආරම්භ වූ බාලදක්ෂ ව්‍යාපාරය කෙටි කලක් තුළ දිවයින පුරා ව්‍යාප්ත වී වර්තමානයේ ශ්‍රී ලංකාවේ බාලදක්ෂ දිස්ත්‍රික්ක 37 ක් තුළ බාලදක්ෂයින් 80,000 කට අධික සංඛ්‍යාවක් දක්වා ව්‍යාප්ත වී ඇත.

### බාලදක්ෂ ව්‍යාපාරය යනු

බාලදක්ෂ ව්‍යාපාරය යනු එහි නිර්මාතෘවරයා විසින් හඳුනාගත් අරමුණු, මූලධර්ම, බාලදක්ෂ ක්‍රමයට අනුකූලව , ස්ත්‍රීපුරුෂභාවය, සම්භවය, ජාතිය හෝ ආගම අතර වෙනසකින් තොරව අධ්‍යාපනය සඳහා සැකසුනු, සැමට විවෘත වු සහ දේශපාලනයෙන් තොර වූ ස්වේච්ඡා සංවිධානයකි.

### මෙහෙවර

"ස්වයං පරිසමාප්ත පුද්ගලයින් වශයෙන් සමාජයට ඵලදායී කාර්යභාරයක් ඉටුකරමින් වඩාත් යහපත් ලොවක් ගොඩනැගීම සඳහා සහය වීමට, බාලදක්ෂ නීතිය හා පොරොන්දුව මත පදනම් වූ පිළිගත් අගයන් මගින් ළමා හා යොවුන් අධ්‍යාපනයට දායක වීම බාලදක්ෂ ව්‍යාපාරයේ මෙහෙවර වේ."

### අරමුණු

"බාලදක්ෂ ව්‍යාපාරයේ මූලික අරමුණු වන්නේ ළමා සහ තරුණ පරපුර තුළ කායික, බුද්ධිමය, චිත්තවේගී, සමාජයීය, ආධ්‍යාත්මික හා සංස්කෘතික හැකියාවන් වර්ධනය කිරීම තුලින් ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවට වැඩදායි වූ වගකිව හැකි යහපත් පුරවැසියෙකු බිහි කිරීමයි."

### මූලධර්ම

1. ආගම පිළිබඳ යුතුකම (Duty to Religion)
   තම ආගමෙහි ඇති ආධ්‍යාත්මික ධර්මතාවයන්ට අනුකූලව හා එයට පක්ෂපාතීව දිවි පෙවෙත සාදා ගැනීම.
2. අන් අය කෙරෙහි ඇති යුතුකම (Duty to Others)
   ප්‍රාදේශීය, දේශීය, සහ ජාත්‍යන්තර සංහිඳියාව හරහා තම රටට පක්ෂපාතී වීම හා ජගත් සහයෝගීතාවය සහ මනුෂ්‍යත්වය මුල් කොටගෙන සමාජ අභිමානය හා ගරුත්වය පදනම් කර ගත් සමාජ සංවර්ධන වැඩ සඳහා සහභාගී වීම.
3. තමා පිළිබඳ යුතුකම (Duty to Self)
   තමාගේ අභිවෘධිය සඳහා වූ යුතුකම (බාලදක්ෂ නීති 10ට අනුකූලව ජීවත්වීම)

**බාලදක්ෂ පොරොන්දුව**

"මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට ද, සැම කල්හි ම අනුන්ට උපකාරි කිරීමට ද, බාලදක්ෂ නීතියට කීකරු වීමට ද, මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සහය යෙදීමට ගෞරව බහුමාණයෙන් පොරොන්දු වෙමි."

**බාලදක්ෂ නීතිය**

1. බාලදක්ෂයා විශ්වාස කටයුතු අයෙකි. (A Scout is trustworthy)
2. බාලදක්ෂයා පක්ෂපාති අයෙකි. (A Scout is loyal)
3. බාලදක්ෂයා හිතෛෂීය කාරුණික අයෙකි. (A Scout is friendly and considerate)
4. බාලදක්ෂයා සැම බාලදක්ෂයෙකුගේ ම සහෝදරයෙකි.
(A Scout is a Brother to every other Scout)
5. බාලදක්ෂයා ධෛර්යය සම්පන්න අයෙකි. ( A Scout is courageous)
6. බාලදක්ෂයා සත්ව කරුණාව ඇත්තෙකි. (A Scout is kind to animals)
7. බාලදක්ෂයා සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකි. (A Scout is Cooperative)
8. බාදක්ෂයා සොම්නස් සහගත අයෙකි. (A Scout is Cheerful)
9. බාලදක්ෂයා සකසුරුවම් අයෙකි. (A Scout is Thrifty)
10. බාලදක්ෂයා සිත, කය හා වචනයෙන් පිරිසිදු අයෙකි.
(A Scout is clean in thought" word and Deed)

**බාලදක්ෂ ක්‍රමය (Scout Method)**

"බාලදක්ෂ ක්‍රමය" බාලදක්ෂ ව්‍යාපාරයේ මූලිකාංගයක් වන අතර එය පහත සඳහන් අංග තුලින් ප්‍රකාශ වේ.

"බාලදක්ෂ ක්‍රමය" අධ්‍යාපන යෝජනාව සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය පද්ධතියකි. බාලදක්ෂ ව්‍යාපාරයේ එය අර්ථ දැක්වෙන්නේ ප්‍රගතිශීලි ස්වයං අධ්‍යාපන ක්‍රමයක් ලෙස ය. එය අන්තර් ක්‍රියා මත පදනම් වූ එක් ක්‍රමයකි. සංයුක්ත පද්ධතියක් ලෙස එකට වැඩ කරන, සමානව වැදගත් අංග ඇතුලත් මෙම මූලාශ්‍ර ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සහ සමබර ආකාරයකින් පවත්වාගෙන යාම බාලදක්ෂ ව්‍යාපාරයට සුවිශේෂී වේ.





1. පොරොන්දුව හා නීතිය - (The Promise And Law)
2. ක්‍රියාවෙන් අවබෝධය - (Learning by doing)
3. කාණ්ඩායම් ක්‍රමය - ( Team System)
4. සංකේතාත්මක රාමුව - (Symbolic Framework)
5. සොබා දහම - (Nature)
6. වැඩිහිටි සහය - (Adult Support)
7. ප්‍රජා සහභාගිත්වය - Community Involvement
8. පෞද්ගලික ප්‍රගතිය - Personal Progression

## 3. ශ්‍රී ලංකාවේ බාලදක්ෂ සංවිධානයේ ව්‍යුහය

- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය 1957 මාර්තු 27 දින පාර්ලිමේන්තුවේදී සම්මත වූ අංක 13 දරණ ලංකා බාලදක්ෂ කවුන්සල පනත මගින් නිල වශයෙන් සංස්ථාපනය කර ඇත.
- ඉහත පනතට අනුව ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රධාන බාලදක්ෂයා ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා නිල බලයෙන් පත්වේ.

## 4. පාසල් පද්ධතිය තුළ බාලදක්ෂ ව්‍යාපාරයේ ව්‍යුහය.




### සමූහ බාලදක්ෂ නායකයින්

බාලදක්ෂ කටයුතු පවත්වාගෙන යාමේ කළමනාකරණ වගකීම සමූහ බාලදක්ෂ නායකයා සතුය. ඔහු/ඇය, විදුහල්පති හෝ විදුහල්පති විසින් බලය පැවරූ රාජකාරිමය වශයෙන් පාසලේ සේවයේ නියුතු අයකු හෝ විය යුතුය.

### බාලදක්ෂ ව්‍යාපාරයේ පුහුණු වැඩ සටහන දෙආකාරය

1. ළමා හා තරුණ වැඩසටහන - Children/Youth Programme
2. වැඩිහිටි පුහුණු වැඩසටහන - Adult Training Programme (for teachers and leaders)

ළමා හා තරුණ වැඩසටහන

| සමූහයේ බාලදක්ෂ ඒකක (පිරිමි හා ගැහැණු) | | | | |
|---|---|---|---|---|
| සිඟිති බාලදක්ෂ ගොමුව | පෝතක බාලදක්ෂ රැළ | කණිෂ්ට බාලදක්ෂ කණ්ඩායම | ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ කණ්ඩායම | මානවක බාලදක්ෂ සමාජය |
| අවු 5 - අවු 7 | අවු 7 - අවු 11 | අවු 10 1/2 - අවු 14 1/2 | අවු 14 1/2 - අවු 18 | අවු 18 - අවු 24 |
| ඒකකයේ බාලදක්ෂ සංඛ්‍යාව 12-40 | ඒකකයේ බාලදක්ෂසංඛ්‍යාව 12-36 | ඒකකයේ බාලදක්ෂ සංඛ්‍යාව 12-40 | ඒකකයේ බාලදක්ෂ සංඛ්‍යාව 12-40 | ඒකකයේ බාලදක්ෂ සංඛ්‍යාව 06-24 |
| ආදර්ශ පාඨය "යහළුකමයි සතුටයි" | ආදර්ශ පාඨය "සෑම වීර්යය කරමු" | ආදර්ශ පාඨය "සූදානමින් සිටිනු" | ආදර්ශ පාඨය "පුළුල්ව බලමු" | ආදර්ශ පාඨය "අපි සේවය කරමු" |
| **ප්‍රගති** | **පදක්කම්** | **මාර්ගය** | **හා** | **ඇගයීම** |
| සාමාජික පදක්කම | සාමාජික පදක්කම | සාමාජික පදක්කම | සාමාජික පදක්කම | සාමාජික පදක්කම |
| සතුට පදක්කම | ලෝකඩ තරුව | බාලදක්ෂ ප්‍රදානය | බාලදක්ෂ ප්‍රදානය | මානවක පරමාදර්ශ පදක්කම |
| දිනුම පදක්කම | රිදී තරුව | ප්‍රධාන කොමසාරිස් අභියෝගතා ප්‍රදානය | ප්‍රධාන කොමසාරිස් ප්‍රදානය | දිවිරුම්දීම උරපලඳනා පැළඳවීම |
| ප්‍රවීනතා පදක්කම් නැත | රන් තරුව | ප්‍රධාන කොමසාරිස් ප්‍රදානය | වනවාසියාගේ රැහැන හෝ මුහුදු බාලදක්ෂ පදක්කම්/ගුවන් බාලදක්ෂ පදක්කම් | ප්‍රවීණතා තරු |
| | ප්‍රවීනතා පදක්කම් 25 | | අග්‍රාමාත්‍ය ප්‍රදානය | යහපත් පුරවැසි ප්‍රදානය |
| | ජාත්‍යන්තර පදක්කම් 05 යි. | ප්‍රවීණතා පදක්කම් 55 ක් අතරින් තෝරා ගත යුතුය. | ජනාධිපති ප්‍රදානය | බේඩන් පවල් ප්‍රදානය |
| | | ජාත්‍යන්තර පදක්කම් 06 යි. | ප්‍රවීනතා පදක්කම 63 ක් අතරින් තෝරා ගත යුතුය. | නිපුනතා පදක්කම් 12 |
| | | | ජාත්‍යන්තර පදක්කම් 06 | ජාත්‍යන්තර පදක්කම් 07 |

**බාලදක්ෂ ව්‍යාපාරයේ ප්‍රධාන අංශ**

### 1. සිඟිති බාලදක්ෂ අංශය

පාසලේ පළමු හා දෙවැනි ශ්‍රේණියේ දරු දැරියන් (වයස අවු - 5 සිට 7) සඳහා සිඟිති බාලදක්ෂ අංශය ආරම්භ කළ හැකි ය.

**අරමුණ**

ශ්‍රී ලංකාවේ කුඩා ම පාසල් දරු දැරියන් තුළ බාලදක්ෂ ව්‍යාපාරය පිළිබඳ ඇල්මක් ඇතිකර ගනිමින් මුල් අවධිය තුළ නිපුනතා ඇති කර වීමට හා අර්ථවත් ලෙස සොබා දහම රස විඳිමින්, සරළ ක්‍රියාකාරකම් තුළින් අන්‍යයන්ට උදවු කිරීම හා එය තුළින් සතුටක් ලැබීමයි.

**සිඟිති බාලදක්ෂ පොරොන්දුව**

"මාගේ ආගමට හා රටට මම ආදරය කරමි."

### සිඟිති බාලදක්ෂ නීතිය

1. සිගිති බාලදක්ෂයා වැඩිහිටියන්ට කීකරු වෙයි.
2. සිගිති බාලදක්ෂයා සතුටින් සිටින්නෙකි.

### සිඟිති බාලදක්ෂ ආදර්ශ පාඨය

"යහළුකමයි සතුටයි"

සිඟිති බාලදක්ෂ පදක්කම් ක්‍රමය

සාමාජික පදක්කම



සතුට පදක්කම




දිනුම පදක්කම




සිඟිති බාලදක්ෂ නිළ ඇඳුම



### සිඟිති ගොමුවක් ආරම්භ කරන්නේ කෙසේද

සිඟිති බාලදක්ෂ පළමු අදියර පුහුණුව ලැබූ ආචාර්යවරියක් / වරයෙක් මගින් සිඟිති බාලදක්ෂ ගොමුවක් (ඒකකයක්) ආරම්භ කළ හැකි ය. මේ සඳහා සිසු සිසුවියන් අවම 12 ක් හා උපරිම 40 ක් විය හැකි ය.) හා එක ගොමුවක සිඟිති බාලදක්ෂයන් පොකුරු (කුඩා ඒකක) කිහිපයකට වෙන් කරයි. එක පොකුරක සිඟිති බාලදක්ෂයින් 08 සිටිය හැකි ය. මෙම කුඩා ඒකක සඳහා වර්ණවත් අලංකාර මල් වල නම් යොදා ගනු ලැබේ.

උදා - ඇන්තුරියම් මල, රැක්අත්තන මල, මානෙල් මල, සූරියකාන්ත මල, ඇහැල මල

### සිඟිති බාලදක්ෂයන් පුහුණු කිරීමේ ක්‍රම වේදය

1. සතියකට වරක් පාසල් කාලය තුළ පළමු අදියර පුහුණුව ලැබූ ආචාර්යවරයෙකු / වරියෙකුගේ නායකත්වය යටතේ පැය භාගයක එළිමහනේ රැස්වීම් වාරයක් පැවැත්විය යුතුය. පුහුණුව ලබා දීමේ දී නියමිත විෂය නිර්දේශය අනුගමනය කළ යුතු ය.
(බාලදක්ෂ ආචාර්ය අත් පත්‍රිකා පොතේ සිඟිති බාලදක්ෂ අංශයට අදාළ පිටු අංක 22 සිට 31 දක්වා කොටස පරිශීලනය කරන්න.)

### 2. පෝතක බාලදක්ෂ අංශය

පාසලේ වයස අවු 7 සිට 11 දක්වා වූ සිසු දරු දැරියන් (2 ශ්‍රේණියේ සිට 6 ශ්‍රේණිය දක්වා) පෝතක බාලදක්ෂ අංශයට ඇතුලත් කර ගත හැකි වේ.

### අරමුණු

ශ්‍රී ලංකාවේ වයස අවු 07 සිට 11 දක්වා වූ වයස් කාණ්ඩයේ පාසල් දරු දැරියන්ගේ පෞද්ගලික සංවර්ධනයට අදාළ වන කායික, බුද්ධිමය, චිත්තවේගීය, සාමාජීය, අධ්‍යාත්මික හා සංස්කෘතික යන අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආගමික නැඹුරුව, පරිසරය රස විඳීම, වන කථාව ඇතුළු කතන්දර, නාට්‍ය, ගීත, ක්‍රීඩා හා සෝෂා ඇසුරින් කුසලතාවයන් ඔප් නැන්වීමට කටයුතු කරයි.

මේ සඳහා සාමාජික පදක්කම, ලෝකඩ තරුව, රිදී තරුව හා රන් තරුව දක්වා වූ ප්‍රගති පදක්කම් මාර්ගය හා ඔවුන්ගේ සහජ දක්ෂතා වර්ධනයට ප්‍රවීණතා පදක්කම් 26 ක් ද ඇතුළත් කර ඇත.

### පෝතක බාලදක්ෂ පොරොන්දුව

"මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට ද, පෝතක බාලදක්ෂ නීතියට කීකරු වීමට ද, දිනපතා යහපත් වැඩක් කිරීමට ද, මාගේ සම්පූර්ණ උත්සාහය යෙදීමට පොරොන්දු වෙමි."

### පෝතක බාලදක්ෂ නීතිය

1. පෝතක බාලදක්ෂයා ආකේලාට කීකරු වෙයි.
2. පෝතක බාලදක්ෂයා ප්‍රයෝජනවත් අයෙක් වෙයි.
3. පෝතක බාලදක්ෂයා වඩාත් හොඳින් කිරීමට යත්න දරයි.

පෝතක බාලදක්ෂ නිල ඇඳුම




### පෝතක බාලදක්ෂ ආදර්ශ පාඨය

"සෑම වීර්යය කරමි."




සාමාජික පදක්කම්


රන් තරුව



රිදී තරුව



ලෝකඩ තරුව




### පෝතක බාලදක්ෂ අංශය සඳහා පරිශීලනය කළ යුතු පොත් පත්

- පෝතක බාලදක්ෂ වැඩසටහන.
- පෝතක බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් නිර්දේශය.
- වන කතාව.
- පෝතක බාලදක්ෂ ප්‍රගති පත්‍රිකාව.
- පෝතක බාලදක්ෂ ප්‍රගති කාඩ්පත.
- පෝතක බාලදක්ෂ ගීත පොත හා සී.ඩී තැටිය.
- ක්‍රීඩා පොත.
- බාලදක්ෂ ආචාර්ය අත්පත්‍රිකා පොත.

### පෝතක බාලදක්ෂ රැලක් ආරම්භ කරන්නේ කෙසේද?

පෝතක බාලදක්ෂ පළමු අදියර පුහුණුව ලැබූ ආචාර්යවරයෙක් / වරියක් මගින් පෝතක බාලදක්ෂ රැළක් ආරම්භ කළ හැකිය. මේ සඳහා සිසු සිසුවියන් අවම 12 ක් උපරිම 36 ක් සිටිය හැකිය. එක රැළක පෝතක බාලදක්ෂයන් හයවල් (කුඩා ඒකක) කිහිපයකට වෙන් කළ හැකිය. මෙම කුඩා ඒකකයක පෝතක බාලදක්ෂයින් උපරිම 06 ක් සිටිය හැකිය. ඒවා ආකර්ෂණීය වර්ණ වලින් නම් කර හැකිය. අදාල හයවල් වල සමාජිකයින් හඳුනා ගැනීම සඳහා හය අණ්ඩ (වර්ණ ත්‍රිකෝණ) වම් කමිස අතේ පැළඳ ගනී.

උදා - හය අණ්ඩ (Sixer Patches)



**පෝතක බාලදක්ෂයින්ගේ පුහුණු කිරීමේ ක්‍රම වේදය**

පළමු අදියර පෝතක බාලදක්ෂ නායක පුහුණුව ලැබූ නායිකාවකගේ/නායකයෙකුගේ නායකත්වය යටතේ සතියකට වරක් නියමිත දිනයක විනාඩි 75 ක එළිමහනේ රැස්වීම් වාරයක් පැවැත්විය යුතුය. පුහුණුව ලබා දීමේදී නියමිත විෂය නිර්දේශය අනුගමනය කළ යුතු ය. බාලදක්ෂ නායක අත් පත්‍රිකා පොතේ පෝතක බාලදක්ෂ අංශයට අදාළ පිටු 32 සිට 58 දක්වා කොටස පරිශීලනය කරන්න.

## 3. කණිෂ්ඨ බාලදක්ෂ අංශය

6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණියේ දක්වා (අවු. 10 1/2 සිට 14 1/2 දක්වා) වූ දරු දැරියන් කණිෂ්ඨ බාලදක්ෂ අංශයට ඇතුළත් කර ගත හැකිය. බාලදක්ෂ බාලිකාවන් (Girl's in scouting) ඇතුළත් කර ගන්නේ නම් බාලදක්ෂ නායිකාවක් සිටීම අනිවාර්ය වේ.

බාලදක්ෂ බාලිකාවන් සිටින කණ්ඩායම් වල කිසිදු හේතුවක් මත පිරිමි බාලදක්ෂ ආචාර්යවරුන්ට මූලිකත්වය ගෙන කටයුතු කළ නොහැක. ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ බාලදක්ෂිකා කණ්ඩායමක් (Girl Guide) තිබෙන පාසලක බාලදක්ෂ බාලිකා කණ්ඩායමක් ආරම්භ කිරීම නුසුදුසු වේ.

**අරමුණු**

ශ්‍රී ලංකාවේ වයස අවු 10 1/2 සිට 14 1/2 දක්වා වූ වයස් කාණ්ඩයේ පාසල් දරු දැරියන්ගේ පෞද්ගලික සංවර්ධනයට අදාල වන කායික, බුද්ධිමය, චිත්තවේගීය, සමාජීය, අධ්‍යාත්මික හා සංස්කෘතික යන අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආගමික නැඹුරුව, පරිසර සංරක්ෂණය, නිරීක්ෂණය, නිර්මාණශීලී බව, නායකත්ව පුහුණුව, කඳවුරු බැඳීම, ගැට හා බැමි ආදිය උපයෝගී කර ගැනීම. මේ සඳහා සාමාජික පදක්කම, බාලදක්ෂ ප්‍රදානය, ප්‍රදාන කොමාසාරිස් අභියෝගිතා ප්‍රදානය, ප්‍රදාන කොමසාරිස් ප්‍රදානය, ප්‍රවීණතා පදක්කම් මාර්ගය හා ඔවුන්ගේ සහජ දස්කම් වර්ධනය සඳහා ප්‍රවීණතා පදක්කම් 56ක් ඇතුළත් කර ඇත.

**බාලදක්ෂ පොරොන්දුව**

"මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට ද, සැම කල්හි ම අනුන්ට උපකාරී කිරීමට ද, බාලදක්ෂ නීතියට කීකරු වීමට ද, මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සහය යෙදීමට ගෞරව බහුමාණයෙන් පොරොන්දු වෙමි.

**බාලදක්ෂ නීතිය**

1. බාලදක්ෂයා විශ්වාස කටයුතු අයෙකි. (A Scout is trustworthy)
2. බාලදක්ෂයා පක්ෂපාති අයෙකි. (A Scout is loyal)
3. බාලදක්ෂයා හිතෛෂීය කාරුණික අයෙකි. (A Scout is friendly and considerate)
4. බාලදක්ෂයා සැම බාලදක්ෂයෙකුගේ ම සහෝදරයෙකි.
(A Scout is a Brother to every other Scout)
5. බාලදක්ෂයා ධෛර්යය සම්පන්න අයෙකි. ( A Scout is courageous)
6. බාලදක්ෂයා සත්ව කරුණාව ඇත්තෙකි. (A Scout is kind to animals)
7. බාලදක්ෂයා සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකි. (A Scout is Cooperative)

8. බාලදක්ෂයා සොම්නස් සහගත අයෙකි. (A Scout is Cheerful)
9. බාලදක්ෂයා සකසුරුවම් අයෙකි. (A Scout is Thrifty)
10. බාලදක්ෂයා සිත, කය හා වචනයෙන් පිරිසිදු අයෙකි.
(A Scout is clean in thought" word and Deed)

**කණිෂ්ඨ බාලදක්ෂ ආදර්ශ පාඨය**
"සූදානම්ව සිටිනු"

**කණිෂ්ඨ බාලදක්ෂ පදක්කම් ක්‍රමය**
සාමාජික පදක්කම


**බාලදක්ෂ ප්‍රදානය**





කණිෂ්ඨ බාලදක්ෂ නිල ඇඳුම





දිසා කොමසාරිස් රැහැන




ප්‍රධාන කොමසාරිස් අභියෝගතා ප්‍රදානය



ප්‍රධාන කොමසාරිස් ප්‍රදානය

**පරිශීලනය කළ යුතු පොත්පත්**

- ළමා හා තරුණ වැඩසටහන
- බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් නිර්දේශය
- බාලදක්ෂ විද්‍යාව
- බාලදක්ෂ ප්‍රගති වාර්තා පොත
- බාලදක්ෂ ප්‍රදානය දිනා ගැනීමේ මග
- බාලදක්ෂ ආචාර්ය අත්පත්‍රිකා පොත
- බාලදක්ෂ ගීත සහ ක්‍රීඩා පොත්
- බාලදක්ෂ ප්‍රගති කාඩ්පත් 1
- සාමාජික පදක්කම දිනා ගැනීමේ මග
- ප්‍රධාන කොමසාරිස් ප්‍රදානය දිනා ගැනීමේ මග

**බාලදක්ෂ කණ්ඩායමක් ආරම්භ කරන්නේ කෙසේද?**

බාලදක්ෂ 1 අදියර පුහුණුව ලැබූ ආචාර්යවරයෙක් / වරියක් මඟින් කණිෂ්ඨ බාලදක්ෂ කණ්ඩායමක් ආරම්භ කළ හැකි ය. මේ සඳහා සිසු සිසුවියන් අවම 12 ක් හා උපරිම 40 ක් විය හැකිය. එක කණ්ඩායමක කණිෂ්ඨ බාලදක්ෂයන් කාණ්ඩ (කුඩා ඒකක) කිහිපයකට වෙන්කළ හැකිය. මෙම කුඩා ඒකක සත්ත්ව නාම වලින් නම් කළ හැකි ය.
උදා - රාජාලියා, ගිරා, මයුර, සැළලිහිණි, පරවි
එක් කාණ්ඩයක කණිෂ්ඨ බාලදක්ෂයින් උපරිම 8 ක් සිටිය හැකිය.

**කණිෂ්ඨ බාලදක්ෂයින් පුහුණු කිරීමේ ක්‍රමවේදය**

සතියකට වරක් අවම වශයෙන් 1 අදියර බාලදක්ෂ නායක පුහුණුව ලැබූ ආචාර්යවරයෙකු හෝ වරියෙකු යටතේ විනාඩි 90 ක එළිමහන් රැස්වීම් වාරයක් පැවැත් විය යුතුය. පුහුණුව ලබාදීමේ දී නියමිත විෂය නිර්දේශයන් අනුගමනය කළ යුතු ය. මෙම අංශයේ කටයුතු කිරීමේ දී කාණ්ඩ ක්‍රමය අනුගමනය කිරීම, කාණ්ඩ සභා (Patrol in council) පැවැත්වීම, කාණ්ඩ නායක සභා (Patrol leaders council) පැවැත්වීම, කාණ්ඩ නායකයන් විශේෂ පුහුණුවට යොමු කිරීම අත්‍යවශය වේ.

බාලදක්ෂ බාලිකාවන් සිටි නම් බාලදක්ෂ ආචාර්යවරියක භාරයේ පුහුණුව ලබා දීම අනිවාර්ය වේ. බාලදක්ෂ ආචාර්ය අත්පොතේ පිටු අංක 59 සිට 95 දක්වා පරිශීලනය කරන්න.

**ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශය**

- පාසලේ 9 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා වූ දරු දැරියන් (අවු 15 සිට 18 දක්වා) ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශයට ඇතුළත් කර ගත හැකි ය.
- බාලදක්ෂ බාලිකාවන් ඇතුළත් කර ගන්නේ නම් බාලදක්ෂ ආචාර්යවරියෙකු සිටීම අනිවාර්ය වේ. බාලදක්ෂ බාලිකාවන් සිටින කණ්ඩායම් වල කිසිදු හේතුවක් මත පිරිමි ආචාර්යවරුන්ට මූලිකත්වය ගෙන කටයුතු කළ නොහැකි ය.

ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ බාලදක්ෂිකා සමාජයක් තිබෙන පාසලක බාලදක්ෂ බාලිකා කණ්ඩායමක් ආරම්භ කිරීම නුසුදුසු ය.

**අරමුණු**

ශ්‍රී ලංකාවේ වයස අවු. 14 සිට අවු 18 දක්වා වූ වයස් කාණ්ඩයේ පාසල් දරු දැරියන්ගේ පෞද්ගලික සංවර්ධනයට අදාල වන කායික, බුද්ධිමය, චිත්තවේගීය, සමාජීය හා සංස්කෘතික යන අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආගමානුකූල දිවි පෙවෙත, පරිසර සංරක්ෂණය, නිරීක්ෂණය, ගවේෂණය, පුරෝගාමී ක්‍රියා, පාගමන්, නායකත්වය, කඳවුරු බැඳීම, ගැට හා බැමි ආදිය උපයෝගි කර ගනියි. මේ සඳහා අග්‍රාමාත්‍ය ප්‍රධානය, ජනාධිපති බාලදක්ෂ ප්‍රදානය දක්වා වූ ප්‍රගති පදක්කම් මාර්ගය හා ඔවුන්ගේ සහජ දස්කම් තව දුරටත් වර්ධනයට ප්‍රවීණතා පදක්කම් 67ක් ඇතුළත් කර ඇත.

**ජ්‍යේෂ්ඨ බාලදක්ෂ ආදර්ශ පාඨය**

"පුළුල්ව බලමු"

(බාලදක්ෂ අත්පත්‍රිකා පොතේ පිටු 88, 89)

**ජ්‍යේෂ්ඨ බාලදක්ෂ කණ්ඩායම් ආරම්භ කරන්නේ කෙසේද?**

කණිෂ්ඨ බාලදක්ෂ අංශයේ පුහුණුව ලද බාලදක්ෂයින් වයස අවු. 14 ඉක්මවීමත් සමඟ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශයට උසස් කෙරේ. ඔවුන්ගේ ඉදිරි ප්‍රගති කටයුතු ජ්‍යෙෂ්ඨ අංශයට අදාල විෂය නිර්දේශයට අදාල ව කළ යුතු වේ.

අලුතින් ම ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශයට බාලදක්ෂයන් ඇතුළත් වේ නම් ඔවුන්ට සාමාජික පදක්කමේ සියලු අවශ්‍යතා සපුරාලමින් ජනාධිපති ප්‍රදානය දක්වා ළඟා විය හැකි ය.

**ජ්‍යේෂ්ඨ බාලදක්ෂ පුහුණු කිරීමේ ක්‍රමවේදය**

සතියකට වරක් පාසල් කාලයෙන් පසු 1 අදියර බාලදක්ෂ නායක පුහුණුව ලබා සිය ඉදිරි පුහුණු කටයුතු සපුරාලමින් සිටින ආචාර්යවරයෙකු හෝ වරියෙකු යටතේ විනාඩි 90ක එළිමහන් රැස්වීම් වාරයක් පැවැත්විය යුතුය. පුහුණුව ලබාදීමේ දී නියමිත විෂය නිර්දේශයන් අනුගමනය කළ යුතු ය. බාලදක්ෂ බාලිකාවන් සිටි නම් බාලදක්ෂ ආචාර්යවරියක භාරයේ පුහුණුව ලබා දීම අනිවාර්ය වේ. මෙම අංශයේ කටයුතු කිරීමේ දී කාණ්ඩ ක්‍රමය අනුගමනය කිරීම, කාණ්ඩ සභා පැවැත්වීම, කාණ්ඩ නායක සභා පැවැත්වීම, කාණ්ඩ නායකයන් විශේෂ පුහුණුවට යොමු කිරීම අත්‍යවශය වේ.

මෙම අංශයේ කටයුතු කරන බාලදක්ෂයන් සාමාජීය කටයුතු, ප්‍රජා සේවා කටයුතු සහ විශේෂ ගවේෂණ, පාගමන්, චාරිකා, කඳවුරු ආදියට සහභාගි විය යුතු බැවින් ඒ සඳහා ක්‍රමවත් ව අවස්ථාව සලසා දීම විදුහල්පතිතුමාගේ සහ බාලදක්ෂ නායක වරයාගේ වගකීම වේ.

**ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශය සඳහා පරිශීලනය කළ යුතු පොත් පත්**

- මා හා තරුණ වැඩසටහන
- බාලදක්ෂ ප්‍රවීණතා පදක්කම් නිර්දේශය
- බාලදක්ෂ විද්‍යාව
- බාලදක්ෂ ආචාර්ය අත්පත්‍රිකා පොත
- බාලදක්ෂ ගීත සහ ක්‍රීඩා පොත්
- බාලදක්ෂ ප්‍රගති වාර්තා පොත 11

(බාලදක්ෂ නායක අත්පොතේ පිටු අංක 59 සිට 95 දක්වා පරිශීලනය කරන්න.)

**ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ පදක්කම් ක්‍රමය**

සාමාජික පදක්කම





ජේෂ්ඨ බාලදක්ෂ
නිළ ඇඳුම




බාලදක්ෂ ප්‍රදානය



ප්‍රධාන කොමසාරිස් ප්‍රදානය



දිසා කොමසාරිස් රැහැන




ප්‍රධාන කොමසාරිස් අභියෝගතා ප්‍රදානය



වනවාසියාගේ රැහැන




එයාර්මන් පදක්කම




සීමන් පදක්කම




අග්‍රමාත්‍ය බාලදක්ෂ ප්‍රදානය



ජනාධිපති බාලදක්ෂ ප්‍රදානය

## මානවක බාලදක්ෂ අංශය

පාසලේ 12 ශ්‍රේණියේ සිට වයස (අවු 18 -26) අතර බාලදක්ෂ බාලක බාලිකාවන් මෙම අංශයට ඇතුලත් කර ගත හැකි ය.

මානවක බාලදක්ෂ බාලිකාවන් පුහුණුව ලබන්නේ නම් මානවක බාලදක්ෂ නායිකාවක් යටතේ පුහුණුව ලැබීම අනිවාර්ය වේ.

### අරමුණු

ශ්‍රී ලංකාවේ වයස අවු 18 සිට අවු 26 දක්වා වූ වයස් කාණ්ඩයේ තරුණ තරුණියන්ගේ කාලීන පෞද්ගලික සංවර්ධනයට අදාළ කායික, බුද්ධිමය, චිත්තවේගීය, සාමාජීය, අධ්‍යාත්මික හා සංස්කෘතික යන අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ඉලක්ක සපුරා ගැනීම අපේක්ෂා කෙරේ.

1. අධ්‍යාත්මික සංවර්ධනය තුලින් විනය ගරුක හා සාධාරණ පුද්ගලයෙකු බවට තම ජීවිතය හැඩ ගස්වා ගැනීම.
2. තමා පරිණත මිනිසෙකු ලෙස සමාජගත වීම සඳහා වගකීම බාර ගැනීමට සුදුසු මානසික හා ශාරීරික දියුණුවක් අත් පත් කර ගැනීම.
3. පෞරුෂත්ව වර්ධනය හා චරිත වර්ධනය, යහපත් පුරවැසි බව හා ස්වයං විශ්වාසය ගොඩ නංවා ගැනීම.
4. පෝතක හා බාලදක්ෂ පුහුණුව තුලින් අත්පත් කරගත් ප්‍රතිපත්ති හා පුහුණු ක්‍රම ප්‍රගුණ කර ගනිමින් තව දුරටත් ඒවා ගැඹුරෙන් හැදෑරීමට ඉඩ ප්‍රස්තා සලසා ගැනීම.
5. වැඩිදුර අධ්‍යාපන සඳහා උනන්දු වීම මගින් තමන්ගේ අනාගත දිවිය ශක්තිමත් කර ගැනීමට සහාය ලබා ගැනීම.
6. තම අධ්‍යාපන සීමාවන් හා කුසලතා හඳුනාගත් විගස එම හැකියාවන් මත පිහිටා වෘත්තීමය පුහුණු අවස්ථා උදාකර ගැනීම තුලින් තමන්ගේ ජීවිත සාර්ථක කර ගැනීමට කටයුතු කිරීම.
7. වෘත්තියක් ආරම්භ කළ පසු ප්‍රගතියක් අත්පත් කර ගැනීම සඳහා උපදෙස් හා දායකත්වය ලබාදීමේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම.

**මානවක බාලදක්ෂ ආදර්ශ පාඨය - "අපි සේවය කරමු"**

**පදක්කම් ක්‍රමය**

සමාජික





මානවක උර පළඳනා




මානවක පරමාදර්ශ පදක්කම



මානවක බාලදක්ෂ නිල ඇඳුම

**ප්‍රවීණතා තරු**





**මානවක සමාජයක් ආරම්භ කරන්නේ කෙසේද?**

ලංකාවේ වයස අවුරුදු 18 ත් 24 ත් අතර සිසු සිසුවියන් සඳහා මානවක බාලදක්ෂ පළමු අදියර පුහුණුව ලැබූ ආචාර්යවරයෙක් / වරියක් මගින් මානවක බාලදක්ෂ සමාජයක් ආරම්භ කළ හැකි ය. මේ සඳහා සිසු සිසුවියන් අවම 06 ක් හා උපරිම 24 ක් සිටිය හැකි වේ.

එක සමාජයක පර්ෂද (කුඩා ඒකක) කිහිපයක් තිබිය හැකි අතර එක් පර්ෂදයක අවම වශයෙන් 3 සිට 6 දක්වා මානවක බාලදක්ෂයින් සිටිය හැකි ය. පර්ෂද ජාත්‍යන්තර වීරයන් හෝ ප්‍රභූන්ගේ නම් වලින් හැඳින්විය හැකි ය.

උදා:- මහත්මා ගාන්ධි, ඒබ්‍රහම් ලින්කන්, ඩබ්.ඩී අමරදේව

**මානවක බාලදක්ෂයන් පුහුණු කිරීමේ ක්‍රමවේදය**

සති දෙකකට වරක් පහසු දිනක පහසු ස්ථානයක මානවක බාලදක්ෂ, පළමු අදියර පුහුණුව ලැබූ මානවක බාලදක්ෂ ආචාර්යරයෙකු / වරියකගේ අධීක්ෂණය යටතේ එළිමහනේ හෝ සුදුසු පරිදි සමාජ රැස්වීම් පැවැත්විය හැකි ය. මානවක බාලදක්ෂ බාලිකාවන් සහභාගි වන්නේ නම් මානවක බාලදක්ෂ ආචාර්යවරයකගේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීම අනිවාර්ය වේ. පුහුණුව ලබා දීමේ දී මානවක බාලදක්ෂ විෂය නිර්දේශය අනුගමනය කිරීම අනිවාර්ය වේ. මානවක බාලදක්ෂ කටයුතු වල දී සමාජ ක්‍රමය,පර්ෂද ක්‍රමය,පර්ෂද නායක රැස්වීම් යන ක්‍රම වේදයන් අනුගමනය කළ යුතු ය. පුහුණු කටයුතු කර ගෙන යාමේ දී මානවක බාලදක්ෂ අංශයේ ප්‍රගති පදක්කම් මාර්ගය පොත පරිශීලනය කිරීම අත්‍යවශය වේ. මානවක බාලදක්ෂයන් බාලදක්ෂ ව්‍යාපාරයේ ප්‍රවර්ධනය හා සමාජ සංවර්ධනය කෙරෙහි වැඩිපුර යොමු වීම අපේක්ෂා කෙරේ. මානවක බාලදක්ෂ කටයුතු පාසලෙන් ආරම්භ කර බහු තාක්ෂණික ආයතන හා විශ්ව විද්‍යාල මට්ටම දක්වා පුළුල් කර ගැනීමට අවකාශ ඇත.

## වැඩිහිටි පුහුණුව

**බාලදක්ෂ නායක පුහුණුව**

බාලදක්ෂ ව්‍යාපාරයේ බාලදක්ෂයින් පුහුණු කරනුයේ වැඩිහිටි බාලදක්ෂ ආචාර්ය මහත්ම මහත්මීන් විසිනි. මේ අය සඳහා අංග සම්පූර්ණ පස් වැදෑරුම් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක වේ.

මෙම පුහුණුවට විදුහල්පතිතුමා විසින් නිර්දේශ කරනු ලබන ගුරු මහත්ම මහත්මීන් ඇතුලත් විය හැකි ය. මෙම බාලදක්ෂ ආචාර්යවරුන්ට සහය වීම සඳහා සහය බාලදක්ෂ ආචාර්යවරුන් ලෙස වයස අවු 18 ට වැඩි අ.පො.ස (සා.පෙළ) සමත් පාසලේ ආදි බාලදක්ෂ හෝ ශිෂ්‍ය නායක/නායිකාවකට විදුහල්පතිතුමාගේ නිර්දේශය මත සහභාගි විය හැකි ය. බාලදක්ෂ ආචාර්ය පුහුණුව, බාලදක්ෂ දිස්ත්‍රික්ක මට්ටමින්, දිසා කොමසාරිස්තුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මේ සඳහා දිසා මට්ටමින් අයදුම්පත් කැඳවනු ලැබේ. ආදර්ශ අයදුම්පත මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 01) බලන්න. තමාගේ පාසල අයත් බාලදක්ෂ දිසාවේ දිසා කොමසාරිස් වෙත අයදුම්පත යොමු කළ යුතු ය.
පළමු අදියර පාඨමාලා හැදෑරූ පසු බාලදක්ෂ මහත්ම මහත්මීන් තම පාසලේ බාලදක්ෂ ඒකක ආරම්භ කළ යුතු ය.

පළමු අදියර පුහුණුවෙන් පසු තම ඒකකයේ බාලදක්ෂයන් සාමාජික පදක්කම ප්‍රදානය කිරීම දක්වා පුහුණු කළ හැකි වන අතර තවදුරටත් ඉදිරියට බාලදක්ෂයින් ප්‍රගතිය කරා රැගෙන යාමට පස් වැදෑරුම් වැඩිහිටි පුහුණුවේ දෙවන අදියර, හතරවන අදියර පාඨමාලා වලට සහභාගීවීමත්, තුන්වන හා පස්වන අදියර සේවාස්ථ පුහුණු සම්පූර්ණ කිරීමත් අත්‍යවශ්‍යය වේ.

පස්වැදෑරුම් පුහුණුව නිම කිරීමෙන් පසු බාලදක්ෂ ආචාර්ය මහත්ම මහත්මීන් සඳහා පිරිනැමෙන උසස්ම ප්‍රදානය වන ලී පදක්කම (wood badge) පිරිනමනු ලැබේ. (මෙය ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙන වටිනා පදක්කමකි.)

**බාලදක්ෂ ඒකකයක් පවත්ගෙන යාමේදී ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම්/අවශ්‍යතා සහ ඇගයීම්**

| අංශ | ක්‍රියාකාරකම් (අදාළ අංශයට ගැලපෙන ක්‍රියාකාරකම් පමණක් තෝරා ගන්න.) | උපකරණ (අදාළ අංශයට ගැලපෙන උපකරණ පමණක් තෝරා ගන්න.) | ලිපි ලේඛණ (අදාළ අංශයට ගැලපෙන ලිපි ලේඛණ පමණක් පවත්වාගෙන යන්න.) | ඇගයීම |
|---|---|---|---|---|
| සිඟිති බාලදක්ෂ<br>පෝතක බාලදක්ෂ<br>කණිෂ්ඨ බාලදක්ෂ<br>ජ්‍යේෂ්ඨ බාලදක්ෂ<br>මානවක බාලදක්ෂ | පා ගමන්<br>කඳවුරු<br>සංචාර<br>ප්‍රජා සංවර්ධන කටයුතු<br>ආගමික උත්සව<br>තරඟ<br>සංස්කෘතික ක්‍රියාකාරකම්<br>අධ්‍යාපන ක්‍රියාකාරකම්<br>කතන්දර කීම<br>එළිමහන් ක්‍රියාකාරකම්<br>තිරසාර ක්‍රියාකාරකම්<br>සති අන්ත පුහුණුව<br>පැය 1\1/2 | කොඩි<br>කොඩි ලණු<br>නලාව<br>ක්‍රීඩා උපකරණ<br>ලිපි ද්‍රව්‍යය<br>අලවංගුව<br>උදැල්ල<br>මාලිමාව<br>කඹ<br>පිහි<br>ප්‍රථමාධාර<br>අත්පොරව<br>ලන්තෑරුම | • ඇතුලත් වීමේ ලිපි ගොණු<br>•අධ්‍යාපන දෙපාර්තුමේන්තු ලිපි ගොණු/ චක්‍රලේඛ<br>•බාලදක්ෂ මූලස්ථාන/දිසා චක්‍රලේඛ<br>•දෙමාපිය අවසර ලිපි<br>• ලොග් පොත<br>• පැමිණීමේ ලේඛණ<br>• ප්‍රගති වාර්තා<br>• ප්‍රගති සටහන්<br>• ප්‍රගති කාඩ්පත්<br>•බාලදක්ෂ ජයග්‍රහණ පිළිබඳ වර්තා | • ඒකක මට්ටම (බාලදක්ෂ සමූහ මට්ටම)<br>• දිසා මට්ටම<br>• ජාතික මට්ටම<br>• ජාත්‍යන්තර මට්ටම |

සාමාජික පදක්කම




ලී පදක්කම



බාලදක්ෂ ආචාර්ය නිල ඇඳුම



ගිල්වෙල් කර ලේන්සුව



ගිල්වෙල් වොගලය



**පාසල තුළ බාලදක්ෂ කටයුතු පවත්වාගෙන යාමේ ප්‍රතිලාභ**

**බාලදක්ෂයාට ලැබෙන ප්‍රතිලාභ**

- ❖ යහපත් ආදර්ශමත් පුරවැසියෙකු වීමට මග පෑදීම.
- ❖ පාසල් වයසේදී ම ලෝකයේ දැවැන්තම ජාත්‍යන්තර යෞවන සංවිධානයක සාමාජිකත්වය ලබා ගැනීමට අවස්ථාව උදාවීම.
- ❖ පාසල් කාලයේ සිට මුළු ජීවිත කාලය පුරාම ප්‍රයෝජනයට ගත හැකි ජීවන කුසලතා ලබා ගත හැකි වීම.
- ❖ සහජ දක්ෂතා සහ සැඟවුනු කුසලතා මතුකර ගැනීමට හා සංවර්ධනය කර ගැනීමට හැකි වීම.

- ❖ සියළු අභියෝගයන්ට අවබෝධයෙන් යුතුව මුහුණ දෙමින් ජීවිත කාලය පුරාවට ම සතුටින් ගත කිරීමට හැකි වීම.
- ❖ සමාජයීය කටයුතුවලට යොමු වෙමින් සමාජය තුළ පිළිගැනීමට ලක්වෙමින් නිහතමානී ජීවිතයකට හුරු කර වීම.
- ❖ තම ආගම හා රට වෙනුවෙන් ඉටු කළ යුතු තම යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීමට හුරුවීම.
- ❖ සෑම බාලදක්ෂ අංශයක ම ඉහළම ප්‍රදානය දිනා ගන්නා බාල දක්ෂයින්ට අදාළ නියමිත පදක්කම සමග ජාතික මට්ටමේ පිළි ගැනීමකට ලක්වන සහතිකයක් ප්‍රදානය කිරීම.
- ❖ බාලදක්ෂයෙකුට දිනා ගත හැකි උසස්ම ප්‍රදානය වන ජනාධිපති බාලදක්ෂ ප්‍රදානය සඳහා විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී අමතර ලකුණු ප්‍රමාණයක් හිමි වීම.
- ❖ ජාතික හා ජාතන්තර මට්ටමේ වැඩ සටහන් වලට සහභාගී වීමට අවශ්‍යය ඉඩ සැලසීම.
- ❖ පාසල තුළ කැපී පෙනෙන නායකත්වයක් හා පිළිගැනීමක් ලැබීම.
- ❖ ජාතික හා ජාත්‍යන්තර සංහිදියාව වර්ධනයට අදාළ වැඩ සටහන් වලට සහභාගි වීමේ අවස්ථාව හිමි වීම.
- ❖ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීමේ අවස්ථා හිමි වීම.

**බාලදක්ෂ ආචාර්ය වරුන්ට ලැබෙන ප්‍රතිලාභ**

- ❖ තම ආගම හා රට කෙරෙහි කළ යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට විශේෂ අවස්ථාවක් උදා වීම.
- ❖ ජාත්‍යන්තර ස්වෙච්චා සංවිධානයක වැඩිහිටි සාමාජිකත්වය හිමිවීම.
- ❖ බාලදක්ෂ ක්‍රමවේද හා පුහුණු උපකරණ යොදා ගැනීම පිළිබඳ ලබා ගන්නා සුවිශේෂී ප්‍රායෝගික පුහුණු නිසා තම වෘත්තීය නිපුණතා සංවර්ධනය කර ගැනීම හැකිවීම.
- ❖ පාසල් පද්ධතිය තුළ සැමගේ ගෞරව ආදරයට හා පිළිගැනීමට ලක් වීම.
- ❖ වෘත්තීය ඇගයීම් වල දී විශේෂිත ඇගයීමකට ලක් වීම.
- ❖ තම ඒකකයේ දරුවන්ගේ දැනුම, කුසලතා ආකල්ප මෙන් ම නිපුනතා සංවර්ධනය වනු දැකීමෙන් ස්වයං ආත්ම තෘප්තියක් ලැබීම.

**පාසලට ලැබෙන ප්‍රතිලාභ**

- ❖ පාසල තුළ විනය පවත්වාගෙන යාමට පහසු වීම.
- ❖ බාලදක්ෂ කටයුතු වලින් සිසුන් ලබන විවිධ අත්දැකීම් පාසලේ විවිධ කටයුතු සංවිධානයේ දී උපයෝගී කර ගත හැකි වීම. පාසලේ උත්සව අවස්ථා වර්ණවත් කර ගැනීමට හැකි වීම.
- ❖ පාසලට සුවිශේෂී කීර්තියක් ලබා ගැනීමට හැකි වීම.

## 2.2 IV ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය
## (1917)

- බාලදක්ෂිකාවක් යනු ලොව පුරා විසිරී සිටින විශාල පවුලක සාමාජිකාවකි.
- සොයා ගැනීමට සූදානම්, ගවේෂණය කිරීමට හා විනෝදයෙන් පිරුණු ගෘහස්ථ හා එළිමහන් ක්‍රියාකාරකම් සහිත වැඩසටහනක් භුක්ති විඳීමට ඇයට අවස්ථා සැලසේ.

**දැක්ම**

බාලිකාවන්ගේ සහ තරුණියන්ගේ හඬ බවට පත් වෙමින් ගෝලීය ගැටලු වලට බලපෑම් කරමින් ඔවුන් සඳහා වඩා හොඳ ලෝකයක් බිහි කිරීමේ ප්‍රමුඛතම ලෝක ව්‍යාප්ත සංවිධානය බවට පත් වීම.

**මෙහෙවර**

බාලිකාවන් සහ තරුණියන්ගේ හැකියා සහ දක්ෂතා උපරිම අන්දමින් වර්ධනය කොට ඔවුන් ලෝකයේ වගකිව යුතු පුරවැසියන් බවට පත් කිරීම.

**හැඳින්වීම**

වර්තමාන ලෝකයේ ළමා හා තරුණියන් සඳහා ක්‍රියාත්මක වන විශාලතම, ප්‍රබලතම හා ජනප්‍රියතම ස්වේච්ඡා සංවිධානය වන බාලදක්ෂිකා ව්‍යාපාරය තුළින් ලබාදෙන නොවිධිමත් අධ්‍යාපන වැඩ පිළිවෙළ පාසල් තුළ ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මග පෙන්වීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. මේ අනුව පාසල් පද්ධතිය තුළ නව බාලදක්ෂිකා කණ්ඩායම් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා ක්‍රමවේදයන් හා ප්‍රතිලාභ මෙහි අන්තර්ගතව ඇත.

**ආරම්භය හා ව්‍යාප්තිය**

**බාලදක්ෂිකා ව්‍යාපාරයේ නිර්මාතෘ**



බාලදක්ෂ ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය හමුදාවේ ලුතිනන් ජෙනරාල්වරයෙකු වූ 1857 පෙබරවාරි 22 එංගලන්තයේ දී උපත ලද රොබට් ස්ටීවන්සන් ස්මිත් බේඩ්න් පොයෙල් සාමිතුමා විසිනි. ඉතා දක්ෂ සටන් මෙහෙයවන්නෙකු වූ බේඩ්න් පොයෙල් සාමිතුමා ලෝකය පුරා ප්‍රකට වූයේ දකුණු අප්‍රිකාවේ මැෆ්කින් නගරය සතුරන්ගෙන් මුදා ගැනීමේ දී කළ පරිත්‍යාග හා ඇප කැපවීම් නිසා ය. විශේෂයෙන් මේ නිසා ඔහු ළමයින් අතර ජනප්‍රිය චරිතයක් බවට පත් විය. තමා විසින් යුධ බිමේදී ලැබූ අත්දැකීම් අනුව ඔහු විසින් ලියන ලද වැඩිහිටියන් සඳහා වූ බාලදක්ෂ කටයුතු සඳහා උපදෙස් ග්‍රන්ථය ද ළමයින් අතර ජනප්‍රිය වී තිබුණි. මේ ජනප්‍රියත්වය මත ළමයින් වෙනුවෙන් යමක් කිරීමට ඔහුට වුවමනා විය.

ඉන්දියාවේ සහ දකුණු අප්‍රිකාවේ යුධ බිම්වල සේවය කරද්දී තමා ලද අත්දැකීම් උපයෝගී කොට නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බේඩ්න් පොයෙල් සාමිතුමාට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1907 දී ලොව පළමු බාලදක්ෂ කඳවුර ඉංග්‍රීසි ඕඩයේ බ්‍රවුන්සි දූපතේ දී පවත්වන්නට ඔහුට හැකි විය. පසුව බාලදක්ෂ විද්‍යාව පිළිබඳ ඔහු රචනා කළ ග්‍රන්ථය හේතුවෙන් ලොව බොහෝ රටවල බාලදක්ෂ සංගම් ආරම්භ විය. බාලදක්ෂ ව්‍යාපාරය ලොව පුරා පැතිරයත්ම හමුදා සේවයෙන් ඉවත් වූ බේඩ්න් පොයෙල් සාමිතුමා සිය ජීවිතය ඒ වෙනුවෙන් ම කැප කළේ ය.

## ඇග්නස් බේඩ්න් පොයෙල් සහ බාලදක්ෂිකා ව්‍යාපාරය



1910 වසරේ දී බේඩ්න් පොයෙල් සාමිතුමා ගැහැණු ළමුන් උදෙසා බාලදක්ෂිකා ව්‍යාපාරය හඳුන්වා දෙන ලදී. ඉන්පසු නැගණිය වන ඇග්නස් බේඩ්න් පොයෙල්ට මෙම ව්‍යාපාරය පවරා දෙන ලදී. ක්‍රිස්ටල් මාලිගාවේ පැවති පළමු බාලදක්ෂ රැලියට සහභාගි වූ ගැහැණු ළමුන්ගේ ඉල්ලීම මත ඇරඹුණු බාලදක්ෂිකා ව්‍යාපාරයේ පළමු සභාපතිනිය ලෙස ඇග්නස් බේඩ්න් පොයෙල් 1910 දී පත්විය. 1914 දී ඇරඹූ කනිෂ්ඨ අංශය රෝස්බඩ්ස් යන නමින් ආරම්භව පසුව බ්‍රවුනීස් ලෙස නම වෙනස් කරන ලදී. 1920 වසරේදී සභාපති ධූරයෙන් ඉවත් වූ ඇග්නස් බේඩ්න් පොයෙල් එම තනතුර බේඩ්න් පොයෙල් ආර්යාව වන ඔලෙව් බේඩ්න් පොයෙල් මැතිනිය වෙත ප්‍රදානය කරන ලදී. ඇය 1918 දී එංගලන්තයේ ප්‍රධාන බාලදක්ෂිකාව ලෙස ද, 1930 දී ලෝක ප්‍රධාන බාලදක්ෂිකාව ලෙස ද පත් විය.

## ලෝක බාලදක්ෂිකා සහ බාලදක්ෂ මානවිකා සංගමය (WAGGGS)

වර්තමාන ලෝකයේ රටවල් 155ක මිලියන 10ක් අභිබවා බාලදක්ෂිකා සාමාජිකාවන් ව්‍යාප්ත වී ඇති අතර පරිපාලන පහසුව සඳහා කලාප 5කට බෙදා ඇත. ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය අයත් වන්නේ ඒ අතුරින් විශාලතම කලාපය වන ආසියා ශාන්තිකර කලාපයටයි. ලෝක බාලදක්ෂිකා හා බාල දක්ෂ මානවිකා සංගමයට කලාප පහක් ඇත. ඒවා යුරෝපය, අරාබි, අප්‍රිකාව, ආසියා ශාන්තිකර සහ බටහිර අර්ධගෝලය ලෙස හඳුනා ගත හැකි ය.



## ලෝක මධ්‍යස්ථාන

ලෝක බාලදක්ෂිකා හා බාලදක්ෂ මානවිකා මූලස්ථානය එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පිහිටා ඇත. තවද ලෝක මධ්‍යස්ථාන 5 ක් ඇත. ඒවා පහත ලෙස දැක්විය හැකි ය.




1. ස්විට්සර්ලන්තයේ ඇඩෙල්බෝඩන් හි පිහිටි අවර් ෂැලේ (Our Chalet) 1932දී විවෘත කරන ලදී.
2. අපේ කබානා (Our Cabaña), මෙක්සිකෝවේ කුවනවාකාහි 1957 දී විවෘත කරන ලදී
3. පැක්ස් ලොජ් (Pax Lodge), හැම්ප්ස්ටඩ්, ලන්ඩන්, එංගලන්තය වත්මන් ස්ථානය 1990 දී විවෘත කරන ලදී. එය තුන්වන ලෝක මධ්‍යස්ථානයයි. පළමුවැන්න 1937 දී විවෘත කරන ලද අතර 25 වැනි ලෝක සංවත්සරයේ දී එම මධ්‍යස්ථානය Olave House ලෙස නම් කරන ලදී.
4. සංගම් (Sangam), ඉන්දියාවේ මහාරාෂ්ට්‍රයේ පූනේහි 1966 දී විවෘත කරන ලදී.
5. කුසෆිරි (Kusafiri), අප්‍රිකාවේ නගර අතර ක්‍රියාත්මක වේ. 2010 දී විවෘත කරන ලද අතර ජංගම මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ.

**ශ්‍රී ලංකා බාලදක්ෂිකා ව්‍යාපාරය**

**<u>ශ්‍රී ලංකා බාලදක්ෂිකා ව්‍යාපාරයේ නිර්මාතෘ</u>**



රටවල් 155ක කාන්තා සාමාජිකයන් මිලියන 10කට අධික ලොව විශාලතම කාන්තා ස්වේච්ඡා සංවිධානය වන ලෝක බාලදක්ෂිකා හා බාලදක්ෂ මානවිකා සංගමයෙහි (WAGGGS) සාමාජිකත්වය ශ්‍රී ලංකාවට ද 1917 දී ලැබිණි. ජෙනී කැල්වලි මෙනවිය විසින් මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ දී පළමු බාලදක්ෂිකා කණ්ඩායම ආරම්භ කරන ලදී. එවකට එම විද්‍යාලයේ විදුහල්පතිනිය එෆ්.ආර්. සැන්සම් මහත්මිය මේ සඳහා දායකත්වය ලබා දුණි.

ගෝලීය ගැහැණු ළමුන් සහ තරුණ කාන්තාවන් සඳහා වෙන් වූ ලෝකයේ වගකිවයුතු පුරවැසියන් ලෙස සිය පූර්ණ හැකියාවන් දියුණු කිරීමට ගැහැණු ළමුන් සහ තරුණ කාන්තාවන් සවිබල ගැන්වීම මෙම ව්‍යාපාරයේ මෙහෙවර වී ඇත. මෙය කුලය, ආගම, සහ ජාතිය විවිධ තරාතිරම්වල ගැහැණු ළමුන් සහ කාන්තාවන් සඳහා විවෘත වූ රාජ්‍ය නොවන, ආගමික නොවන මෙන්ම දේශපාලන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ නොවන සංවිධානයකි.

**එකමුතු බවේ පුරුක් - Links of Unity**

මේවා ලෝක බාලදක්ෂිකා සංගමයේ සාමාජිකත්වය දරණ සෑම රටටකටම පොදු ලක්ෂණයන් වෙයි.

- බාලදක්ෂිකා පොරොන්දුව, නීතිය සහ ආදර්ශ පාඨය.
- බාලදක්ෂිකා සළකුණ, ආචාරය සහ වම් අතින් අතට අත දීම.
- යහපත් ක්‍රියාව.
- ලෝක පදක්කම සහ ලෝක ධජය.
- ලෝක ගීතය.
- සිහි කිරීමේ දිනය.
- නිර්මාතෘවරයා සහ ලෝකයේ ප්‍රධාන බාලදක්ෂිකාව

**බාලදක්ෂිකා පොරොන්දුව**

මාගේ ආගම හා රට කෙරෙහි
මාගේ යුතුකම ඉටුකිරීමටත්,
හැමවිටම අනුන්ට
පිහිටවීමටත්,
බාලදක්ෂිකා නීතිය අනුව
ජීවත් වීමටත්
මට හැකි තරමින් දිරිදැරීමට
මම ගෞරව පෙරදැරිව
පොරොන්දු වෙමි.

**බාලදක්ෂිකා නීතිය**

1. බාලදක්ෂිකාව අවංකය, විශ්වාස කටයුතුය.
2. බාලදක්ෂිකාව පක්ෂපාතය.
3. බාලදක්ෂිකාව අනුන් ගැන සලකයි, හැමවිටම උපකාර කරයි.
4. බාලදක්ෂිකාව අන් සෑම බාලදක්ෂිකාවකගේම සොහොයුරියකි.
5. බාලදක්ෂිකාව මිත්‍රශීලී ය, ආචාරශීලී ය.
6. බාලදක්ෂිකාව සියලුම ජීවීන් කෙරෙහි කරුණාශීලී ය.
7. බාලදක්ෂිකාව නීති ගරුකය.
8. බාලදක්ෂිකාව දිරිමත් ය, සෑම අවස්ථාවක දීම අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි.
9. බාලදක්ෂිකාව නැණවත්ව සම්පත් පරිහරණය කරයි.
10. බාලදක්ෂිකාව තම ගරුත්වය රැකගනිමින් අන් අය අවබෝධ කරගැනීමට උත්සාහ ගනී.

**බාලදක්ෂිකා ආදර්ශ පාඨය**

බේඩින් පොයෙල්තුමා විසින් ආරම්භ කරන ලද බාලදක්ෂ හා බාලදක්ෂිකා ව්‍යාපාර දෙකෙහිම ආදර්ශ පාඨය 'සූදානම්ව සිටින්න' යන්න වේ. ඉංග්‍රීසියෙන් ලියැවෙන පරිදි එතුමාගේ නමේ මුලකුරු දෙකට, ඉංග්‍රීසි බසින් කියැවෙන මෙම ආදර්ශ පාඨයේ මුලකුරු සමාන වේ. (බී.පී.සාමිතුමා)

BE PREPARED

''සූදානම්ව සිටින්න''

1901 වසරේදී බේඩින් පොයෙල් තුමා විසින් ආරම්භ කරන ලද අශ්වාරෝහක පොලිස් බලඇණියේ සිටි මිනිසුන් විසින් පළමුවෙන්ම මේ ආදර්ශ පාඨය තෝරාගන්නා ලදී.



**ආචාරය සහ සළකුණ**

ආචාරයේ දී හා සළකුණ දැක්වීමේ දී දකුණු අතේ ඇඟිලි තුනක් නළල දක්වා ඔසවා බාලදක්ෂිකාව එකිනෙකාට ආචාර කරයි. එම අත ඇඟිළි තුන දක්වමින් උරහිස දක්වා එසවීමෙන් බාලදක්ෂිකා සළකුණ භාවිතා කරයි.

ඉහළට එසවී ඇති ඇඟිලි තුන මගින් පොරොන්දුවේ කොටස් තුන නිරූපණය කරයි. බාලදක්ෂිකාවන් එසේ ආචාර කරන්නේ නිළ ඇඳුමෙන් සිටින විට පමණි.

**සළකුණ**

දකුණු අතේ මැද ඇඟිලි තුන උරහිස දක්වා එසවීමෙන් සළකුණ දක්වයි.

**වම් අතින් අතට අත දීම**

බාලදක්ෂිකා ව්‍යාපාරයේ සාමාජික සාමාජිකාවන් එකිනෙකාට ආචාර කිරීම සඳහා භාවිතා කරන විශේෂ ක්‍රමයකි. ලෝක බාලදක්ෂිකා සංගමයේ නිර්මාතෘ ව්‍යාපාරයේ අනෙකුත් සාමාජිකයින් හඳුනා ගැනීම සඳහා වම් අතට අත දීමක් යෝජනා කළ අතර එය තවමත් භාවිතා වේ. බටහිර අප්‍රිකාවේදී බේඩන්-පොයෙල් සාමිවරයා මීට පාදක වූ පුරාවෘත්තයක් සඳහන් කර ඇත. මෙහිදී සතුරු, අසල්වැසි ප්‍රජාවන් දෙකක් සාමයෙන් එකට ජීවත් වීමට උත්සාහ කිරීමට තීරණය



කළ අතර, ඔවුන් වම් අතේ රැගෙන ගිය පලිහ බිම හෙළා විශ්වාසයෙන් සහ මිත්‍රත්වයෙන් තම වම් දෑත් දිගු කර එකිනෙකාට ආචාර කර ඇත. මෙම රහස් සංඥාව තරුණ පිරිසට මනාව ගැළපෙන බව සිතා බේඩ්න් පොයෙල් සාමිවරයා මෙම ක්‍රියාව බාලදක්ෂ බාලදක්ෂිකා සංවිධානවලට හඳුන්වා දුන්නේ ය.

**යහපත් ක්‍රියාව**

බාලදක්ෂිකා ජීවිතයේ මුදුන් මුල සේවයයි. බාල දක්ෂිකාවගේ කාලය ප්‍රයෝජනයට ගනිමින් වෙනත් කෙනෙකු සඳහා යම් දෙයක් කිරීම සේවය යනුවෙන් සලකයි. යහපත් ක්‍රියාවෙන් සංකේතවත් කරන්නේ ව්‍යාපාරයේ සියලු ම සාමාජිකාවන් විසින් නිවසේ දී පාසලේ දී හෝ ප්‍රජාවට කරනු ලබන සේවයයි. පොරොන්දුවේ දෙවෙනි කොටසේ සඳහන් වන ආකාරයට සේවයට සූදානමින් සිටීම බාලදක්ෂිකා වැඩසටහනේ ඇතුළත් ප්‍රධාන අංගයක් වේ.

**ලෝක පදක්කම සහ ලෝක ධජය**

**ලෝක පදක්කම**



**ලෝක ධජය**



**ලෝක බාලදක්ෂිකා ධජයේ සංකේත මගින් අර්ථවත් වන කරුණු**

**නිල් පසුතලය මත ඇති ත්‍රිපත**

- නිල් අහසේ බබළන හිරු සංකේතවත් කරයි.
- හිරු අහස මත සියලු දෙනාට ආලෝකය හා උණුසුම ලබා දෙන්නේ යම් ආකාරයට ද බාලදක්ෂිකා ව්‍යාපාරය සියලු බාලදක්ෂිකාවන්ට ආලෝකය ලබාදෙන බව පිළිබිඹු කරයි.
- පත්‍ර දෙකෙහි ඇති තරු දෙකින් පොරොන්දුව සහ නීතිය සංකේතවත් වේ.
- පෙති තුන පොරොන්දුවේ කොටස් 3 නියෝජනය කරයි.
- කොම්පාසුවේ ඉඳිකටුව මගින් බාලදක්ෂිකාව නිවැරදි මග ගමන් කරන බව දක්වයි.
- ත්‍රිපත වටා ඇති කවය ලෝක සංගමය නියෝජනය කරයි.

**රන්වන් පැහැති කොටු තුන**

- පොරොන්දුවේ කොටස් තුන සංකේතවත් කරයි.

**සුදු පැහැති කොටස**

- සාමය කෙරෙහි බාලදක්ෂිකාවන්ගේ කැපවීම සංකේතවත් කරයි.
- 1991 වසරේ මාර්තු මාසයේ දී මෙම ලෝක බාලදක්ෂිකා ධජය හඳුන්වා දෙන ලදී.

**සිහිකිරීමේ දිනය හා සිහිකිරීමේ දින ලාංඡනය**

පෙබරවාරි මස 22 වන දින බී. පී.සාමිවරයාගේ හා එම ආර්යාවගේ උපන් දිනය යෙදී තිබෙන නිසා ලොව පුරා බාලදක්ෂ හා බාලදක්ෂිකාවන් එම සාමිවරයා හා ආර්යාව සමරනු ලබයි. (1857 පෙබරවාරි 22, 1889 පෙබරවාරි 22) වර්ෂ 1926 දී පැවති ලෝක සම්මේලනයේ දී මෙම දිනය සිහි කිරීමේ දිනය ලෙස නම්කෙරිණි. සිහි කිරීමේ දිනයේ දී අඩුම වටිනාමින් යුත් කාසියක් පරිත්‍යාග කිරීමට යෝජනා වූ අතර පසුව එය 1932 දී "සිහි කිරීමේ දින අරමුදල" ලෙස නම් කෙරිණි.



__ලෝක ගීතය__

Our way is clear as we march on,
And see our flag on high!
It's never furled,
Throughout the world,
For hope shall never die
We must unite for what is right,
In friendship true and strong,
Until the earth,
In its rebirth,
Shall sing our song,
Shall sing our song.


All those who love the true and good,
Who's promises were kept,
With humble minds,
Whose acts were kind,
Whose honour never slept!
These were the free,
And we must be,
Prepared like them to live,
To give to all,
Both great and small,
All we can give.
All we can give.

බාලදක්ෂිකා සංගමයේ ඉතිහාසයෙන්....

1. 1917 - පළමු බාලදක්ෂිකා කම්ටුව මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ ජෙනී කැල්වල් මිය විසින් ආරම්භ කරන ලදී.
2. 1922 - පළමු සමස්ත ලංකා රැළිය පැවැත්වීම.
3. 1928 - පළමු බාලදක්ෂිකා මූලස්ථානය විවෘත කරන ලදී.
4. 1951 - සංගමය, WAGGGS සම්පූර්ණ සාමාජිකයෙකු බවට හඳුනා ගන්නා ලදී.
5. 1952 - ශ්‍රී ලංකාවේ පළමු ප්‍රධාන කොමසාරිස් ලෙස එඩිනා අල්විස් මිය පත් කරන ලදී.
6. පළමු ජාත්‍යන්තර කොමසාරිස් ලෙස ජෙනට් වෛරාකියම් පත් කරන ලදී.
7. 1957 - ආබාධිත ශාඛාවෙහි පළමු උපදේශයක ලෙස සීතා රාජසූරිය මිය පත් කරන ලදී.
8. 1960 - සීතා රාජසූරිය මිය ලෝක කම්ටුවට තේරී පත් විය.
9. 1969 - ආසියා පැසිෆික් කම්ටුවේ පළමු සභාපති ලෙස සීතා රාජසූරිය මිය පත් කරන ලදී.
10. 1975 - සීතා රාජසූරිය මිය ඇමරිකාවේ විසි දෙවන ලෝක සමුළුවේ  මුලසුන දැරීය. ඇය ලෝක සමුළුව මුලසුන දැරූ පළමු ආසියාතිකයා විය.
11. 1977 - දියමන්ති ජුබිලිය ජාත්‍යන්තර කඳවුර කොළඹ දී පවත්වන ලදී.
12. 1981 - ප්‍රේනී ජුල්ලා මිය ආසියා - පැසිෆික් කම්ටුවට තෝරා පත් කරන ලදී.
13. 1985 - ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ නිර්මාතෘ වූ ජෙනී කැල්විලී මියගේ අභාවය
14. 26 වන ලෝක සම්මන්ත්‍රණයේ දී විනිෂියා ගමගේ මිය ලෝක කම්ටුවට තෝරා පත් විය.
15. 1997 - බාලදක්ෂිකා කටයුතු බන්ධනාගාරවල ආරම්භ විය.
16. 1999 - ජාත්‍යන්තර ජ්‍යේෂ්ඨ බාලදක්ෂිකා කඳවුරක් මාවනැල්ලේ දී පැවැත්විණි.
17. 2000 - ආසියා පැසිෆික් කම්ටු රැස්වීම් ශ්‍රී ලංකාවේ පැවැත්විණි.
18. 2008 - පළමු සමස්ත ලංකා වික්‍රමාන්විත ක්‍රීඩා උළෙල ගණේමුල්ලල ජාතික පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වීම.
19. 11 වන මහනුවර බාලදක්ෂිකාවන් ඔලෙව් සම්මානය ලබා ගැනීම.
20. 2010 - වජිරා සිල්වා මෙනවිය සහ උත්පලා ජයසේකර මෙනවිය ලෝක බාලදක්ෂිකා සංගමයේ සංවත්සර තානාපතිවරියන් ලෙස පත් විය.
21. 2011 - ශලීකා අබේගුණසේකර මිය ලෝක කම්ටුවේ සාමාජිකාවක් ලෙස පත් විය.
22. රුචිරා ජයසිංහ මෙනවිය 10 වන ආසියා පැසිෆික් සම්මන්ත්‍රණයේ උප සභාපති ලෙස කටයුතු කිරීම.
23. 2017 - ජම්බෝ 17 කඳවුර සියවස් සැමරුම නිමිත්තෙන් මින්නේරියේ දී පැවැත්විණි.
24. 2018 - චමත්‍යා ප්‍රනාන්දු මෙනවිය ලෝක කම්ටුවේ සාමාජිකාවක් ලෙස පත් විය.
25. 2022 ප්‍රාර්ථනා ලියනගේ මෙනවිය ආසියා පැසිෆික් කලාපයේ උප සභාපති තනතුරට පත් විය.

# SRI LANKA GIRL GUIDES ASSOCIATION ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය

## STRUCTURE ව්‍යුහය



**බාලදක්ෂිකා සංගමයේ ප්‍රධාන අංශ**

- සමනලී අංශය
- කුඩා මිතුරි අංශය
- බාලදක්ෂිකා අංශය
- විවිධ දක්ෂතා සහිත බාලදක්ෂිකා අංශය
- රේන්ජර්දක්ෂිකා අංශය
- ප්‍රජා බාලදක්ෂිකා අංශය



**සමනලී අංශය**

සමනලී යනු,

අවුරුදු 05 - 08 අතර සිසුවියන් වන අතර මෙයට අයත් වන්නේ පාසලේ එක හා දෙක ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුවියන් ය. ඇයට තුන් වන ශ්‍රේණියේ මාස 06 ක් පමණ කාලයක් ගෙවෙන තුරු කටයුතු කළ හැකි ය.

**සමනලී ඒකකය**



මෙය කුඩා කොටස් 04 කට බෙදේ. ඒවා කහ, රතු, තැඹිලි හා දම් වශයෙන් රංචු ලෙස හඳුන්වනු ලබයි. ඒකකයක සමනලියන් 24 දෙනෙක් සිටිය යුතු අතර එවැනි ඒකක කිහිපයක් වුවද පාසලක් තුළ ආරම්භ කළ හැකිය. අවම වශයෙන් වැඩිහිටි නායිකාවන් දෙදෙනෙකුවත් සිටිය යුතු ය. කුඩා මිතුරි රැළක් සහිත පාසලක පවත්වාගෙන යාම වඩාත් සුදුසු වේ. එසේ නොවුවද සමනලී ඒකකයක් ඇරඹිය හැකි ය.

**සමනලී පොරොන්දුව**

"මම කරුණාවන්ත වීමටත් අන් අයට උදව් කිරීමටත් පොරොන්දු වෙමි."

**සමනලී ආදර්ශ පාඨය**

"සතුටු වන්න"

**සමනලී තේමාව**

"බලමු. ඉගෙන ගනිමු. සිනාසෙමු. ආදරය කරමු."

**සමනලී සලකුණ**



දකුණු අතේ දබරැඟිල්ල හා මැදඟිල්ල කෙළින් සිටින සේ තබාගෙන වෙදැඟිල්ල සහ සුළැඟිල්ල නමා මාපටැඟිල්ලෙන් ස්පර්ශ වචන සේ තබා අත උරහිස තෙක් එසවීමෙන් සලකුණ දැක්විය යුතු ය. ඇඟිලි දෙකින් පිළිඹිබු වන්නේ පොරොන්දුවේ කොටස් දෙකයි.

**සමනලී ආචාරය**

දකුණු අත දකුණු ඇහි බැමේ ගැවෙන නොගැවෙන සේ ආචාරය දක්වමින් වම් අතින් අතට අත දීම සිදු කරයි.

**සමනලී නිළ ඇඳුම**

ඒකකයේ සියලුම සමනලියන් එකම ඇඳුමකින් සැරසී සිටිය යුතුය. පාසල් නිළ ඇඳුම/ සමනලී නිළ ඇඳුම, සමනලී ලාංඡනය සහිත ලා නිල් පැහැති කමිසය හා තද නිල් සාය (Scort). තම රැනේ වර්ණයට අදාළ රංචු පදක්කම ඒකකය ආරම්භ කළ දින සිට ම පැළඳිය යුතුය. පොරොන්දු උත්සවයෙන් පසු පොරොන්දු පදක්කම හා ලෝක පදක්කම පැළඳිය යුතුය. සමනලියන් 'තරුව' කරා ළඟා වීමේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ පසු තරු පදක්කම පැළඳීම කළ හැකිය. නිළ ඇඳුම් සඳහා කළු මේස් සහ කළු සපත්තු පැළඳිය යුතුය.



**සමනලී පෙනන්ට්**




**සමනලී උසස් ආචාරය** (Grand Flutter)

සමනලියන් උසස් ආචාරය කරන අවස්ථා පහත පරිදි වේ.

- ආරාධිත අමුත්තකු පිළිගැනීමට.
- පියාසර කරන සමනලියන්ට සමු දීමට.

**සමනලී රැස්වීම් කාලය**

පැයකට නොවැඩි විය යුතුය.

**සමනලී**

- සමනලිය බඳවා ගැනීමට ප්‍රථම දෙමාපිය රැස්වීමක් පවත්වා අවසර ලබා ගත යුතු ය.
- පාසල් වේලාවෙන් පසු හෝ පාසල ලබා දෙන වේලාව තුළ රැස්වීම් පැවැත්විය යුතු ය.
- රැස්වීම් කාලය පැයකට සීමාවීම ප්‍රමාණවත් ය. රැස්වීම ආරම්භයේ දී සරඹ කළ යුතු ය.
- සෑම ඒකකයකට ම බඳවා ගත යුතු ළමුන් ගණන අවම 06 උපරිම 24 කි.
- දින 12 වැඩසටහන අවසානයේ පොරොන්දු උත්සවය පැවැත් විය යුතු ය. (දින 12 වැඩසටහන සම්පූර්ණ කළ බවට ක්‍රියාකාරකම් සටහන් පත්‍රයේ ලකුණු කළ යුතු ය.)

**පොරොන්දු උත්සවය**

දින 12 වැඩසටහන අවසාන වූ පසු දෙමාපියන් සහ විදුහල්පතිවරුන් දැනුම්වත් කර පොරොන්දු උත්සවය පැවැත්විය යුතු ය.

**තරු පදක්කම**

සමනලී තේමා 04 වන 'බලමු, ඉගෙන ගනිමු, සිනාසෙමු, ආදරය කරමු' යටතේ එක් තේමාවකින් අවම වශයෙන් එක් ක්‍රියාකාරකමක් හෝ සම්පූර්ණ කර තරු පදක්කම සඳහා සුදුසුකම් ලබාගත යුතුය.

**කුඩා මිතුරි රැළ කරා පියාසර කිරීම**

සමනලී ක්‍රියාකාරකම් සියල්ල සාර්ථකව අවසන් කළ පසු තම පාසලේ 'කුඩා මිතුරි නායිකාව' පූර්ව දැනුම්වත් කළ පසුව 'සමනලියන්ට' කුඩා මිතුරු රැළ කරා ඉහළට පියාසර කිරීමේ අවස්ථාව හිමි වේ.

**කුඩා මිතුරි**

**කුඩා මිතුරි පොරොන්දුව**

මාගේ ආගම හා රට කෙරෙහි මාගේ යුතුකම ඉටුකිරීමටත්, හැමවිටම අනුන්ට පිහිටවීමටත්, දිනපතා හොඳ ක්‍රියා කිරීමටත් මට හැකි තරමින් දිරිදැරීමට මම ගෞරව පෙරදැරිව පොරොන්දු වෙමි.

**කුඩා මිතුරි ආදර්ශ පාඨය**

"උදව් කරන්න" "LAND A HAND"

**කුඩා මිතුරි සලකුණ**

දකුණු අතේ දබරැඟිල්ල මැදඟිල්ල හා වෙදැඟිල්ල කෙළින් සිටින සේ තබාගෙන සහ සුළැඟිල්ල නමා මාපටැඟිල්ලෙන් ස්පර්ශ වන සේ තබා අත උරහිස තෙක් එසවීමෙන් සලකුණ දැක්විය යුතුය. ඇඟිලි දෙකින් පිළිඹිබු වන්නේ පොරොන්දුවේ කොටස් දෙකයි.

**කුඩා මිතුරි ආචාරය**

දකුණු අත දකුණු ඇහි බැමේ ගැවෙන නොගැවෙන සේ ආචාරය දක්වමින් වම් අතින් අතට අත දීම.

**කුඩා මිතුරි නිළ ඇඳුම**

රැළේ සියලුම කුඩා මිතුරියන් එකම ඇඳුමකින් සැරසී සිටිය යුතු ය. පාසල් නිළ ඇඳුම/කුඩා මිතුරි නිළ ඇඳුම. බාලදක්ෂිකා ලාංඡනය මුද්‍රිත ලා නිල් පැහැති කමිසය හා තද නිල් සාය/දිග කලිසම, කහ සහ දුඹුරු ඉරි සහිත ස්කාෆ්. තම රැළේ නමට  අදාළ රංචු පදක්කම, පොරොන්දු පදක්කම හා ලෝක පදක්කම පොරොන්දු උත්සවයෙන් පසු පැළඳිය යුතු ය.





### කුඩා මිතුරි රැළක් ක්‍රියාත්මක කරන ආකාරය

කුඩා මිතුරි රැස්වීම සඳහා පැමිණෙන විට, කුඩා මිතුරියන් ඔවුන්ගේ හය පෙළ මුල්ලෙහි (sixer corners) සිටිය යුතු ය, සෙවණ ඇති ගසක් යට ඔවුන් ground sheets එලාගෙන, ඔවුන්ගේ බඩු බාහිරාදිය කෙළවරේ පිළිවෙලට සැකසිය යුතුයි. වරින් වර ඔවුන්ගේ හය පෙළ මුල්ල අත්කම් මගින් හෝ සොබාදහමෙන් එකතු කරන දේවලින් (ගස්වලින් කොළ කඩා නොගෙන) අලංකාර කළ හැකි ය.
සරසා ඇති කල්ප වෘක්ෂය මධ්‍යයේ තබා ගෙන, එය වටා මිත්‍රත්වයේ කවය සැකසිය යුතු ය. (සෑම සතියකම එක් හය පෙළක් කල්ප වෘක්ෂය භාර ව සිටිය හැකි ය.)

### කුඩා මිතුරි රැළක් පවත්වාගෙන යාමට උපදෙස්

- කුඩා මිතුරි රැළක අවම වශයෙන් කුඩා මිතුරියන් 12 ක්, උපරිම වශයෙන් කුඩා මිතුරියන් 36 ක් සහ වැඩිහිටි නායිකාවන් දෙදෙනෙකු සිටිය යුතු ය. (වනරාණි සහ වනකුමරි).
- බාලිකාවන්ගේ වයස් සීමාව - අවුරුදු 8 සිට 12 දක්වා.
- කුඩා මිතුරි රැළක විවිධ කුඩා මිතුරියන් සිටිය යුතු ය. එනම් අලුතින් බඳවා ගත් කිහිප දෙනෙක්, රන් තීරුව සහ රන් අත කරන කිහිප දෙනෙක් ලෙස සිටිය යුතු ය.

### මිත්‍රත්ව කවය සහ රැළේ රාවය - රැළ ආරම්භ කිරීම

- වනරාණි සහ වන කුමරි ඔවුන්ගේ ස්ථාන වලට ගොස් මිත්‍රත්ව කවය සකස් කරති.
- එවිට වනරාණි "රැළ, රැළ, රැළ, රැළ" යනුවෙන් අමතයි, එවිට "තිත් මුවෝ අපි එනවා...." යන්න ගයමින් සියලු කුඩා මිතුරියන් ඔවුන්ගේ හය පෙළ මුල්ලෙහි මිත්‍රත්ව කවය වෙත දිව යා යුතු ය.
- ඔවුන් මිත්‍රත්ව කවය සාදන විට වනරාණි "ඔබ කවුරුද" කියා අසයි. එවිට කුඩා මිතුරියෝ කෑගසන්නේ "රැළේ කුඩා මිතුරියෝ වෙමු" යනුවෙනි.
- එවිට වනරාණි "ඔබට කුමක් කළ හැකිද?" අසයි එවිට කුඩා මිතුරියන් රවුමක් ලෙසින් සැදී රැළේ රාවය දෙවරක් ගායනා කරමින් එක් දිශාවකටත් සහ ප්‍රතිවිරුද්ධ දිශාවටත් දිව යති.
- එවිට වනරාණිට සෑම හය පෙළකටම ඔවුන්ගේ හය පෙළ ගීතය (sixer song) ගායනා කරන ලෙස ආරාධනා කරයි.
- දවසේ රැළේ රන් (pack gold) එකතු කිරීම සඳහා කුඩා මිතුරියක් පත් කළ හැකිය. පැමිණීම සටහන් කරන විට කුඩා මිතුරියෝ උඩ පැන "පැක්" කියමින් ඔවුන්ගේ රුපියල් පහේ කාසිය එකතු කරන තැනැත්තා වෙත ගෙන ආ යුතු ය.
- පැමිණීම සටහන් කිරීමෙන් පසුව, වනරාණිට හෝ වනකුමරිට දවසේ ක්‍රියාකාරකම් පැහැදිලි කළ හැකි අතර ඊළඟ ක්‍රියාකාරකමට මඟ පෙන්වනු ඇත.
- දවසේ ක්‍රියාකාරකම් ඇතුළත, ගයන ගීත කිහිපයක් සහ සැමට සහභාගී විය හැකි ක්‍රීඩාවක් ඇතුළත් විය යුතු ය.

### රැළේ රාවය - රැළ අවසන් කිරීම

දවස අවසානයේදී, රැළේ රාවය ගායනා කිරීම සඳහා ඔවුන්ගේ ස්ථාන පිරිසිදු කිරීමෙන් පසු නැවත මිත්‍රත්වයේ කවයට පැමිණෙන ලෙස වනරාණි / වන කුමරි කුඩා මිතුරියන් හට දැනුම් දෙයි.

ඊළඟ සතියේ ක්‍රියාකාරකම් සඳහා ඔවුන් ගෙන ඒමට අවශ්‍ය දේ හෝ ඔවුන් සූදානම් වීමට අවශ්‍ය පරීක්ෂණ මොනවා ද යන්න ඔවුන්ට දැන්විය යුතු ය.

### රැළක කුමක් කළ හැකිද?

කුඩා මිතුරියෝ සතුටින් තබා ගැනීමට සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට රැළක විවිධ ආකාරයේ ක්‍රියාකාරකම් තිබිය යුතු ය. ඔවුන් හැකි තරම් පරිසර හිතකාමී සහ කණ්ඩායම් වැඩ කිරීමට උත්සාහ කළ යුතු ය.

රැළක රැස්වීම් සඳහා අදහස් කිහිපයක් පහත දැක්වේ.

- රසවත් කෑමක් පිසීමට ඉඩ ලබා දීම.
- නිර්මාණශීලී වීමට අවස්ථාව සලසා දීම. චිත්‍ර / ශිල්ප / මැහුම් / ගෙතීම.
- ස්වභාව ධර්මය හරහා ගමන් කිරීමට ඉඩ දෙන්න - සොබාදහමේ ඇවිදීම, ක්‍රීඩා හෝ ක්‍රියාකාරකම්.
- විනෝද වීමට අවස්ථාව දීම, - ක්‍රීඩා සහ ගීත.

රැළක් සඳහා වැඩසටහන සැලසුම් කිරීමේදී අවම වශයෙන් එක් වරක්වත් විශේෂ ක්‍රියාකාරකමක් ඇතුළත් කිරීමට උත්සාහ කළ යුතු ය.

සෑම සතියකම පරීක්ෂණ කටයුතු කළ යුතු ය. පරීක්ෂණ කිරීම සඳහා මසකට වරක් තබා ගත යුතු වේ. කුඩා මිතුරියන්ට එකිනෙකා සමඟ විනෝද වීමට සහ නව කුසලතා ඉගෙන ගැනීමට, අත්දැකීම් බෙදා ගැනීමට ඉඩ දිය යුතු ය. පහත දැක්වෙන කුසලතා වර්ධනය කර ගැනීමට කුඩා මිතුරියන්ට මෙය උපකාරී වේ.

- නායකත්වය.
- සහයෝගීතාවය.
- එකිනෙකාට ගරු කිරීම.
- කාල කළමණාකරණය.
- පරිසර හිතකාමී වීම.
- සකසුරුවම්.

ඉදිරි කටයුතු සැලසුම් කිරීම වැදගත් ය. ඒ නිසා කුඩා මිතුරියන්ගේ ක්‍රියාකාරකම් වඩාත් සංවිධානාත්මක හා පැහැදිලිව කිරීමට වාර්ෂික සැලැස්මක් තබා ගැනීම කළ යුතු ය.

කුඩා මිතුරි රැළක් ක්‍රියාත්මක කිරීමට වනරාණිට තිබිය යුතු දේ

- කුඩා මිතුරි බලපත්‍රය
- කල්ප වෘක්ෂ
- ප්‍රථමාධාර කට්ටලය

අත්කම් සඳහා ලිපි ද්‍රව්‍ය, බොත්තම්, රිබන්, කතුර ආදිය සහිත ඇසුරුම් පෙට්ටිය සහ ලියාපදිංචි කිරීමේදී කාසි එකතු කිරීම සඳහා කැටයක්.

**කුඩා මිතුරි රැළේ වාර්ෂික සැලැස්ම**

වාර්ෂික වැඩසටහනට පහත සඳහන් උත්සව ඇතුළත් කළ හැකි ය.

- ජාතික උත්සව
  - සිහි කිරීමේ දිනය පෙබරවාරි 22 හෝ ඊට ආසන්න දිනය
  - නිළඇඳුම් දිනය - මාර්තු 21
- පළාත් / කලාපීය උත්සව
  - වෙසක් සැමරුම- මැයි
  - නත්තල් කැරොල් - දෙසැම්බර්
- කණ්ඩායම් උත්සව
  - බඳවා ගැනීම සහ පියාසර කිරීමේ උත්සවය
  - සංවත්සර සැමරුම / අවුරුදු සැමරුම
- දෙමාපියන්ගේ රැස්වීම්
  - බඳවා ගැනීමේ උත්සව, රංචු නිවාඩු හා පා ගමන් සැලසුම් කිරීමේදී
  - කුඩා මිතුරියන් රන් අත පදක්කම ආරම්භ කිරීමේදී

**කුඩා මිතුරියන්ගේ වෙනත් විශේෂ උත්සවය**

Revels - (විනෝද දිනය) කුඩා මිතුරියන්ගේ ක්‍රියාකාරකම්වල සඳහන් වගන්ති පහ ඇතුළත් කර කුඩා මිතුරියන් සඳහා විනෝදජනක ක්‍රියාකාරකම් දිනයක් සංවිධානය කළ හැකි ය.

මෙහිදී 1. මම ආරක්ෂාකාරී හා සෞඛ්‍ය සම්පන්න වෙමි.

2. මම වික්‍රමාන්විත වෙමි.
3. මම මගේ අනාගතය දකිමි.
4. මම නිර්මාණශීලී වෙමි.
5. මම දැනුම්වත් වෙමි.

යන වගන්ති යටතේ දැනුම හා කුසලතා වර්ධනය වන ආකාරයේ ක්‍රියාකාරකම් ඇතුළත් වන විනෝද දිනයක් පැවැත්විය හැකි ය.

Sleepover - (යෝධ නින්ද) කුඩා මිතුරියන්ට විනෝද ක්‍රියාකාරකම් සමඟ පාසලේ එක් රාත්‍රියක් ගත කළ හැකි ය.

Pack Holiday රංචු නිවාඩුව - සොබාදහම් පා ගමනක්, එළිමහනේ ආහාර පිසීම, ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ශිල්පීය දැනුම සහ ක්‍රීඩා සහ ගායනය ඇතුළු විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් කර ඔවුන්ගේ පාසලෙන් බැහැර ස්ථානයක රාත්‍රී දෙකක් රැඳී සිටීමට කටයුතු කළ යුතු ය.

**විශේෂ රැළේ සරඹ**

1. කතා කවය

කතා කවයෙහි වැදගත්කම කුමක්ද?

- රැළක වැදගත් කරුණු සාකච්ඡා කිරීම.
- වැඩසටහන් / උත්සව ආදිය සැලසුම් කිරීම.
- රංචු නිවාඩුව සැලසුම් කිරීම.

**කතා කවය කරන්නේ කෙසේද?**

- වනරාණි "pow wow" යනුවෙන් පැවසීමේදී, කුඩා මිතුරියන් අත් අල්ලාගෙන රවුමක් සාදයි.
- කුඩා මිතුරියන් පියවරක් ඉදිරියට තබා "pow wow" යනුවෙන් ඉතා හයියෙන් කෑ ගසයි,
- ඊළඟට මධ්‍යම ශබ්දයෙන් "pow wow" යන්න කියමින් එක් පියවරක් ද,
- තෙවනුව ඉතා සියුම් ශබ්දයෙන් "pow wow" කියමින් තවත් පියවරක් ද ගෙන,
- කුඩා මිතුරියන් එරමිණිය ගොතා ගෙන වාඩි වෙයි.
- කුඩා මිතුරියකට කතා කිරීමට අවශ්‍ය වූ විට ඇඟිලි තුනක් බිම තබා ගනී. එවිට වනරාණි ඇයට කතා කිරීමට අවස්ථාව ලබා දෙයි.

**"pow wow" අවසන් කිරීමට;**

නැගිට අත් අල්ලාගෙන "pow wow" මෘදු ලෙස කිව යුතු ය. පසුව අඩියක් පස්සට තබා මධ්‍යම ශබ්දයෙන් "pow wow" කිව යුතු ය. ඉන්පසු තවත් පියවරක් පසුපසට ගෙන "pow wow" ශබ්ද නගා කියා, කුඩා මිතුරියන් විසිර යයි.

**2. උසස් ආචාරය (Grand Salute)**

කුඩා මිතුරියන් උසස් ආචාරය ලබා දෙන අවස්ථා පහත ලෙස දැක්විය හැකි ය.

**විශේෂ අවස්ථා** -

- ආරාධිත අමුත්තා පිළිගැනීමට
- පියාසර කරන කුඩා මිතුරියන්ට සමු දීමට.

**බාලදක්ෂිකාවන්**

**බාලදක්ෂිකා කණ්ඩායමක් යනු,**

බලපත්‍ර ලත්නායිකාවක් සහ උපනායිකාවක් සමඟ උපරිම සාමාජික සංඛ්‍යාව 36 හා අවම සංඛ්‍යාව 12ක් සමග, වයස් සීමාව අවුරුදු 12-17 අතර බාලිකාවන්ගෙන් සමන්විත කණ්ඩායමකි.

එය ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ ලියාපදිංචි කළ යුතුය. එහිදී තම කණ්ඩායම අයත් අධ්‍යාපන කලාපය නමින් අංකයක් ලබා දෙනු ඇත. (1වන ගම්පහ බාලදක්ෂිකා කණ්ඩායම) එය පංති කීපයකින් යුක්ත වේ.

**බාලදක්ෂිකා නිළ ඇඳුම**

කණ්ඩායමේ සියලුම බාලදක්ෂිකාවන් එකම ඇඳුමකින් සැරසී සිටිය යුතු ය. පාසල් නිළ ඇඳුම/බාලදක්ෂිකා නිළ ඇඳුම, බාලදක්ෂිකා ලාංඡනය මුද්‍රිත ලා නිල් පැහැති කමිසය හා තද නිල් සාය/දිග කලිසම හා කහ සහ නිල් ඉරි සහිත ස්කාෆ්, තම පංතියේ නමට අදාළ පංති පදක්කම, නවක පදක්කම හා ලෝක පදක්කම, නවක පදක්කම් පැළඳීමේ උත්සවයේ දී පැළඳිය යුතු ය.





**බාලදක්ෂිකා කණ්ඩායම් සරඹ**

**ක්‍රමය**

නායිකාවන්ගේ අනුදැනුම හා ආරක්ෂාව යටතේ සේවයට කැපවෙන බව පිළිබිඹු කරමින් අශ්ව ලාඩම හැඩයට කණ්ඩායම් සරඹ සිදුකරනු ලබයි.

**භාවිතා වන අවස්ථා**

- කණ්ඩායමක රැස්වීමක් ආරම්භයේ දී හා අවසානයේ දී
- පදක්කම් පැළඳීමේ උත්සව අවස්ථාවන්හි දී
- වෙනත් විශේෂ උත්සව අවස්ථාවන්හි දී

**පංති ක්‍රමය**

- පංතියක් යනු අවුරුදු 12 -17 අතර ගැහැණු ළමුන් 6-8 අතර සහයෝගයෙන් වැඩ කරන කුඩා කණ්ඩායමකි.
- සෑම බාලදක්ෂිකා කණ්ඩායමක් ම පංති 2කින් හෝ වැඩි ගණනකින් සමන්විත වේ.
- මෙම පංතියකට මලක නමක් ලබා දෙනු ඇත. පංතියකට මුලිකාවන් පත් කරගත යුතු වේ.
- මූලිකාව විසින් උප මූලිකාව පත් කරගත යුතු වේ.
- පංතියක් රැස් වෙන ස්ථානයක් පංති මුල්ලක් නම් වේ.
- කණ්ඩායමේ රැස්වීමට විනාඩි කීපයකට පෙර පංතිවලට තම පන්ති මුලුවල රැස් වී නිදහසේ කතා කිරීමට ඉඩ ලබා දේ. මෙය සතිපතා රැස්වීමේ පංති වෙලාවයි.
- නැතහොත් පන්ති වේලාව සඳහා නියමිත තැනක්, වේලාවක් නොමැත. තම විවේක කාලයේ දී හෝ කෑම ගන්නා අතරතුර කතාවේ යෙදිය හැක.
- සතිපතා රැස්වීමේ දී පංති වේලාවේ සාකච්ඡා කළ අදහස් පංති මූලිකාව ගරු සභාවට ඉදිරිපත් කළ යුතු ය.
- ගරු සභාව පවත්වන වෙලාවේදී නායිකාව සහ පන්ති මුලිකාවන් කණ්ඩායමේ ඉදිරි වැඩ පිළිබඳ තීරණය කරයි.
- ගරු සභාව වාරයකට එක් වාරයක්වත් රැස් විය යුතු ය.
- බාලදක්ෂිකා නායිකාව එහි මුලසුන ගන්නා අතර ලේකම්වරියක් හා භාණ්ඩාගාරිකවරියක් සිටිය යුතු ය.
- විශේෂ අවස්ථා වල දී ආරාධනාවකින් පිටස්තර අය සහභාගී විය හැකි ය.
- උදා.විදුහල්පතිනිය / විදුහල්පතිනිය, සෞන්දර්ය ගුරුවරු

**ජනාධිපති බාලදක්ෂිකා ප්‍රදානය**

**හැඳින්වීම**

මෙම ප්‍රදානයේ අරමුණ වන්නේ පවුලට, සමාජයට, රටට සහ බාලදක්ෂිකා ව්‍යාපාරයට සේවය කිරීමට අවස්ථාවක් ලබා දීමයි. ජනාධිපති බාලදක්ෂිකා ප්‍රදානය සේවය සඳහා වගකීමෙන් බැඳී සිටින බව පිටතට පෙන්වන සලකුණයි. මෙම ප්‍රදානය ලද අවස්ථාවේ සිට පවුලට, ප්‍රජාවට, රටට සහ බාලදක්ෂිකා ව්‍යාපාරයට සේවය කිරීම සඳහා උදා වන සෑම අවස්ථාවක දී ම බාලදක්ෂිකාව කැඳවන බව සිතේ දරාගෙන සිටිය යුතු ය.

## රේන්ජර්දක්ෂිකා කණ්ඩායම්

**රේන්ජර්දක්ෂිකා කණ්ඩායමක් යනු,**

බලපත්‍රලත් නායිකාවක් සමඟ උපරිම සාමාජික සංඛ්‍යාව 36ක් වූ හා අවම 12ක් වන, වයස් සීමාව අවුරුදු 15 ක් 23 ක් අතර බාලිකාවන්ගෙන් සමන්විත වනු ඇත. කණ්ඩායම ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ ලියාපදිංචි කළ යුතු ය. එහිදී තම කණ්ඩායම අයත් අධ්‍යාපන කලාපය නමින් අංකයක් ලබාදෙනු ඇත. (උදා. - 1 වන කොළඹ රේන්ජර් කණ්ඩායම)

"පුළුල්ව දකින්න" යන්න ආදර්ශ පාඨය පෙරටු කරගෙන මොවුන් කටයුතු කරයි.

**රේන්ජර්දක්ෂිකා නිළ ඇඳුම**

කණ්ඩායමේ සියලුම රේන්ජර් දක්ෂිකාවන් එක ම ඇඳුමකින් සැරසී සිටිය යුතු ය. පාසල් නිළ ඇඳුම/ රේන්ජර් දක්ෂිකා නිළ ඇඳුම, බාලදක්ෂිකා ලාංඡනය මුද්‍රිත ලා නිල් පැහැති කමිසය හා තද නිල් සාය/ දිග කලිසම හා කහ සහ රතු ඉරි සහිත ස්කාෆ්, තම පංතියේ නමට අදාළ පංති පදක්කම, පොරොන්දු පදක්කම හා ලෝක පදක්කම පොරොන්දු උත්සවයෙන් පසු පැළඳිය යුතු ය.



**රේන්ජර්දක්ෂිකා කණ්ඩායමක් ඇරඹීම සහ නායිකාව**

- නවක පෙළ අභියෝගතා සම්පූර්ණ කළ නායිකාවක් සිටිය යුතු ය.
- නායිකාව විසින් ප්‍රාදේශීය, කලාප පුහුණු ඒකක හා සම්බන්ධ වී දැනුම යාවත්කාලීන සහ සංවර්ධනය කර ගනිමින්, නායිකා පුහුණුව සම්පූර්ණ කරගත යුතු ය.
- ඉන්පසු නායිකාව විසින් නායිකා බලපත්‍රය ලබා ගැනීමට සුදුසුකම් සපුරනු ඇත.

**රේන්ජර්දක්ෂිකා කණ්ඩායමක් පවත්වා ගන්නා ආකාරය**

රේන්ජර් කවුන්සිලය පිහිටුවා ගත යුතුය. එය සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික තනතුරුවලින් යුක්ත විය යුතුය. බාලදක්ෂිකාවන්ගේ වාර්ෂික මහාසභා රැස්වීමකදී කවුන්සලයේ තනතුර සඳහා රේන්ජර් සාමාජිකාවන් තෝරාගත යුතු අතර මාස 03කට වරක් අවම වශයෙන් කවුන්සිලය රැස්විය යුතු ය.

- සභාපති - කණ්ඩායම පිළිබඳ වගකීම දැරිය යුතු ය.
- ලේකම් - වාර්තා තබා ගැනීම ආදී ලිපි ලේඛන කටයුතුවල වගකීම දැරිය යුතුයි.
- භාණ්ඩාගාරික - අයවැය වාර්තා, අරමුදල් රැස් කිරීම හා මූල්‍ය ගනුදෙනු පිළිබඳ වගකීම දැරිය යුතු ය.
- විශේෂ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී අනුකමිටු පත්කර, ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතු ය.
  උදා : කඳවුරු යාම, පා ගමන් සංවිධානය, අරමුදල් රැස් කිරීමේ ව්‍යාපෘති හා සේවා ව්‍යාපෘති

**රේන්ජර්දක්ෂිකා කණ්ඩායම් නායිකාවකගේ කාර්යය**

- නායිකා බලපත්‍රය ලබාගත යුතු ය.
- කණ්ඩායමේ ලොග් පොත යාවත්කාලීන කිරීම.
- කණ්ඩායම ලියාපදිංචිය සිදුකිරීම සහ අඛණ්ඩව පවත්වා ගැනීම.
- තම කණ්ඩායමට අයත් පරීක්ෂණ මණ්ඩලයේ තොරතුරු යාවත්කාලීනව තබා ගැනීම හා කණ්ඩායම දැනුවත් කිරීම.
- නියමිත කාල වකවානුවලදී කණ්ඩායමේ සාමාජිකාවන්ගේ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට උපදෙස් දීම හා අධීක්ෂණය.
- කණ්ඩායම් රැස්වීම් කාලය තුළ හා විවිධ ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීමේ දී, සාමාජිකාවන්ගේ ආරක්ෂාව හා විනය පිළිබඳ සැළකිලිමත් වීම.
- කණ්ඩායම සඳහා අවශ්‍ය රේන්ජර් කොඩිය, අත්පොත්, ගීත පොත් සපයාගත යුතු ය.
- යාවත්කාලීන වූ ජාත්‍යන්තර බාලදක්ෂිකා තොරතුරු පිළිබඳව කණ්ඩායම දැනුවත් කළ යුතු ය.

**රේන්ජර්දක්ෂිකා කණ්ඩායම් ලේකම් විසින් පවත්වා ගතයුතු ලේඛන**


- කණ්ඩායමේ දිනපතා පැමිණීම සටහන් කරනු ලබන නාමලේඛන
- රේන්ජර් කවුන්සිලයේ වාර්තා හා සහභාගීත්ව ලේඛන
- කණ්ඩායමේ සාමාජිකාවන්ගේ ජීවදත්ත ලේඛන
- කණ්ඩායමට ලැබෙන විවිධ ලිපි ලේඛන ඇතුළත් ලිපිගොනු
- කණ්ඩායම වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට යොමු කරන ලේඛන පිටපත් ඇතුළත් ලිපිගොනු
- බාහිර ක්‍රියාකාරකම් සඳහා සහභාගි වූ තොරතුරු ඇතුළත් ලිපිගොනු

**සේවා ව්‍යාපාති**

- අවම කාලයකට යටත් ව සමාජයට ඵලදායී අවම පිරිවැයකින් උපරිම ශ්‍රම දායකත්වයක් දරණ ව්‍යාපෘතියක යෙදීම මින් අදහස් කෙරේ.
- කුඩා කණ්ඩායම් ලෙස හෝ තනි තනිව සේවයේ යෙදීම කළ හැකි අතර, අනුකමිටුවක් මගින් සාකච්ඡා කර රේන්ජර් කවුන්සිලයෙන් ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

**අගමැති සම්මානය**

රේන්ජර්දක්ෂිකාවන්ට ලබා ගත හැකි උසස්ම පදක්කමයි. තමාට, පාසලට යන සමාජය වෙනුවෙන් දක්වන කැපවීමත්, සේවය කිරීම යනාදියෙහි අග්‍රඵලය අගමැති සම්මානයයි.



අගමැති සම්මානය

**ආදර්ශ රේන්ජර්දක්ෂිකා කණ්ඩායම් රැස්වීම**

- V හැඩයට සරඹ සිදුකිරීම.
- දවසේ සිතුවිල්ල ඉදිරිපත් කිරීම.
- පැමිණීම සටහන් කිරීම.
- නායිකාව විසින් විශේෂ දැනුම් දීම් පිළිබඳ දැනුම් දීම.
- සභාපති විසින් එදිනට නියමිත කාර්යයන් පිළිබඳ දැන්වීම.
- කණ්ඩායම ඉදිරි වැඩ සඳහා ඉවත යාම.
- රේන්ජර් කවුන්සිලය රැස්වන දිනයක් නම්, එම රැස්වීම පැවැත්වීම හෝ එසේ නොවේ නම් එදිනට නියමිත කාර්යයන් සිදුකිරීම.
- අවසානයේ සියල්ලන් රැස්ව ටැප්ස් ගායනයෙන් පසුව, විසිර යාමේ සරඹ සිදුකිරීම.

**රේන්ජර්දක්ෂිකා කණ්ඩායම් සරඹ**

- නායිකාවගේ උපදෙස් අනුව පුළුල් ලෝකය සඳහා සේවයට කැපවන බව පිළිබිඹු කරමින්, 'V' හැඩයට කණ්ඩායම් සරඹ සිදුකරනු ලබයි.

**භාවිතා වන අවස්ථා**

- කණ්ඩායමක රැස්වීමක් ආරම්භයේ දී හා අවසානයේ දී
- පදක්කම් පැළඳවීමේ උත්සව අවස්ථාවන්හි දී
- වෙනත් විශේෂ උත්සව අවස්ථාවන්හි දී

**සමනලී ඒකකයක් / කුඩාමිතුරි රැළක් / බාලදක්ෂිකා කණ්ඩායමක් / රේන්ජර් දක්ෂිකා කණ්ඩායමක් ආරම්භ කරන ආකාරය**

- විදුහල්පතිතුමා විසින් කලාපයේ කැඳවීමට අනුව බාලදක්ෂිකා කටයුතු (සමනලී, කුඩාමිතුරි, බාලදක්ෂිකා හෝ රෙන්ජර් දක්ෂිකා අංශ) සඳහා කැමැත්තක් දක්වන, හැකියාවක් ඇති ගුරු මහත්මීන් දෙදෙනෙකු තෝරා ගැනීම. (එක අංශයකට දෙදෙනෙකු බැගින්)
- ඔවුන් බාලදක්ෂිකා නවක නායිකා පුහුණුව සඳහා සහභාගී කරවීම.
- එම පුහුණුවේ දින දෙකකට පසු (සමනලී ඒකකයක් / කුඩාමිතුරි රැළක් / බාලදක්ෂිකා කණ්ඩායමක් / රේන්ජර්දක්ෂිකා කණ්ඩායමක්) ඇරඹීම සිදු කළ හැකි ය.
- අදාල වයස් කාණ්ඩයේ බාලිකාවන්ගෙන් අයදුම්පත් කැඳවීම.
- දෙමාපියන් දැනුවත් කිරීම සහ අවසර ලබා ගැනීම.
- කොට්ඨාස සහ කලාප කොමසාරිස් තුමියන් දැනුවත් කිරීම.
- රැස්වීම පැවැත්වීමට සුදුසු දිනය සහ වේලාව බාලිකාවන් සමග සාකච්ඡා කොට දැනුවත් කිරීම.

**ඒකකය, රැළ හෝ කණ්ඩායමක් ආරම්භ කිරීමට අවශ්‍ය දේ**

- (කොඩිය, ලොග් පොත, වාර්තා පොත් ආදිය) පාසල මගින් ලබාගැනීමේ හැකියාව පිළිබඳ ව විමසීම.
- බාලදක්ෂිකා කණ්ඩායම ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ ලියාපදිංචි කළ යුතු ය.
- නායිකාව කණ්ඩායම පිළිබඳ වගකීම දැරිය යුතු ය.
- විශේෂ ක්‍රියාකාරකම් සිදු කිරීමේදී අනු කමිටු පත්කර, ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතු ය. (උදා. - කඳවුරු සංවිධානය, පා ගමන් සංවිධානය, අරමුදල් රැස් කිරීමේ ව්‍යාපෘති හා සේවා ව්‍යාපෘති)
- පාසලක සමනලී ඒකකයක්/ කුඩා මිතුරි රැළක්/ බාලදක්ෂිකා කණ්ඩායමක් හෝ රේන්ජර්දක්ෂිකා කණ්ඩායමක් ඇරඹීමේ දී අදාළ විදුහල්පතිගේ පූර්ණ අනුමැතිය ලබාගත යුතු ය.
- සමනලී ඒකකයක් , කුඩා මිතුරි රැලක්, බාලදක්ෂිකා හෝ රේන්ජර්දක්ෂිකා කණ්ඩායමක් ඇරඹීමේ දී වැඩිහිටි නායිකාවන් දෙදෙනෙකු සිටිය යුතු ය.
- වැඩිහිටි නායිකාවන් සමනලී - ට්වින්කල් සහ ට්වින්ක්ලට්
- කුඩාමිතුරි-වනරාණි සහ වනකුමරි
- බාලදක්ෂිකා හෝ රේන්ජර්දක්ෂිකා අංශ සඳහා නායිකාව සහ උපනායිකාව ලෙස ද හඳුන්වනු ලබයි.

**නායිකාවක් යනු,**

- වයස අවුරුදු 18ට වැඩි කරුණාවන්ත, බාලිකා හැකියාවන් තේරුම් ගත් පුහුණුවේ යෙදීමට කැමති උද්යෝගීමත් කාන්තාවකි.
- ඇය නායිකා බලපත්‍ර ලබාගත යුතු ය.
- අදාල අංශය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතු ය.
- සංගමයේ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාවට අනුව සංගමයේ නීතිවලට එකඟ ව තම කණ්ඩායම් පවත්වාගෙන යාමට නිදහස තිබේ.
- තම ප්‍රාදේශීය හා කලාප කොමසාරිස්වරිය සමඟ මනා සම්බන්ධතාවක් පවත්වාගත යුතු ය.
- පුහුණුව යාවත්කාලීන කරගත යුතු ය.
- ඒකකය, රළ හෝ කණ්ඩායම් වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් කළ යුතු ය.
- ඒකක, රළ හෝ කණ්ඩායම් නාම ලේඛන පවත්වා ගත යුතු ය.
- ඒකකය, රළ හෝ කණ්ඩායම් ගිණුම පවත්වා ගෙන යා යුතු ය.
- ඒකකය, රළ හෝ කණ්ඩායම් පරීක්ෂාව කළ යුතු ය.
- පංති ලේඛන පරීක්ෂාව සිදු කළ යුතු ය.
- වාර්තා තබා ගැනීම හා ලිපි ලේඛන කටයුතු වල වගකීම දැරිය යුතු ය.
- අයවැය වාර්තා, අරමුදල් රැස් කිරීම හා මූල්‍ය ගනුදෙණු පිළිබඳව වගකීම දැරිය යුතු ය.
- ඒකක, රළ හෝ කණ්ඩායම් ලොග් පොත යාවත්කාලීන කිරීම සිදු කළ යුතු ය.
- ඒකකය, රළ හෝ කණ්ඩායම ලියාපදිංචි කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.
- තම කණ්ඩායමට යටත් පරීක්ෂණ මණ්ඩලයේ තොරතුරු යාවත්කාලින ව තබා ගැනීම හා කණ්ඩායම දැනුවත් කිරීම කළ යුතු ය.
- නියමිත කාල වකවානුවල කණ්ඩායමේ සාමාජිකාවන්ගේ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට උපදෙස් දීම හා අධීක්ෂණය සිදු කළ යුතු ය.
- ඒකක, රළ හෝ කණ්ඩායම රැස්වීම් කාලය තුළ හා විවිධ ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීමේ දී, සාමාජිකාවන්ගේ ආරක්ෂාව හා විනය පිළිබඳ සැලකිලිමත්වීම සිදු කළ යුතු ය.
- ඒකක, රළ හෝ කණ්ඩායම සඳහා අවශ්‍ය කොඩිය, අත්පොත්, ගීත පොත් සපයාගත යුතු ය.
- යාවත්කාලින වූ ජාත්‍යන්තර බාලදක්ෂිකා තොරතුරු පිළිබඳව කණ්ඩායම දැනුවත් කළ යුතු ය.

**සමනළී ඒකකය/ කුඩා මිතුරි රැළ/ බාලදක්ෂිකා කණ්ඩායම/ රෙන්ජර් කණ්ඩායම පවත්වාගෙන යා යුතු ලේඛන**

- නාම ලේඛනය.
- ලොග් පොත.
- දෙමාපිය අවසර ලිපි.
- ලියාපදිංචි සහතිකය.
- ප්‍රගති වාර්තා (සහභාගී වූ වැඩසටහන්/ සම්පූර්ණ කරන ලද වැඩසටහන්).
- ගිණුම් පොත.
- සමනලියන්ගේ/ කුඩා මිතුරියන්ගේ/ බාලදක්ෂිකාවන්ගේ/ රේන්ජර්දක්ෂිකාවන්ගේ තොරතුරු පොත.
- ගීත පොත.
- තොරතුරු ගොනුව - ෆයිල් කවරයක සකසන ලද (ලියාපදිංචි කිරීමේ ලේඛනයේ අනුපිටපත, පරීක්ෂක ලැයිස්තුව හා රළේ අදාල ලිපි ලේඛන).
- ඒකකයට, රළට හෝ කණ්ඩායමට ලැබෙන විවිධ ලිපි ලේඛන ඇතුළත් ලිපිගොනු.
- ඒකකයේ, රළේ හෝ කණ්ඩායමේ දිනපතා පැමිණීම සටහන් කරනු ලබන නාම ලේඛන.
- ගරු සභාවේ වාර්තා හා සහභාගිත්ව ලේඛන.
- කණ්ඩායමේ සාමාජිකාවන්ගේ විස්තර ලේඛන.

**ප්‍රජා බාලදක්ෂිකා අංශය**

ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ නවතම අංශය ප්‍රජා බාලදක්ෂිකා අංශයයි. සමාජයේ විශේෂ අවධානය ද යොමු කළ යුතු ප්‍රජාවන්හි ගැහැණු දරුවන් සහ කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ ජීවන කුසලතා සංවර්ධනය කිරීම මෙහි අරමුණයි. ධීවර ප්‍රජාව, වතු ආශ්‍රිත ප්‍රජාව, යුධ ගැටුම් බලපා ඇති ප්‍රදේශ, අති දුෂ්කර පළාත්වල ජීවත් වන ගැමි ප්‍රජාව, අඩු ආදායම්ලාභී නාගරික පදිංචිකරුවන්, අභිකුණ්ඨික ප්‍රජාව ආදී ජන කොටස් පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වයි.

**ප්‍රජා බාලදක්ෂිකා ආදර්ශ පාඨය**

"ජීවත්වීමට සූදානම් වීම "

- පොරොන්දුව, නීතිය, ආචාරය, සළකුණ ආදී එකගත්වයේ පුරුක් සියල්ල බාලදක්ෂිකා අංශය හා සමාන ය.

**වයස් සීමාව**

ප්‍රජා බාලදක්ෂිකා කණ්ඩායම් වයස් සීමාවන් අනුව කොටස් දෙකකි.

1. අවුරුදු 12 -18
2. අවුරුදු 18 - 60

**කණ්ඩායම් පාලනය**

ප්‍රජා මූල සංවිධානයකට (CBO) හෝ රාජ්‍ය නොවන සංවිධානයකට (NGO) හෝ සම්බන්ධ වයස අවුරුදු 18 - 60 අතර කාන්තාව දෙදෙනකු නායිකාව සහ උප නායිකාව ලෙස කටයුතු කරයි. කණ්ඩායමක සිටිය හැකි උපරිම සාමාජිකයන් ගණන 36 ක් වන අතර අවම සාමාජිකයන් ගණන 6 කි. ඔවුන් කණ්ඩායම් ක්‍රමය අනුව ගිරවා, මයිනා, කහ කුරුල්ලා, පරවියා, පැණි කුරුල්ලා, දේ කුරුල්ලා යන නම් වලින් යුතු හයේ පංති ලෙස පංති ක්‍රමය අනුව කටයුතු කරයි.

**ප්‍රජා බාලදක්ෂිකා නිළ ඇඳුම**

සාමාජිකාවන් ඔවුන්ගේ සාමාන්‍ය ඇඳුමට නිල් කර පටිය, ලෝක පදක්කම සහ ප්‍රජා බාලදක්ෂිකා පදක්කම් එකක් පළඳියි.

**ප්‍රජා බාලදක්ෂිකා කොඩිය**

නිල්වන් අහසේ බබළන සූර්යයා ලෙස කොඩිය හඳුන්වයි. ත්‍රිපත මැද ඇති කොළ පාට පරිසරය සංකේත්වත් කරන අතර ත්‍රිපත වටා සිටින ළමුන් මගින් විවිධ ජන කොටස් නියෝජනය කරයි.

**ප්‍රජා බාලදක්ෂිකා කණ්ඩායම් සරඹ**

බඳවා ගැනීමේ උත්සවයේදී මෙන්ම දවසේ වැඩ ආරම්භ කිරීමේදී සහ දවසේ වැඩ අවසන් කිරීමේදී අඩ කවයකට පැමිණ කණ්ඩායම් සරඹ සිදු කරයි.

**ක්‍රමය**

- ප්‍රජා බාලදක්ෂිකා කොඩිය අඩ කවය සෑදීමට පෙර ඉදිරියෙන් තැබිය යුතුයි.
- ප්‍රජා බාලදක්ෂිකාවන් අතරින් අණ දෙන්නා තෝරා ගත යුතුයි.
- අණ දෙන්නා ඔසවන ලද කොඩියේ වම් පසින් සිට ගනී.
- නායිකාව කොඩියේ දකුණු පසින් සිට ගනී.
- අණ දෙන්නා පහත සඳහන් අණ දෙනු ලබයි.

  "කණ්ඩායම සීරුවෙන් සිටින්"

  "අඩ කවය සෑදීමට ගමන් කරන්"

  "කණ්ඩායම පහසුවෙන් සිටින්"

**බඳවා ගැනීමේ උත්සවය**

- පෙර දැක්වූ ලෙස අඩ කවයක් සාදා ගත යුතු ය.
- කොමසාරිස්/ ප්‍රජා බාලදක්ෂිකා නායිකාව බාලදක්ෂිකාවන්ට පොරොන්දුව කියන ලෙස දන්වයි.
- බාලදක්ෂිකාවෝ පොරොන්දුව කියන අතර සළකුණ දක්වයි.
- කොමසාරිස්/ නායිකාව ඉන්පසු කරපටිය, ලෝක පදක්කම සහ ප්‍රජා බාලදක්ෂිකා පොරොන්දු පදක්කම සෑම බාලදක්ෂිකාවකටම පළඳවයි.
- බාලදක්ෂිකාව උත්සවය ආරම්භයේදී දල්වන ලද පහනෙන් දල්වාගත් මැටි පහනක් ඔවුන් අතට දෙනු ලබයි.
- ඉන්පසු ප්‍රජා බාලදක්ෂිකාවන් පහත වාක්‍ය කිව යුතු ය.
- "මේම පහන දැල්වෙන්නාසේ මට මනා නිපුණත්වයේන් යුත් ප්‍රජා බාලදක්ෂිකාවක් වී මාගේ සේවය මාගේ ප්‍රජාවට දීමට ශක්තිය ලැබේවා"
- ප්‍රධාන අමුත්තාගේ කථාව සහ න්‍යාය පත්‍රයේ වෙනත් කතා / අංග (අවශ්‍යතාවය අනුව) පැවැත්වීම.
- විසිර යාම.

ප්‍රජා බාලදක්ෂිකා වැඩසටහන අදියර 10කින් යුක්ත ය.

අදියර 01 - ප්‍රජා බාලක්ෂිකාවක් ලෙස බඳවා ගැනීමට පෙර දැන ගත යුතු කරුණු
අදියර 02 - සමාජ නිපුණතා වර්ධනය
අදියර 03 - සකසුරුවම හා නිර්මාණාත්මක කුසලතා
අදියර 04 - ප්‍රථමාධාර හා ආරක්ෂාව
අදියර 05 - නිරෝගී මනස සහ නිරෝගී සිරුර
අදියර 06 - වටපිටාව හඳුනා ගැනීම
අදියර 07 - කඳවුරු යාම
අදියර 08 - යහපත් පුරවැසියකු ලෙස යුතුකම් හා වගකීම්
අදියර 09 - ස්වයං රැකියා නිපුණතා
අදියර 10 - විශිෂ්ට නායකත්ව සම්මානය

**බාලදක්ෂිකා සංගමයේ නායිකාවන්ගේ ඇගයීම්.**

බාලදක්ෂිකා නායිකාවන් ස්වේච්ඡාවෙන් ඉතා කැපවීමෙන් කරන සේවය ඇගයීම සෑම වර්ෂයක ම වාර්ෂික මහා සභා රැස්වීමේ දී (පළාත් හා ජාතික) සිදුකරනු ලබයි.

**Service award - සේවා ප්‍රදානය.**

නායිකාවක ලෙස අඛණ්ඩව තම සේවය ලබා දෙමින් මෙම සේවා ප්‍රදානය හිමිවෙයි. නායිකා බලපත්‍රය ලබා ගැනීමෙන් අනතුරු ව මෙම සේවය ගණනය කරන අතර අඛණ්ඩ සේවය සඳහා වසර 5 න් පහට මෙම ප්‍රදානය ලබා දීම සුවිශේෂී කරුණකි. වසර 20 දක්වා පළාත් මට්ටමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේ දී හා 25 ඉක්ම වූ සේවා ප්‍රධාන ජාතික මට්ටමේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ය. සිදු කරයි.

**Medle of Merrit - විශිෂ්ට සේවා ප්‍රදානය.**

අඛණ්ඩ වසර 10 වඩා වැඩි හා බාලිකාවන් හා බාලදක්ෂිකා සංගමයේ උන්නතිය උදෙසා විශේෂ කැපකිරීම් සිදුකරන නායිකාවකට මෙම ප්‍රදානය හිමිවෙයි.

**Silver lotus - සුදු නෙළුම**

වසර 20 වඩා වැඩි අඛණ්ඩ සේවාවක් හා සංගමය වෙනුවෙන් පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ විශේෂ කාර්යයන් සිදුකරන නායිකාවකට මෙම ප්‍රදානය හිමි වේ.



**Hansa Puttuwa - හංස පුට්ටුව.**

වසර 20 වඩා වැඩි අඛණ්ඩ සේවාවක් සපයන ජාතික හෝ අන්තර්ජාතික මට්ටමේ සේවාවක් ඉටුකරන ලද නායිකාවකට මෙම ප්‍රදානය හිමි වේ. මෙය ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ නායිකාවට ලබා ගත හැකි ඉහළ ම සම්මානය වේ.

කුඩා මිතුරි , බාලදක්ෂිකාවන් හා රේන්ජර් බාලදක්ෂිකාවන් සඳහා සේවා ව්‍යාපෘති සඳහා පිළිවෙලින් (LEND A HAND, Jenny calverly, Muktha Wijesinghe) සේවා ප්‍රදානය හිමි වේ.

**බාලදක්ෂිකා නායිකාවන්ගේ ගමන් මග**

1. නවක නායිකාවක ලෙස පුහුණුව
2. නවක නායිකා පදක්කම් ලැබීම.
3. නායිකා බලපත්‍රය ලබා ගැනීම.
4. II වන පෙළ හා කඳවුරු පුහුණුව (ප්‍රාදේශීය මට්ටමින් ලබාගත යුතුය.)
5. I වන පෙළ පුහුණුව (ප්‍රාදේශීය මට්ටමින් ලබාගත යුතුය.)
6. කඳවුරු බලපත්‍රය / රංචු නිවාඩු බලපත්‍ර පුහුණුව (ජාතික මට්ටම)
7. උසස් ශාඛා පුහුණුව (ජාතික මට්ටම්)
8. ආධුනික පුහුණුවරියන්ගේ පුහුණුව
9. ආධුනික පුහුණුවරිය
10. කඳවුරු බලපත්‍රය රංචු නිවාඩු බලපත්‍රය
11. සහතිකලත් පුහුණුවරිය
12. ඩිප්ලෝමාධාරී පුහුණුවරිය

නියමිත කාලවලදී කලාප, පළාත් හා ජාතික මට්ටමින් පවත්වන සංස්කරණ පුහුණු සඳහා සහභාගී විය යුතු ය. කලාප මට්ටමේ පවත්වන පුහුණු ඒකකයකට සම්බන්ධ වී කටයුතු කිරීමටත් මාසිකව පවත්වන රැස්වීමට සහභාගී වීමටත් සෑම නායිකාවක් ම උත්සාහ කළ යුතු ය.

**පාසල තුළ බාලදක්ෂිකා කටයුතුවල නියැලීමෙන් බාලිකාවන්ට සඳහා ලැබෙන ප්‍රතිලාභ**

1. අත්දැකීම් තුළින් යහපත්, ආදර්ශමත්, විනයගරුක පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමට හැකිවීම.
2. කාල කළමනාකරණය කර ගනිමින් සියලු අභියෝගයන්ට අවබෝධයෙන් යුතුව මුහුණ දෙමින් දක්ෂතා හා කුසලතා සංවර්ධනය කරගත හැකි වීම.
3. විවේක කාලය අර්ථවත් හා ප්‍රීතිමත් ලෙස ගත කිරීමට අවකාශය ලබා ගනී.
4. නායකත්ව කුසලතා ප්‍රගුණ කරමින් අනුගාමිකයින් නිසි මඟ රැගෙන යාමේ හැකියාව ලබා ගනී.
5. පාසල් වියේදීම ලොව විශාලම කාන්තා ස්වේච්ඡා සංවිධානයේ සාමාජිකාවක් බවට පත් වීම.
6. විවිධ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වලට සහභාගී වීමට අවස්ථාව ලැබීම.
7. බාලදක්ෂිකාවකට ජනාධිපති බාලදක්ෂිකා සම්මානය හා රේන්ජර් දක්ෂිකාවකට අගමැති සම්මානය ලෙස ලබාගන්නා ප්‍රදානය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ හා විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී සැලකිල්ලට භාජනය වීම.
8. ස්වයං විනයකින් යුතුව කටයුතු කළ හැකි වීම.
9. සේවා ව්‍යාපෘති වලට සම්බන්ධ වීමෙන් අනාගත රැකියා සඳහා අත්දැකීම් හා පුහුණුව ලැබීම.
10. ජාතික හා ජාත්‍යයන්තර මට්ටමේ සමුළු, වැඩසටහන් සඳහා නියෝජනය කිරීමට හැකියාව ලැබීම.

**බාලදක්ෂිකා නායිකාවන්ට ලැබෙන ප්‍රතිලාභ**

1. ලොව තිබෙන විශාලම කාන්තා ජාත්‍යන්තර ස්වේච්ඡා සංවිධාන සාමාජිකත්වය හිමි වීම.
2. පාසල තුළ අභිමානවත් නායිකාවක ලෙස ගෞරවාදරය හා පිළිගැනීමට ලක් වීම.
3. කාල කළමනාකරණය කරගනිමින් අනාගත දූරියක් බිහි කිරීමෙන් හා සේවය කිරීමෙන් ආත්ම තෘප්තිය ලැබීම.
4. විවිධ ක්‍රියාකාරකම්වල යෙදමින් ලබාගන්නා වෘත්තිය නිපුණතාව.
5. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ විවිධ වැඩසටහන්වලට සම්බන්ධ වීම හැකියාව ලැබීම.
6. ආගම හා රට වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට අවකාශය ලැබීම.

**පාසලට ලැබෙන ප්‍රතිලාභ**

1. පාසලේ වැඩසටහන් හා දෛනික කටයුතු කර ගැනීමට හැකිවන නායිකාවන් බිහි වීමෙන් කටයුතු පහසු වීම.
2. පාසලේ විවිධ උත්සව, වැඩසටහන් වර්ණවත් වීම.
3. පාසලේ විනය නිසි පරිදි පවත්වාගෙන යාමට පහසු වීම.
4. විදුහලේ ඉහළ කළමනාකාරීත්වයට කටයුතු කරගෙන යාමේ දී පහසු වීම.
5. පාසල අභිමානයට හා ගෞරවයට ලක් වීම.

තොරතුරු දැන ගැනීම සඳහා සම්බන්ධ කර ගැනීම.

ලිපිනය : ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය
නො. 10, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 7.

දුරකථන අංකය : 0112 695720 / 0113 133123

ෆැක්ස් අංකය : 0112 673558

විද්‍යුත් තැපැල - girlguidessrilanka@gmail.com

Facebook : Sri Lanka Girl Guides (Official)

Instagram : Sri Lanka Girl Guides

## 2.2 V ශ්‍රී ලංකා රතු කුරුස සමාජය
## (1936)

**හැඳින්වීම**

1936 දී අප රටේ එවකට පාලකයින් වූ බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් ඔවුන්ගේ රටේ රතු කුරුස සමාජයේ මධ්‍යම ශාඛාවක් ලංකාව තුළ ස්ථාපිත කරන ලදී. මෙයට මුලික වශයෙන් හේතු පාදක වුයේ එවකට ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් මහනුවර ප්‍රදේශය තුළ ව්‍යාප්ත වෙමින් පැවති මැලේරියා උණ වසංගතය මර්ධනය කිරිම සඳහා ලංකාවේ ස්වෙච්ඡා සේවකයින්ගේ සහය ලබා ගැනීමට අදහස් කිරිමයි. වර්ෂ 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබිමත් සමග 1949 මාර්තු 30 වන දින මෙම රතු කුරුස සමාජයේ මධ්‍යම ශාඛාව විසුරුවා හැර 1949 අප්‍රේල් 01 වන දින ලංකා රතු කුරුස සමාජය ලෙස පිහිටවනු ලැබූ අතර 1972 ලංකාව ජනරජයක් වීමෙන් අනතුරුව ලංකා රතු කුරුස සමාජය ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ලෙස නැවත නම් කරනු ලැබීය.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය වනාහි ජාති, ආගම්, කුල, පන්ති භේදයකින් තොරව වඩාත් ම පිඩාවට පත්වන්නා වූ ප්‍රජාවන් සඳහා කිසිදු ලාභ ප්‍රයෝජනයක් අපෙක්ෂා නොකොට මානුෂීය සේවාවන් සපයන ආයතනයකි.

**රතු කුරුස ව්‍යාපාරයේ ඉතිහාසය**

රතු කුරුස ව්‍යාපාරයේ නිර්මාතෘවරයා නමින් ජින් හෙන්රි ඩුනාන්ට් නම් වේ. 1828 මැයි මස 08 වන දින උපත ලද ඔහු ස්විස්ටර්ලන්ත ජාතිකයෙකි.

හෙන්රි ඩුනාන්ට්ගේ පියා වෘත්තියෙන් බැංකුකරුවෙකු වූ අතර අනාථයන් භාරව ඔවුන්ගේ නීතිඥයෙක් වශයෙන් කටයුතු කළ අයෙකි. ඔහුගේ මව ආගමට ඉතා ලැදි කාන්තාවක් වූවාය.

සත් අවුරුද්දක් තරම් කුඩා වයසේ දී හෙන්රි ඩුනාන්ට් ප්‍රංශයේ දී නැවක බඩු පැටවීමට යොදවා තිබූ යදම් වලින් එකිනෙකා බැඳි සිටි සිරකරුවන් පිරිසක් විඳි දුක් ගැහැට දුටු ඔහුගේ හද දැඩි ලෙස කම්පා විණි. එලෙස සිරකරුවන් බලන්නට පැමිණි ඔහු වයස අවුරුදු දහ අට පමණ වන විට සිරකරුවන් බලන්නට නිරන්තරයෙන් ආගිය අමුත්තෙකු බවට පත් වූයේ ය.

පසුව ඔහු 24 වැනි වියේ දී බැංකු කරුවෙකු ලෙස සිය පියාගේ වෘත්තියට හවුල් වී ජිනිවා හි බැංකු ව්‍යාපාරයට සම්බන්ධ විය. 1858 ජනවාරියේ දී ඔහු තමාගේ ම සිමිත වගකිම් සමාගමක් ආරම්භ කළේ ය. එතැන් සිට ඔහු දියුණුවෙන් දියුණුව කරා වේගයෙන් ගමන් කළේ ය. මෙම කාලය තුළ දී ඔහු ප්‍රංශයේ නැපෝලියන් අධිරාජයා හමුවීමට තීරණය කළේ ය. ඔහුට අවශ්‍ය වූයේ ඔහු විසින් ලියන ලද නැපෝලියන් අධිරාජයා විසින් රෝමන් අධිරාජ්‍ය යළි ගොඩ නගනු ලැබීම යන ග්‍රන්ථය පිරිනැමීම ද තම ව්‍යාපාරික කටයුතු සඳහා තවත් ඉඩම් ලබා ගැනීමේ ගැටලුව ද සාකච්ඡා කිරීමට ය.

ඔහු 1859 ජුනි 24 දා උතුරු ඉතාලියේ සොල්ෆරිනෝ වෙත පැමිණියේ ය. මේ වන විට ඔස්ට්‍රියානු අධිරාජ්‍යයේ සොල්දාදුවන් හා නැපෝලියන් අධිරාජයා මෙහෙයවනු ලැබූ ප්‍රංශ හා ඉතාලි සර්දීනියානු සොල්දාදුවන් පැය 16ක් පුරා මුහුණට මුහුණලා සටන් කිරීමෙන් අනතුරු ව නැපොලියන් අධිරාජ්‍යයා විසින් සොල්ෆරිනෝ සංග්‍රාමය දිනා ගත්තා පමණි. මෙහි දී 40,000 ක් පමණ වූ දෙපාර්ශවයේ ම සොල්දාදුවන් තුවාල ලබා මියැදෙමින් සිටිය හ.

හෙන්රි ඩුනාන්ට් එම සටන් බිමේ දී තුවාල ලත් සෙබලුන් දැක කම්පා වී ඔවුන්ගේ ජාතිය හෝ ඔවුන් අයත් වු හමුදාව ගැන නොතකා ඔවුන්ට සාත්තු සප්පායම් කිරීම තෝරාගත් අතර ඒ සඳහා වෛද්‍යවරුන්ගේ හෙදියන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ද සහය ලබා ගත්තේ ය. පුරා දින අටක් සොල්දාදුවන් වෙනුවෙන් කැප කළ ඩුනාන්ට් ආපසු ජිනීවා වෙත ගියේ ය.

නැවත සියරට පැමිණි ඔහු 1859 ජුනි මස 24 වැනිදා සොල්ෆරිනෝ යුද පිටියේ දී ලද බිහිසුණු අත්දැකීම් අළලා 1862 දී "සොල්ෆරිනෝවේ මතක සටහන් - A memory of Solferino " නමැති ග්‍රන්ථය රචනා කළේ ය.

මෙම ග්‍රන්ථය ඔහු තමාගේ ම වියදමින් මුද්‍රණය කොට එහි පිටපත් යුරෝපයේ එකල සිටි අධිරාජයන්ට ද, දේශපාලනඥයන්ට, හමුදා නිලධාරින්ට ද, දාර්ශනිකයන්ට හා හිතමිතරන්ට ද යැවීය. යුද්ධයේ කුරිරු යථාර්තය පිළිබඳ වැඩි අවබෝධයක් නොතිබුණු යුරෝපීය ජනතාව මහත් කම්පාවට පත් කළ ග්‍රන්ථයට ඔවුන්ගෙන් ලැබුණේ අනපේක්ෂිත පිළිගැනීමකි.

ජිනිවා මහජන සුබසාධක සමාජයේ සභාපති තනතුර දැරූ ගුස්ටාවේ මොනියර් නමැති නීතිඥයා ඩුනාන්ට් මුණ ගැසී සිය අත්දැකීම් ගැන කතා කළ යුතු යැයි වහා යෝජනා කළේ ය. 1863 පෙබරවාරි 9 වැනිදා එම කණ්ඩායම ඇමතීමට ඩුනාන්ට්ට ආරාධනාවක් ලැබී අභිප්‍රායන් ප්‍රවර්ධනය කිරිම සඳහා ඩුනාන්ට් සමග එකතු වූහ.

යුධ හමුදා ජනරාල්වරයෙකු, වෛද්‍යවරුන් දෙදෙනෙකු, නීතිඥවරයෙකු හා ලේකම් වශයෙන් ඩුනාන්ට්ගෙන් ද සමන්විත වූ මෙම පිරිස ජිනිවාහි පංචතාන්ත්‍රික කමිටුව නමින් ප්‍රකට විය. ඔවුන් තමන් හඳුන්වා ගත්තේ තුවාල ලද්දවුන්හට සහන සැලසීමේ අන්තර්ජාතික කමිටුව නමිනි. පසුව එය අන්තර්ජාතික රතු කුරුස කමිටුව යනුවෙන් නම් කෙරිණි. රතු කුරුස ව්‍යාපාරයේ ආරම්භය සනිටුහන් වුයේ ඒ අයුරිනි.

මින් පසු ගතවුණු මාසවල දී කමිටුවේ සමාජිකයන් පස්දෙනා එකතු වී අන්තර්ජාතික සමුළුවක් සංවිධානය කළ අතර 1863 ඔක්තොම්බර්හි දී රටවල් 16ක නියෝජිතයෝ ජිනිවාහි එකතු වූහ. මේ සමුළුව විසින් තුවාල ලත් සොල්දාදුවන්ට ආධාර කරන පුද්ගලයන් හඳුනා ගැනීමට හා එමගින් ඔවුන් ආරක්ෂා කර ගැනීමට සුවිශේෂ වූ ලාංඡනයක් අනුමත කර ගත්හ. මෙම සමුළුවේ දී ගන්නා ලද තීරණ නිළ නොලත් ඒවා වූ අතර එසේ වීම නිසා ඊළඟ වසරේ දී ආරම්භ වූ යුද්ධයේ දී ප්‍රශ්න රැසක් මතු විය. පසුව 1864 අගෝස්තු 22 දා ජිනීවා සම්මුතියේ සඳහන් වූ වගන්ති 10 නීතිමය වශයෙන් සම්මත වී සුවිශේෂ වූ ලාංඡනයට ද නීත්‍යානුකූල තත්ත්වය ලැබුණේ ය.

මෙබඳු මානුෂවාදී කටයුතු වල නියැලුණු ඩුනානාට් ඇල්ජිරියාවේ සිය ව්‍යාපාරික කටයුතු බොහෝ දුරට අතපසු කළේය. ඒවායේ පාලනය පවරා තිබුණේ එතරම් විශ්වාස නැති පුද්ගලයන්ට ය. ජිනිවොයිස් ක්‍රෙඩිට් නැමැති පෞද්ගලික බැංකුවේ කඩාවැටීම නිසා ඔහුට බංකොලොත් ණයකරුවකු ලෙස සිරගත වන්නට සිදු විය. අනතුරු ව ඔහු ඔහුගේ බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමත් සමග පංචතාන්ත්‍රික කමිටුවේ ඔහු දරූ ලේකම් ධූරයෙන් ඉවත් වූ අතර, එහි ලේකම් ලෙසත් සාමාජිකයෙක් ලෙසත් ඔහුගේ ඉල්ලා අස්වීම කමිටුව විසින් භාර ගත්තේ ය. ඉන් අනතුරු ව ඔහුගේ නම තවදුරටත් කොතැනකවත් සඳහන් නොකෙරිණ.

එහෙත් ඩුනාන්ට් මේ ව්‍යාපාරය සඳහා තනිවම බොහෝ දේ කළේය. නමුත් බංකොලොත් ණයකරුවකු ලෙස ඔහුට තවදුරටත් එසේ කළ නොහැකි විය. වැඩිකල් යන්නට පෙර දැඩි දරිද්‍රතාවය හේතුකොට ගෙන ඔහු කුසගින්නෙන් පෙළුණු අතර පොදු ස්ථානවල පිහිටි බංකුවල සහ උයන්වතුවල පවා නිදාගත්තේ ය. සීතලෙන් හා කුසගින්නෙන් පෙළුණු ඔහු අන්තිමේ දී රෝගී දිළින්දෙකුගේ තත්ත්වයකට පත් විය. පසුව ඔහු සදාකාලික රෝගියෙකු විය. වයසට පෙර මහල්ලෙකු වු ඔහු 1887 දී ස්විට්සර්ලන්තයේ අපෙන්සල් ප්‍රාන්තයේ හේඩන් නගරයෙහි මහළු නිවාසයකට ඇතුළු විය. වර්ෂ 1892 දී ඔහු තම අවසාන කාලය ගත කිරීමට හේඩන්හි දිස්ත්‍රික් රෝහලට ඇතුළු විය.

කෙසේ නමුත් වර්ෂ 1895 දී ශාන්ත පෝල්හි ජෝජ් බෝම්බර්ගර් නමැති මාධ්‍යවේදියෙක් මෙම රෝහලට පැමිණියේ ය. ඔහු ඩුනාන්ට්ගේ නම දැක තමා කලකට පෙර කියවූ සොල්ෆරිනෝවේ මතක සටහන් නමැති පොතේ කතෘ ඔහු බව හඳුනා ගත්තේ ය.

ඔහු මේ කිසිවෙකුත් නොහඳුනන රතු කුරුස නිර්මාතෘවරයා පිළිබඳව හෙළිදරව් කළ අතර ඔහු ගැන පළ කළ ලිපිය ලොව පුරා මහත් ආන්දෝලනයක් ඇති කළේ ය. ඒ සඳහා හෙන්රි ඩුනාන්ට් වෙත ගෞරව නාම, අමුත්තන්, හැඳිනීමේ සහතික හා සම්මාන ගලා ආවේය. වර්ෂ 1901 දෙසැම්බර් මස 01 දා හෙන්රි ඩුනාන්ට් හට හා තවත් ප්‍රංශ මානව හිතවාදියෙකු හට නොර්වීජියානු රජය විසින් ප්‍රථම වරට නොබෙල් සාම ත්‍යාගය පිරිනමන ලදී. එහෙත් ඒ උත්සවයට සහභාගි වීමට තරම් ශරීර ශක්තියක් ඩුනාන්ට් හට නොතිබිණි.

ජීන් හෙන්රි ඩූනාන්ට් 1910 ඔක්තෝම්බර් 30 වන ඉරිදා හේඩන්හිදී මිය ගියේ ය. ඔහු එවිට 82 හැවිරිදි වියේ පසු විය. ඔහුගේ අන්තිම කැමැති පත්‍රයෙන් ප්‍රදේශයේ ඉතාමත් දිළිඳු රෝගී පුද්ගලයින් සඳහා හේඩන් රෝහලේ හිස් ඇඳක් වෙන් කිරීමට ප්‍රැන්ක් 13,000ක් පරිත්‍යාග කර තිබුණි.

මෙම රතු කුරුස ව්‍යාපාරය මනුෂ්‍යත්වය, අපක්ෂපාතිත්වය, මධ්‍යස්ථ බව, ස්වාධීනත්වය, ස්වේච්ඡා සේවය, එක්සත් බව සහ විශ්වාසනීය බව යන මූලික ප්‍රතිපත්ති හතක් මත පදනම්ව මේ වන විට රටවල් 192 ක ක්‍රියාත්මක වේ.

ජිනිවාහි පංචතාන්ත්‍රික කමිටුව වර්තමානයේ අන්තර්ජාතික රතු කුරුස කමිටුව වශයෙන් හඳුන්වනු ලබයි. රතු කුරුස ව්‍යාපාරය රටවල් 192ක ක්‍රියාත්මක වන අතර මුස්ලිම් ජාතික රටවල් රතු කුරුසය වෙනුවට රතු  අඩසඳ ලාංඡනය භාවිතා කරනු ලබයි. මෙම රටවල් 192 සම්බන්ධීකරණය වනුයේ ඒ සඳහා පිහිටුවා ගනු ලැබූ අන්තර්ජාතික රතු කුරුස හා රතු අඩසඳ සමාජ සම්මේලනය මගින් වන අතර සෑම රතු කුරුස හෝ රතු අඩසඳ සමාජයක් ම මෙම සම්මේලනයේ සාමාජිකත්වය ලබා ගත යුතුය.

**ශ්‍රී ලංකා රතු කුරුස සමාජය**

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය 1936 බ්‍රිතාන්‍ය රතු කුරුසයේ මධ්‍යම ශාඛාවක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටුවිණි. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමඟ 1949 මාර්තු 30 වන දින මෙම රතු කුරුස සමාජයේ මධ්‍යම ශාඛාව විසුරුවා හැර 1949 අප්‍රේල් 01 වන දින ලංකා රතු කුරුස සමාජය ලෙස පිහිටුවනු ලැබූ අතර, 1952 දී ලොව විශාලතම මානුෂවාදී ජාලය වන අන්තර්ජාතික රතු කුරුස හා රතු අඩසඳ ව්‍යාපාරයේ කොටසක් වශයෙන් අනුබද්ධ කර ගන්නා ලදී. මෙසේ ලොව පුරා පිහිටුවා ඇති රතු කුරුස හා රතු අඩසඳ ජාතික සමාජ ගණන 192 කි. වර්ෂ 1972 ලංකාව ජනරජයක් වීමෙන් අනතුරුව ලංකා රතු කුරුස සමාජය, ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ලෙස හඳුන්වනු ලබයි.

**ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ලාංඡනය**

**මෙහෙවර**

මිනිසා විසින් ඇති කරන ලද හා ස්වාභාවික ආපදාවලින් ශ්‍රී ලංකාව තුළ විපතට පත් වූ හා තුවාල ලැබූ ප්‍රජාවන්ගේ දුක් පීඩා වැළැක්වීම හා තුරන් කර දැමීම සඳහා අපක්ෂපාතී ව කටයුතු කරයි.

**සාමාජිකත්වය**

කුලය, ඇදහීම් හෝ ආගම පිළිබඳව කිසිදු වෙනසක් නැතිව ලංකාවේ සියලු පුරවැසියන්ට රතු කුරුස සමාජිකත්වය විවෘතය. සාමාජිකත්වය වර්ග 8කින් සමන්විත වන අතර එයින් සාමාජික වර්ග 3ක් තරුණ හා ළමා පරපුර සඳහා වෙන්න පවතී.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය අද ලොව පවත්නා විශාලතම මානුෂවාදී ජාලයේ පුරුකකි. ශ්‍රී ලංකා රතු කුරුස සමාජය යනු ජාත්‍යන්තර සම්මේලනයට සම්බන්ධ ව ලංකාවේ ඇති එකම සමාජයයි. ස්වාභාවික ව ඇති වන හෝ මිනිසා විසින් ඇති කරනු ලබන ආපදා අවස්ථාව දී පමණක් නොව ආපදාවක් ඇතිවීමට පෙර ඒ සඳහා පෙර සූදානම් වීම ඇතුළු ව ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජා පුහුණුව, ආපදා අවස්ථා වලදී ඒ ප්‍රතිචාර දැක්වීම, ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය, සෞඛ්‍ය සායන, ඩෙංගු මර්ධන වැඩසටහන්, බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, වෙනත් සෞඛ්‍ය වැඩසටහන්, පීඩාවට පත් වූවන් සඳහා නිවාස ව්‍යාපෘති සහ ව්‍යවසායක හා ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘති, ශිෂ්‍යාධාර වැඩසටහන්, මනෝ සමාජීය ප්‍රථමාධාර හා  වැඩසටහන්, තරුණ හා ළමා වෙනුවෙන් දිස්ත්‍රික්/ පලාත්/ ජාතික නායකත්ව පුහුණු වැඩසටහන් ඇතුළු ව වැඩසටහන් රාශියක් ශ්‍රී ලංකා රතු කුරුස සමාජය හරහා ක්‍රියාත්මක වේ.

විශේෂයෙන් ප්‍රථමාධාර වැඩසටහන් ආපදා අවස්ථාවලදී පමණක් නොව, දීප ව්‍යාප්තව පවත්වන ආගමික, ජාතික හෝ ක්‍රීඩා උත්සව වැනි සාමකාමී අවස්ථාවල දී පවා සෑම විටෙකම මුළු රටටම ප්‍රථමාධාර සේවා සැපයීමට සමත් වේ.

## 6. කැකුළු, කණිෂ්ඨ, තරුණ රතු කුරුස සාමාජිකත්වය, එහි අරමුණු හා අභිමතාර්ථ

- ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ක්‍රියාත්මක කරනු ලබන මානුෂීය සේවාවන් සාක්ෂාත් කර ගැනීම හා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ අභිමතාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා තාරුණ්‍යයේ ශක්තිය යොදවා ගැනීම.
- රතු කුරුස ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළින් රතු කුරුස සමාජයේ සම හවුල්රුවන් වශයෙන් ඔවුන් රතු කුරුස ක්‍රියාකාරකම් වල නිරත කරවා ගැනීම හා තීරණ ගැනීම ක්‍රියාවලියට හවුල් කරවා ගැනීම.
- තාරුණ්‍ය සතු කුසලතා හා ධාරිතාවයන් සංවර්ධනය කිරිම තුළින් වඩාත් ඵලදායි සේවාවක් ප්‍රජාව වෙත ලබා දීම.
- තරුණ හා ළමා පරපුර වෙත ඔවුන් සතු දක්ෂතා සංවර්ධනය කර ගැනීම සඳහා අවස්ථාව සැලසීම.

**ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ තරුණ සංකේතය**

- අනාගතයේ දී ජාතික සමාජය තුළ වගකීම් දැරීමට අවශ්‍ය වන නායකත්ව හැකියාවන් සහ නිපුණතා ලබා දීම.
- සැලසුම් සහගත ක්‍රියාවලියත් තුළින් වඩා නිවැරදි දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනයට ඉවහල් වන පරිදි තරුණයන්ගේ ශක්තීන් වැඩිදියුණු කිරීම සහ එමගින් ඔවුන්ගේ පෞරුෂ වර්ධනය කරමින් සමාජයට ප්‍රයෝජනවත් සුදුසුකම් සපිරි ලොව අගනා පුරවැසියන් බවට පත් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර තරුණ කඳවුරු, වැඩමුළු සම්බන්ධීකරණය හා සම්මේලන සහ සම්මන්ත්‍රණවලට සහභාගිවීමේ අවස්ථා වලට තරුණ පෙළ නිරාවරණය කිරීම මගින් ලෝකයේ ඉතා වේගයෙන් සිදුවන වෙනස්වීම් හා අභියෝගයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය වන උචිත පරිචයන් තෝරා ගැනීමට අවස්ථාව ලබා දීම.

### සාමාජික වර්ගය

| අංකය | සාමාජික වර්ගය | වයස් කාණ්ඩය | වර්ණය | වසරකට සමාජික මුදල (වෙනස් විය හැකිය.) |
|---|---|---|---|---|
| 1. | කැකුළු සාමාජික | අවු. 06 - 11 | අළු - කොළ | රු. 10.00 |
| 2. | කණිෂ්ඨ සාමාජික | අවු. 12 - 17 | අළු - මෙරූන් | රු. 10.00 |
| 3. | තරුණ සාමාජික | අවු. 18 - 28 | අළු - නිල් | රු. 10.00 |

### පාසැල තුළ කණිෂ්ඨ සහ කැකුළු කව ස්ථාපිත කිරීමේ කියාමාර්ග

1) විදුහල්පතිතුමා / විදුහල්පතිතුමියගේ ලිඛිත ඉල්ලීමකට අනුව යම් පාසලක රතු කුරුස කණිෂ්ඨ සහ කැකුළු සහ කව ආරම්භ කළ හැක.
2) 30 ක අවම සමාජිකත්වයක් සිටිය යුතු වන අතර එහි උපරිමය 50ක් වේ.
3) පාසලේ සංවිධාන ශක්තිය හා ශිෂ්‍ය සංඛ්‍යාව මත එක් පාසලක කණිෂ්ඨ හෝ කැකුළු කව කිහිපයක් පිහිටුවා ගත හැක.
4) විදුහල්පති විසින් නම් කරනු ලබන ගුරු මහත්ම මහත්මින් තරුණ රතු කුරුස කවයේ උපදේශකයින් වෙති. ඔහු හෝ ඇය ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ සමාජිකත්වය ලබා ගත යුතු වේ. එමගින් ශාඛාව මගින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් සහ සැසි සඳහා සහභාගි විය යුතු ය.

**කණිෂ්ඨ රතු කුරුස කවයේ ව්‍යුහය**

කණිෂ්ඨ රතු කුරුස කව

↓

අනුශාසක / විදුහල්පති

↓

නායකයා කණිෂ්ඨ රතු කුරුස භාර ආචාර්වරයා

↓

සභාපති / උපසභාපති / ලේකම් / කමිටු සාමාජිකයින් 06

↓

සාමාජිකයින්

කමිටුවෙහි නිළ කාලය වසරකි. අවම වශයෙන් මාස දෙකකට වරක් වත් මෙම කමිටුව රැස්විය යුතු ය.

සාමාජික මුදල් හා මුල්‍ය කටයුතු කණිෂ්ඨ සහ කැකුළු රතු කුරුස කවයන්වල සියළුම මුල්‍ය කටයුතු කවයන්වල උපදේශකයින් විසින් සිදු කළ යුතු ය.

සාමාජික මුදල් ගෙවීමේදී තවත් කණිෂ්ඨ හෝ කැකුළු සාමාජිකයෙකු ලෙස සිටිය හැකි වයස කාල පරාසයට අදාලව සාමාජික ගාස්තු එකවර ගෙවිය හැකි ය. එහෙත් රතු කුරුස කවය භාර ආචාරවරයාට යම් සාමාජිකයෙකුගේ අපහසුතාව සලකා බලා සාමාජික ගාස්තු වාර්ෂිකව ලබා ගත හැක.

**අනු කමිටු**

කණිෂ්ඨ හෝ කැකුළු රතු කුරුස කමිටුවට අමතරව පාසල් රතු කුරුස කව යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති හෝ වැඩසටහන් වඩා සාර්ථකව කිරීම සඳහා කවයේ අනුශාසකත්වයේ මෙහෙයවීම මත උප කමිටු පත් කළ හැක.

**කණිෂ්ඨ කවයන් වලට ඇතුළත් කර ගැනීම**

නියමිත සාමාජික ගාස්තු ගෙවා සාමාජිකත්වය ලබා ගත්ත ද, ඔවුන් සාමාජිකයෙකු ලෙස පිළිගනු ලබන්නේ කවයේ පවත්වනු ලබන ඇතුලත් කර ගැනීමේ අවස්ථාවන්හි දී ප්‍රතිඥා දී ලාංඡන පැළඳවීමෙන් අනතුරුව ය. ලාංඡන පළඳවන අයද අනිවාර්යයෙන්ම රතු කුරුස සමාජයේ සාමාජිකත්වය ලබා සිටිය යුතු ය.

## 10. කණිෂ්ඨ රතු කුරුස කවයේ නිළධාරින්ගේ වගකීම්

**සභාපති**

- රතු කුරුස කවයේ කමිටු රැස්වීම්වල දී මුලසුන දරනු ලබයි.
- රතු කුරුස කවයේ නායකයා කමිටුව සමග එක් වී ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කරයි.

**උප සභාපති**

- සභාපති නොමැති අවස්ථාවක ඔහුගේ කටයුතු ආවරණය කරයි.

**ලේකම්**

- නායකයා හා සභාපති සමග සාකච්ඡා කර රැස්වීම කැඳවයි.
- රැස්වීම් වාර්තා තබා ගෙන සහ එම වාර්තා ශාඛාවට යොමු කරයි.
- මාසිකව හා වාර්ෂිකව ප්‍රගති වාර්තා සකස් කර ඉදිරිපත් කරයි.
- වාර්ෂික මහා සභාව කැඳවයි.

**කමිටු සාමාජිකයින්**

- කමිටු රැස්වීම් නියෝජනය කරයි.
- වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහය වෙයි.

**කමිටු රැස්වීම්**

- යටත් පිරිසෙයින් මාස දෙකකට වරක්වත් කමිටු රැස්වීම පැවැත්විය යුතුයි.
- කමිටු රැස්වීමේ මුලසුන සභාපති විසින් දරනු ලැබේ.
- වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම කමිටුව මගිනි.
- වාර්ෂික වැඩ සැලැස්ම පිළියෙල කර ඒකකය/ ශාඛාව වෙත ඉදිරිපත් කරයි.
- උපදේශකවරයා කමිටු රැස්වීමට සහභාගි විය යුතු ය.

**මහා සභා**

- වසරකට වරක් නොවැම්බර් මාසය අවසානයට පෙර පැවැත්විය යුතු ය.
- මහා සභාවට දින 14කට පෙර සාමාජිකයින්ට මහා සභාව පිළිබඳව දැනුම් දිය යුතු ය.
- ඊළඟ වසර සඳහා කවයේ නිළධාරි මණ්ඩලය සාමාජිකයින්ගේ යෝජනා ස්ථිරත්වයෙන් තෝරා පත් කර ගත යුතු ය.
- ඡන්දය පාවිච්චි කිරීමේ දී සාමාජිකයින් තම අත ඔසවා ඡන්දය පකාශ කළ යුතු ය.
- මහා සභාවේ දී එම වසරේ ප්‍රගති වාර්තාව සභාපති විසින් සහ මුදල් වාර්තාව නායකයා විසින් ඉදිරිපත් කළ යුතු අතර එය සභාවේ 2/3 ක ඡන්දයෙන් සම්මත විය යුතු ය.
- ඉදිරි වසර සඳහා විශේෂ යෝජනා වෙතොත් මහා සභාවේදී ඉදිරිපත් කර සම්මත කර ගත යුතු ය.
- මහා සභාවේ මුලාසනය කවයේ සභාපති විසින් උසුලනු ලබයි.
- ඊළඟ වසර සඳහා නිළධාරි මණ්ඩලය තෝරා පත් කර ගැනීමට පෙර කමිටු නිළධාරින් ඉල්ලා අස්විය යුතුය. එවිට කවයේ නායකයා මුලසුන හොබවන අතර, නව නිළධාරි මණ්ඩලය පත් කර ගැනීම ඔහුගේ හෝ ඇයගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.
- මහා සභාවේ අධීක්ෂකයෙකු ලෙස ශාඛා තරුණ කමිටුවේ නියෝජිතයෙකු සහභාගි විය යුතු අතර, රැස්වීම් දිනය දින 14කට කලින් ශාඛාවට දැනුම් දිය යුතු ය.

**<u>වාර්තාකරණය</u>**

සාමාජිකයින් විසින් ඉටු කරනු ලබන සේවාවන් සියල්ලම කවය තුළ වාර්තා විය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලිපි ලේඛන නඩත්තු කළ යුතු වේ.

- සාමාජික නාම ලේඛණය
- සාමාජික මුදල් ගෙවීම් පිළිබඳ නාම ලේඛනය
- සාමාජික ක්‍රියාකාරකම් ලේඛනය
- අරමුදල් රැස්කිරීම පිළිබඳ වාර්තාව
- සාමාජික ක්‍රියාකාරිත්වය සටහන් කිරීම සඳහා සාමාජිකයින්ට වෙන් වූ ක්ෂේත්‍ර සටහන් පොතක් පවත්වා ගත යුතුය. සහභාගි වන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරය නායකයාගේ අත්සනින් සටහන් විය යුතු ය.
- ශාඛාව සමඟ ලිපි හුවමාරුව සඳහා විශේෂ ලිපි ගොනුවක් සකස් විය යුතු ය.
- වාර්තාකරණය පිළිබඳ වගකීම විදුහල්පති/ නායක/ සභාපති සතුව පවතී.

**ලොග් සටහන් පොත**

- කවයේ සියලුම ක්‍රියාකාරකම් විස්තරව සටහන් කිරීම සඳහා ලොග් පොත ප්‍රයෝජනට ගත යුතුය. බාහිරව පැමිණෙන අධීක්ෂකයින්/ අමුත්තන් ලවා උචිත ආකාරයෙන් කරවා ගත යුතු ය.

**සාමාජිකත්වය අහෝසි වීම.**

සාමාජිකත්වය අහෝසි වීම, අහෝසි කිරීම හා සාමාජිකත්වය මාරු කිරීම.

- වයස අවුරුදු 19 අවසන් වනවාත් සමග එම සාමාජිකත්වය අහෝසි වේ.
- නමුත් ප්‍රදේශයේ අදාළ රතු කුරුස සමාජ ශාඛා කාර්යාලය හරහා සාමාජිකත්වය ලබාගෙන ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ස්වෙච්ඡා සේවයේ නිරත විය හැකි ය.
- පාසල් කවය නියෝජනය කරන්නන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමට අවශ්‍යනම් එම බලය පාසල් විදුහල්පතිට හිමි ය.

- යම් කණිෂ්ඨ රතු කුරුස සාමාජිකයෙකු වෙනත් පාසලකට ඇතුළත් වූ අවස්ථාවක එම පාසලේ රතු කුරුස කවයේ ලියාපදිංචි විය හැකි ය. යම් හෙයකින් එම පාසලේ කණිෂ්ඨ රතු කුරුස කවයක් ස්ථාපිත කර නැත්නම් ආසන්නයේ ඇති ඒකක මට්ටමේ පිහිටුවා ඇති කණිෂ්ඨ රතු කුරුස කවයෙහි ලියාපදිංචි විය හැකි ය.
- එසේ දෙවතාවක් ලියාපදිංචි වීමේදී නැවතත් සාමාජික ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

**ක්‍රියාකාරකම්**

පාසල් කණිෂ්ඨ රතු කුරුස කවයක් මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කළ හැක. මීට අමතරව රතු කුරුස ප්‍රතිපත්තිවලට අනුකූලව තවත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව ද ඔවුනට ඇත.

**පාසල් කණිෂ්ඨ රතු කුරුස කවය**

- පාසල හා අවට පවිත්‍රතාවය රැක ගැනීම.
- පාසල තුළ සහ ඉන් බාහිරව ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය සහ සහන සේවා කටයුතු සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.
- ප්‍රථමාධාර ඒකකයන් පවත්වාගෙන යාම සහ උත්සව හෝ දෛනික අවශ්‍යතාවලදී ප්‍රථමාධාර ලබා දීම.
- අනෙකුත් පාසල් කව හා අන්‍යෝන්‍ය අවබෝධය හා මිත්‍රත්වය ගොඩ නැගීම.
- චිත්‍ර/ කවීක/ පෝස්ටර් තරඟ පැවැත්වීම.
- කඳවුරු පැවැත්වීම සහ සහභාගී වීම.
- පාසලෙහි පිහිටුවා ඇති අනෙකුත් සමිති සමාගම් සමග සුහදව කටයුතු කිරීම.
- තරුණ රතුකුරුස කටයුතු සඳහා හැකි සෑම සහ සහයෝගයක්ම ලබා දීම.
- පුහුණු වැඩසටහන් හා ශ්‍රමදානයන්ට සහභාගී වීම.
- වෙනත් සමාන ආධාර කටයුතු හෝ සේවාවන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ජාතික මූලස්ථානය හා ශාඛාව මගින් වරින් වර නිවේදනය කරන සෙසු ක්‍රියාකාරකම් ඉටු කිරීම.

**15.පදක්කම් හා හිස් පලඳනා**

කනිෂ්ඨ රතුකුරුස සාමාජිකයෙකු විසින් දිනාගත් හැකි පදක්කම් වර්ග 07කි.
ඒවා අනුපිළිවෙළින් පහතින් සඳහන් කර ඇති අතර සාමාජිකයෙකු විසින් එම පදක්කම් දිනා ගත යුත්තේ ද දක්වා ඇති අනුපිළිවෙලටම ය.

**පදක්කම්**

රතු කුරුස ලාංඡනය




ප්‍රථමාධාර




ප්‍රජා සේවා




පරිසර සංරක්ෂණය




අරමුදල් රැස්කිරීම




ක්‍රියාකාරි සහභාගිත්වය




කුසලතා



පදක්කම් 07 දිනා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කණිෂ්ඨ/ තරුණ මාර්ගෝපදේශ අත් පොතෙහි විස්තර කර ඇත. එම අත්පොත භාවිතයෙන් සාමාජිකයා සිදු කළයුතු ක්‍රියාකාරකම් මොනවාදැයි පැහැදිළිව අවබෝධ වනු ඇත.

**හිස පළඳනාව**

පදක්කම් සියල්ල දිනාගත් සාමාජිකයා හිස් පළඳනාව ලැබීම්ට සුදුසුකම් දරයි. එය කනිෂ්ඨ රතු කුරුස සාමාජිකයාට දිනාගත හැකි උපරිම තත්ත්වය වන අතර ශාඛා මට්ටමින් පවත්වනු ලබන උත්සවයකදී එය පැළඳවිය යුතු ය.

යම් සාමාජිකයෙකු විසින් දිනා ගත් පදක්කම් නිළ ඇඳුමේ අංගයක් වේ. නමුත් විනයානුකූල හේතූන් මත මෙම පදක්කම් තාවකාලිකව අත් අත්හිටුවීමේ බලය නායකත්වය සතු වේ.

**කනිෂ්ඨ රතු කුරුස කඳවුර**

ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුත් පරිසරයට ඇලුම් කරන, පරිසරය සමග ජීවත්වන, යුතුකම් හා වගකීම් සාර්ථකව ඉටු කළ හැකි, සාමූහික හැඟීමෙන් යුත්, කලට වේලාවට වැඩ කරන නායකයින් බිහි කිරීමේ අරමුණින් යුතුව කනිෂ්ඨ රතුකුරුස කඳවුර කඳවුරු පැවැත්විය යුතු වන අතර, මෙම කනිෂ්ඨ රතුකුරුස කඳවුරක් නිර්මාණය කරන ආකාරය හා කඳවුරක් සඳහා අවශ්‍ය උපකරණ, ආම්පන්න, සැලැස්ම හා පිළිවෙත් ක්‍රියාකාරකම් පිළිබඳව කනිෂ්ඨ /තරුණ රතු කුරුස මාර්ගෝපදේශ අත්පොතෙහි පැහැදිලිව සඳහන් කර ඇත.

**නිළ ඇඳුම**

කණිෂ්ඨ රතුකුරුස සාමාජිකයාගේ සහ සාමාජිකාවකගේ නිළ ඇඳුම් පහත පරිදි වේ.



**සාමාජිකයින්ගේ නිළ ඇඳුම**

- සුදු දිග කලිසම, සුදු අත් දිග කමිසය, තද නිල් පැහැති ටයි පටිය, කළු සපත්තු , සුදු මේස් හා තද නිල් පැහැති කැප් තොප්පිය යන අංගයන්ගෙන් සමන්විත වේ.

**සාමාජිකාවන්ගේ නිළ ඇඳුම**

- කොලරය සහිත රැලි නොකළ කොළරයේ සිට පහත වාටිය දක්වා පලා වෙන් කරන ලද කළු බොත්තම් ඇල්ලූ අඟලකට නොඅඩු ඍජු පටියක් සහිත දණහිස ආවරණය වන පරිදි වූ සුදු ගවුම අඟල් 1.5 පළල් වූ කළු ඉන පටිය, සුදු සපත්තු සුදු මේස් සහ සුදු පළඳනාව

- සියලු ම රතු කුරුස සමාජිකයින් හා සාමාජිකාවන් විශේෂ අවස්ථාවල දී ඉහත රතු කුරුස නිල ඇඳුමින් සැරසී සිටිය යුතු අතර, එය ඉහත සඳහන් ආකාරයෙන් විය යුතු ය.

**18. පාසැලේ අධීක්ෂණය යටතේ කැකුළු සමාජ ස්ථාපිත කිරීමේ ක්‍රියාමාර්ග**

කැකුළු සමාජ බිහි කිරීම, කුඩා අවධියේ සිට රතු කුරුස සමාජ පිළිබඳ අවබෝධයක්, හුරුවක් ලැදියාවක් ළමයින් තුළ ජනිත් කර ගැනීමේ අරමුණ වනු ඇත.

පාසැලක විදුහල්පතිවරයා හෝ විදුහල්පතිවරියගේ අවසරය මත ප්‍රදේශයේ රතුකුරුස පාසැල් කවයක පාසැල් ගුරුවරයෙකු උපදේශක තත්ත්වයේ තබා ගෙන ප්‍රදේශයේ රතු කුරුස ශාඛාවේ මැදිහත්වීමෙන් මෙම ළමා සමාජ පිහිටුවා ගත හැක. සියලුම සම්බන්ධීකරණයන් රතුකුරුස ශාඛා හරහා සිදු වනු ඇත.

වයස අවුරුදු 6 සිට 11 අතර ළමා පිරිස් ඒකරාශී කරගත් රතුකුරුස ළමා සමාජ බිහි කරගත හැක. මෙම කැකුළු සමාජ සාමාජිකයින් 10 කට නොඅඩු විය යුතු ය.

**කැකුළු රතු කුරුස කවයේ ව්‍යුහය**

රතු කුරුස කැකුළු සමාජ

↓

නායකයා කැකුළු රතු කුරුස භාර ආචාරවරයා

↓

සභාපති / ලේකම් /කමිටු සාමාජිකයන් 05

↓

සාමාජිකයින්

**කැකුළු සාමාජික භූමිකා සහ ක්‍රියාකාරකම්**

- සේවාදායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම හෝ ක්‍රියාත්මක වීම.
- ප්‍රතිලාභියෙක හෝ සේවා ලාභියෙක් ලෙස හැකියාවන් වර්ධනය කර ගනිමින් සමාජයේ වර්ධනයට කොටස්කරුවෙක් වී දායක වීම.
- කැකුළු සමාජ සාමාජිකයින්ට ගැළපෙන ක්‍රියාකාරකම් සමාජයේ නායකයා විසින් නිර්මාණය කර රතුකුරුස කොට්ඨාසයේ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක කළ හැකි ය.

කැකුළු රතුකුරුස සාමාජිකයා තම වයස සම්පූර්ණ වීමත් සමඟම ඔහු අධ්‍යාපනය ලබන පාසැලේ කනිෂ්ඨ රතුකුරුස කවයේ සාමාජිකත්වය ලබාගෙන කනිෂ්ඨ රතුකුරුස සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමටත් හා හැකියාවන් පෙන්වීමටත් හැකිවනු ඇත.

## 21. ප්‍රතිලාභ

පාසලක රතු කුරුස පාසල් කවයක් ආරම්භ කිරීම නිසා පාසලට විදුහල්පතිතුමාට හෝ විදුහල්පතිතුමියට, පාසලේ ගුරුභවතුනට, පාසල් දරු දැරියන් හට, දෙමාපියන්ට සහ පරිසරයට ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත සඳහන් වේ.

- ශ්‍රමදාන හා පරිසර සංරක්ෂණ වැඩසටහන් තුළින් පාසල් පරිසරය ක්‍රමවත්ව හා පිරිසිදුව පවත්වාගෙන යාම නිසා පරිසරය ආරක්ෂා වනවා මෙන් ම පාසලට නව අලංකාරයක් ඇතිවීම ඒ හරහා එම පරිසරය තුළ අධ්‍යාපනය හදාරන සියළුම දරු දැරියන්ට මෙන් ම විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය සහ ගුරුභවතුන් හට ඉතා ප්‍රබෝධයකින් යුක්තව කටයුතු කරගෙන යාමට හැකි වීම.
- රතු කුරුස සමාජය ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් තුළින් විනය ගරුක දරු පිරිසක් බිහිවීම නිසා පාසලටත්, විදුහල්පති ඇතුළු ගුරුභවතුන්හට, දරුවන්ගේ දෙමාපියන්ට එහි ප්‍රණාමය හිමිවීම.
- රතු කුරුස සමාජය විසින් රතු කුරුස කවයේ දරුවන්ට ලබා දෙන්නා වූ ප්‍රථමාධාර පුහුණුව නිසා පාසල තුළ ඇතිවන හදිසි තත්වයන්ට ප්‍රථමාධාර ලබා දීමට හැකිවනවා මෙන්ම පාසලේ පැවැත්වෙන උත්සව හෝ එදිනෙදා කටයුතු වලදී අවශ්‍ය ප්‍රථමාධාර සේවාවන් මෙසේ පුහුණුව ලත් දරුවන්ගෙන් සපයා ගැනීමට හැකිවීම, විදුහල්පති ඇතුළු ගුරුභවතුන්හට මහත් පිටුවහලක් වනු ඇත. එමෙන් ම දරුවන් පාසලෙන් බැහැරව සිටින අවස්ථාවක වුවද තමාගේ, තම පවුලේ හෝ අසල්වැසියන්ගේ හෝ විපතට පත්වන වෙනයම් ඕනෑම අයෙකුට ප්‍රථමාධාර සැපයීමට හැකි වීම.
- රතු කුරුස පාසල් කව දරුවන් සඳහා පවත්වනු ලබන චිත්‍ර, කථික, නාට්‍ය, පොස්ටර් තරග හරහා වලට මුහුණ දිය හැකි, විවිධ හැකියාවන් වර්ධනය වූ, ජය පරාජය එකසේ විඳදරා ගත හැකි දරු පිරිසක් බිහිවනු ඇත. එමෙන් ම අනෙකුත් පාසල් සමග ද තරග වදිමින් තම හැකියාවන් පෙන්වීම හා පාසලට කීර්තියක් ගෙන ඒමට උනන්දු වන දරුවන් පිරිසක් සහිත පාසලක් නිර්මාණය වීම.
- රතු කුරුස සමාජය ලබා දෙන්නා වූ නායකත්ව පුහුණුව ඇතුළු විවිධ පුහුණු වැඩසටහන් තුළින් දරුවන්ගේ නායකත්ව කුසලතාවයන් තව තවත් වැඩිදියුණු වීම සහ අන්‍යෝන්‍යය අවබෝධය හා මිත්‍රත්වය ගොඩනැගීම.

- රතු කුරුස පාසල් කව සාමාජික සාමාජිකාවන්ගේ හැකියාවන් හා කුසලතාවයන් නිරන්තරයෙන් වැඩිදියුණු වන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදුවන හෙයින් එම දරුවන් පාසල් තුල කැපී පෙනෙන චරිත බවට පත්වනු ඇත. එවන් දරුවන් පාසල තුළ පිහිටුවා ඇති අනෙකුත් සමිතිවල දරු දැරියන්ටත් ආදර්ශයක් වනු ඇත.
- පරිසරයට ආදරය කරන සහ දෙමාපියන්හට, ගුරුභවතුන්හට, වැඩිහිටියන්හට මෙන්ම සමස්ත ප්‍රජාවට ගරු කරන දැයට යහපත් දරු පිරිසක් බිහි කිරීම.

**පාසල් රතු කුරුස කවය හා සම්බන්ධ වීමෙන් අනාගතයේදී ලබාගත හැකි ප්‍රතිලාභ**

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ශාඛා කාර්යාල දිස්ත්‍රික්ක මට්ටමින් පිහිටුවා ඇති කාර්යාල ඇති අතර පසුකාලීනව සිසුන්ට ඒ හරහා සම්බන්ධ වී පරිපූර්ණ මානුෂවාදී ක්‍රියාවක් ලෙසින් ස්වෙච්ඡා සේවයේ යෙදිය හැකි ය. එමෙන්ම වෘත්තීමය මට්ට්මේ ප්‍රථමාධාර පුහුණු උපදේශකයෙකු ලෙස ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් සේවය ලබා දිය හැකි ය. රතු කුරුස සමාජය හා සම්බන්ධ වීමෙන් පාසල් කාලය අවසන් වුවත් ඔවුන්ගේ වෘත්තීමය මට්ටම ද ආර්ථික මට්ටම ද ශක්තිමත් කර ගැනීමේ අවකාශය සිසුන්ට හිමි වේ.

**මූලික ප්‍රතිලාභ**

- ප්‍රථමාධාර පිළිබඳව පුහුණුව ලබා  ගැනීම හා ප්‍රථමාධාර පුහුණු උපදේශකවරයෙකු වීම.
- ආපදා කළමනාකරණය පිළිබඳව දැනුම්වත් වීම හා ජීවිතාරක්ෂකයෙකු ලෙස පුහුණු වීම.
- ස්වෙච්ඡා සේවකයෙකු ලෙස සාමාජිකත්වය ලබා ගත හැකි වීම.

**01. වෘත්තීමය මට්ටමේ ප්‍රථමාධාර පුහුණු උපදේශකවරයෙකු වීමේ ක්‍රමවේදය**

**පියවර 01 - ප්‍රථමාධාර මූලික පරීක්ෂණය (Basic First Aid Course)**

සෑම වසරකම දීප ව්‍යාප්තව රතු කුරුස සමාජ ආවරණය වන පරිදි පවත්වන දින තුනක පුහුණු වැඩසටහනකින් අනතුරුව පවත්වන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

**පියවර 02 - ප්‍රථමාධාර උසස් පරීක්ෂණය (Advance First Aid Course)**

සෑම වසරකම අවශ්‍යතාවය මත දිස්ත්‍රික්ක පදනමින් රතු කුරුස සමාජ ආවරණය වන පරිදි පවත්වන දින හයක පුහුණු වැඩසටහනකින් අනතුරුව පවත්වන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

**පියවර 03 - ප්‍රථමාධාර පුහුණුකරුවෙකු වීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය (Instructor Training Course)**

රතු කුරුස සමාජ ආවරණය වන පරිදි පවත්වන දින අටක පුහුණු වැඩසටහනකින් අනතුරුව පවත්වන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය. අදාළ පුහුණු දින ගණන පහත පරිදි ක්‍රියාත්මක වේ.

දින 01 සිට දින  04 දක්වා - ප්‍රථමාධාර පුහුණුව<br>
දින 05 සිට දින  07 දක්වා - ගුරු පුහුණුව<br>
08 වෙනි දින - ඇගයීම මහ සමාලෝචනය

**පියවර 04 - දැනුම, ප්‍රායෝගික පුහුණුව හා ආකල්ප යාවත්කාලීන කිරීමේ පුහුණුව (Refreshers Course)**

සෑම ප්‍රථමාධාර පුහුණුකරුවෙකුම වසර තුනකට ම වරක් තම දැනුම ප්‍රායෝගික පුහුණුව හා ආකල්ප යාවත්කාලීන කර ගත යුතු ය. අදාළ පුහුණුව ශ්‍රී ලංකා රතු කුරුස ජාතික මූලස්ථානයෙන් පවත්වනු ලැබේ. දින තුනක පුහුණු වැඩමුළුවක් ලෙස පවත්වන මෙයට සම්බන්ධ වී තම පුහුණු උපදේශන සහතිකය අලුත් කර ගත යුතු ය.

**02. ආපදා කළමනාකරණය පිළිබඳව දැනුම්වත් වීම හා ජීවිතාරක්ෂකයෙකු ලෙස ස්වෙච්ඡා සේවයේ යෙදීම.**

හදිසි ආපදා අවස්ථාවන්ට මුහුණ දීමට හැකි ස්වෙච්ඡා සේවකයින් මේ හරහා බිහි කරනවා මෙන්ම ජීවිතාරක්ෂකයෙකු ලෙස ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ පුළුල් දැනුවත් වීමක් ලබා ගත හැකි ය.

**03. ස්වෙච්ඡා සේවකයෙකු ලෙස කටයුතු කළ හැකි වීම.**

ස්වෙච්ඡා සේවය රතු කුරුස සමාජයේ ප්‍රතිපත්තියක් ලෙසත් දක්වා ඇත. කැකුළු සාමාජිකයෙක් ලෙස වයස අවුරුදු 06 දී පාසල් සිසුන් ලබාගන්නා සාමාජිකත්වය දීප ව්‍යාප්තව පවතින ශ්‍රී ලංකා රතු කුරුස දිස්ත්‍රික් කාර්යාල හරහා යාවජීව සාමාජිකත්වයක් **(A Life Membership)** ලෙස පසුකාලීනව වෙනස්කර ගත හැකිය. හදිසි අවස්ථාවලදීත්, ආපදා තත්ව වලදීත් රටේ අවශ්‍යතාවය මත ක්ෂණිකව ක්‍රියාත්මක විය හැකි මනෝ සමාජීය වශයෙන් දියුණු වූ ස්වෙච්ඡා සේවකයෙකු වීමේ හැකියාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය හා එක්වීම තුළින් ලබා ගත හැකි ය. ආකල්ප සංවර්ධනය, කුසලතා ඔප්නැංවීම මෙන්ම න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවෙන් හෙබි තාර්කික නායකයෙකු බිහි කිරීම රතු කුරුස ස්වෙච්ඡා සේවය හරහා ඵලදායීව සිදු වේ.

**ඇගයීම**

**වගු අංක 01**

| පදක්කම් වර්ගය | ලබාගත් කාලය |
|---|---|
| රතු කුරුස ලාංඡනය | |
| ප්‍රථමාධාර ලාංඡනය | |
| ප්‍රජා සේවා | |
| පරිසර සංරක්ෂණය | |
| අරමුදල් රැස් කිරීම | |
| ක්‍රියාකාරී සහභාගීත්වය | |
| කුසලතා | |

**වගු අංක 02**

| | ඇගයීමේ නිර්නායක | විශිෂ්ඨ | හොඳයි | මධ්‍යස්ථයි | සංවර්ධනය විය යුතුයි. |
|---|---|---|---|---|---|
| 01 | ඉදිරිපත් වීමේ හැකියාව | | | | |
| 02 | සංවිධානය වීමේ හැකියාව | | | | |
| 03 | යමක් සංවිධානය කිරීමේ හැකියාව | | | | |
| 04 | කණ්ඩායම් හැඟීම | | | | |
| 05 | නායකත්ව කුසලතාවය | | | | |
| 06 | කාල කළමනාකරණය | | | | |
| 07 | ප්‍රායෝගික පුහුණුව | | | | |
| 08 | ආකල්ප සංවර්ධනය | | | | |

## 2.2 VI. ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය
## (1959)

**හැඳින්වීම**

ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය ප්‍රථමාධාරයට, වෛද්‍යාධාරයට සහ ප්‍රජා සංවර්ධනයට කැප වූ රජය පිළිගත් පුණ්‍ය ආයතනයකි.

**ආරම්භය**

1959 වසරේ රත්නපුර මග ඔස්සේ ශ්‍රී පාද වන්දනාවේ ගිය තරුණ වෛද්‍යවරු පිරිසක් තමන් රැගෙන ගිය ප්‍රථමාධාර කට්ටලයෙන් එහිදී හමු වූ විවිධ රෝගාබාධවලට ලක් වූ රෝගීන්ට ප්‍රථමාධාර ගබා දුන් අතර එම අවස්ථාවේ දී මෙම වෛද්‍යවරුන් තුළ ඇති වූ පරහිතකාමීත්වයේ ප්‍රතිඵලයක් ලෙස 1960 පෙබරවාරි 04 වන දින සෞඛ්‍යදාන ව්‍යාපාරය බිහි විය. එසේ පිහිටුවා මසකට පසුව 1960 මාර්තු මාසයේ දී ශ්‍රී පාදයේ රත්නපුර හා හැටන් මාර්ගවල ස්ථාන කිහිපයක ම කඳවුරු ඉදිකර රෝගීන් 650 කට ප්‍රතිකාර ලබා දීමෙන් මෙම සේවාව ඇරඹිණි. සෞඛ්‍යදාන ව්‍යාපාරය ආරම්භ කිරීමෙහිලා පුරෝගාමීව කටයුතු කළේ වෛද්‍ය වජිරනාත් ලක්ෂ්මන් ද සිල්වා මහතා වන අතර එතුමා මෙහි නිර්මාතෘවරයා මෙන්ම ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා ද වන්නේ ය.

**අරමුණු**

1. ශ්‍රී ලංකාව සෞඛ්‍ය සම්පන්න රටක් බවට පත් කිරීම.
2. යහපත් පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීම.
3. තරුණ පරපුරට ස්වේච්ඡා සේවය පිළිබඳව හැඟීමක් ඇති කර, අන්‍යන්ට උපකාරී වීමට අවස්ථාවක් ලබා දීම.

**සේවා**

1. දිවයිනේ ජාතික, ආගමික උත්සව වලදී නොමිලේ ප්‍රථමාධාර, වෛද්‍යාධාර ලබා දීම.
2. ගංවතුර සුළිසුළං වැනි ජාතික ආපදා අවස්ථාවලදී ප්‍රථමාධාර/වෛද්‍යාධාර සහ සහන සේවා සැලසීම.
3. රෝහල් ළමා වැඩිහිටි හා විශේෂ අවස්ථා රැඳවුම් නිවාස සඳහා උපස්ථාන සේවා ඉටු කිරීම.
4. පාසැල් හා ප්‍රාදේශීය මට්ටමෙන් සෞඛ්‍යදාන ඒකක බිහි කර තරුණ පෙළට සෞඛ්‍ය අධ්‍යාපනය, ගෘහ හෙදකම හා ප්‍රථමාධාර පිළිබඳ පුහුණුව ලබා දී අදාළ පරීක්ෂණ පවත්වා සහතික ප්‍රදානය කිරීම.
5. ශ්‍රමදාන, පෝෂණ සේවා ඉටු කිරීම.
6. දුෂ්කර ගම්මානවල සෞඛ්‍ය හා සාමාජීය සත්කාර වැඩසටහන් පැවැත්වීම.
7. ළමා රැකවරණ වැඩසටහන් පැවැත්වීම.
8. ලේ දන් දීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
9. ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම.
10. විවිධ ආයතනවල සෞඛ්‍යදාන ඒකක බිහි කිරීම හා ප්‍රථමාධාර පුහුණු සංවිධානය කිරීම.

**ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරයේ ලාංඡනය**

අශෝක චක්‍රය හා ඒ වටා නැවුණු ගොයම් කරල් දෙකකි.

**පාසැල් ඒකක ඇරඹීම**

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2001/14 -2001.05.09 හා ED/01/02/07/14 - 2007.10.24 චක්‍ර ලේඛණය මත මෙම ඒකක පිහිටවනු ලැබේ.

**සාමාජිකත්වය**

පාසැල්වල හත (07) සහ අට (08) ශ්‍රේණියේ සිට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙහි සාමාජිකත්වය ලබාගත හැක. ඒකකයක් ඇරඹීම සඳහා අවම සාමාජික සංඛ්‍යාව 20 කි (උපරිම සීමාවක් නැත.)

**සෞඛ්‍යදාන පරීක්ෂණය (කනිෂ්ඨ)**

වසරක පුහුණු කාල සීමාවකින් අනතුරුව කනිටු පරීක්ෂණයට පෙනී සිටීමට හැකියාව ඇති අතර එම අවස්ථාවේදී අදාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 8 වන ශ්‍රේණිය හෝ ඊට ඉහළ අධ්‍යාපන පසුබිම තිබිය යුතුයි. (මෙය ලිඛිත පරීක්ෂණයකි.)

**ජ්‍යෙෂ්ඨ**

කනිටු පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව අදාල ප්‍රායෝගික පුහුණුව හා නියමිත සේවාවල නිරත වූ පසු ජේෂ්ඨ පරීක්ෂණයට ඉදිරිපත්වීම. (මෙය ප්‍රායෝගික පරීක්ෂණයකි.)

**ජ්‍යෙෂ්ඨ පාඨමාලාව (ප්‍රායෝගික)**

- D.R.C.A.B. අනුගමනය කිරීම සහ C.P.R. ලබා දීම.
- ලේ ගැලීම නැවැත්වීම (Bleeding control)
  - i. ඍජු පීඩනය.
  - ii. අනියම් පීඩනය.
- උගුරේ සිරවූ දෙයක් ඉවතට ගැනීම (Choking).
- අක්ෂි බිඳුමකදී පතුරු තබා වෙළීම (Fracture).
- ක්ලාන්තය, විසඥතාවය, අදාළ ප්‍රථමාධාර සහ ආරක්ෂිත ඉරියව්. (Recovery Position)
- රෝගීන් ප්‍රවාහනය

ඉහත ප්‍රථමාධාර පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු වේ.

**ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ට ලැබෙන ප්‍රතිලාභ**

1. කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ පරීක්ෂණ සමත් වන පිරිසට රජය පිළිගත් වටිනා සහතිකයක් පිරිනමන අතර එම සහතිකය රැකියා / පුහුණු පාඨමාලා වැනි අවස්ථාවලදී අමතර සුදුසුකමක් ලෙස පිළිගනු ලබයි.
2. අදාළ ප්‍රවීනතා ලත් පිරිසට පාසැල හැර යෑමෙන් පසු ප්‍රාදේශීය ඒකකවල සාමාජිකත්වය ලබා මෙම සේවාව අඛණ්ඩව සිදුකළ හැක.
3. ප්‍රථමාධාර පුහුණුකරුවන් වශයෙන් සේවය කිරීමට අවස්ථාව හිමි වීම.
4. විෂය සමගාමී සේවාවක් ලෙස පිළිගැනීම තුළින් අදාල ලකුණු හිමි වීම.

පාසලට ලැබෙන ප්‍රතිලාභ

1. ප්‍රථමාධාර පුහුණු ස්වේච්ඡා සේවාව ලැදි පරහිතකාමී කණ්ඩායමක් බිහි කිරීමට අවස්ථාව ලැබීම.
2. පාසල් ප්‍රථමාධාර අංශය සංවිධානය කර ගැනීමට හැකි වීම.
3. B.M.I මැනීම ඇතුළු සෞඛ්‍ය වැඩසටහන් පාසැල තුළ පැවැත්වීමට හැකියාව ලැබේ.
4. ක්‍රීඩා උත්සව, ප්‍රදර්ශන සහ විවිධ වැඩසටහන් පවතින අවස්ථාවලදී ප්‍රථමාධාර සේවා පාසැල තුළ සංවිධානය කිරීමට හැකිවීම.
5. රුක් රෝපණය, පරිසර සංරක්ෂණය වැනි වැඩසටහන් සඳහා අදාළ ආයතන සම්බන්ධ කර ගැනීමේ අවස්ථාව හිමිවීම.
6. පාසල තුළ විශේෂ දේශන, සෞඛ්‍ය අධ්‍යාපන ප්‍රදර්ශන සංවිධානය කිරීමට අවස්ථාව ලැබීම.

**හොඳම පාසල් ඒකක සඳහා තිළිණ ප්‍රදානය**

එක් එක් පාසැල් ඒකක ලෙස අදාළ වර්ෂයක් තුළ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් සහ සියළු ප්‍රජා සේවාවන් නිසි ඇගයීමකට ලක් කර දිවයිනේ විශිෂ්ඨතම පාසැල් ඒකක පළවන, දෙවන, තෙවන සහ කුසලතා මට්ටමට ළඟා වන ඒකක 25 ඇතුළුව 28 ක් සඳහා මුදල් ත්‍යාග සහ තිළිණ ප්‍රධානය සිදු කෙරෙනු ඇත.

**සෞඛ්‍යදාන කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ පරීක්ෂණ සඳහා නියමිත සේවා හා කාර්යයන්**

1. පාසල් තුළ පවත්වනු ලබන පාරිසරික සෞඛ්‍යයට අදාළ ශ්‍රමදාන
2. රුක් රෝපණ වැඩසටහන්
3. ප්‍රාථමික ශ්‍රේණිවල අදාළව පුද්ගලික ස්වස්ථතාවයට බලපාන දැනුවත් කිරීමේ වැඩසටහන්
   රෝහල්, වැඩිහිටි හා ළමා නිවාස උපස්ථාන සේවා

## 2.2 VII. The Duke of Edinburgh's International Award

## එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන

## (1980)

**හැඳින්වීම**

ශිෂ්ට සමාජය රඳා පවතින්නේ ඒ ඒ සාමාජිකයන්ගේ නිදහස, බුද්ධිය, වගකීම හා චර්යා හා ප්‍රමිතීන් මතය යන විශ්වාසය මත ජාතික යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහනේ දර්ශනය පදනම් වී ඇත.


වැඩෙන තරුණ තරුණියන්ගේ මනෝභාවයන් සංවර්ධන කිරීම මෙන්ම බොහෝ විට පුද්ගලයාට ලෝකය තුළ තමාට හිමි ස්ථානය සකස් කර ගැනීම සඳහාත් ඉඩ ප්‍රස්ථාවක් ග්‍රහනය කර ගැනීමට උද්‍යෝගීමත් වේ.

මෙම වැඩසටහනේ ව්‍යුහය සකස් වී ඇත්තේ වගකීම අන්‍යෝන්‍ය සබඳතා යනාදී හැඟීම් දනවන සංකල්ප ප්‍රත්‍යක්ෂ කර ගැනීමට ය. මෙමඟින් සමාජයේ ඔවුන්ගේ පෞද්ගලිකත්වය මැනවින් ඉස්මතු වී පෙනේ.

**වැඩසටහනේ මූලිකාංග පහත දැක්වෙන පරිදිය.**


- සහභාගීවන්නන්ගේ වයස් ප්‍රමාණය අවු: 13-24 දක්වා වේ.
- තිළිණ ප්‍රදාන වැඩසටහනින් සේවා, ගවේෂණ, කුසලතා හා රුචිකත්වයන් හා ශාරීරික යෝග්‍යතා යන අංශ හතර නියම කෙරේ. මීට අමතරව ස්වර්ණ තිළිණය සඳහා සහභාගීවන්නන් නේවාසික ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ යුතු ය.
- ලෝකඩ, රජත හා ස්වර්ණ යනුවෙන් තිළිණ ශ්‍රේණි 03කි.
- එක් එක් තිළිණය සම්පූර්ණ කිරීම සඳහා අවම කාල සීමා නියමය පිළිවෙළින් මාස 06, 12 සහ 18 කි.
- මෙහි පදනම පුද්ගල රුචිය සඳහා පුළුල්තම ඉඩප්‍රස්ථාවන් සැලසීම මත වන අතර සහභාගීත්වය අත්‍යවශ්‍යයෙන්ම ස්වෙච්ඡාවෙන් වේ.
- වැඩසටහනේ දී පුද්ගල රුචිය පිළිබඳ ප්‍රමුඛස්ථානයක් හිමිවන අතර වැඩිහිටි සහභාගීත්වය තුළින් එහි අගය වර්ධනය කෙරේ.
- වැඩිහිටි ආධාරකරුවෝ උගැන්වීමෙහි නොයෙදෙන අතර ඔවුන් සාමාන්‍යයෙන් කරනු ලබන්නේ අපේක්ෂිත ප්‍රමිතීන් අත්කර ගැනීමට තම භාරයේ සිටින අපේක්ෂකයන් පිරිසට මඟපෙන්වීමයි.
- මෙම ක්‍රියාවලියේදී හැසිරීම් රටාව වර්ධනය වීම සම්බන්ධයෙන් වැඩිහිටි ආධාරකරුවන් වැදගත් කාර්යක් ඉටුකරන අතර ඔවුන්ගේ ආදර්ශයට හා තම පෞද්ගලික චර්යාව වැදගත් මෙහෙයක් ඉටුකරන බැවින් වැඩිහිටි ආධාරකරුවන්ගේ මෙහෙය ඉතා වැදගත් වේ.

## ඉතිහාසය



එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන ක්‍රි.ව.1956 දී එංගලන්තයේ එඩින්බරෝ ආදිපාද පිලිප් කුමරුගේ සංකල්පයක් මත ආරම්භ කරන ලදි.

මෙම වැඩසටහන සැළසුම් කරනු ලැබුවේ ජර්මන් ජාතික අධ්‍යාපන විශේෂඥයෙකු වන ආචාර්ය කර්ට්හාන් මැතිතුමා විසිනි. එතුමා එංගලන්තයේ ගෝඩ්ස්ටන් පාසලේ නිර්මාතෘවරයා ය.






මෙහි ශාරීරික යෝග්‍යතාව හා පුද්ගල සංවර්ධනය සම්බන්ධයෙන් වන කොටස එවරස්ට් කන්ද තරණය කළ ප්‍රථම කණ්ඩායමේ නායකයා වූ ජෝන් හන්ට් විසින් සිදු කරන ලදී.

මෙම වැඩසටහන ආරම්භයේදී එහි මූලික අරමුණ වූයේ වයස අවු: 15 - 18 ත් අතර තරුණයක් තුළ සමබර පෞරුෂයක් ඇති කරලීම කෙරෙහි පෙළඹවීමක් ඇති කර වීමටත් නව යෞවන වියෙන් යෞවනත්වයට නිවැරදිව සංක්‍රමණය වීමට අවශ්‍ය නිවැරදි මඟ පෙන්වීම ලබා දීමත්ය.

1958 වන විට තිළිණ වැඩසටහන ස්ථාවර වෙන්නේ වයස අවු: 14 සිට 24 නව යෞවන වියේ පසුවන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම දරු දැරියන් දක්වා ද ව්‍යාප්ත වෙමින් ලෝකය පුරා ව්‍යාප්ත වීම ආරම්භ වීමත් සමඟ ය. (වෙබ් අඩවිය www.Intaward.org ජාත්‍යන්තර තිළිණ පදනම)

ශ්‍රී ලංකාවේ ද මෙම වැඩසටහන ක්‍රි.ව.1980 දී ආරම්භ වූ අතර ඒ සඳහා මූලිකත්වය ගනු ලැබුවේ තරුණ කටයුතු අමාත්‍යාංශයයි. මුල් කාලයේ දී පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවනු ලැබූ ජාතික යෞවන තිළිණ අධිකාරිය මගින් යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලදුව පසුකාලීනව ජාතික තරුණ සේවා සභාවේ ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.


ජාතික තරුණ සේවා සභාව

මේවන විට මෙම වැඩසටහන ක්‍රියාත්මකවන රටවල් ලෝකයේ කලාප 04කට බෙදා වෙන් කර ඇති අතර ශ්‍රී ලංකාව ආසියා පැසිපික් කලාපයට අයත් වේ. එක් ලොවක් එක් තිළිණයක් යන තේමාව යටතේ ක්‍රියාත්මක මෙම වැඩසටහනට කාලීනව විවිධ තේමාවන් හඳුන්වා දෙන අතර "World Ready" වර්තමානයේ ජනප්‍රියතම තේමාවයි.



ඇමරිකා කලාපය

යුරෝපා , මධ්‍යධරණී හා අරාබි රාජ්‍ය කලාපය

අප්‍රිකා කලාපය

ආසියා පැසිෆික් කලාපය
(ශ්‍රී ලංකාව මෙම කලාපයට අයත් වේ.)

**ජාත්‍යන්තර නිල ලාංඡනය - ශ්‍රී ලංකාව**

Proud to be
THE DUKE OF EDINBURGH'S
INTERNATIONAL AWARD
In Sri Lanka

## වර්තමාන තත්ත්වය

මුල් කාලයේදී ස්වෙච්ඡා සංවිධාන හරහා තිළිණය ක්‍රියාත්මක කිරීම සිදු වුවද පසුකාලීනව ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වෙමින් දිස්ත්‍රික්ක 21 ක පමණ යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහන ක්‍රියාත්මක වේ.

වර්තමානයේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ,රජයේ පාසල්, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සිටින පාසල්, ගුරු විද්‍යාල, SOS ළමා ගම්මාන, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන, රජයේ නොවන ස්වේඡා සංවිධාන, ළමා නිවාස ආදි විවිධ ආයතන තුළ යෞවන තිළිණ වැඩසටහන ක්‍රියාත්මක වේ.

ලංකාව පුරා තිළිණ ඒකක 196 ක්‍රියාත්මක වන අතර බස්නාහිර පළාත තුළ තිළිණ ඒකක 52 ක් පමණ ක්‍රියාත්මක වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය හා යෞවන තිළිණ වැඩසටහන අතර ඇති අවබෝධතා ගිවිසුමක් මගින් වර්තමානයේ මෙය පාසල් තුළ ක්‍රියාත්මකවීම තිළිණ වැඩසටහනේ සුවිශේෂි කඩඉමකි.

මෙම වැඩසටහනේ ගවේෂණ අවස්ථාවලදී එයට සහභාගීවන තිළිණ අපේක්ෂකයන් හා තිළිණ නායකයන් සඳහා රක්ෂණාවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ.
වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ඊට සමගාමීව ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර ඒ සම්බන්ධයෙන් යෞවන තිළිණ නායක නායිකාවන්ට සුවිශේෂි පුහුණුවක් ලබාදෙනු ලැබේ.

සෑම වසරකම තිළිණ හා සහතිකපත් ප්‍රධානෝත්සවයක් පැවැත්වෙන අතර ජනාධිපති අගමැති ප්‍රමුඛ රාජ්‍ය අනුග්‍රහය ඇතිව බ්‍රිතාන්‍ය රාජකීය පවුලේ සාමාජිකයකු හෝ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් තුමාගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අයුරින් පවත්වනු ලැබේ.

**ලබාගත හැකි තිළිණ**


ලෝකඩ


රජත


ස්වර්ණ

**තිළිණ ලබා ගත හැකි වයස් සීමාව**

1. අවුරුදු 13 ට වැඩි සිසුන්ට ලෝකඩ තිළිණය
2. අවුරුදු 15 ට වැඩි සිසුන්ට රිදී තිළිණය
3. අවුරුදු 16 ට වැඩි සිසුන්ට ස්වර්ණ තිළිණය

**තිළිණය ලබා ගැනීමට ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම්**




1. ස්වේච්ඡා සේවය ( පරාර්ථ සේවය දිරි ගැන්වීම)
   - රෝහල් සේවය
   - ප්‍රථමාධාර සේවය
   - ළමා නිවාස හා වැඩිහිටි නිවාස සේවය
   - ළමා ගම්මාන හා දහම් පාසල් සේවය
   - පරිසර සංරක්ෂණය
   - පාසල් අලංකරණය
   - දුර්වල සිසුන්ට විෂය සමගාමීව උපකාර කිරීම ආදී වශයෙන්



2. කුසලතා හා රුචිකත්ව අංශය (දක්ෂතා හා හැකියාවන් හඳුනා ගෙන කුසලතා වර්ධනය කර ගැනීම)
   - සංගීතය, චිත්‍ර, මූර්ති, කැටයම්, නාට්‍ය හා රංග කලාව.
   - කැරම්, චෙස්.
   - නිවේදන කටයුතු.
   - මුද්දර එකතු කිරීම.
   - පරිගණක කටයුතු.
   - මැහුම් ගෙතුම්.
   - ගෘහ විද්‍යාව.
   - කලා ශිල්ප.
   - රූපලාවන්‍ය.
   - ගෙවතු වගාව.
   - ගෙවතු අලංකරණය.
   - ගොක් කලාව.



3. ශාරීරික යෝග්‍යතාව (පෞරුෂ සංවර්ධනය, නම්‍යශීලීත්වය හා නිරෝගී බව ඇති කර ගැනීම)

- නර්තනය.
- වොලිබෝල්.
- බැඩ්මින්ටන්.
- මලල ක්‍රීඩා.
- කරාතේ, වූෂු, අංගම්පොර, ටයිකොනඩෝ.
- ක්‍රිකට්.
- පිහිනුම් වැනි හෘද ස්පන්දනය වැඩි කරන ක්‍රීඩා.



4. අභියෝගාත්මක චාරිකා (කණ්ඩායමක් ලෙස එළැඹෙන අභියෝගවලට මුහුණ දෙමින් ධෛර්යමත් ලෙස නව පරිසරයක ගවේෂණයක නිරත වීම)

- ගවේෂණය (Expedition)
- ප්‍රයානය. (Exploration)
- වෙනත් චාරිකා. (Other Journey)



**වැදගත්**

- ගවේෂණය (Expedition) - ගමනේ යෙදීම මූලික අරමුණ විය යුතු ය.
- ප්‍රයානය (Exploration) - අරමුණ මූලික කරගෙන ගමනේ යෙදිය යුතු ය.

**ගවේෂණ අරමුණු**

1) සෑම ගවේෂණයකටම පැහැදිලිව වෙන් කළ හඳුනාගත් අරමුණක් තිබිය යුතු ය.
2) සෑම සහභාගිකයෙකුටම ගවේෂණයට අවශ්‍ය කුසලතා සංවර්ධනයට අඛණ්ඩව ස්ථිරසාර පුහුණුවක් ලබා දිය යුතු ය.
3) සෑම සහභාගිකයෙකුම අවම වශයෙන් එක් පුහුණු ගවේෂණ අවස්ථාවක් සඳහා සහභාගී වී සිටිය යුතු ය.
4) ගවේෂණ කණ්ඩායමේ සාමාජිකයන් ගණන අවමය 4 හා උපරිමය 7 ක් විය යුතු ය.
5) කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුම ගවේෂණයට ප්‍රථම ගවේෂණයේ පූර්ව සැළසුම් කිරීම හා සූදානම් වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.
6) සෑම ගවේෂණයක්ම යෝග්‍ය අත්දැකීම්ලත් / පුහුණු ගවේෂණ ඇගයුම්කරුවන් හා සුපරීක්ෂක වරුන් විසින්ම ඇගයීම් හා සුපරීක්ෂණය කළ යුතු ය.
7) සෑම ගවේෂණයක්ම ගොඩබිම හෝ ජලය ආශ්‍රිතව සිදු කළ යුතු අතර සෑම සහභාගිකයෙකුම ඔහුට හෝ ඇයට අනන්‍ය ගමනාගමන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ය.
8) නවාතැන් සඳහා සුදුසු කුඩාරම් යොදාගත යුතු අතර එය ප්‍රායෝගිකව භාවිත කළ නොහැකි අවස්ථාවලදී, තමා විසින්ම සකස් කර ගන්නා ආකාරයේ නවාතැන්පලක් හෝ මඩුවක් යොදා ගත යුතුය. (මෙය අවම පහසුකම් සහිත ස්ථානයක් විය යුතු ය.)
9) තෝරාගන්නා පරිසරය සහභාගිකයන්ට අලුත් පරිසරයක් විය යුතු ය.
10) ගවේෂණයෙන් ආවරණය කරන දුර ප්‍රමාණය, ගවේෂණ මාර්ගයේ ඇති බාධක, කාලගුණ තත්වය හා සහභාගිකයන්ගේ යෝග්‍යතාවය මත තීරණය වන අතර සෑම සහභාගිකයෙකුම තිළිණයේ මට්ටම අනුව, අරමුණක් අනුව දරණ උත්සාහයේ කාලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ලෝකඩ | දින 2 යි රාත්‍රියයි | අවම පැය 6 |
| රිදී | දින 3 යි රාත්‍රි 2 | අවම පැය 7 |
| රන් | දින 4 යි රාත්‍රි 3 | අවම පැය 8 |

11) ගවේෂණයකදී නම් අවම වශයෙන් සම්පූර්ණ ගවේෂණ කාලයෙන් 1/3 ක පමණ කාලයක් සමස්ත අරමුණට ළඟා වන තුරු පාගමනින් ගමන් කළ යුතු අතර ඉතිරි 2/3 ක කාලය ගවේෂණ අරමුණු ඉටු කිරීමේ කටයුත්තේ ඵලදායීව නියැලිය යුතු ය.

12)ප්‍රයානයකදී නම් අවම වශයෙන් සම්පූර්ණ ගවේෂණ කාලයෙන් 2/3 ක් පමණ කාලයක් පාගමනින් හෝ යොදා ගන්නා ගමනාගමන ක්‍රමවේදය අනුව ප්‍රයාණයේ යෙදිය යුතු අතර, ඉතිරි 1/3 ක කාලය ප්‍රධානයේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ඵලදායීව යොදාගත යුතු ය.

13)සෑම කණ්ඩායම් සාමාජිකයෙක්ම අවශ්‍ය තරම් ප්‍රමාණයේ උපකරණ රැගෙන යා යුතු අතර ආහාර හා ජලය එක් එක් සාමාජිකයන්ට සෑහෙන ප්‍රමාණයට ඔවුන් විසින්ම සපයා ගත යුතු ය.

14)සෑම සහභාගිකයෙකුම සෑම දිනකදීම සම්පූර්ණ ආහාර වේලක් පිළියෙළ කිරීම් කටයුතු වලට නිරත විය යුතු අතර ගවේෂණ දිනවලදී සමබල ආහාර වේලක් ලබා ගැනීම සුදුසු වේ.

15)ගවේෂණය සම්පූර්ණ කිරීමට ගවේෂණ කණ්ඩායම සමූහ/කේවල වශයෙන් ගවේෂණ සාරාංශ වාර්තාවක් ගවේෂණ ඇගයුම්කරුට ලබාදිය යුතු ය.

**ගවේෂණ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන.**

1. ගවේෂණය සඳහා විදුහල්පතිගේ අවසරය සහිත ආවරණ ලිපිය.
2. ගවේෂණයේ යෙදෙන දිනය, ස්ථානය හා ඊට අදාළ තොරතුරු.
3. ගවේෂණයේ යෙදෙන ළමුන්ගේ නාම ලේඛනය.
4. ගවේෂණ අරමුණු සැලසුම් පත්‍රිකාව.
5. මාර්ග පත්‍රිකාව (Rout Card) හා සිතියම් (එක් එක් දිනයන් සඳහා වෙන වෙනම)
6. කාල සටහන (එක් එක් දිනයන් සඳහා)
7. බොජුන් පත (එක් එක් දිනයන් සඳහා)
8. පොදු අනතුරු ඇගයුම් පත්‍රිකාව.
9. ඇගයුම්කරුගේ මාර්ග සටහන හා ගවේෂණ සුපරීක්ෂක සැලසුම.
10. ආසන්නතම පොලිස් ස්ථානයේ හා රෝහල් විස්තර. (ලිපිනය දුරකතන අංකය)

**සැලකිය යුතු විශේෂ කරුණු**

1. සහභාගිකයන්ගේ හා දෙමාපියන්ගේ දුරකතන අංක ලේඛනයක් පවත්වා ගැනීම.
2. ගවේෂණය පිළිබඳව සාමාන්‍ය චාරිකා චක්‍ර ලේඛනවලට යටත්ව පලාත්/කලාප කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම.
3. ගවේෂණ ස්ථානයට ආසන්නතම පොලීසියට හා රෝහලට ගවේෂණය පිළිබඳ දැනුම් දීම.
4. ගවේෂණ අනුමැතිය ලබා ගැනීම සඳහා උක්ත ලේඛන දින 14 කට ප්‍රථම තිළිණ ප්‍රදාන අංශය වෙත ලැබීමට සැලැස්වීම හා අනුමැතිය ලබා ගැනීම.

<table>
<tr><th>තිළිණය</th><th>සේවා අංශය</th><th>කුසලතා අංශය</th><th>ශාරීරික සුවතා අංශය</th><th>අභියෝගාත්මක චාරිකා අංශය</th><th></th></tr>
<tr><td rowspan="2">ලෝකඩ තිළිණය<br>මාස 06<br>වයස අවු 14</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td rowspan="2">දවස් 2 - රාත්‍රී 1</td><td rowspan="2"></td></tr>
<tr><td colspan="3">මාස 03   මාස 03   මාස 03<br>(+ඕනෑම අංශයක වැඩිපුර මාස 3 නියැලිය යුතුය)</td></tr>
<tr><td rowspan="2">රජත තිළිණය<br>මාස 06<br>ලෝකඩ තිළිණ ලාභීන් මාස 12<br>ලෝකඩ තිළිණලාභී නොවන්නන්<br>වයස 15 +</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td rowspan="2">දවස් 3 - රාත්‍රී 2</td><td rowspan="2"></td></tr>
<tr><td colspan="3">මාස 6   මාස 6   මාස 6<br>(+ලෝකඩ තිළිණලාභීන් නොවන්නන් ඕනෑම අංශයක වැඩිපුර මාස 6 ක් නියැලිය යුතුය)</td></tr>
<tr><td rowspan="3">ස්වර්ණ තිළිණය<br>මාස 12<br>(ලෝකඩ තිළිණ ලාභීන් නොවන්නන්)<br>වයස 16 +</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td>අවම වශයෙන් සතියකට පැයක්</td><td rowspan="2">දවස් 4 - රාත්‍රී 3</td><td>නේවාසික ව්‍යාපෘතිය</td></tr>
<tr><td>මාස 12</td><td>මාස 12</td><td>මාස 12</td><td>දවස් 5 - රාත්‍රී 4<br>(අලුත් අත්දැකීමක් ,අලුත්,පිරිසක්,අලුත් තැනක්)</td></tr>
<tr><td colspan="3">(+ රජත තිළිණලාභීන් නොවන්නන් ඕනෑම අංශයක වැඩිපුර මාස 6 ක් නියැලිය යුතුය</td><td></td><td></td></tr>
</table>

**සංවිධාන ව්‍යුහය**

ජාත්‍යන්තර තිළිණ පදනම - එංගලන්තය

↓

ප්‍රාදේශීය කාර්යාලය (ආසියා පැසිපික් කලාපය)

↓

ජාතික තරුණ සේවා සභාව

↓

ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය - ජාතික අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ

↓

ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයෙහි කාර්ය මණ්ඩලය

↓

ජාතික පුහුණු මණ්ඩලය

↓

තිළිණ ඒකකය (පාසල / විදුහල්පති)

↓

තිළිණ නායක නායිකාවන්

↓

ඇගයුම්කරුවන් හා සුපරීක්ෂකවරු

↓

තිළිණ අපේක්ෂකයින්

**ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලැබෙන ප්‍රතිලාභ**

- සමාජ කුසලතා හා පෞරුෂ සංවර්ධනය.
- එලැබෙන අභියෝගවලට මුහුණ දිය හැකි නායකත්ව කුසලතා සංවර්ධනය.
- නව මිතුරන් පුද්ගලයන් හා අන්තර් පුද්ගල කුසලතා සංවර්ධනය.
- අන් අයගේ ජීවිතවලට සැබෑ වෙනස්කම් ඇති කිරීමට දායක වීම.
- අන් අය කෙරෙහි කැපවීම සඳහා ඇති වගකීම / විදේශීය තරුණ කඳවුරු / විදේශීය සම්මන්ත්‍රන / විදේශීය පුහුණු වැඩමුළු සඳහා සහභාගී විය හැකි වීම.
- විශ්වවිද්‍යාල හා විද්‍යාපීඨ ප්‍රවේශයේදී සම්මුඛ පරීක්ෂණවල විශේෂ ලකුණු හිමිවන වැඩසටහනක් වීම.
- උසස් පෙළ හැදෑරීම සඳහා පාසල් තෝරාගැනීමේ දී සම්මුඛ පරීක්ෂණයන්හිදී ප්‍රමුඛතාවය ලබාදීම.
- ජාත්‍යන්තර වශයෙන් තිළිණලාභීන්ට ඇති පිළිගැනීම.
- රැකියා සඳහා තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණවලදී තිළිණ සහතිකපත් සඳහා (ජාත්‍යන්තර තිළිණයක් බැවින්) ප්‍රමුඛස්ථානයක් ලබාදීම.

**ගුරුවරුන්ට ලැබෙන ප්‍රතිලාභ**

- නව නායකත්ව පුහුණු ලැබීම.
- ධාරිතා සංවර්ධන වැඩසටහන්වලට සහභාගී විය හැකි වීම.
- ගුරුභවතුන්ට (තිළිණ නායක) විදේශ සංචාර හිමි වීම.

**විදුහල්පතිට ලැබෙන ප්‍රතිලාභ**

- පැසලේ ගුණාත්මකභාවය ඉහළ යාම නිසා විදුහල්පතිට කීර්ති ප්‍රශංසා ලැබීම.
- විදුහල්පති ප්‍රනාම උළෙලේදී විදුහල්පතිට ප්‍රශංසා ලැබීම.

**පාසලට ලැබෙන ප්‍රතිලාභ**

- පාසලේ කීර්තිනාමය  ජාත්‍යන්තරය දක්වා යාම.
- පාසලේ සිසුන් විධිමත් ක්‍රියාවලියකට යටත් වීම තුළින් ළමා මනෝභාවයන් සංවර්ධනය කිරීම.
- තිළිණයේ විවිධ අංශ මඟින් පාසල් පිරියතෙහි සංවර්ධනයට අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක වීම.

**විදුහල්පතිගේ භූමිකාව**

- වර්තමානය වන විට බොහෝ පාසල්වල විදුහල්පතිවරු හෝ විෂය සමගාමී කටයුතු පිළිබඳ නියෝජ්‍ය විදුහල්පතිවරු මෙම වැඩසටහන පිළිබඳව මීපේ ගුරු පුහුණු මධ්‍යස්ථානයේදී / ජාතික අධ්‍යාපන ආයතනයේදී / පළාත් / කලාප මට්ටමින් පුහුණු සැසිවලදී දැනුවත් වී ඇත.

එම දැනුවත් වීම මත,

1. තම පාසලේ යෞවන තිළිණ ඒකකයක් පිහිටුවීමේ කැමැත්ත ප්‍රකාශ කරමින් තිළිණ උප බල පත්‍රය අත්සන් කර, පුහුණු වීමට ගුරුභවතුන් දෙදෙනෙකු ද නම් කර තිළිණ ප්‍රදාන අංශයට ඒ පිළිබඳ දැනුම් දීම.
2. පාසලේ තිළිණ ප්‍රදාන ඒකකය ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දීම.
3. දැනුවත් කිරීමේ වැඩසටහන් තිළිණ ක්‍රියාකාරකම් ගවේෂණ වැඩසටහන්, සඳහා උපදෙස් හා අවශ්‍ය අනුමැතිය ලබා දී සම්බන්ධීකරණය කිරීම.

**තිළිණ නායකයාගේ භූමිකාව**

- තිළිණ වැඩසටහනට අදාළ වාර්ෂික සැලැස්ම සකස් කොට එය අනුමත කිරීම.
- සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- ලෝකඩ තිළිණය සඳහා 8/9 ශ්‍රේණිවල සිසුන් තෝරා ගෙන ලියාපදිංචි කිරීම. (තිළිණ සැළසුම සමඟ)
- වාර්තා පොත් දෛනික සටහන් අංශවලට අදාළ ක්‍රියාකාරකම් තෝරා ගැනීම පිළිබඳ සිසුන් දැනුවත් කිරීම, පුහුණුව ලබා දීම සහ ක්‍රියාකාරකම්වලට අදාල දෛනික සටහන් පත්‍ර හා වාර්තා පොත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් ලබා දීම
- තිළිණ අපේක්ෂකයන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම.
- එක් එක් අංශවල ක්‍රියාකාරකම් සඳහා ඇගයුම්කරුවන් නම් කොට තිළිණ ප්‍රදාන අංශයට ඒ බව දැනුම් දීම.
- වාර්ෂික සැලැස්මට අනුව ගවේෂණ සැළසුම් කිරීම.
- සියලු ක්‍රියාකාරකම් පිළිබඳ ලිපි ගොනුවක් නඩත්තු කිරීම.
- පාසලේ තිළිණ ඒකකය හා තිළිණ ප්‍රදාන අංශය අතර සම්බන්ධීකාරකයෙකු ලෙස කටයුතු කිරීම.
- තිළිණ නායක දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රගති සමාලෝචන රැස්වීම් හා තිළිණ නායක පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමෙන් යාවත්කාලීන වීම.

**පාසලේ ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල**

- කලාප කාර්යාලය හරහා හෝ යෞවන තිළිණ ප්‍රදාන අංශය මඟින් ඍජුවම සංවිධානය කරන යෞවන තිළිණ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා පාසලේ විදුහල්පති විසින් නම් කරන ලද ගුරුභවතුන් දෙදෙනෙකු සහභාගී විය යුතු ය.

- පාසලක යෞවන තිළිණ ඒකකයක් පිහිටුවීමේ දී පාසලේ විදුහල්පති සහ යෞවන තිළිණ අංශය සමඟ තිළිණ ඒකක උප බල පත්‍රය අත්සන් කිරීම.

- එම උප බල පත්‍රය මඟින් පාසල තුළ තිළිණ නායක නායිකාවන් වශයෙන් ගුරුභවතුන් දෙදෙනෙකු විදුහල්පතිගේ නිර්දේශයෙන් ලබා දීම.

- එම ගුරුභවතුන් සඳහා යෞවන තිළිණ අංශය මඟින් දැනුවත් කිරීම හා තිළිණ නායක පුහුණුව ලබා දීම.

- යෞවන තිළිණ නායකයින් ලෙස පුහුණුව ලබා ගෙන පාසල තුළ තිළිණ ඒකකය සහ සිසුන් ලියාපදිංචි කිරීම හා යෞවන තිළිණ අංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

**පාසලේ තිළිණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී වගකීම් අනුපිළිවෙළ**

ජාතික තරුණ සේවා සභාවේ, තිළිණ ප්‍රදාන අංශය + අධ්‍යාපන අමාත්‍යාංශය

↓

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (විෂය සමගාමී අංශය)

↓

කලාප අධ්‍යාපන කාර්යාලය (විෂය සමගාමී අංශය)

↓

පාසල (විදුහල්පති)

↓

තිළිණ නායක (තිළිණ ඒකකය)

↓

තිළිණ අපේක්ෂක

**පාසලෙන් අපේක්ෂිත කාර්යභාරය**

- මෙම වැඩසටහන වාර්ෂික සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීම.
- පාසල් සංවර්ධන සමිතියේ හා පාසලේ ඒකාබද්ධ අයවැයෙන් මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම.
- තිළිණ වැඩ සටහන සම්බන්ධයෙන් ආයතනය තුළ හෝ ආයතනයෙන් පරිබාහිරව සංවිධානය කරන ක්‍රියාකාරකම්වල දී අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දීම.

**පාසලේ ක්‍රියාකාරකම් ඇගයීම**

- යෞවන තිළිණ වැඩසටහනේ නියැලෙන සිසුන්ට ශිෂ්‍ය නායක තනතුරු ලබා ගැනීමේ දී ප්‍රසාද ලකුණු ලබා දීම.
- වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේදී තිළිණලාභීන්ට කුසලතා සහතිකයක් හෝ ත්‍යාගයක් ලබා දිම.
- තිළිණ නායකයන් හා ක්‍රියාකාරකම් ඇගයුම්කරුවන් ඇගයීමට ලක් කිරීම.

තොරතුරු දැනගැනීම සඳහා සම්බන්ධ කර ගැනීම


දුරකතන අංකය / ෆැක්ස් අංකය - 0112896563

ලිපිනය - සහකාර අධ්‍යක්ෂ
ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය
ජාතික තරුණ සේවා සභාව
අංක 65
හයිලෙවල් පාර
මහරගම

විද්‍යුත් තැපැල් ලිපිනය - dukeofedsl@nysc.lk
awardlanka@gmail.com

වෙබ් අඩවිය (ජාත්‍යන්තර තිළිණ පදනම) www.intaward.org
www.awardcommunity.org

Facebook - @dofeSrilanka/The Duke of Edinburgh's International Award - Sri Lanka

## 2.2 VIII. පරිසර නියමු කණ්ඩායම්

**(1984)**

**හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 B වගන්තියට අනුව "ස්වභාවධර්මය සහ ස්වභාවික සම්පත් රැකගැනීම ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තකු ගේම යුතුකම වන්නේ ය." ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිගත මෙම වගන්තිය යථාර්ථයක් බවට පත් කරමින් 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ 1981 වර්ෂයේ දී මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවන ලදී. ශ්‍රී ලාංකික පුරවැසියන් අතර පරිසරය සුරැකීමටත්, පාරිසරික සම්පත් කළමනාකරණය හා පරිසර සංරක්ෂණය සඳහා වන සක්‍රීය දායකත්වය ලබා ගැනීමටත් මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කරනු ලැබේ.

මේ සඳහා පුරවැසියන්ගේ පරිසර අධ්‍යාපන මට්ටම ඉහළ නැංවිය යුතු අතර, පරිසර අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන මූලික අරමුණු, 1977 වර්ෂයේ දී ජෝර්ජියාවේ අගනුවර වූ ටිබිලිසි නුවර පැවැත් වූ ජාත්‍යන්තර සමුළුවේ දී ප්‍රකාශිත ටිබිලිසි සමුළු ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් වේ.

තවද එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශිත තිරසර සංවර්ධන ඉලක්ක 17න් සිව්වන ඉලක්කය ලෙස සඳහන් වන්නේ "සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම" යන්නයි. ගුණාත්මක අධ්‍යාපනය තුළ පරිසර අධ්‍යාපනයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ මූලික අරමුණ පෙරදැරි කරගනිමින් ශිෂ්‍ය ප්‍රජාව, පරිසර සංරක්ෂණයේ පුරෝගාමීන් බවට පත්කිරීමේ ප්‍රයත්නයක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධ වෙමින් පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරනු ලබයි.

පරිසර නියමුවෝ, සාගරයේ හා ගොඩබිම ජීවත් වන ජීවීන් හා වාතය, ජලය, පස, ගහකොළ ඇතුළු සියලු ම ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමට බැඳී සිටින අතර පාරිසරික සුන්දරත්වය විනාශවීමට ඉවහල් වන සියලු කටයුතුවලින් වැළකී සිටිති. වන විනාශය, වෙරළ දූෂණය, ජල දූෂණය, වායු දූෂණය, පස දූෂණය, ජෛව විවිධත්වය හීනවීම ආදිය සිදුවීමට ඉවහල් වන හේතු, එමගින් දූෂණය සිදුවන ආකාරය, එම හානිකර තත්ත්වයන් නිසා ඇතිවන ප්‍රතිඵල, එම තත්ත්ව නැති කිරීමට කළ යුතු දේ ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගනිති. එලෙස ලබා ගන්නා අවබෝධය තුළින් තමා ද අන්‍යයන් ද පරිසරය සුරැකීමේ ක්‍රියාවලියකට ප්‍රායෝගිකව යොමු කරති.

**ආදර්ශ පාඨය**

"පරිසරය අප රකියි - රකිමු අපි පරිසරය"

පරිසර නියමු කණ්ඩායම් පිහිටුවීමේ අරමුණු

- පරිසර අවබෝධය වර්ධනය
- පාසල් ප්‍රජාව හා බාහිර සමාජය වෙත පරිසර පණිවිඩය රැගෙන යාම.
- මව්බිමට, එහි ජනතාවට සහ පරිසරයට ආදරය සහ ඇල්ම ඇති කිරීම.
- පාරිසරික වගකීම්වලින් බැඳුණු ජීවන රටාවකට යොමු කිරීම.
- පරිසර නියමු වගකීම් ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව හඳුනා ගැනීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය, කලාප, දිස්ත්‍රික්ක මට්ටමින් අධ්‍යාපන හා සියලුම පාරිසරික විෂය ක්ෂේත්‍ර අතර සම්බන්ධතාව ගොඩ නගා ගැනීම.

**පාරිසරික චර්යා ධර්ම පද්ධතිය**

- පරිසර නියමුවා මව්බිම, දේශීයත්වය, සංස්කෘතිය අගය කරයි. ගරු කරයි.
- ඉතාමත් සකසුරුවම් සරල ජීවන පැවැත්මකට යොමු වේ.
- පරිසර නියමුවා සත්‍යගරුකය. අවංකය. කරුණාවන්තය.
- හැමදෙනෙකුගේ මෙන්ම ගස්වැල්වල හා සතුන්ගේ ද මිතුරෙකි, හිතවතෙකි.
- අන්‍යයන් තමා හා සමාන කොට සලකා කටයුතු කරන්නෙකි.
- අධ්‍යාත්මික මෙන්ම ප්‍රායෝගිකව ද පරිසරයේ පවිත්‍රතාව අගය කරයි.
- පරිසරය සුරැකීමේ දී අන්‍යයන්ගෙන් පැමිණෙන බාධකවලට ඉවසීමෙන් මුහුණ දෙයි.
- නිතරම සතුටින් සිටින, සැම දෙනෙකුගේ ම යහපත සඳහා ක්‍රියාකරන්නෙකි.
- සැමවිටම පරිසර සංරක්ෂණය ප්‍රමුඛත්වයෙහිලා සලකන්නෙකි.
- පරිසර නියමුවා තිරසර සංවර්ධනයේ පෙර ගමන්කරුවෙකි.


**පරිසර නියමු කණ්ඩායම් පිහිටුවීම සඳහා පාසල් තෝරාගැනීම**

- රජයේ මෙන් ම පෞද්ගලික පාසල් තුළ 6 වන ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණි ආවරණය වන සේ පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ඇත. මේ සඳහා ජාත්‍යන්තර පාසල්වලට ද සම්බන්ධ විය හැකි ය.
- පරිසර නියමුවෝ පදක්කම් ලබාගත යුතු ආකාරය පහත පරිදි වේ.
- පරිසර නියමු - 6 ශ්‍රේණිය
- හරිත වර්ණ - 7 ශ්‍රේණිය
- රජත වර්ණ - 8 ශ්‍රේණි
- ස්වර්ණ වර්ණ - 9 - 10 ශ්‍රේණිය
- ජනාධිපති වර්ණ - උසස් පෙළ

**පරිසර නියමු වැඩසටහනේ මෙහෙයුම් ජාලය**

මෙම වැඩසටහන මෙහෙයවීමේ ජාතික වගකීම පැවරී ඇත්තේ පරිසර විෂය භාර අමාත්‍යාංශය වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියට හා අධ්‍යාපන අමාත්‍යාංශයට ය. මධ්‍යම පරිසර අධිකාරියේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහයන් ඒකාබද්ධ ව පරිසර නියමු වැඩසටහන ජාතික වශයෙන් මෙහෙයවනු ලබයි.

**පරිසර නියමු වැඩසටහන මෙහෙයවීම**



**පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ/ පරිසර නිලධාරීන්ගේ කාර්යභාරය**

1. පාසල් හඳුනාගැනීම.
2. නව කණ්ඩායම් පිහිටුවීමට අදාළව පාසල් දැනුවත් කිරීම.
3. නියමිත කාලය තුළ පදක්කම් ක්‍රියාවලියට අදාළ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා කාර්යභාර නිලධාරීන් දැනුවත් කිරීම.
4. නියමිත කාලය තුළ කණ්ඩායම් නාම ලේඛන සහ ලකුණු වාර්තා ලබා ගැනීම.
5. දේශන, වැඩමුළු පැවැත්වීම හා ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දීම.
6. පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.
7. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය
8. පරිසර නියමු වැඩසටහනට අදාළ පරිසර නියමු නියාමන කොට්ඨාස කමිටුවලට සහභාගීවීම හා එහි ප්‍රගතිය දිස්ත්‍රික් කාර්යාලවලට වාර්තා කිරීම.
9. පරිසරය සම්බන්ධ විශේෂ දින වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම

**පරිසර නියමු අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන් පත් කිරීම.**

චක්‍රලේඛ අංක 27/2016 අනුව පරිසර නියමු වැඩසටහනේ ප්‍රගතියට අදාළව සැලසුම් කිරීම්, මෙහෙයවීම් හා ඇගයීම් සිදු කරන නිල නියෝජිතයා වන්නේ,

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - පළාත් සම්බන්ධීකරණ නිලධාරී
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප සම්බන්ධීකරණ නිලධාරී
3. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ - කොට්ඨාස සම්බන්ධීකරණ නිලධාරී

**පරිසර නියමු අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන්ගේ කාර්යභාරය**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යභාරය

- පළාත් මෙහෙයුම් කමිටුව පැවැත්වීම.
- දිස්ත්‍රික් උපදේශක, කලාප / කොට්ඨාස කොමසාරිස්වරුන් නම් කිරීමෙන් පසු අනුමැතිය ලබා දීම.
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම.
- ජනාධිපති පූර්ව පරීක්ෂණය සඳහා නිලධාරියෙකු පත් කිරීම.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යභාරය

- කලාප මෙහෙයුම් කමිටුව පැවැත් වීම.
- කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කිරීම.
- පදක්කම් පරීක්ෂණවලට සහභාගී වීම.
- විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යභාරය

- කොට්ඨාස මෙහෙයුම් කමිටුව පැවැත් වීම.
- පදක්කම් පරීක්ෂණවලට සහභාගී වීම.
- විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.

විදුහල්පතිගේ කාර්යභාරය

- පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන් පත් කිරීම.
- පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන් අධීක්ෂණය, ඇගයීම හා මෙහෙයවීම.
- දෙමාපිය රැස්වීම් පැවැත්වීම හා දැනුවත් කිරීම.
- පරිසර නියමු කණ්ඩායම් නාම ලේඛනය ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කර, මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කිරීම.
- පරිසර නියමු පදක්කම් පරීක්ෂණ පවත්වා (නියමිත ආකෘතියට අනුව) ලකුණු වාර්තා නිර්දේශ සහිත ව ඉදිරිපත් කිරීම.
- පදක්කම් ප්‍රදානෝත්සව සංවිධානය කිරීම.

**පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන් තේරීම, වගකීම හා කාර්යභාරය**

- පරිසර නියමු කණ්ඩායමක් පාසලේ ආරම්භ කිරීමෙන් අනතුරුව සාර්ථකව පවත්වා ගෙන යෑමේ සම්පූර්ණ වගකීම කණ්ඩායම් භාර ගුරුවරුන්ට පැවරේ.
- ගුරුවරුන්ගේ පෞරුෂත්වය, පුළුල් අවබෝධය හා උනන්දුව පදනම් කොට විදුහල්පති විසින් පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන් තෝරා ගනු ලබයි. පරිසර නියමු කණ්ඩායමක් භාරව ගුරුවරුන් දෙදෙනෙකු පත් කළ යුතු වේ. නියමු කණ්ඩායමකට ශිෂ්‍යාවන් ඇතුළත් වේ නම්, ගුරු මහත්මියක ද පත් කිරීම අනිවාර්ය ය. ඒ අනුව ගැහැණු පිරිමි දෙපක්ෂයෙන්ම යුත් නියමු කණ්ඩායමක් භාරව ගුරුමහතෙකු හා ගුරුමහත්මියක පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන් වශයෙන් තෝරා ගත යුතුයි.
- යම්කිසි කාර්යභාර ගුරුවරයෙක් තමා සේවය කරන පාසලින් වෙනත් පාසලකට ස්ථාන මාරුවක් ලබා යන විට තම අත්දැකීම අලුත් පාසලට ද ලබා දිය යුතු අතර, අලුත් පාසලේ ද කණ්ඩායම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය. එසේම පාසලෙන් ඉවත්ව යාමට පෙර තමා සිටි පාසලේ වැඩසටහන් අඩපණ නොවීම පිණිස නියමු කණ්ඩායමට අදාළව නඩත්තු කරනු ලබන ලිපි ගොනුව විදුහල්පති විසින් පත්කරනු ලබන වැඩසටහන භාර ගුරුවරුන් වෙත භාර දිය යුතු ය. තව ද තමා විසින් ඉටු කරනු ලැබූ කාර්ය පිළිබඳ කෙටි වාර්තාවක් ලිපිගොනුවේ අඩංගු කළ යුතු ය. එය මධ්‍යම පරිසර අධිකාරියට පිටපතක් සහිතව ලිපියක් මඟින් විදුහල්පතිට භාර දිය යුතු ය. පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන් එම තනතුරෙන් ඉවත් වන අවස්ථාවේ දී හෝ විශ්‍රාම යාමේ දී ඒ බව මධ්‍යම පරිසර අධිකාරියට ද දැනුම් දිය යුතු වේ.

**පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරුන්ගේ කාර්යභාරය**

1. විදුහල්පතිගේ එකඟතාව මත පරිසර නියමු කණ්ඩායම සඳහා සිසුන් විසිපහක් (25) තෝරා ගැනීම.
2. එම කණ්ඩායම වෙනුවෙන් නායකයන් පස් දෙනෙකු තෝරා පත් කිරීම.
3. ඵලදායී ලෙස සිසුන් දැනුම්වත් කිරීම හා පුහුණු කිරීම.
4. විදුහල්පතිගේ අනුමැතිය ඇතිව දේශන/වැඩමුළු සංවිධානය
5. පදක්කම් පරීක්ෂණ කටයුතු සඳහා සිසුන් සූදානම් කිරීම.
6. මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල, කලාප/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, පරිසර නියමු කලාප කොමසාරිස්, පරිසර නියමු කොට්ඨාස කොමසාරිස් හා ප්‍රාදේශීය පරිසර නිලධාරී/ පරිසර නිලධාරී සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
7. ලොග් පොත හා ලිපි ගොනුවක් පවත්වා ගෙන යාම.
8. මධ්‍යම පරිසර අධිකාරියේ / පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක හා කලාප කොමසාරිස්ගේ දැනුම් දීම අනුව වෙනත් පාසල්වල නියමු කණ්ඩායම් වැඩවලට සහභාගී වීම.
9. නියමු අත්පොතේ දැක්වෙන පදක්කම් ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කිරීම.
10. කණ්ඩායමේ අඛණ්ඩ ක්‍රියාකාරී පැවැත්ම සහතික කිරීම.
11. වර්ෂය ආරම්භයේ දී අලුතින් කණ්ඩායම් ආරම්භ කිරීම හා ශිෂ්‍ය නාමාවලිය (ඔවුන් පිළිවෙළින් දිනා ඇති පදක්කම් පිළිබඳ විස්තර ද සහිතව) හා භාරව කටයුතු කරනු ලබන ගුරුවරුන්ගේ නම්, ලිපිනයන් ආදී විස්තර මධ්‍යම පරිසර අධිකාරියේ පළාත්/ දිස්ත්‍රික් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
12. පදක්කම්ලාභී පරිසර නියමුවෙකු වෙනත් පාසලක සිට තම පාසලට ඇතුළත් වන්නේ නම් අදාළ පදක්කම් ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම.
13. සිසුන්ගේ උද්යෝගය රැක ගැනීම පිණිස යම් සුදුසු වැඩසටහන් විදුහල්පතිගේ හා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟත්වය ඇතිව ක්‍රියාත්මක කිරීම සහ වැඩසටහන සම්බන්ධීකරණය.
14. ජගත් පරිසර දිනය හා රුක් රෝපණ දිනයට අමතර ව අනෙකුත් පාරිසරික වශයෙන් වැදගත් දිනවලට අදාළව වැඩසටහන් පැවැත්වීම.

**පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, කලාප / කොට්ඨාස කොමසාරිස්වරයෙකු ලෙස පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්**

1. දිස්ත්‍රික්කයේ වසර පහකට නොඅඩු කාලයක් තුළ කලාප/ කොට්ඨාස කොමසාරිස්වරයෙකු වශයෙන් සක්‍රීයව කටයුතු කරන ලද ගුරුවරයෙකු දිස්ත්‍රික් උපදේශක ලෙස පත්කළ යුතු ය.
2. කලාප කොමසාරිස්වරයෙකු පත් කිරීමේ දී ගුරු උපදේශකවරයෙකු හෝ කොට්ඨාස කොමසාරිස්වරයෙකු වශයෙන් අවම වශයෙන් වසර තුනක් පළපුරුද්දක් තිබිය යුතු ය.
3. කොට්ඨාස කොමසාරිස් වශයෙන් පත් කිරීමේ දී ගුරු උපදේශකවරයෙකු හෝ තම පාසලේ හරිත පදක්කම දක්වා පරිසර නියමු වැඩසටහන භාර ගුරුභවතා වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.

පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, කලාප සහ කොට්ඨාස කොමසාරිස්වරුන් තෝරා පත්කර ගැනීමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය ඇතිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පත්කරනු ලැබේ.

**පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, කලාප / කොට්ඨාස, කොමසාරිස්වරු පත්කිරීම හා සේවාව නිම කිරීම**

1. පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, කලාප/ කොට්ඨාස කොමසාරිස්වරුන් පත් කිරීමේ හා ඉවත් කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරිය සතු ය. වර්ෂ තුනකට වරක් මෙම පත්වීම අලුත් කරනු ලැබේ.
2. මුල් මාස හයක කාලයක ප්‍රගති අධීක්ෂණයක් සිදු වේ. එම ප්‍රගති අධීක්ෂණය මත ඉදිරි වසර දෙකහමාරක් (2 1/2) සඳහා නැවත පත්වීම හෝ ඉවත් කිරීම ද සිදුවිය හැකි ය.
3. පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, කලාප/ කොට්ඨාස කොමසාරිස් පත් කළ විට මධ්‍යම පරිසර අධිකාරිය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, පළාත් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විදුහල්පති, මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල වෙත පිටපත් සහිතව පත්වීමේ ලිපියක් නිකුත් කරනු ලැබේ.
4. පරිසර නියමු දිස්ත්‍රික් උපදේශක, කලාප/ කොට්ඨාස කොමසාරිස් සඳහා හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.
5. විශ්‍රාම ගැනීමේ දී/ ස්ථානමාරු වීමේ දී/ තනතුරෙන් ඉල්ලා අස්වීමේ දී ඒ බව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**පරිසර නියමු දිස්ත්‍රික් උපදේශකවරුන්ගේ කාර්යභාරය**

පරිසර නියමු දිස්ත්‍රික් උපදේශකවරුන් පහත සඳහන් කාර්යභාර පිළිබඳව වගකීම් දරනු ඇත.

1. පරිසර නියමු කණ්ඩායම් සහ කණ්ඩායම් භාර ගුරුවරුන් අධීක්ෂණය හා උපදෙස් දීම.
2. සිව් මසකට වරක් කලාප කොමසාරිස් මගින් කණ්ඩායම් පිළිබඳව ලබා ගත් තොරතුරු පදනම් කොට ප්‍රගති සමාලෝචන වාර්තාවක් මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත ඉදිරිපත් කිරීම.
3. පරිසර නියමුවැඩසටහන භාර ගුරුවරුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් අනුව කටයුතු කිරීම.
4. මධ්‍යම පරිසර අධිකාරිය, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා අදාළ දිස්ත්‍රික්කය තුළ ඇති පරිසරය සම්බන්ධ කටයුතු කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම.
5. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හා සම්බන්ධතාවක් ගොඩ නැගීම.
6. පදක්කම් ප්‍රදාන උත්සව සංවිධානය හා සහභාගිත්වය.
7. කණ්ඩායම් සාර්ථකව පවත්වා ගෙන යාම පිණිස අවශ්‍ය යෝජනා මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කිරීම.

8. ක්‍රියාකාරී නොවන පාසල් දිරිමත් කිරීම
9. ඉවත් කළ යුතු පාසල් හා වැඩසටහනට ඇතුළත් කර ගත යුතු පාසල් මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත යෝජනා කිරීම
10. දිස්ත්‍රික් පරිසර පුවත්පතෙහි සංස්කාරක මඬුල්ලේ සාමාජිකයෙකු වීම හා පුවත්වල සත්‍යතාව සහතික කිරීම.
11. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසරය හා අදාළව පවරනු ලබන වෙනත් වැඩකටයුතු මෙහෙයවීම
12. ස්වර්ණ පදක්කම් පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම
13. ස්වර්ණ හා ජනාධිපති පදක්කම් අපේක්ෂිත පරිසර නියමුවන් සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබා දීම.

**පරිසර නියමු කලාප / කොට්ඨාස කොමසාරිස්වරුන්ගේ කාර්යභාරය**

1. වැඩසටහන කලාප/ කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
2. නියමු කණ්ඩායම්වල ප්‍රගති අධීක්ෂණය හා උපදෙස් ලබා දීම.
3. කොට්ඨාස කොමසාරිස්වරුන් හා ප්‍රාදේශීය පරිසර නිලධාරීන්/ පරිසර නිලධාරීන් එක්ව හරිත වර්ණ පදක්කම් පරීක්ෂණ පැවැත්වීම.
4. කලාප කොමසාරිස්වරුන් හා ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන්/ප්‍රාදේශීය පරිසර නිලධාරීන්/ පරිසර නිලධාරීන් එක්ව රජත වර්ණ පදක්කම් පරීක්ෂණ පැවැත්වීම.
5. මාස හයකට වරක් අදාළ කලාප/ කොට්ඨාසවල පරිසර නියමු වැඩසටහනේ නියාමන කමිටුව පැවැත්වීම හා අදාළ ප්‍රගති වාර්තා මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කිරීම.
6. පාසල්වලින් සිදු කෙරෙන ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි පුවත් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර පුවත්පතට සහ දිස්ත්‍රික් පුවත්පතට ලබා දීම.
7. පළාත්/ දිස්ත්‍රික් කාර්යාලය, කලාප/ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පරිසර නියමු කොමසාරිස්, ප්‍රාදේශීය පරිසර නිලධාරී/ පරිසර නිලධාරී, සම්බන්ධීකරණය තුළින් පරිසර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
8. පරිසර නියමු නිල ඇඳුම් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

**පරිසර නියමුවන් තේරීම.**

කණ්ඩායම් භාරව කටයුතු කිරීමට පත්කරනු ලබන ගුරුවරුන් විසින් පරිසර නියමු කණ්ඩායමට සම්බන්ධවීමට කැමති සිසුන්ගෙන් වර්ෂය මුල දී අයදුම්පත් කැඳවනු ලැබේ. එම අයදුම්පත් අතුරින් පරිසරය පිළිබඳ ක්‍රියාකාරකම්වලට උනන්දුවක් දක්වන සිසුන් විසිපහකින් (25) සැදුම්ලත් කණ්ඩායම් පිහිටුවීම කළ යුතු ය.

**පරිසර නියමු කණ්ඩායම් ව්‍යුහය**



**නිල ඇඳුම**

පරිසර නියමු හා හරිත පදක්කම්ලාභී ශිෂ්‍යයන් සඳහා

- කොළපාට හිස් වැසුම
- සුදු අත්කොට කමිසය (ඉදිරිපස දෙපැත්තට සාක්කු සහිත)
- සුදු දිග කලිසම/ නිල් කොට කලිසම
- සුදු මේස්
- කළු සපත්තු




සුදු මේස්
කළු සපත්තු



කොළ පාට
හිස්වැසුම



සුදු අත්කොට කමිසය
(ඉදිරිපස දෙපසට
සාක්කු සහිත)



සුදු දිග
කලිසම



නිල් කොට
කලිසම

**පරිසර නියමු හා හරිත පදක්කම්ලාභී ශිෂ්‍යාවන් සඳහා**

- කොළ පාට හිස්වැසුම සහ කොණ්ඩය කළු රිබන් පටිවලින් ගැට ගැසීම.
- දණහිස තෙක් වූ අඟල් එකහමාරක (1 1/2 ) සුදු රැලි සාය, සුදු අත්කොට කමිසය (ඉදිරිපස දෙපැත්තට සාක්කු සහිත)
- සුදු මේස්
- සුදු සපත්තු





කොළ පාට
හිස්වැසුම



කොණ්ඩය කළු රිබන්
පටි වලින් ගැට ගැසීම



සුදු අත්කොට කමිසය
(ඉදිරිපස දෙපසට
සාක්කු සහිත)



සුදු මේස්
සුදු සපත්තු



දණහිස් තෙක් වූ අඟල්
එකහමාරක (1 1/2) සුදු
රැලි සාය


**නිවැරදිව පදක්කම් පැළඳීම (පරිසර නියමු, හරිත)**

පිළිවෙළින් සාක්කුවට ඉහළින් හරහට

1. හරිත
2. පරිසර නියමු ලෙස පැළඳිය යුතුය.



**රජත, ස්වර්ණ හා ජනාධිපති පදක්කම්ලාභී ශිෂ්‍යයන් සඳහා**



**රජත, ස්වර්ණ හා ජනාධිපති පදක්කම්ලාභී ශිෂ්‍යාවන් සඳහා**



**පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු වැඩසටහන්**

පරිසර නියමු වැඩසටහන සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා එයට සම්බන්ධ පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල සේවය කරන සම්බන්ධීකරණ නිලධාරීන්, විදුහල්පතිවරුන්, දිස්ත්‍රික් උපදේශකවරුන්, පරිසර නියමු කොමසාරිස්වරුන්, පරිසර නියමු වැඩසටහන භාර ගුරුභවතුන් හා පරිසර නියමු නායකයින්ට නිවැරදි දැනුමක් මෙන් ම අවබෝධයක් තිබිය යුතු ය. මේ සඳහා පුහුණු කිරීම් කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කෙරේ.

**පරිසර ප්‍රතිඥාව හා ගීතය**

මධ්‍යම පරිසර අධිකාරිය ලබා දෙන ලද පරිසර ප්‍රතිඥාව හා ගීතය අන්තර්ගත නව සංයුක්ත තැටිය පුහුණුවීම සඳහා යොදා ගත යුතු ය.

1. ප්‍රතිඥාව සියලු ම ශිෂ්‍යයන්ට මතකයෙන් නිවැරදි උච්චාරණ සහිතව ශබ්ද නගා කියවීමේ හැකියාව තිබිය යුතු වේ. එක් ශිෂ්‍යයකු ප්‍රතිඥාව කියවීමෙන් අනතුරුව අනික් ශිෂ්‍යයන් ඒ අනුව කියවිය යුතු ය. ප්‍රතිඥාව ලබා දීමේ දී ඡායාරූපයේ දැක්වෙන පරිදි පොළවට සමාන්තර වන සේ දකුණු අත ඉදිරියට දිගු කොට අත්ල පොළව දෙසට යොමු කර සීරුවෙන් සිටිය යුතු ය.



2. පරිසර ගීතය ද සියල්ලන්ට ම මතකයෙන් ගායනා කිරීමේ හැකියාව තිබිය යුතු වේ. ගීතය සඳහා සංගීතය සැපයීමට පරිසර නියමුවන් පුහුණු විය යුතු ය. කණ්ඩායමට සිසුන් ඇතුළත් කර ගැනීමේ දී සංගීතයට දක්ෂ සිසුන් ද ඇතුළත් කර ගැනීමෙන් උද්ගත වන ගැටලු පහසුවෙන් නිරාකරණය කර ගත හැකි වනු ඇත.
3. විශේෂිත උත්සවවල දී පරිසර ගීතය හා ප්‍රතිඥාව මනා ලෙස ගායනයට පරිසර නියමුවන්ට හැකි විය යුතු වේ. මේ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල්වල සතියකට වරක් පාසල් රැස්වීමේ දී පරිසර ගීතය, විකාශනය කිරීමට කටයුතු කළ යුතු ය.
4. පරිසර ගීතය ගායනා කිරීමේ දී හා ප්‍රතිඥාව ලබා දීමේ දී නිවැරදි ව අභිමානවත් ලෙස ඉදිරිපත් කිරීම අතිශයන් ම වැදගත් ය.

එම අවස්ථාවේ දී උත්සව සභාවේ සියලු දෙනාම නැගී සිටින ලෙස පෙර දැනුම් දීමක් කළ යුතුය.

### පරිසර ධජය

පරිසර නියමු කණ්ඩායම් ශිෂ්‍ය නායකයින් විසින් මේ පිළිබඳ පුහුණුවක් ලබා ගත යුතු ය. කණ්ඩායමේ සෑම විශේෂ උත්සව අවස්ථාවක දී ම පරිසර ධජය එසවීම කළ යුතු වේ.




### පදක්කම් දිනා ගැනීම

වැඩසටහන හා සම්බන්ධ වූ පරිසර නියමුවෙකුට පදක්කම් පහක් දිනා ගැනීමට අවස්ථාව ඇත.



ජනාධිපති පදක්කම් පරීක්ෂණයෙන් විශිෂ්ට සාමාර්ථ ලබා ගත් පරිසර නියමුවන් සඳහා ලබාදෙන විශේෂ පළඳනාව (Medal)



**පදක්කම් ප්‍රදානය**

පරිසර නියමු, හරිත සහ රජත පදක්කම් පාසල් මට්ටමින් ප්‍රදානය කිරීමේ දී විදුහල්පතිගේ උපදෙස් පරිදි හා ප්‍රාදේශීය පරිසර නිලධාරි/ පරිසර නිලධාරියාගේ අධීක්ෂණය හා සහභාගිත්වය යටතේ පරිසර නියමු වැඩසටහන භාර ගුරුවරයා විසින් සංවිධානය කළ යුතු ය. මේ උත්සවවලට ප්‍රදේශයේ ප්‍රභූවරුන්, රාජ්‍ය ආයතන ප්‍රධානීන් විශේෂ ආරාධිත අමුත්තන් වශයෙන් සහභාගි කරවා ගැනීම ඉතා සුදුසු ය. ප්‍රාදේශීය ලේකම්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් පරිසර නියමු උපදේශක, පරිසර නියමු කලාප හා කොට්ඨාස කොමසාරිස්, ප්‍රාදේශයේ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ප්‍රධානීන්, පරිසර නියමුවන්ගේ දෙමව්පියන් ආදීන් ද මේ අවස්ථාවට සහභාගි කරවා ගැනීමට කටයුතු කළ යුතු ය. හරිත හා රජත පදක්කම් ප්‍රදානෝත්සව කලාප/ කොට්ඨාස මට්ටමින් සිදු කළ හැකි ය.

**පදක්කම් දිනාගැනීමේ ක්‍රියාවලිය**

- පරිසර නියමු පදක්කමට අදාළ ක්‍රියාකාරකම් 6 ශ්‍රේණිය තුළ දී ආරම්භ කර පරීක්ෂණ පවත්වා අවසන් කළ යුතු ය
- හරිත පදක්කමට අදාළ ක්‍රියාකාරකම් 7ශ්‍රේණි ය තුළ දී ආරම්භ කර පරීක්ෂණ පවත්වා අවසන් කළ යුතු ය
- රජත පදක්කමට අදාළ ක්‍රියාකාරකම් 8 ශ්‍රේණිය තුළ දී ආරම්භ කර පරීක්ෂණ පවත්වා අවසන් කළ යුතු ය
- ස්වර්ණ පදක්කමට අදාළ ක්‍රියාකාරකම් 9 ශ්‍රේණිය තුළ දී ආරම්භ කර 10ශ්‍රේණි ය අවසානයේ දී පරීක්ෂණ පවත්වා අවසන් කළ යුතු ය
- ජනාධිපති පදක්කමට අදාළ ක්‍රියාකාරකම් උසස් පෙළ කාලසීමාව තුළ දී ආරම්භ කර පරීක්ෂණ පවත්වා අවසන් කළ යුතු ය.

**පරිසර නියමු ලාංඡනය සඳහා ඉටු කළ යුතු ක්‍රියාකාරකම්**

1. පරිසරය පිළිබඳ අවම වශයෙන් දේශන/ වැඩමුළු හතරකට සහභාගි වීම.
2. ශාක දෙකක් රෝපණය කොට නඩත්තු කර තිබීම (ජනාධිපති පදක්කම දක්වා ශාක නඩත්තු කර සටහන් පොත පවත්වාගෙන යාම අනිවාර්ය වේ.)
3. පාරිසරික කටයුතු පිළිබඳ සටහන් පොත
4. පරිසර ප්‍රතිඥාව හා ගීතය මතකයෙන් නිසි පරිදි ගායනා කිරීමට හැකි වීම.
5. පරිසර නියමු වැඩසටහන පිළිබඳ සාමාන්‍ය දැනුම
6. පරිසරය පිළිබඳ කෙටි නිරීක්ෂණ වාර්තාව
7. තම පාසල් පන්ති කාමරය තුළ සහ පරිසර නියමුවාගේ ක්‍රියාපටිපාටිය තුළින් පොලිතීන්/ ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා දායකත්වය
8. පෙරට ආචාරය ඉදිරිපත් කිරීම.

**හරිත වර්ණ පදක්කම සඳහා සම්පූර්ණ කළ යුතු ක්‍රියාකාරකම්**

1. අවම වශයෙන් දේශන/ වැඩමුළු/ පුහුණු වීමේ වැඩසටහන් 04කට සහභාගි වීම.
2. ශ්‍රී ලංකාවේ වඳ වී යන ශාක හා සත්ත්ව ලේඛනයක් සැකසීම.
3. ශාක වර්ග ඇතුළත් පොතක් සකස් කිරීම.
4. මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කරන සටහන් පොත නඩත්තු කිරීම.
5. බලශක්ති සංරක්ෂණයට සහ කසළ කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම
6. පරිසරය හා සම්බන්ධ විශේෂ දිනවල දී සිදුකරන ලද ක්‍රියාකාරකම්, ඒ සඳහා සහභාගීත්වය ලබා දීම.
7. ශාක නඩත්තු පොත ඉදිරිපත් කිරීම.
8. පෙරට ආචාරය ඉදිරිපත් කිරීම.

**රජත වර්ණ පදක්කම සඳහා ඉටු කළ යුතු ක්‍රියාකාරකම්**

1. පරිසර ගැටලු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කිරීම.
2. ඓතිහාසික/ සෞන්දර්යාත්මක/ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථානයක් පිළිබඳ නිරීක්ෂණය කර වාර්තාවක් සකස් කිරීම.
3. පාසලේ හෝ ගෙවත්තේ පාංශු සංරක්ෂණ හා භූමි අලංකරණ කටයුතු සාර්ථකව නිම කිරීම සහ වාර්තාවක් සකස් කිරීම.
4. නිවසේ බලශක්තිය පිරිමැස්ම හෝ කසළ කළමනාකරණය
5. තෝරාගත් පරිසර පද්ධතියක ජෛව විවිධත්වය අධ්‍යයනය කර වාර්තාවක් සකස් කිරීම.
6. පරිසර සංරක්ෂණ තේමාව යටතේ (නාට්‍ය/ චිත්‍ර/ සංගීත/ ඡායාරූප/ කථික/ පෝස්ටර්/ ප්‍රදර්ශන ආදී) විචිත්‍රාංගයක් ඉදිරිපත් කිරීම.
7. ශාක නඩත්තු පොත ඉදිරිපත් කිරීම.
8. පෙරට ආචාරය ඉදිරිපත් කිරීම.

**ස්වර්ණ වර්ණ පදක්කම සඳහා සම්පූර්ණ කළ යුතු ක්‍රියාකාරකම්**

1. පහත සඳහන් වැඩසටහන් වලින් එකක් (01) ක්‍රියාත්මක කිරීම
   i. පරිසර නියමු/ පරිසර ළමා සමාජ වැඩසටහන ආසන්න පාසලක අලුතින් ආරම්භ කර පවත්වාගෙන යාම.
   ii. පාසලක පරිසර නියමු හෝ හරිත පදක්කම අපේක්ෂිත පරිසර නියමුවන් සඳහා දේශන තුනක් පැවැත්වීම, (ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ/ පරිසර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම)
   iii. විශේෂිත පාරිසරික දිනයක දී ප්‍රජා සහභාගීත්වයෙන් පාරිසරික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. (උදා: රුක් රෝපණ වැඩසටහන්, පාරිසරික පා ගමන්, ශ්‍රමදාන වැඩසටහන්, ඩෙංගු මර්දන වැඩසටහන්)
   iv. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම (අවම වශයෙන් පවුල් ඒකක 20 ක් සඳහා)
   v. පාසල් සංවර්ධන සමිතිය හා ආදි ශිෂ්‍ය සංගමය හෝ තම ප්‍රදේශයේ පවතින ප්‍රජා සංවිධාන දෙකක සාමාජිකයන් කාලීන පාරිසරික ගැටලු පිළිබඳ ව දැනුවත් කිරීම
2. තමා ජීවත්වන ග්‍රාමයේ/ නගරයේ පරිසර සංවේදී ප්‍රදේශයක් තුළ පරිසර ගැටලුවක් පිළිබඳ තත්ත්ව වාර්තාවක් සැකසීම
3. දේශීය තාක්ෂණ ක්‍රම තුනක් ඉදිරිපත් කිරීම
4. ජල සංරක්ෂණ විධික්‍රම හඳුන්වා දීම සහ ප්‍රදේශයේ බහුල ව පවතින අපද්‍රව්‍යයක් භාවිතකර නිර්මාණ දෙකක් ඉදිරිපත් කිරීම
5. ශාක නඩත්තු පොත ඉදිරිපත් කිරීම
6. පෙරට ආචාරය ඉදිරිපත් කිරීම

**ජනාධිපති පදක්කම සඳහා සම්පූර්ණ කළ යුතු ක්‍රියාකාරකම්**

1. පාරිසරික අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කිරීම
2. පරිසර සංරක්ෂණ කටයුතුවල ක්‍රියාකාරී සහභාගිත්වය
3. පරිසරය හා අදාළව කටයුතු කරන රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වීම
4. පාරිසරික ව්‍යාපෘතියක හිමිකම
5. ජාතික පාරිසරික පනත, පාරිසරික ප්‍රමිතීන් හා ශ්‍රී ලංකාව අත්සන් කරන ලද ජාත්‍යන්තර පාරිසරික සම්මුති පිළිබඳ අවබෝධය
6. ශාක නඩත්තු පොත ඉදිරිපත් කිරීම
7. පෙරට ආචාරය ඉදිරිපත් කිරීම

## පරිසර ළමා සමාජ වැඩසටහන

### හැඳින්වීම

පරිසරය රැක ගැනීමේ පෙර ගමන්කරුවන් ලෙස ආකල්පමය හා චර්යාමය වෙනසක් ඇති කරමින් දරුවන් හැඩගැස්වීම සඳහාත්, දරුවන් හරහා පරිසර සංරක්ෂණ පණිවිඩය වැඩිහිටි සමාජයට ගෙන යාමේ පසුබිම සකස් කර ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියේ මෙහෙයවීමෙන් දිවයින පුරා පාසල්වල පරිසර ළමා සමාජ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

### පරිසර ළමා සමාජ සාමාජිකත්වය

පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන සිසුන් ඉලක්ක කර ගෙන පරිසර ළමා සමාජ පිහිටුවනු ලැබේ.

### පරිසර ළමා සමාජ පිහිටුවීමේ අරමුණු

- දරුවන් තුළ ළමා කාලයේ සිට ම පාරිසරික අවබෝධය පිළිබඳව යහපත් ආකල්ප හා කුසලතා වර්ධනය
- ළමා වියේ සිට ම පරිසරයත් සමඟ සහජීවනයෙන් ගත කිරීමේ ඉගැන්වීම.
- ළමා වියේ සිට ම යහපත් පාරිසරික හුරු පුරුදුවලට හුරු කරවීම.
- පාසල් පරිශ්‍රය තුළ දී සිදුවන පරිසර හිතකාමී ක්‍රියාකාරකම් සඳහා දරුවන් ප්‍රායෝගිකව සහභාගී කරවීම.
- වැඩිහිටියන්ගේ මග පෙන්වීමෙන් බාහිර සමාජය තුළ දී පරිසර සංරක්ෂණ කටයුතුවලට දායක කරවීම.
- හය වන ශ්‍රේණියේ දී පරිසර නියමු කණ්ඩායමට සම්බන්ධ වීම සඳහා ප්‍රාථමික අංශයේ දී ම හුරුවක් ලබා දීම.
- පරිසරයට සංවේදී අනාගත පරපුරක් ගොඩනැංවීම සඳහා පදනම සකස් කිරීම.

### සිසුන් ලබන ප්‍රතිලාභ

- තුරුලතා, විහඟ සහ සොබා සහතික දිනා ගැනීම.
- ප්‍රාථමික අංශයේ දී ම පරිසර සංරක්ෂණ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට අවස්ථාවක් ලැබීම.
- ප්‍රාථමික විෂය මාලාවේ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට උපකාරී වීම.
- යහපත් පාරිසරික හුරු පුරුදු තුළින් මිනිසාට, ගහ කොළ හා සතුන්ට සැබැවින්ම ආදරය කිරීමට යොමු වීම.
- යහ ගුණධර්ම වර්ධනයට අවස්ථාව ලැබීම.
- තමා ජීවත්වන පරිසරයේ සිදුවන පාරිසරික සිදුවීම් පිළිබඳ අවධියෙන් කටයුතු කිරීම.

### පරිසර ළමා සමාජ තුළින් පාසලට ලැබෙන ප්‍රතිලාභ

- පාසල් භූමිය පිරිසිදුව තබා ගත හැකි වීම.
- පාසල් භූමිය අලංකාරව තබා ගැනීමට හැකි වීම.
- දරුවන්ගේ දැනුම වඩවාලීව සඳහා අත්වැලක් වීම.
- පාරිසරික හික්මීමක් ඇති දරුවන් පාසලින් බිහි වීම.
- යහපත් ඉගෙනුම් පරිසරයක් පාසල තුළ නිර්මාණය වීම.

**පරිසර ළමා සමාජ ගුරු කමිටු හා දෙමාපිය කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම**

- ළමා සමාජ ගුරු කමිටුව හා දෙමාපිය කමිටුවල නායකත්ව හා මෙහෙයවීම විදුහල්පතිවරයාගේ වගකීම යටතේ සිදුවිය යුතු ය.
- ප්‍රාථමික ළමා සමාජ ගුරු කමිටුව සඳහා ප්‍රාථමික

**පරිසර ළමා සමාජ තුළින් පාසලට ලැබෙන ප්‍රතිලාභ**

- පාසල් භූමිය පිරිසිදුව තබා ගත හැකි වීම.
- පාසල් භූමිය අලංකාරව තබා ගැනීමට හැකි වීම.
- දරුවන්ගේ දැනුම වඩවාලීව සඳහා අත්වැලක් වීම.
- පාරිසරික හික්මීමක් ඇති දරුවන් පාසලින් බිහි වීම.
- යහපත් ඉගෙනුම් පරිසරයක් පාසල තුළ නිර්මාණය වීම.

# 3.1 උත්සව හා වැඩසටහන්

## 3.1 උත්සව හා වැඩසටහන් සංවිධානයේ දී සැලකිය යුතු කරුණු

**1. කාලය**

- විනාඩි 120 කට වඩා වෙන් නොකළ යුතු ය.
- අනවශ්‍ය දේශන ඇතුළත් නොකළ යුතු ය.
- තෝරාගත් ආකර්ශනීය සෞන්දර්ය අයිතම පමණක් යොදාගත යුතු ය.
- අනවශ්‍ය පරිදි කාලය අපතේ යන ක්‍රියාකාරකම් ඉවත් කළ යුතු ය.
- නියමිත වේලාවට ආරම්භ කිරීම හා අවසන් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**2. තේමාව**

- තේමාව සුවිශේෂී වීම.
- තේමාවට අනුකූලව නොවන කිසිවක් ඇතුළත් නොකළ යුතු ය.
- දේශන හා කථා සියල්ල තේමාව හා අනුබද්ධ විය යුතු ය.
- සැරසිලි හා අලංකරණය තේමාව හා සැසඳිය යුතු ය.

**3. සංවිධානය**

- උත්සවයට / වැඩසටහනට අයත් එක් එක් කාර්යයන් මැනවින් සංවිධානය කර තිබිය යුතු ය.
- කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ලබා ගැනීම සඳහා නිවැරදි කාර්යය පැවරීම් කර තිබිය යුතු ය.
- කුඩා උත්සවයක් වුවද හොඳින් සංවිධානය කිරීම වැදගත් ය.
- සංවිධාන කටයුතුවලදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වය උපරිම අයුරින් යොදාගත යුතු ය.
- වැඩසටහනට පෙර, වැඩසටහන පවත්වන දිනය හා වැඩසටහනට පසු ලෙස කාර්යය පැවරීම, අධීක්ෂණය හා නියාමනය කළ යුතු ය.

**4. අයවැය**

- මූල්‍ය ප්‍රතිපාදන සොයා ගන්නා ආකාරය සැලසුම් කර ගත යුතු ය.
- හැකි තරම් වියදම් අවම කිරීමට වග බලා ගත යුතු ය.
- අනවශ්‍ය වියදම් කපා හැරීමට කටයුතු කළ යුතු ය.
- අවශ්‍ය ද්‍රව්‍ය පාසල තුළින් හා ප්‍රජාව සබඳතා මගින් ලබා ගැනීමට උත්සාහ කිරීම වැදගත් ය.
- සරල හා චමත්කාර සැරසිලි අනුගමනය කළ යුතු ය.
- වෙනත් බාහිර උත්සව සමඟ කිසිවිටකත් තරඟ නොකළ යුතු ය.
- වැඩසටහන් අවසානයේ අයවැය සකස් කළ යුතු ය.

**5. න්‍යාය පත්‍රය**

- ඉතා සැලකිල්ලෙන් සැලසුම් කළ යුතු ය.
- අනවශ්‍ය අයිතම ඇතුළත් නොකළ යුතු ය.
- උත්සව අතරතුර කිසිම විටක න්‍යාය පත්‍රය වෙනස් නොකළ යුතු ය.
- න්‍යාය පත්‍රයේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා බාධා තිබේ ද යන්න උත්සවය ආරම්භ වීමට පෙර සොයා බැලිය යුතු ය.

**6. මෙහෙයවීම**

- ඉතා පැහැදිලි කටහඬක් ඇති, ප්‍රසන්න ඉදිරිපත් කිරීමේ කුසලතාවයක් ඇති අයෙකු තෝරාගත යුතු ය.
- කාලය වැයවන අනවශ්‍ය හැඳින්වීම්, කථාවලින් වලකින ලෙස මෙහෙයවන්නාට උපදෙස් දිය යුතු ය.
- විදුහල්පතිගේ අනුමැතියෙන් තොරව න්‍යාය පත්‍රය වෙනස් කිරීමට ඉඩ නොදිය යුතු ය.
- උත්සව සභාව මෙහෙයවීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු ආරම්භයට පෙර මෙහෙයවන්නාට ලබා දිය යුතු ය.
- මෙහෙයවන්නාට සම්බන්ධීකරණ නිලධාරියෙකු ලබා දිය යුතු ය.
- උත්සව සභාවට පැමිණි අය සහ නොපැමිණි අය පිළිබඳ උත්සවය ඇරඹීමට පෙර සම්බන්ධීකරණ නිලධාරියා විසින් තොරතුරු සනාථ කරගෙන මෙහෙයවන්නාට ලබා දිය යුතු ය.

**7. වාර්තාකරණය**

- මාධ්‍යය හා පුවත්පත් වාර්තාකරණය
- අයවැය හා ගිණුම් නිසි ලෙස පියවීම.
- වැඩසටහන අවසානයේ පසු විපරම සඳහා රැස්වීමක් හෝ සාකච්ඡාවක් පවත්වා සමාලෝචනය කිරීම.
- වැඩසටහනේ අවසන් වාර්තාව පිළියෙල කිරීම.

## 3.2 වැඩසටහන් සැලසුම්කරණය

වැඩසටහන : ------------------------------------------------------------

පැවැත්වෙන දිනය : ------------------------------------------------------------

වේලාව : ------------------------------------------------------------

| අනු අංකය | ඉටු කළ යුතු කාර්යය | යෝජිත දිනය | නිම කළ දිනය | වගකිව යුතු පුද්ගලයා |
|---|---|---|---|---|
| | **වැඩසටහනට පෙර** | | | |
| 1. | වැඩසටහන හඳුන්වාදීම, අරමුණු පැහැදිලි කිරීම, ආචාර්ය මණ්ඩලය, පාසල් සංවර්ධන සමිතිය ආදි ශිෂ්‍ය සංගමය / ශිෂ්‍ය ශිෂ්‍යාවන් | | | |
| 2. | කාර්යය පැවරුම් ලබා දීම. | | | |
| 3. | ප්‍රධාන අමුත්තා / විශේෂ අමුත්තන්ට ආරාධනා කිරීම සහ ඔවුන්ගේ සහභාගීත්වය සහතික කර ගැනීම. | | | |
| 4. | සෙසු ආරාධිතයන්ට ආරාධනා පත්‍ර යැවීම. | | | |
| 5. | වැඩසටහන පැවැත්වෙන ස්ථානය, ශාලාව, ක්‍රීඩා පිටිය ශුද්ධ පවිත්‍ර කිරීම ආරම්භ කිරීම. | | | |
| 6. | න්‍යාය පත්‍ර සකස් කිරීම. | | | |
| 7. | විදුලි ජනක යන්ත්‍රය /ශබ්ද විකාශන යන්ත්‍ර වෙන්කර ගැනීම. | | | |
| 8. | ත්‍යාග, සහතික පත්‍ර, කුසලාන ආදිය සකස් කර ගැනීම. | | | |
| 9. | උත්සව සභාව අලංකාර කිරීමට අවශ්‍ය දෑ සඳහා ඇණවුම් කිරීම. | | | |
| 10. | නර්තන කණ්ඩායම්, සංගීත කණ්ඩායම්, ගායන කණ්ඩායම් තෝරා ගැනීම හා පුහුණුවීම් සඳහා යොමු කිරීම. | | | |
| 11. | සංග්‍රහය සඳහා අවශ්‍ය දෑ සඳහා කාර්යයන් / ඇණවුම් ලබා දීම. | | | |
| 12. | සමරු කලාප සඳහා නිවේදන, දැන්වීම් ලබා දීම. | | | |
| 13. | ඡායාරූප ශිල්පීන්, කැමරා ශිල්පීන්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම. | | | |
| 14. | ශිෂ්‍යභට ආචාර / බාලදක්ෂ / බාලදක්ෂිකා ආචාර සඳහා අවශ්‍ය උපකරණ මූලස්ථානයෙන් ලබා ගැනීම. | | | |
| 15. | වැඩසටහන ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පාසලේ සෙසු කාර්යයන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සංවිධානය කිරීම. | | | |
| 16. | විදුහල්පතිගේ දේශනය, ස්තුති කතාව හා වෙනත් කතා පිළිබඳ දැනුවත් කිරීම. | | | |
| 17. | පෙරහුරු පැවැත්වීම (න්‍යාය පත්‍රයට අනුව සියලු දේ) | | | |

| | | | | |
|---|---|---|---|---|
| 18. | පුවත්පත් සඳහා වැඩසටහනේ තොරතුරු ලබා දීම. | | | |
| 19. | ප්‍රගති සමාලෝචනය සඳහා එක් එක් කමිටු වෙන වෙනම කැඳවා ප්‍රගතිය විමසීම. | | | |
| 20. | තුන්වන පරීක්ෂාවෙන් පසු යම් නිම නොවූ කාර්යයන් වේ නම් කඩිනම් පියවර ගැනීම. | | | |
| 21. | ප්‍රගති සමාලෝචනය හා උත්සවය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම. | | | |
| | **වැඩසටහන් දිනය** | | | |
| 1. | න්‍යාය පත්‍ර පරීක්ෂා කිරීම. | | | |
| 2. | ශබ්ද විකාශන යන්ත්‍රවල ක්‍රියාත්මක බව පිරික්සීම. | | | |
| 3. | ශාලාව හෝ ක්‍රීඩා පිටිය උත්සව පවත්වන ස්ථානයේ අලංකරණය, පවිත්‍රතාව විමසා බැලීම. | | | |
| 4. | උත්සව සභාවේ අලංකරණ කටයුතු පරීක්ෂා කිරීම. | | | |
| 5. | ආසන පැනවීම පරීක්ෂා කිරීම. | | | |
| 6. | පොල්තෙල් පහනට අවශ්‍ය දෑ සපයා ගැනීම. | | | |
| 7. | සංඝයා වහන්සේලා, විශේෂ ආරාධිතයන් හා අනෙක් අය සඳහා ආසන වෙන් කිරීම. | | | |
| 8. | ත්‍යාග / සහතික / කුසලාන මේසය පරීක්ෂා කිරීම. | | | |
| 9. | ජාතික ගීය / පාසල් ගීතය ගායනය හෝ වාදනය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම. | | | |
| 10. | තූර්ය වාදක කණ්ඩායම්, නැටුම් කණ්ඩායම් සූදානම් කිරීම. | | | |
| 11. | මල්මාලා, බුලත් ආදිය සූදානම් කිරීම. | | | |
| 12. | සංග්‍රහ සඳහා අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කිරීම. | | | |
| 13. | කාර්ය පැවරුම්වල දී ලබා දී ඇති කාර්යයන් එකිනෙක ඉටු වී ඇත්දැයි පරීක්ෂා කිරීම. | | | |
| 14. | පාසලේ භූමිය, වැසිකිළි, කැසිකිළිවල පවිත්‍රතාව පරීක්ෂා කිරීම. | | | |
| 15. | පාසලේ සාමාන්‍ය වැඩ කටයුතු පවත්වාගෙන යෑම සඳහා සැලසුම් කළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම. | | | |
| 16. | ඡායාරූප ශිල්පීන් හා කැමරා ශිල්පීන්ගේ සහභාගීත්වය පරීක්ෂා කිරීම. | | | |
| | **වැඩසටහනට පසුදින** | | | |
| 1. | උත්සව ශාලාව පිරිසිදු කිරීම හා උත්සවයට අදාළ භාණ්ඩ ඉවත් කිරීම. | | | |
| 2. | පිටතින් ගෙන්වා ගන්නා ලද භාණ්ඩ හා උපකරණ නැවත ආපසු භාරදීම. | | | |
| 3. | පාසලේ භාණ්ඩ හා උපකරණ අදාළ ස්ථානවලට යොමු කිරීම. | | | |
| 4. | උදව් උපකාර කළ බාහිර පාර්ශවයන්ට හා ආරාධිත අමුත්තන්ට ස්තුතිය පළ කිරීමේ ලිපි යැවීම. | | | |
| 5. | ගෙවීම් කළ යුතු අංශ සඳහා ගෙවීම් කටයුතු කඩිනම් කිරීම. | | | |
| 6. | කාර්යය පැවරුම් භාරව සිටි සියලු දෙනාට ම ස්තුති කිරීම. | | | |
| 7. | වැඩසටහන ඇගයීම. | | | |

සැලසුම් කරන ලද නිලධාරියාගේ නම හා තනතුර : ..........................................................................................
දිනය : ..............................................................
අත්සන : ..............................................................

සැලසුම් කරන ලද නිලධාරියාගේ නම හා තනතුර : ..........................................................................................
දිනය : ..............................................................
අත්සන : ..............................................................

සැලසුම් කරන ලද නිලධාරියාගේ නම හා තනතුර : ..........................................................................................
දිනය : ..............................................................
අත්සන : ..............................................................

## වැඩසටහන් ප්‍රගතිය

වැඩසටහන : ..............................................................
පැවැත්වෙන දිනය : ..............................................................
වේලාව : ..............................................................

| අනු අංකය | ඉටු කළ යුතු කාර්යය | යෝජිත දිනය | නිම කළ දිනය | වගකිව යුතු පුද්ගලයා |
|---|---|---|---|---|
| 1. | **වැඩසටහනට පෙර**<br>වැඩසටහන හඳුන්වාදීම, අරමුණු පැහැදිලි කිරීම, ආචාර්ය මණ්ඩලය, පාසල් සංවර්ධන සමිතිය ආදි ශිෂ්‍ය සංගමය / ශිෂ්‍ය ශිෂ්‍යාවන් | | | |
| 2. | කාර්යය පැවරුම් ලබා දීම. | | | |
| 3. | ප්‍රධාන අමුත්තා / විශේෂ අමුත්තන්ට ආරාධනා කිරීම සහ ඔවුන්ගේ සහභාගීත්වය සහතික කර ගැනීම. | | | |
| 4. | සෙසු ආරාධිතයන්ට ආරාධනා පත්‍ර යැවීම. | | | |
| 5. | වැඩසටහන පැවැත්වෙන ස්ථානය, ශාලාව, ක්‍රීඩා පිටිය ශුද්ධ පවිත්‍ර කිරීම ආරම්භ කිරීම. | | | |
| 6. | න්‍යාය පත්‍ර සකස් කිරීම. | | | |
| 7. | විදුලි ජනක යන්ත්‍රය /ශබ්ද විකාශන යන්ත්‍ර වෙන්කර ගැනීම. | | | |
| 8. | ත්‍යාග, සහතික පත්‍ර, කුසලාන ආදිය සකස් කර ගැනීම. | | | |
| 9. | උත්සව සභාව අලංකාර කිරීමට අවශ්‍ය දෑ සඳහා ඇණවුම් කිරීම. | | | |
| 10. | නර්තන කණ්ඩායම්, සංගීත කණ්ඩායම්, ගායන කණ්ඩායම් තෝරා ගැනීම හා පුහුණුවීම් සඳහා යොමු කිරීම. | | | |
| 11. | සංග්‍රහය සඳහා අවශ්‍ය දෑ සඳහා කාර්යයන් / ඇණවුම් ලබා දීම. | | | |
| 12. | සමරු කලාප සඳහා නිවේදන, දැන්වීම් ලබා දීම. | | | |
| 13. | ඡායාරූප ශිල්පින්, කැමරා ශිල්පීන්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම. | | | |
| 14. | ශිෂ්‍යභට ආචාර / බාලදක්ෂ /බාලදක්ෂිකා ආචාර සඳහා අවශ්‍ය උපකරණ මූලස්ථානයෙන් ලබා ගැනීම. | | | |
| 15. | වැඩසටහන ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පාසලේ සෙසු කාර්යයන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සංවිධානය කිරීම. | | | |
| 16. | විදුහල්පතිගේ දේශනය, ස්තුති කතාව හා වෙනත් කතා පිළිබඳ දැනුවත් කිරීම. | | | |
| 17. | පෙරහුරු පැවැත්වීම (න්‍යාය පත්‍රයට අනුව සියලු දේ) | | | |

| | | | | |
|---|---|---|---|---|
| 18. | පුවත්පත් සඳහා වැඩසටහනේ තොරතුරු ලබා දීම. | | | |
| 19. | ප්‍රගති සමාලෝචනය සඳහා එක් එක් කමිටු වෙන වෙනම කැඳවා ප්‍රගතිය විමසීම. | | | |
| 20. | තුන්වන පරික්ෂාවෙන් පසු යම් නිම නොවූ කාර්යයන් වේ නම් කඩිනම් පියවර ගැනීම. | | | |
| 21. | අවශ්‍ය ප්‍රගති සමාලෝචනය හා උත්සවය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම. | | | |
| | **වැඩසටහන් දිනය** | | | |
| 1. | න්‍යාය පත්‍ර පරික්ෂා කිරීම. | | | |
| 2. | ශබ්ද විකාශන යන්ත්‍රවල ක්‍රියාත්මක බව පිරික්සීම. | | | |
| 3. | ශාලාව හෝ ක්‍රීඩා පිටිය උත්සව පවත්වන ස්ථානයේ අලංකරණය, පවිත්‍රතාව විමසා බැලීම. | | | |
| 4. | උත්සව සභාවේ අලංකරණ කටයුතු පරික්ෂා කිරීම. | | | |
| 5. | ආසන පැනවීම පරීක්ෂා කිරීම. | | | |
| 6. | පොල්තෙල් පහනට අවශ්‍ය දෑ සැපයීම සිදුව තිබීම. | | | |
| 7. | සංඝයා වහන්සේලා, විශේෂ ආරාධිතයන් හා අනෙක් අය සඳහා ආසන වෙන් කිරීම. | | | |
| 8. | ත්‍යාග / සහතික / කුසලාන මේසය පරීක්ෂා කිරීම. | | | |
| 9. | ජාතික ගීය / පාසල් ගීතය ගායනය හෝ වාදනය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම. | | | |
| 10. | තූර්ය වාදක කණ්ඩායම්, නැටුම් කණ්ඩායම් සූදානම් කිරීම. | | | |
| 11. | මල්මාලා, බුලත් ආදිය සූදානම් කිරීම. | | | |
| 12. | සංග්‍රහ සඳහා අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කිරීම. | | | |
| 13. | කාර්ය පැවරුම්වල දී ලබා දී ඇති කාර්යයන් එකිනෙක ඉටු වී ඇත්දැයි පරීක්ෂා කිරීම. | | | |
| 14. | පාසලේ භූමිය, වැසිකිළි, කැසිකිළිවල පවිත්‍රතාව පරීක්ෂා කිරීම. | | | |
| 15. | පාසලේ සාමාන්‍ය වැඩ කටයුතු පවත්වාගෙන යෑම සඳහා සැලසුම් කළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම. | | | |
| 16. | ඡායාරූප ශිල්පීන් හා කැමරා ශිල්පීන්ගේ සහභාගීත්වය පරීක්ෂා කිරීම. | | | |
| | **වැඩසටහනට පසුදින** | | | |
| 1. | උත්සව ශාලාව පිරිසිදු කිරීම හා උත්සවයට අදාළ භාණ්ඩ ඉවත් කිරීම. | | | |
| 2. | පිටතින් ගෙන්වා ගන්නා ලද භාණ්ඩ හා උපකරණ නැවත ආපසු භාරදීම. | | | |
| 3. | පාසලේ භාණ්ඩ හා උපකරණ අදාළ ස්ථානවලට යොමු කිරීම. | | | |
| 4. | උදව් උපකාර කළ බාහිර පාර්ශවයන්ට හා ආරාධිත අමුත්තන්ට ස්තූතිය එල කිරීමේ ලිපි යැවීම. | | | |
| 5. | ගෙවීම් කළ යුතු අංශ සඳහා ගෙවීම් කටයුතු කඩිනම් කිරීම. | | | |
| 6. | කාර්යය පැවරුම් භාරව සිටි සියලු දෙනාට ම ස්තුති කිරීම. | | | |
| 7. | වැඩසටහන ඇගයීම. | | | |

සැලසුම් කරන ලද නිලධාරියාගේ නම හා තනතුර : ......................................................................
දිනය : ......................................................
අත්සන : ......................................................

සැලසුම් කරන ලද නිලධාරියාගේ නම හා තනතුර : ......................................................................
දිනය : ......................................................
අත්සන : ......................................................

සැලසුම් කරන ලද නිලධාරියාගේ නම හා තනතුර : ......................................................................
දිනය : ......................................................
අත්සන : ......................................................

## විෂය සමගාමී ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම් පෝරමය

(එක් එක් ක්‍රියාකාරකම් සඳහා වෙනම පෝරමයක් පුරවන්න.)

විෂය සමගාමී ක්‍රියාකාරකම (බාලදක්ෂිකා / බාලදක්ෂ / කෙඩෙට් / ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව / රතු කුරුස/ යෞවන තිළිණ / පරිසර නියමු)

කණ්ඩායම් රැස්වීම් පවත්වන දිනය හා ස්ථානය :

විෂය සමගාමී ක්‍රියාකාරකම භාරව සිටින ගුරුභවතුන් / වෙනත් අයගේ විස්තර (වෙනත් නම් සඳහන් කරන්න.)

උදා :- බාලදක්ෂ -
බාලදක්ෂිකා -
ශාන්ත ජෝන් -

විෂය සමගාමී ක්‍රියාකාරකම් :-

| අනු අංකය | නම | දුරකථන අංකය | බලපත්‍රලාභී | බලපත්‍ර නොලත් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| 6. | | | | | |
| 7. | | | | | |
| 8. | | | | | |
| 9. | | | | | |
| 10. | | | | | |
| 11. | | | | | |
| 12. | | | | | |
| 13. | | | | | |
| 14. | | | | | |

සැලසුම :-

වාර්ෂික සැලසුම පිළියෙල කර ඇත. / නැත.

වාර සැලසුම පිළියෙල කර ඇත. / නැත.

සැලසුම් පිටපත ඉදිරිපත් කර ඇත. / නැත.

මෙම සැලසුමෙහි දක්වා ඇති විශේෂ වැඩසටහන් මොනවා ද? 03 ක් සඳහන් කරන්න.

1. ------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------

කණ්ඩායම් ක්‍රියාකාරකම් කර ඇත්තේ ද? ඔව් / නැත.

ඔව් නම් ක්‍රියාකාරකම් සඳහන් කරන්න.

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

නැත නම් හේතු දක්වන්න.

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

කණ්ඩායමේ සාමාජිකයින් සංඛ්‍යාව :-

| නවක පෙළ | දෙවන පෙළ | පළමු පෙළ | වෙනත් |
|---|---|---|---|
| | | | |

විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සහභාගී වූ සිසුන් සමඟ කළ සාකච්ඡාව :-

පසුගිය මාස 02 ක ඇතුළත ඔවුන් උනන්දුවෙන් යෙදී සිටි ක්‍රියාකාරකම් මොනවා ද?

1. ------------------------------------------------------------------
2. ------------------------------------------------------------------
3. ------------------------------------------------------------------
4. ------------------------------------------------------------------
5. ------------------------------------------------------------------

සිසුන් කැමති ක්‍රියාකාරකම් මොනවා ද?

1. ------------------------------------------------------------------
2. ------------------------------------------------------------------
3. ------------------------------------------------------------------
4. ------------------------------------------------------------------
5. ------------------------------------------------------------------

කඳවුරු ගොස් තිබේ ද? ඔව් / නැත.

කඳවුරු සඳහා සහභාගී වූවන් ------------------------------------------------------------------------------

ක්‍රියාකාරකම් විනෝදජනක ද? ඔව් / නැත.

ක්‍රියාකාරකම්

1. ---------------------------------------------------------------------------------------------
2. ---------------------------------------------------------------------------------------------
3. ---------------------------------------------------------------------------------------------
4. ---------------------------------------------------------------------------------------------
5. ---------------------------------------------------------------------------------------------

විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා කාමරය / ස්ථානය නිරීක්ෂණය ඃ

ඉඩපහසුකම් තිබේ ද? ඔව් / නැත.

එය තුළ ඇති බඩු මොනවා ද?

--------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------

නිසි පරිදි භාවිතා කරයි ද? ඔව් / නැත.

කඳවුරු උපකරණ තිබේ ද? ඔව් / නැත.

ඔව් නම් කඳවුරු උපකරණ මොනවා ද?

1. ------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------------------------
4. ------------------------------------------------------------------------------------------
5. ------------------------------------------------------------------------------------------

කණ්ඩායම් අරමුදල ඃ-

වාර්ෂික සාමාජික මුදල් රැස් කිරීම සහ කණ්ඩායම් අරමුදලට දායකත්වය අඛණ්ඩව සිදු වේ ද? ඔව් / නැත.

කණ්ඩායමට වෙනත් අරමුදල් ඇත්තේ ද? ඔව් / නැත.

ඔව් නම් කෙසේ ද? අරමුදල් රැස් කිරීමෙන් ද හෝ වෙනත් දායකත්වයන්ගෙන් ද? විස්තර කරන්න.

අරමුදල් තැන්පත් කර ඇත්තේ කෙසේ ද? පාසලේ ද? බැංකු ගිණුමක ද? විස්තර කරන්න.

බැංකු ගිණුමක නම් එහි විස්තර පහත දක්වන්න.

බැංකුවෙහි නම ඃ ---------------------------------------------------------

ගිණුම් අංකය ඃ ---------------------------------------------------------

තැන්පතු මුදල් ප්‍රමාණය ඃ ---------------------------------------------------------

පවත්වාගෙන යන වාර්තා :-

| | ලේඛනය / වාර්තාව | ඇත | නැත | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| 1. | වාර්ෂික සැලැස්ම | | | |
| 1. | ලොග් පොත | | | |
| 2. | නාමලේඛනය | | | |
| 3. | දෛනික වාර්තා | | | |
| 4. | ජයග්‍රහණ වාර්තා | | | |
| 5. | මූල්‍ය වාර්තා | | | |
| 6. | සිසුන්ගේ හා දෙමව්පියන්ගේ පෞද්ගලික තොරතුරු | | | |
| 7. | සහභාගී වූ වැඩසටහන් වාර්තා | | | |
| 8. | දෙමාපිය අවසර ලිපිගොනු | | | |
| 9. | බාහිර සම්පත් පුද්ගල ලේඛන | | | |
| 10. | වෙනත් ආයතන හා සම්බන්ධ ලිපිගොනු | | | |
| 11. | වෙනත් | | | |

ගුරුවරුන් විෂය සමගාමී ක්‍රියාකාරකම්වල යෙදීමේ මුහුණ දුන් ගැටලු හා යෝජනා :-

ගැටලු

1. ------------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------------------------------
4. ------------------------------------------------------------------------------------------------
5. ------------------------------------------------------------------------------------------------

යෝජනා

1. ------------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------------------------------
4. ------------------------------------------------------------------------------------------------
5. ------------------------------------------------------------------------------------------------

අධීක්ෂණ වාර්තාව අනුමත කිරීම. :-

අධීක්‍ෂණ වාර්තාවෙහි සඳහන් දෑ සමඟ එකඟ වෙමි.

කණ්ඩායම් රැස්වීමට සහභාගී වී සිටින නායිකාවන්ගේ / කණ්ඩායම් භාර ගුරුභවතුන්ගේ නම්

නම : ------------------------------------------------------------------------------------------------

අත්සන : ------------------------------------------------------------------------------------------------

ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ තිබේ නම් පහත සඳහන් කරන්න.

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

පාසලේ සිටින විෂය සමගාමී ක්‍රියාකාරකමට අයත් නොවන අයගේ ප්‍රතිචාර සහ අදහස් :-

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

කණ්ඩායම පිළිබඳව විදුහල්පතිතුමාගේ / තුමියගේ අදහස් ?

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

දෙමව්පියන්ගේ අදහස්

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

වෙනත් අදහස්

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

සංවර්ධන යෝජනා

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

සමස්ත අධීක්ෂණය පිළිබඳ අදහස්

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

| කණ්ඩායම් භාර නිලධාරියාගේ නම හා තනතුර | අත්සන |
| --- | --- |
| 1. ------------------------------------------------------- | -------------------------------- |
| 2. ------------------------------------------------------- | -------------------------------- |
| 3. ------------------------------------------------------- | -------------------------------- |
| 4. ------------------------------------------------------- | -------------------------------- |

(කණ්ඩායම් භාර ගුරුවරුන් විසින් සියලු තොරතුරු කියවීමෙන් අනතුරුව අත්සන යෙදිය යුතු ය.)

අධීක්ෂණයේ යෙදුණු නිලධාරියාගේ නම හා තනතුර ------------------------------------------------

අත්සන : ------------------------------------------------------------------------------------------

දිනය : ------------------------------------------------------------------------------------------

| විශය සමගාමී ක්‍රියාකාරකම් සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛ | | | |
|---|---|---|---|
| අනු අංකය | චක්‍රලේඛ අංකය හා නිකත් කල ආයතනය | චක්‍රලේඛය | නිකත් කල දිනය |
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/9/39/1/1/25 | රාජකාරි විදේශ නිවාඩු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | 2017.01.03 |
| 2 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/9/15/2/2/පොදු | දේශිය සහ විදේශිය ක්‍රීඩා තරගාවලි පැවැත්වීම සහ තෝරා ගැනීමේ පරීක්ෂණ ,පුහුණු කඳවුරු ,සාකච්ඡා හා සම්මන්ත්‍රණ සඳහා පාසල් ළමුන් සහභාගි කිරීම. | 2016.03.16 |
| 3 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/9/1/1/13/126 | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය | 2016.02.16 |
| 4 | සංචාරක සහ ක්‍රීඩා අමාත්‍යාංශය MS/4/2/11 | විදේශිය තරගාවලි සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීමට ක්‍රීඩක/ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා අනුමැතිය හා වීසා නිකුත් කිරීම. | 2015.07.30 |
| 5 | ක්‍රීඩා අමාත්‍යාංශය MS/4/4/11 | ක්‍රීඩක/ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් විදේශ තරගාවලි සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීමට අනුමැතිය සහ ඉල්ලුම් කිරිම සහ වීසා සඳහා ලිපි නිකුත් කිරීම. | 2016.02.29 |
| 6 | අධ්‍යාපන අමාත්‍යාංශය MS/1/2/4/1/37 | බාලදක්ෂ/ බාලදක්ෂිකා/සෞඛ්‍යදාන/රතු කුරුස/ශිෂ්‍ය භට/හාන්ත ජෝන් ගිලන් සේවා වැනි විශය සමගාමී කටයුතු සම්බන්ධයෙන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුවරුන් හා නිලධාරින් විදේශ සංචාර සඳහා සහභාගි වීම. | 2015.05.15 |
| 7 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/12/9/5/1 | පාසල් වල අවිධිමත් ලෙස මුදල් අය කිරීම තහනම් කිරීම. | 2015.01.29 |
| 8 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ED/1/15/2/2/2 | සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා හා ගුරු ක්‍රීඩා - 2014 විනිශ්චය මණ්ඩල ගෙවීම. | 2014.12.11 |
| 9 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/2/4/1/33 | ශ්‍රී ලංකා බාලදක්ෂ/ බාලදක්ෂිකා ව්‍යාපාරය | 2014.11.10 |
| 10 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/2/4/1/33 | මහජන සේවා හා සම්බන්ධතා සතිය (බාලදක්ෂ වැඩ සතිය) තුළ පාසල් බාලදක්ෂයින් විසින් එකතු කරනු ලබන මුදල් සම්බන්ධවයි. | 2014.09.09 |

| | | | |
|---|---|---|---|
| 11 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/6/2/13 | පාසල්, පිරිවෙන් හා අනෙකුත් අධ්‍යාපන ආයතන වල ආපනශාලා සෞඛ්‍ය ආරක්ෂිතව පවත්වාගෙන යාම. | 2014.08.12 |
| 12 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/4/ | පාසල් ශරීර සුවතා වැඩසටහන ක්‍රියාත්මක කිරිම. | 2014.05.20 |
| 13 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/4/26 | සෑම පාසල් වාර විභාගයකදීම ක්‍රීඩාව සඳහා ප්‍රගති වාර්තා පොතට ළකුනු ලබා දීම. | 2014.03.19 |
| 14 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/3/5/2 | පාසල් ක්‍රීඩා සංගම් හා ජාතික ක්‍රීඩා සංගම් හා වෙනත් ආයතන සංවිධානය කරන තරග | 2013.11.18 |
| 15 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/4/15 | කායික හා මානසික සමබරතාවයකින් යුතු නිරෝගී පරපුරක් දැයට දායාද කිරීම හා ක්‍රීඩා දක්ෂතා ඇත්තවුන් දක්ෂ ක්‍රීඩකයින් බවට පත් කිරීම වැඩසටහන. | 2013.06.21 |
| 16 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/1/46 | පාසල් ක්‍රීඩා තරග | 2013.03.19 |
| 17 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/2/2/7/15(ii) | පාසල් ශිෂ්‍යාවන් වෙනත් සංවිධාන මගින් බාලදක්ෂ බාලිකාවන් ලෙස බඳවා ගැනීම. | 2012.03.12 |
| 18 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/1/14 | තරග විනිශ්චය සඳහා නිවාඩු ලබා දීම. | 2012.01.16 |
| 19 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/2/15 | ක්‍රීඩා කටයුතු සංවිධානය | 2012.01.12 |
| 20 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/2/2/8/17 | පාසල් ශිෂ්‍යාවන් සඳහා බාලදක්ෂිකා කටයුතු ප්‍රතිසංවිධානය කිරීම. | 2010.11.12 |
| 21 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/3/5 | බාහිර පුද්ගලයන් පුහුණුකරුවන් වශයෙන් පාසල් වල සේවයට යෙදවීම. | 2009.06.30 |
| 22 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/15/2/2/7 | සටන් කලා සහිත පාසල් ක්‍රීඩා | 2009.06.10 |
| 23 | අධ්‍යාපන අමාත්‍යාංශය ED/1/12/1/3/13(iv) | ශ්‍රී ලංකා බාලදක්ෂ/ බාලදක්ෂිකා ව්‍යාපාරය | 2005.02.22 |
| 24 | අධ්‍යාපන අමාත්‍යාංශය 2001/14 | ශ්‍රී ලංකා සෞඛ්‍යදාන පාසල් සමාජ පිහිටුවීම. | 2001.05.09 |